# ශ්‍රී ලංකාවේ
# ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**2025**

**ශ්‍රී ලංකාව සඳහා වන ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය**

---

**විධායක සාරාංශය**

ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය (NSPS), සමාජ ආරක්ෂාව පාදක වන සියළු දෙනා ඇතුලත් , තිරසාර සහ ඩිජිටල් ලෙස බලගන්වන පද්ධතියක් ගොඩනැගීම සඳහා වසර 10 ක මාර්ග සැලසුමක් (2025-2035) සනිටුහන් කරයි . **ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (2024 )**මත පදනම් වූ, මෙම උපායමාර්ගය **සමාජ සහනාධාර, සමාජ රැකවරණය, සමාජ රක්ෂණය** සහ **ශ්‍රම වෙළඳපොල හා ඵලදායී ඇතුලත් කිරීම** ආදි ලෙස කුළුණු හතරක් මත රඳා පවතී.

ශ්‍රී ලංකා රජයේ සංවර්ධන රාමුවේ සහ ප්‍රධාන ආංශික ප්‍රතිපත්ති රාමු වල දක්වා ඇති පරිදි, මානව ප්‍රාග්ධන ආයෝජන පුළුල් කිරීම, අසමානතාවය අඩු කිරීම සහ සුභසාධන සැපයුම් පද්ධති නවීකරණය කිරීම සඳහා එහි ප්‍රතිපත්තිමය කැපවීම් සඳහා ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය ඍජුවම සහාය දක්වයි.

මෙම උපාය මාර්ගය සියලු දෙනා ඇතුලත් , සහ සෑම පුරවැසියෙකුටම ගෞරවයෙන්, ආරක්ෂාවෙන් සහ සියළු අවස්ථාවන් සහිතව ජීවත් වීමට සඳහා සවිබල ගැන්වෙන ශ්‍රී ලංකාවක් අපේක්ෂා කරයි

- ආදායම් සහ සත්කාර සේවා සහාය තුළින් දිළිඳු , අවදානමට ලක් වූ සහ සමාජ ආරක්ෂණ ක්‍රම වලින් බැහැරවූ අය ආරක්ෂා කිරීම.
- දායකත්ව යෝජනා ක්‍රම හරහා අවිධිමත් අංශයේ සේවකයින් සහ වැඩිහිටියන් සඳහා ආවරණය පුළුල් කිරීම.
- සේවා නියුක්තිය , ඵලදායිතාව සහ සේවක ගරුත්වය ප්‍රවර්ධනය කිරීම.
- ජන විකාශයේ සිදුවන වෙනස්කම් විවිධ අර්බුද සඳහා ඔරොත්තු දිය හැකි ( අනුවර්තන ) පද්ධති ගොඩනැගීම.

**ප්‍රමුඛතාවය ලබාදෙන මැදිහත්වීම් (2025-2035)**

- සියලු සමාජ ආරක්ෂක වැඩ සටහන් පුළුල් කිරීම සහ ඩිජිටල්කරණය කිරීම
- අවිධිමත් අංශයේ සේවකයින් සඳහා ක්ෂුද්‍ර රක්ෂණ ක්‍රම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- වැඩිහිටියන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රජා පාදක සත්කාර සේවා ස්ථාපිත කිරීම.
- ශ්‍රම ආරක්ෂණය, අවම වැටුප් නියමයන්ට අනුකූලව සහ යහපත් රැකියා මාර්ගයන් සහතික කිරීම.

**මූල්‍යකරණය සහ සැපයීම**

- ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය සඳහා අරමුදල් සපයනු ලබන්නේ රජයේ අයවැය, අනිවාර්ය සහ ස්වේච්ඡා දායකත්වයන් සහ කාර්යක්ෂම ඉතිරිකිරීම් යනාදියේ සංයෝජනයකිනි.
- සියලුම වැඩසටහන් **ජාතික සමෝධානිත සමාජ සුභසාධන ලියාපදිංචි නාම ලේඛනයක්** මගින් සිදු කිරීම .

**වසර 2030 වන විට අපේක්ෂිත ප්‍රතිඵල**

- සමාජ සහනාධාර : දිළිඳු සහ අවදානමට ලක් වූ ජනගහනයෙන් ≥95% විධිමත් සහ ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබනු ඇත.
- සමාජ රැකවරණය: ගුණාත්මක සත්කාර සහ මනෝ සමාජීය සහාය සඳහා ප්‍රවේශය සහතික කරමින්, සත්කාර සේවා සපයන්නන් , වයස්ගත පුද්ගලයන් සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළුව නිවැසි සහ ප්‍රජා මූලික සත්කාර සේවා පුළුල් කිරීම .
- සමාජ රක්ෂණය: අවිධිමත් අංශයේ සහ විගමණික සේවකයින් ඇතුළුව සියලු සේවකයන් සඳහා දායකත්ව යෝජනා ක්‍රම වලට ප්‍රවේශය පුළුල් කිරීම. (විශ්‍රාම වැටුප් , සෞඛ්‍යය , රැකියා විරහිත භාවය)
- ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුළත් කිරීම ≥90% අවම වැටුප් අනුකූලතාව හැකියා වර්ධනය සහ වැඩසටහන් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ පුළුල් ප්‍රවේශය.
- පද්ධති ශක්තිමත් කිරීම: ඒකීය සුභසාධන පද්ධති හරහා ඩිජිටල් ගෙවීම් සහ කම්පන ප්‍රතිචාරාත්මක සේවා සැපයුම් ඇතුළත් සම්පූර්ණ ඩිජිටල් වැඩසටහනක ආවරණය

## ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ පෙළගැස්වීම

**ජාතික සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍ර සමඟ ගැලපීම**

ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය (NSPS) සියලු දෙනා අන්තර්ගත වන ආර්ථික වර්ධනය, සමාජ සමානාත්මතාවය සහ රාජ්‍ය මූල්‍ය වගකීම සඳහා වන ශ්‍රී ලංකාවේ කැපවීමට සහාය දක්වයි.
එය සම්පූර්ණයෙන්ම පෙළගැසෙන්නේ :
**රජයේ ප්‍රතිපත්ති රාමුව සහ සංවර්ධන දැක්ම**

- සාර්ව ආර්ථික ස්ථායිකරණයේ කොටසක් ලෙස මූල්‍යමය වශයෙන් තිරසාර සහ ඉලක්කගත සමාජ වියදම් සහතික කරනු ඇත.
- අවදානමට ලක්විය හැකි ජනගහනය ආරක්ෂා කිරීම සඳහා ඩිජිටල් ලෙස සක්‍රීය, කම්පන-ප්‍රතිචාරාත්මක පද්ධති හඳුන්වා දෙනු ඇත.
- ශ්‍රම වෙළඳපොළ විධිමත් කිරීම සහ දිගුකාලීන ඔරොත්තුදීමේ හැකියාවට සහාය වනු පිණිස අවිධිමත් අංශයේ සේවකයින් සඳහා සමාජ රක්ෂණය පුළුල් කරනු ඇත.
- ජාතික ප්‍රතිපත්ති රාමුවේ විස්තර කර ඇති අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වේ.
- මානව ප්‍රාග්ධන ආයෝජන, දරිද්‍රතාවය පිටුදැකීම සහ සමාජ සහජීවනය සඳහා කැපවීම් කරනු ඇත .
- ශ්‍රමය, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ඩිජිටල් පාලනයේ අඛණ්ඩ ප්‍රතිසංස්කරණ ශක්තිමත් කරනු ඇත**.**

<u>ගෝලීය වගකීම් සහ තිරසාර සංවර්ධන ඉලක්ක</u>

- SDG 1.3 සඳහා සහාය : සෑම දෙනා වෙනුවෙන් ජාතික වශයෙන් සුදුසු සමාජ ආරක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම.

- SDG 2 (කුසගින්න තුරන් කිරීම), SDG 3 (යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම), SDG 4 (ගුණාත්මක අධ්‍යාපනය), SDG 5 (ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය), SDG 8 (සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය .) සහ SDG 10 (අවම කරන ලද අසමානතාවයන්) සඳහා දායක වේ.

මෙලෙස, ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය, ආර්ථික ප්‍රතිසංස්කරණ සමඟ සමාජ සාධාරණත්වය සම්බන්ධ කිරීමේ මූලික කුළුණක් ලෙස ක්‍රියා කරමින්, ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමනේ කිසිවෙකුත් මඟ නොහැරෙන බව සහතික කිරීමට උපකාරී වනු ඇත.

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව විවිධ අන්තර් සම්බන්ධිත සමාජ-ආර්ථික අභියෝගයන් වන ජන විකාශනයේ වෙනස්කම් (වේගයෙන් වයස්ගත වන ජනගහනය වැනි), දිගුකාලීනව පවතින දරිද්‍රතාවය, ආර්ථික අස්ථාවරත්වය සහ මූලික ලෙස අවිධිමත් ශ්‍රම වෙළඳපොළ සමඟ අඛණ්ඩව ගැටෙමින් පවතී. COVID - 19 වසංගතය සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අවපාතය, විශේෂයෙන් සලකන විට සමාජ ආරක්ෂණ පද්ධතියේ, ප්‍රතිලාභවල ප්‍රමාණවත් බව, ආවරණය වන ජන සංඛ්‍යාවේ පරතරයක් (Coverage gaps) තිබීම, සහකම්පන ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් අඛණ්ඩ දිගුකාලීන අවදානම් සහගත බව අවධාරණය කෙරේ.

2024 ජූලි මාසයේ දී, රජය විසින් අනුමත කරන ලද ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP), සමාජ සහනාධාර, සමාජ රැකවරණය , සමාජ රක්ෂණ සහ ශ්‍රම වෙළඳපොළ මැදිහත්වීම්, ආදිය සියලු පුරවැසියන්ගේ ජීවන චක්‍රය පුරාවටම ආවරණය විශ්වීය සමෝධානිත සමාජ ආරක්ෂණ පද්ධතියකට එක් කිරීම සඳහා නිර්මාණය කරන ලද පළමු ජාතික මට්ටමේ රාමුව වේ. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් සමෝධානිත සමාජ සුභසාධන ලියාපදිංචි නාම ලේඛනයක අවශ්‍යතාවය, ප්‍රතිලාභ ලබාදීම ඩිජිටල්කරණය, වඩා හොඳ ඉලක්ක ගත කිරීම් සහ අනපේක්ෂිත කම්පන සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණුව යනාදියෙහි අවශ්‍යතාවය ඉස්මතු කරන ලදී.

මේ වන විට උපාය මාර්ගයට ගෘහ ඒකක බිම් මට්ටම සංවර්ධනය මූලික කර ගත් ගම්මාන බලගැන්වීමේ වැඩසටහනක් සහ ගෘහ මට්ටමේ ඇතුළත්භාවය ප්‍රවර්ධනයට නිර්මාණය කර ලද ජාතික වශයෙන් පිළිගත් ආරම්භය ඇතුළත් වේ.

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියේ 4 වන කුළුණට සම්බන්ධව, මෙම මුලපිරීම, සම්බන්ධීකරණය වූ සේවා සැපයීම, ජීවනෝපාය සහාය සහ දිගුකාලීන දරිද්‍රතාවයෙන් ඉවත්වීම සඳහා විමධ්‍යගත වූ පුරවැසි ප්‍රමුඛ පද්ධති ගොඩනැගීම අරමුණු කරයි.

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය හි දිගුකාලීන අරමුණු , විශේෂයෙන් ඵලදායී ඇතුළත් කිරීම සහ ප්‍රජාව සතු ඔරොත්තු දීමේ හැකියාව, එහි වලංගු භාවය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මගින් ස්ථාපිත විය.

මෙම උපායමාර්ගය සමාජ ආරක්ෂාව කේන්ද්‍රීය කුළුණක් ලෙස තබන ජාතික ප්‍රමුඛතා සමඟ ද සමපාත වේ.

තවද මෙම උපායමාර්ගය, සමාජ ආරක්ෂාව ප්‍රධාන කුළුණක් සේ සලකන ජාතික ප්‍රමුඛතා සමග පෙළගැසෙනු ඇත.

**අරමුණු කෙරෙන ප්‍රධාන අංශ ලෙස:**

- අඩු ආදායම්ලාභී ගෘහ ඒකක, මෙන්ම ආබාධ සහිත පුද්ගලයින් සහ දිගුකාලිනව රෝගීව සිටින පුද්ගලයින් සඳහා අවම අදායම් සහතික කිරීම
- අවශ්‍යතාවන් සහිත වැඩිහිටි පුරවැසියන් සඳහා දීමනා සහ සත්කාර සේවා සැපයීම ;
- ආබාධිත සහිත පුද්ගලයින්ට සහය ලබාදෙන සංවිධාන සඳහා දිරිගැන්වීම් ලබාදීම
- කාන්තා මූලිකත්වය දරන සහ තනි මාපිය පවුල් සඳහා මූල්‍ය ආධාර සහ පෝෂණ සහාය;

- දේශීය ක්ෂුද්‍ර ව්‍යාපාර සහ අඩු ආදායම් පවුල් වල ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය ආදිය ශක්තිමත් කිරීමට මිනුම් හඳුන්වා දීම

ජාතික ප්‍රමුඛතා සමග ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය පෙළගස්වමින්, මෙම සමාජ ආරක්ෂණ උපායමාර්ගය අරමුණු කරනුයේ පූර්ව අත්දැකීම් මත පදනම් වූ, මූල්‍යමය වශයෙන් විශ්වසනීය සහ දේශපාලනිකව ස්ථාවර පුළුල් මාර්ග සිතියමක් ශක්තිමත්ව නිර්මාණය කිරීමයි .

විනිවිදභාවය සහ ඵලදායී පාලනය තහවුරු කරන ලද සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගනිමින්, වඩාත් අවදානමට ලක්විය හැකි අවිධිමත් අංශයේ සේවකයින්, වැඩිහිටියන්, කාන්තාවන් සහ ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් වෙත ප්‍රමුඛත්වය දෙන ප්‍රවේශයක් උපාය මාර්ගය මගින් අපේක්ෂා කරයි. එය ශක්තිමත් සමාජ ආරක්ෂණ පද්ධති ඇති රටවල ගෝලීය අත්දැකීම් සහ සාර්ථක ආකෘති ආදර්ශයට ගනිමින් ශ්‍රී ලාංකික සන්දර්භයට වඩා හොඳින් ගැලපෙන ලෙස අනුවර්තනය කර ඇත . ජාතික දත්ත පිළිබඳ දැඩි විශ්ලේෂණයක් සහ රජයේ ආයතන, සංවර්ධන හවුල්කරුවන්, විද්වතුන් සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන් සහ ප්‍රජා නියෝජිතයින් ඇතුළු පුළුල් පරාසයක කොටස්කරුවන් සමඟ ගැඹුරු උපදේශන මත පවතින ප්‍රතිපත්ති රාමු පිළිබඳ සිදුකල පුළුල් සමාලෝචනයක්, මත මෙම උපායමාර්ගය පදනම් වේ. විවිධ දෘෂ්ටිකෝණයෙන් , අයිතිවාසිකම් මත පදනම් වූ, ජීවන චක්‍රය-නැඹුරු සහ කම්පන-ප්‍රතිචාරාත්මක, සියලු දෙන සඳහා සමාජ ආරක්ෂණ පද්ධතියක් ගොඩනැගීම අරමුණු කරමින් මෙම උපායමාර්ගය අදාළත්වය, ප්‍රතිචාරාත්මක බව සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කරයි.

## 2. වත්මන් සමාජ ආරක්ෂණ භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ යෝජනා ක්‍රම ද ඇතුළුව, රජයේ විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය සහනාධාර සහ තවත් බොහෝ සමාජ ආරක්ෂණ වැඩසටහන් ගණනාවක් පැවතියද, සමාජ ආරක්ෂණ භූ දර්ශනයේ අඛණ්ඩතාව මෙන්ම අරමුදල් ඌනතාවය හා කාර්යක්ෂමව නොවනබව පෙන්වයි[1]

[1] https://www.worldbank.org/en/news/feature/2023/06/19/3-ways-to-make-social-protection-work-for-sri-lanka-s poor-and vulnerable#:~:text=One%2Dfourth%20of%20Sri%20Lankans,not%20eligible%20are%20receiving%20support.

## A. ආවරණ පරතරයන් සහ බෙදීම

### 1. බැහැර වූ අවිධිමත් අංශය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 60-70% කට වඩා වැඩි පිරිසක් අවිධිමත් ආර්ථික අංශයේ සිටින නමුත්, එයින් විශාල ප්‍රමාණයක් විධිමත් විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය ප්‍රතිලාභ සහ විරැකියා රක්ෂණය[2] ඇතුළු සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වී නොමැත.

### 2. දරිද්‍රතාවයේ අවම ආවරණය සහ ඇතුළත් කිරීමේ දෝෂ

- දිළිඳුතම 40% න් දළ වශයෙන් 69% ක් පමණක් අස්වැසුම මගින් ආවරණය වන අතර, ප්‍රතිලාභවලින් සැලකිය යුතු 10–15% ක ප්‍රමාණයක් සුදුසුකම් නොලත් කාණ්ඩ වෙත කාන්දු වේ [3] .
- සුදුසුකම් සපිරූ ගෘහ ඒකක 58% ක් ඇතුළත් නොවන බවත්, එම සමාන ප්‍රමාණයෙන්ම සුදුසුකම් නොලත් ගෘහ එක්ක ඇතුළත් වන බවත් යුනිසෙෆ් දත්ත[4] පෙන්වා දෙයි.

## B. ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවීම

### 1. මූලික අවශ්‍යතා සහ තත්‍ය වටිනාකම් නොගැලපීම

ශ්‍රී ලංකාවේ සමාජ ආධාර ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සුළු ප්‍රමාණයක් වන අතර සහ විශේෂයෙන් දිළිඳුතම අය අතර ගෘහස්ථ පරිභෝජනයට මධ්‍යස්ත මට්ටමේ දායකත්වයක් වසංගත සහන ලබාදුනි.[5]

වැඩිහිටි, ආබාධිත සහ අඩු ආදායම්ලාභී ගෘහ ඒකක වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ලබා දෙන වත්මන් මාසික දීමනාව[6] මූලික යැපුම් වියදම් සහ පාරිභෝගික මිල මට්ටම් ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවේ. 2025 අප්‍රේල් වන විට, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මූලික ජීවන තත්වයන් සඳහා අවශ්‍ය යැයි සැලකෙන අවම මාසික ආදායම ජාතික දරිද්‍රතා සීමාව ලෙස වාර්තා කර ඇත.[7]

### 2.සම්පත් වෙන් කිරීමේ විෂමතාවන්

සමාජ ආරක්ෂණ වියදම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් විධිමත් අංශයේ සේවක විශ්‍රාම වැටුප් ලබන්නන් සඳහා යොමු වන අතර, මුළු වියදමෙන් කුඩා කොටසක් පමණක් සමාජ ආධාර වැඩසටහන් වෙනුවෙන් වෙන් වේ[8].

[2] https://www.ilo.org/projects-and-partnerships/projects/promoting-and-building-social-protection-south-asia-sri lanka component#:~:text=Background%20and%20Rationale%20In%20Sri%20Lanka%2C%20only,of%20the%20workforce%20%2D%20without%20adequate%20coverage. 3.

[4] https://www.unicef.org/media/136411/file/Sri-Lanka-2022 COAR.pdf#:~:text=While%20Sri%20Lanka's%20flagship%20cash%20transfer%20programme%2C,benefit%20values%2C%20translates%20into%20limited%20poverty%20impact. [5] https://www.elibrary.imf.org/view/journals/002/2023/116/article-A001-en.xml?utm_source=chatgpt.com [6] https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=13080#:~:text=30.,31. [7] https://www.statistics.gov.lk/povertyLine/2021_Rebase?utm_source=chatgpt.com 8 https://www.socialprotectionfloorscoalition.org/wp-content/uploads/2024/10/2024-R2SSC-Case-Studies-SriLanka.pdf?utm_source=chatgpt.com

## C. දුර්වල දත්ත පද්ධති සහ ඉලක්ක ගත කිරීම

### මධ්‍යගත ලියාපදිංචිකිරීමේ අවශ්‍යතාවය සහ යෝග්‍යතා පිළිබඳ නීති

ඒකීය දත්ත පද්ධතියක් නොමැති වීම[9] නිසා ආයතන හරහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙහි අසමානතා, ද්විකරණයට සහ දේශපාලනීකරණයට ඇති ඉඩකඩ[10]

### ක්‍රියාත්මක කිරීමට නියමිත නියමු ප්‍රතිසංස්කරණ

දරිද්‍රතාවය පිටුදැකීමේ ඉලක්කගත කිරීම සඳහා නව නිර්ණායක සකස් කර තිබුණද, සංඛ්‍යා දත්ත පහසුකම් සහ පරිපාලන අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීම දුර්වල වී ඇත[11]

## D. ආයතනික සහ සම්බන්ධීකරණ දුර්වලතා

- **බහු සමාන්තර ආයතන**

  සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, වැඩිහිටි ලේකම් කාර්යාලය, ආබාධිත ලේකම් කාර්යාලය වැනි විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හරහා වැඩසටහන් ව්‍යාප්ත වී ඇති අතර, එමඟින් අතිඡේදනය, අකාර්යක්ෂමතාව සහ බාධා සඳහා ඇති ඉඩකඩ[12].

- **යහ පාලන අභියෝග**

  සාධාරණ ලෙස ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ සේවාවන්හි ගුණාත්මකභාවය සඳහා ඇතැම් පද්ධතිමය සාධක බලපා ඇත.

## E. ජනවිකාශන සාධක මත අති කරන පීඩන සහ නැගී එන අවදානම්

- **වයස්ගත ජනගහණය ඉහළ යාම**

  වසර 2030 වන විට, ජනගහනයෙන් 20% ක් වයස අවුරුදු 60 ට වඩා වැඩි අය වනු ඇත, නමුත් දැනට විධිමත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබෙන්නේ දළ වශයෙන් 30% ක් පමණි. එමෙන්ම කාන්තාවන් ආවරණය අසමානුපාතිකය.[13]

---

[9] The current social registry maintained by the Welfare Benefit Board (WBB) is limited by incomplete coverage, particularly of informal and vulnerable populations, and lacks full integration with other national data systems, which constrains its effectiveness for dynamic eligibility assessment and coordinated service delivery.

[10] The Informal Sector and Gender-Responsive Budgeting: Key to Effective Social Spending | by Maya Karunaratne | Jun, 2025 | Medium

[11] Sri Lanka: 2021 Article IV Consultation-Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka in: IMF Staff Country Reports Volume 2022 Issue 091 (2022)

[12] 3 ways to make social protection work for Sri Lanka's poor and vulnerable

[13] Sri Lanka can benefit from the pandemic experience to craft a comprehensive social protection strategy

- **ළමා මන්දපෝෂණය සහ විරැකියා අවදානම**

බහුමාන ළමා දරිද්‍රතා දර්ශක (MPI child) මගින් හඳුනාගත් පරිදි ළමුන්ගෙන් සැලකිය යුතු කොටසක් මන්දපෝෂණය සහ අනෙකුත් අහිමිවීම් අත් විඳින අතර , තරුණ විරැකියාව ඉහළ මට්ටමක පැවතීමේ අවදානම; පුළුල් සමාජ ආරක්ෂණ පියවරයන් සඳහා අවශ්‍යතාවය අවධාරණය කරයි[14].

## F. COVID-19 සහ ආර්ථික අර්බුදයේ බලපෑම

- **ඉහළ දරිද්‍රතාවය සහ ප්‍රතිචාර දැක්වීමේ අභියෝග**

2019 වසරේ දී දරිද්‍රතාවය දළ වශයෙන් 11% සිට 2022 වනවිට දළ වශයෙන් 25% දක්වා ඉහළ නැගුණි. එසේ වුවද , ආර්ථික අර්බුදය අතරතුර දිළිඳුතම අයගෙන් අඩකට වඩා සමාජ ආරක්ෂණය වෙත ප්‍රවේශය නොතිබුණි[15]

**තාවකාලික සහන සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ**

- වසංගත කාලයේ කෙටි කාලීන මුදල් සහාය ලබා දුන් නමුත්, ඇතැම් නාගරික දුප්පත් ජනගහනය හා මධ්‍යම ආදායම් ලබන නිවාස වෙත ළඟා වීමේ අඩුවක් පැවතුනි

.

## G. මූල්‍ය සීමාවන් සහ බාහිර සහාය මත යැපීම

### අවම රාජ්‍ය වියදම් සහ IMF වැඩසටහන

දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.4% ක මට්ටමක පවතින සමාජ ආරක්ෂණ වියදම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය ලැබෙන වැඩසටහන් සමඟ 0.6%–0.7% දක්වා ඉහළ නැංවීමට ඉලක්ක කරයි[16]

### විශ්‍රාම වැටුප් බර සහ අයවැය

රාජ්‍ය වැටුප් සහ විශ්‍රාම වැටුප් වර්ධනය සීමා කිරීම සඳහා වන ප්‍රතිපත්ති කැපවීම් අභිමත අරමුදල් සීමා කර ඇති අතර, සමාජ රක්ෂණ ආධාර වැඩසටහන්වල තවදුරටත් අඩු ආයෝජන අවදානමක ඇත.[17]

---

[14] https://www.caritaslk.org/news/4112/

[15] The Informal Sector and Gender-Responsive Budgeting: Key to Effective Social Spending | by Maya Karunaratne | Jun, 2025 | Medium

[16] Sri Lanka: Request for an Extended Arrangement Under the Extended Fund Facility-Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka in: IMF Staff Country Reports Volume 2023 Issue 116 (2023)

[17] https://www.elibrary.imf.org/view/journals/002/2023/116/article-A001

## • 3. උපායමාර්ගික රාමුව – NSPS (ශ්‍රී ලංකාව, 2025–2035)

***1. දැක්ම***

***"විශ්වීය, සාධාරණ සහ තිරසාර සමාජ ආරක්ෂාව තුළින් සෑම පුද්ගලයෙක්ම ගෞරවය, ඔරොත්තු දීමේ හැකියාව සහ අවස්ථා භුක්ති විඳින සමාජයක්."***

***2. මෙහෙවර***

***"සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා ආදායම් සහාය, රැකවරණය, රක්ෂණය සහ ඵලදායී ඇතුළත් කිරීම සහතික කරන ජීවන චක්‍රය පදනම් කරගත් ඒකාබද්ධ, සමාජ ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම."***

## උපාය මාර්ගික අරමුණු

### 1 වන කුළුණ : සමාජ සහනාධාර

**උපායමාර්ගික අරමුණ 1.1**: සමාජ සහනාධාර වැඩසටහන් වල ඉලක්ක කිරීම, සම්බන්ධීකරණය සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා විනිවිද භාවයෙන් යුතු සහ ඩිජිටල්ගත ඒකාබද්ධවූ ප්‍රතිලාභී තොරතුරු ගොනුවක් ස්ථාපිත කිරීම.

**උපායමාර්ගික අරමුණ 1.2**: දිළිඳුතම කුටුම්භ යැපීම් මට්ටමේ සිට ස්වයංපෝෂිතභාවය දක්වා සංක්‍රමණය වීමට සහාය වන ව්‍යුහගත, කාලානුරූපී බලගැන්වීමේ මාර්ග සංවර්ධනය කිරීම.

**උපායමාර්ගික අරමුණ 1.3**: ජීවිතයේ සෑම අදියරකදීම වයසට සහ අවදානමට සුදුසු සහයෝගය සහතික කරන ජීවන චක්‍රය මත පදනම් වූ සමාජ ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

**උපායමාර්ගික අරමුණ 1.4:** ආර්ථික, දේශගුණික සහ අනෙකුත් පද්ධතිමය කම්පන සිදුවන අවස්ථා අතරතුර සීඝ්‍රව පරිමාණය ඉහළ දැමිය හැකි ප්‍රතිචාරාත්මක ආරක්ෂිත ජාල පද්ධතියක් ගොඩනැගීම.

**උපායමාර්ගික අරමුණ 1.5:** වැඩසටහන්වල කාර්යක්ෂමතාව, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ දිගු කාලීන යැපීම වැළැක්වීම වැඩි දියුණු කිරීම සඳහා සිද්ධි කළමනාකරණය සහ බැහැරවීමේ උපාය මාර්ග ආයතනගත කිරීම

### 2 වන කුළුණ: සමාජ රැකවරණය

**උපායමාර්ගික අරමුණ 2.1**: වැඩිහිටි, ළමා සහ ආබාධිත පුද්ගලයන් වෙත ලබාදෙන සත්කාර සේවා වෙනුවෙන් නිර්වචනය කරන ලද ප්‍රතිපත්ති, ප්‍රමිතීන් සහ නියාමන රාමු සහිතව ජාතික සත්කාර පද්ධතියක් ස්ථාපිත කිරීම.

**උපායමාර්ගික අරමුණ 2.2**: ජාතික වශයෙන් පිළිගත් පුහුණු, සහතික කිරීම් සහ වෘත්තීය සංවර්ධන මාර්ග හරහා රැකවරණ සේවා සැපයීම ලබාදීම වෘත්තීයකරණය කිරීම.

**උපායමාර්ගික අරමුණ 2.3: මූලය,** මනෝවිද්‍යාත්මක සහ ආයතනික සහාය ලබාදීම තුලින් අවිධිමත් අංශයේ රැකවරණ සේවා සපයන්නන් ගේ භූමිකාව ශක්තිමත් කිරීම.

**උපායමාර්ගික අරමුණ 2.4:** ලඟා වීමට අපහසු ස්ථාන හෝ පුද්ගලයන් ආවරණය වන පරිදි පළාත් පාලන නිලධාරීන් සහ ස්වේච්ඡා සේවකයින් යොදා ගනිමින් ප්‍රජා පාදක සත්කාර සේවා ජාල පුළුල් කිරීම.

**උපායමාර්ගික අරමුණ 2.5:** රටෙහි සෑම පෙදෙසකම ආවරණය වන පරිදි දැරිය හැකි සහ ගුණාත්මක සත්කාර සේවා පුළුල් කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිගැන්වීම

## 3 වන කුළුණ: සමාජ රක්ෂණය

**උපායමාර්ගික අරමුණ 3.1:**අවිධිමත් අංශයේ සේවකයින් උදෙසා , ප්‍රවේශවීමේ හැකියාව සහිත , දැරිය හැකි සහ තාක්ෂණයෙන් බලගැන්වුණු, සක්‍රීය දායකත්ව යෝජනා ක්‍රම හරහා සමාජ රක්ෂණ ආවරණය ව්‍යාප්ත කිරීම.

**උපායමාර්ගික අරමුණ 3.2:** කාර්යක්ෂමතාවයෙන් යුතුව, වැඩි දියුණු කළ සේවාවන් පහසුවෙන් ලබාදිය හැකි පරිදි, දැනට පවතින ඛණ්ඩනය වූ යෝජනා ක්‍රම ඒකාබද්ධ කර එක් සමාජ රක්ෂණ පද්ධතිවක් ස්ථාපනය කිරීම.

**උපායමාර්ගික අරමුණ 3.3**: මාතෘත්වය, ආබාධිතභාවය සහ සෞඛ්‍යය වැනි ප්‍රධාන රක්ෂණ සේවාවන් සඳහා සහනාධාර ලබා දීමෙන්, අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා විශ්වීය අවදානම් ආරක්ෂාව සහතික කිරීම**.**

**උපායමාර්ගික අරමුණ 3.4:** ලියාපදිංචිය, දායකත්වය සහ හිමිකම් ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම තුළින් සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, වංචා අඩු කිරීම සහ සේවා සැපයීම අනුකූලනය කිරීම

**උපායමාර්ගික අරමුණ 3.5:** කෙටි කාලීන කාර්යයන් හි යෙදෙන පුද්ගලයින් ( gig workers), නිදහස් සේවකයින් (freelancers ) සහ මාර්ගගත පද්ධති මත පදනම් වූ ශ්‍රමිකයන්( platform-based labor) වැනි වර්තමානයේ නැඟී එන සේවක කණ්ඩායම්වල අවශ්‍යතා සපුරාලීම සඳහා සමාජ රක්ෂණ යාන්ත්‍රණ අනුවර්තනය වීම**.**

## 4 වන කුළුණ: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී අන්තර්කරණය

**උපායමාර්ගික අරමුණ 4.1**: ආර්ථික අන්තර්කරණය සහ ගෞරවණීය බව ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ සහනාධාර ප්‍රතිලාභීන් රැකියා සහ කුසලතා සංවර්ධන වැඩසටහන්වලට අනුකලනය කිරීම

**උපායමාර්ගික අරමුණ 4.2:** ප්‍රජාව පාදක පොදු කාර්යයන් සහ හරිත රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් සංක්‍රාන්ති රැකියා සැපයීම

**උපායමාර්ගික අරමුණ 4.3:** තරුණයින්, කාන්තාවන් සහ විගමනිකයන් ඇතුළුව අවාසි සහගත තත්ත්වයන්ට මුහුණ දෙන කණ්ඩායම් අතර ව්‍යවසායකත්වය සහ ක්ෂුද්‍ර ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ යටිතල පහසුකම් සහ දේශගුණික අවශ්‍යතා සපුරාලීම

**උපායමාර්ගික අරමුණ 4.4**: වෙළඳපොළ සම්බන්ධව ප්‍රතිචාර දක්වන තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) සහ ඉලක්කගත කුසලතා වැඩි දියුණුව තුළින් රැකියාගත වීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

**උපායමාර්ගික අරමුණ 4.** 5 නැවත පැමිණෙන විදේශගත සංක්‍රමණිකයන් විස්තීර්ණ ආධාරක පද්ධති මඟින් විගමනිකයන් ආරක්ෂිත සහ තිරසාර ලෙස නැවත ඒකාබද්ධ කිරීම සහතික කිරීම.

## 5.විවිධ අංශ හා සම්බන්ධිත උපායමාර්ගික අරමුණු

• අරමුණ 5.1: ඉලක්ක කිරීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය , සක්‍රීය කිරීම සඳහා සියලු කුළුණු හරහා ප්‍රතිලාභී දත්ත ඒකරාශී කරන **ජාතික සමෝධානිත සමාජ සුභසාධන ලියාපදිංචි රෙජිස්තරයක්** ස්ථාපිත කිරීම.

• අරමුණ 5.2: ඩිජිටල්ගත කරන ලද ගෙවීම් පද්ධති හරහා ආරක්ෂිතව , අන්තර්කරණය වූ සහ කාර්යක්ෂම, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම.

• අරමුණ 5.3: සියලුම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්ට ප්‍රවේශ විය හැකි දුක්ගැනවිලි සඳහා සහනය ලබා දීමේ ක්‍රමවේදයන් හරහා වගවීම ශක්තිමත් කිරීම.

අරමුණ 5.4 සියලුම ප්‍රතිපත්ති, වැඩසටහන් සහ සේවා යාන්ත්‍රණයන් තුළ ස්ත්‍රී පුරුෂ පරිවර්තන ප්‍රවේශය සහ අන්තර්කරණය පිළිබඳව අවධානය තිබිය යුතු වේ

• අරමුණ 5.5: ඒකාබද්ධ සේවා සැපයීම සහ ගෘහ ඒකක මට්ටමේ දි අවශ්‍ය වන සහාය ලබාදීම පිණිස වෘත්තීයමය සමාජ සේවකයින් සහ සිද්ධි කළමනාකරුවන් ගෙන් යුතු කාර්යය මණ්ඩලයක් නිර්මාණය කිරිම

## 4: ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ගය (NSPS) මෙහෙයුම් මූලධර්ම

සියලු ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඇතුළත්, ප්‍රතිචාරාත්මක, අයිතිවාසිකම් මත පදනම් වූ සහ තිරසාර බව සහතික කරන ලද සම්බන්ධිත මූලධර්ම සමූහයක් මත ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය (NSPS) ස්ථාපිතව ඇත. . මෙම මූලධර්ම , සමාජ සහනාධාර, සමාජ රැකවරණය, සමාජ රක්ෂණය සහ ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී අන්තර්කරණය යන කුළුණු හතර හරහා සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හැඩගස්වයි. සියල්ලන් සඳහා ගෞරවය, සමානාත්මතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ජාතික දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

### 1. අයිතිවාසිකම් මත පදනම් වීම සහ ජීවන චක්‍ර ප්‍රවේශය

සමාජ රැකවරණය සියලු පුද්ගලයින් සඳහා අයිතියක් වන අතර සමාජ-ආර්ථික පසුබිම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ හැකියාව නොසලකා උපතේ සිට මහලු විය දක්වා ඔවුන්ගේ ජීවිත කාලය පුරාම හිමි විය යුතුය.

• සියලුම වැඩසටහන් මානව හිමිකම් මූලධර්ම සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ අනුකූල වනු ඇත.

• ළමා කාලය, රැකියා කරන වයස, දෙමාපියභාවය, මහලු විය සහ ආබාධිතව හෝ අසනීපව සිටින විටදී

සිදු කෙරෙන මැදිහත්වීම් ජීවන චක්‍රය පුරා ඇති විය හැකි අවදානම් ඉලක්ක කරනු ඇත:

### 2. ප්‍රගතිශීලී ඉලක්කගත කිරීම සමඟ විශ්වීයත්වය

ශ්‍රී ලංකාව ප්‍රගතිශීලී ඉලක්කගත යාන්ත්‍රණයන් හරහා වඩාත් අවදානමට ලක්විය හැකි අය කෙරෙහි ප්‍රමුඛතාවය දෙමින්, ප්‍රධාන සමාජ ආරක්ෂණ සහතිකවල විශ්වීය ආවරණය අනුගමනය කරනු ඇත.

• විශ්වීය හිමිකම් (උදා: මහලු විය සඳහා වන ආදායම් සහාය, ළමුන්ට හිමිවන ප්‍රතිලාභ) කාලයත් සමඟ පුළුල් කරනු ඇත.

• ඉලක්කගත ආධාර දුප්පතුන්, අවිධිමත් සේවකයින්, ආබාධ සහිත පුද්ගලයින් සහ සමාජයීය වශයෙන් බැහැර කරන ලද කණ්ඩායම් කෙරෙහි  යොමු කරනු ඇත.

**3. අන්තර්කරණය  සහ සාධාරණත්වය**

සියලුම වැඩසටහන් මගින් සාධාරණ ප්‍රවේශය සහ ප්‍රතිඵල සහතික කරනු ඇති අතර, විශේෂ අවධානයක් යොමු කරනු ලබන්නේ :

• ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය - ප්‍රතිලාභ සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය , ආර්ථික අන්තර්කරණය  සහ වැටුපක් නොලබා සිදු කරන සේවා සත්කාර පිළිගැනීම සහතික කිරීම.

• ආබාධිත පුද්ගලයන් අන්තර්කරණය - ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ විය හැකි සේවාවන් සහ ආදායම් සහාය ලබා දීම.

• කලාපීය සාධාරණත්වය  - නාගරික, ග්‍රාමීය සහ වතු අංශ සහ ඌන සේවා දිස්ත්‍රික්ක හරහා  වන විෂමතා ආමන්ත්‍රණය කිරීම

**4. කම්පන සඳහා ප්‍රතිචාරාත්මක වීම  සහ දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීම**

ආර්ථික කම්පන, ස්වාභාවික විපත්, සෞඛ්‍ය වසංගත සහ දේශගුණික ආශ්‍රිත අවදානම් වලට  නම්‍යශීලීව ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සඳහා  සමාජ ආරක්ෂණ පද්ධතිය  නිර්මාණය කෙරේ..

• සේවාවන්  තාවකාලිකව ඉහළ නැංවීමට අවශ්‍ය ඉඩ හදිසි අවස්ථා සඳහා වන යාන්ත්‍රණයන් මඟින් සැලසේ.

• පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ ආපදා අවදානම් මූල්‍යකරණය පරිමාණය කළ හැකි සමාජ ආරක්ෂණ මැදිහත්වීම් සමඟ සම්බන්ධ කෙරේ.

**5. මූල්‍ය හා ආයතනික තිරසාරභාවය**

ජාතික මූල්‍ය ප්‍රතිපත්ති පද්ධතිය (NSPS) මූල්‍ය විනය පවත්වා ගනිමින් හිමිකම් සහ ප්‍රතිලාභ ක්‍රමයෙන් පුළුල් කරනු ඇත.

• ප්‍රතිසංස්කරණ (උදා: විශ්‍රාම වැටුප් සහ සමාජ රක්ෂණ) දිගුකාලීන ගෙවීම් හැකියාව සහතික කරනු ඇත.

•විශේෂිත මූල්‍යකරණ යාන්ත්‍රණ සහ  ඩිජිටල් සේවාවන් හරහා වන කාර්යක්ෂමතා ප්‍රතිලාභය පිරිවැය සීමා කිරීමට උපකාරී වනු ඇත.

**6. ඩිජිටල්කරණය, අන්තර් ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාව**

තාක්ෂණය, විනිවිදභාවය, වගවීම සහ පිරිවැය-ඵලදායීතාවය කරා ගමන් කරවනු  ඇත.

• තනි නමුත් ඒකාබද්ධ සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතියක් සියලුම අමාත්‍යාංශ සහ රජයේ විවිධ තලයන් සඳහා සේවය ලබා දෙනු ඇත.

• ප්‍රතිලාභී ලේඛන, ගෙවීම් පද්ධති සහ අධීක්ෂණ මෙවලම් අන්තර් ක්‍රියාකාරී වන අතර  මධ්‍යගතව ප්‍රවේශ විය හැකි වනු ඇත.

**7. සම්බන්ධීකරණය සහ සමස්ත රජයේ ප්‍රවේශය**

ඛණ්ඩනීකරණය, ද්විකරණය  සහ අකාර්යක්ෂමතාවන් වළක්වා ගැනීම සඳහා සම්බන්ධීකරණයවූ  පාලන රාමුවක් අත්‍යවශ්‍ය වේ.

• ඉහළ මට්ටමේ සමාජ ආරක්ෂණ මෙහෙයුම් කමිටුවක් මගින් ක්‍රියාත්මක කිරීම මෙහෙයවනු ඇත.

• රේඛීය අමාත්‍යාංශ මගින් සෞඛ්‍ය, අධ්‍යාපනය, කම්කරු, සමාජ සුභසාධන සහ පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කරනු ඇත.

## 8. විමධ්‍යගතකරණය සහ ප්‍රජා සහභාගීත්වය

පළාත් පාලන ආයතන, ප්‍රජා පාදක සංවිධාන සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් ප්‍රජා සම්බන්ධතා, සේවා සැපයීම සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන්හි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත.

• ධාරිතා සංවර්ධනය  මඟින් විමධ්‍යගත සැලසුම්කරණය සහ සේවා සැපයීම සඳහා පිටිවහලක් සපයනු ඇත.

• විශේෂයෙන් ආන්තික කණ්ඩායම් වල , වැඩසටහන් සැලසුම් කිරීමේදී සහ දුක්ගැනවිලි සඳහා පිළියම් යෙදීමේ දී  ප්‍රජාවගේ අදහස් සැලකිල්ලට ගනු ලැබේ.

## 9. සාක්ෂි මත පදනම් වූ සහ අනුවර්තිය ක්‍රියාත්මක කිරීම්

දත්ත නිරීක්ෂණය කර ,සාක්ෂි මත පදනම්ව පරිමාණය කර ,ගැලපුම් කරමින් සහ  ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් වැඩසටහන් සැලසුම් කරනු ලැබේ.

- සියලුම ප්‍රධාන මැදිහත්වීම් නියමු පරීක්ෂණ තුලින් , ක්‍රියාවලින්  ඇගයීමට ලක්කිරීම තුලින්  සහ සිදුවන බලපෑම් තක්සේරු කිරීම් වලට භාජනය වීම් තුලින් සිදුවනු ඇත.
- ජාතික නියාමන හා ඇගයීමේ  රාමුවක්  තුලින් මුලික කාර්යසාධන දර්ශක  වලට අනුව ප්‍රගතිය නිරීක්ෂණය කරනු ලබන අතර  නිවැරදි කිරීම් මෙහෙයවනු ඇත.

## 10. මහජන වගවීම සහ විනිවිදභාවය

ශක්තිමත් අධීක්ෂණය සහ දුක්ගැනවිලි යොමු කිරිමට නිර්මාණය කල පද්ධති සමඟින් සමාජ ආරක්ෂණය විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කෙරේ.

• සියලුම ප්‍රතිලාභී දත්ත, සුදුසුකම් ලැබීම  සඳහා වන නිර්ණායක  සහ ගෙවීම් තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගත හැකිය.

• දුක්ගැනවිලි විසඳීමේ පද්ධති වෙත ජංගම උපාංග මගින් , මාර්ගගතව  සහ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු බහු නාලිකා හරහා ප්‍රවේශ විය හැකිය.

## 5. ප්‍රධාන උපායමාර්ගික මැදිහත්වීම් -කුළුණු අනුව

### 1 වන කුළුණ : සමාජ සහනාධාර

### 1.1 සමෝධානිත සමාජ සුභසාධන ලියාපදිංචි රෙජිස්තරයක් (UBR) ස්ථාපිත කිරීම

*මධ්‍යගත, අන්තර් ක්‍රියාකාරී තොරතුරු පද්ධතියක් මඟින් විනිවිදභාවය වැඩි දියුණු කිරීම, ද්විකරණය වැලැක්වීම සහ සියලුම සමාජ ආරක්ෂණ වැඩසටහන් හරහා ඵලදායී ඉලක්ක කිරීම සක්‍රීය කරනු ඇත*

**ක්‍රියාකාරී යාන්ත්‍රණය:**

**1.1.1. සියලුම ප්‍රධාන සමාජ ආධාර යෝජනා ක්‍රම (අස්වැසුම, වැඩිහිටි දීමනාව, ආබාධිතභාවය ආදිය) හරහා ජාතික හැඳුනුම්පත හා සම්බන්ධිත ගෘහ ඒකක මට්ටමේ තොරතුරු ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් භාවිතා කරමින් මධ්‍යගත ඩිජිටල් ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනයක් (UBR) සංවර්ධනය කිරීම:**

මෙම උපායමාර්ගය තුළින් අදහස් කරන්නේ සියලුම ප්‍රධාන සමාජ ආධාර වැඩසටහන් වලින් ගන්නා ප්‍රතිලාභී තොරතුරු තනි, ඒකාබද්ධ පද්ධතියකට එක් රැස් කර පුළුල්, අන්තර් ක්‍රියාකාරී සහ නිවැරදි ඩිජිටල් දත්ත පදනමක් නිර්මාණය කිරීමයි. මෙමගින් ඉලක්කගත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, ද්විකරණය අඩු කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ සේවා සැපයීම විධිමත් කිරීම අරමුණු කෙරේ.

**• මධ්‍යගත දත්ත පද්ධතිය නිර්මාණය කිරීම:**

UBR මධ්‍යගත වූ ඩිජිටල් පද්ධතිවක් ලෙස සංවර්ධනය කෙරෙන අතර, එයට විවිධ සමාජ ආධාර යෝජනා ක්‍රමවලින් ප්‍රතිලාභී දත්ත රැස් කිරීම, ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා බලයලත් රජයේ ආයතනවලට ප්‍රවේශ විය හැකිය. මෙම ඒකාබද්ධ දත්ත පද්ධතිය සමාජ ආරක්ෂණ දත්ත සඳහා එකම ප්‍රධාන මූලාශ්‍රය බව සහතික කරයි.

**• මූලික හඳුනාගැනීම සඳහා ජාතික හැඳුනුම්පත (NIC) භාවිතය:**

සෑම ප්‍රතිලාභියෙකුම ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් අනන්‍ය ලෙස හඳුනා ගනු ලැබේ. NIC විශ්වාසදායක සහ නිල හඳුනාගැනීමක් ලෙස ක්‍රියා කරන අතර පුද්ගල නම් සහ ජනවිකාශ නොගැලපීම් නිසා ඇතිවන දෝෂ අඩු කරමින්, විවිධ වැඩසටහන් හරහා පුද්ගලයින් සහ ඔවුන්ගේ ගෘහස්ථ සාමාජිකයින් නිවැරදිව සම්බන්ධ කිරීම සඳහා ඉවහල් වේ.

**• ගෘහ ඒකක මට්ටමේ දත්ත ඒකාබද්ධ කිරීම:**

මට්ටම්වල බිම් මට්ටමේ දී දත්ත රැස් කර විශේෂයෙන් ග්‍රාම නිලධාරී (ග්‍රාම නිලධාරී) සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නඩත්තු කරනු ලැබේ. මෙම ප්‍රදේශය පදනම් කරගත් ප්‍රවේශය ගෘහස්ථ සංයුතිය,සමාජ-ආර්ථික තත්ත්වය සහ සුදුසුකම් නිර්ණායක වැනි සවිස්තරාත්මක සහ සන්දර්භ-විශේෂිත දත්ත ග්‍රහණය කිරීම සහතික කරයි..

**• බහු-යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම:**

තොරතුරු ගොනුවට පහත සඳහන් දෑ ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවෙමින් සියලුම ප්‍රධාන සමාජ සහනාධාර වැඩසටහන්වල ප්‍රතිලාභී තොරතුරු ඇතුළත් කරනු ඇත:

- **අස්වැසුම මූලාධාර වැඩසටහන**
- **වැඩිහිටි දීමනාව**
- **ආබාධිත ප්‍රතිලාභ**
- **සමාජ සේවා දෙපාර්තමේන්තුව** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ මහජන සෞඛ්‍ය අංශය වැනි ආයතන විසින් පරිපාලනය කරනු ලබන අනෙකුත් අදාළ සුභසාධන යෝජනා ක්‍රම.

මෙම සියලු දත්ත පද්ධතින් එක් කිරීම තුලින් UBR මඟින් සෑම ගෘහ ඒකකයකම හිමිකම් සහ සහභාගීත්වය පිළිබඳව සමස්ත දැක්මක් ලබා ගත හැකිය.

**• ද්වීකරණය සහ වංචාවන් වැළැක්වීම:**

තොරතුරු ගොනුව තුළ ඇති ඒකාබද්ධ කිරීම සහ ජාතික හැඳුනුම්පත සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයන් මඟින් යෝජනා ක්‍රම හරහා ද්විත්ව ලියාපදිංචි කිරීම් අවම කරනු ඇති අතර එමඟින් ද්විත්ව ප්‍රතිලාභ ලබාගැනීම් වැළැක්වීම අඩු කරයි. එය වංචනික ක්‍රියා හඳුනා ගැනීමට උපකාරී වන අතර සම්පත් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් වෙත පමණක් යොමු කර ඇති බව සහතික කරයි.

**• තත්‍ය කාලීන සුදුසුකම් සත්‍යාපනය සහ යාවත්කාලීන කිරීම්:**

ලියාපදිංචි වීමේදී සහ දත්ත යාවත්කාලින කිරීමේදි පද්ධතිය ස්වයංක්‍රීයව සහ ඉක්මනින් ප්‍රතිලාභී සුදුසුකම් සත්‍යාපනය කිරීමට ඉඩ සලසන අතර විවිධ වැඩසටහන් අතර කෙරෙන පරීක්ෂාවකින් සහ යාවත්කාලින කරන ලද සමාජ ආර්ථික දර්ශකයන්ට අනුව සිදු කෙරේ.

**• වැඩිදියුණු කළ ඉලක්කගත කිරීම සහ ආවරණ ප්‍රශස්තකරණය:**

ගෘහ ඒකකයේ මුලිකම දත්ත වෙත ඇති ප්‍රවේශය සමඟ, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සහාය ලබාදීම හොඳින් ඉලක්ක කර ගැනීමට, ආවරණ හිඩැස් නිරීක්ෂණය කිරීමට සහ මතුව එන අවශ්‍යතා හෝ ජනවිකාස වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් වැඩසටහන් අනුවර්තනය කිරීමට හැකිය.

**• දත්ත රහස්‍යතාවය සහ ආරක්ෂාව:**

පුද්ගලික සහ ගෘහස්ථ දත්තවල සංවේදීතාව සැලකිල්ලට ගෙන, ප්‍රතිලාභී තොරතුරු ආරක්ෂා කිරීම සඳහා UBR විසින් සංකේතනය, ප්‍රවේශ පාලනයන් සහ ජාතික දත්ත රහස්‍යතා නීතිවලට අනුකූල වීම ඇතුළු ශක්තිමත් දත්ත ආරක්ෂණ ප්‍රමිතීන් ඇතුළත් කරනු ඇත.

- **අන්තර් ක්‍රියාකාරීත්වය සහ පද්ධති ඒකාබද්ධ කිරීම:**

ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය පහත සඳහන් අනෙකුත් අදාළ දත්ත සමුදායන් සමඟ සම්බන්ධ කිරීම සඳහා අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රොටෝකෝල සමඟ නිර්මාණය කෙරේ:

- **සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ සුභසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය (WBIS)**
- **සමාජ සේවා දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය දත්ත පදනම**

- **අධ්‍යාපන අමාත්‍යාංශයේ ළමා ආබාධිත ළමුන් පිළිබඳ වාර්තා**
- **වැවිලි මානව සංවර්ධන භාරය සහ අනෙකුත් අදාළ පරිපාලනමය් මුලාශ්‍ර සතු (PHDT) වතු අංශයේ දත්ත**

මෙම ඒකාබද්ධ කිරීම පුළුල් සිද්ධි කළමනාකරණයට සහ වැඩසටහන් සම්බන්ධීකරණයට සහාය වේ.

- **ධාරිතා සංවර්ධනය සහ නඩත්තුව:**

ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් (උදා: ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්) දත්ත නිවැරදිව රැස් කිරීම, යාවත්කාලීන කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පුහුණු කරනු ලැබේ. පද්ධති අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා නිතිපතා විගණනය සහ දත්ත තත්ත්වයන් තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

---

**1.1.2. WBB , WBIS, DSS දත්ත සමුදායන්, MoE හි ආබාධිත ළමයින් පිළිබඳව පවත්නා දත්ත සහ PHDT සතුව ඇති වතු දත්ත ඒකාබද්ධ කිරීමට ඉඩ සලසන අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රොටෝකෝල නිර්මාණය කිරීම**:

අන්තර් ක්‍රියාකරීත්ව ප්‍රොටෝකෝල යනු විවිධ තොරතුරු පද්ධතිවලට දත්ත බාධාවකින් තොරව සන්නිවේදනය කිරීමට සහ හුවමාරු කර ගැනීමට හැකි වන තාක්ෂණික ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි වේ. මෙම සන්දර්භය තුළ, **සමාජ සුභසාධන ලියාපදිංචි රෙජිස්තරයට** විවිධ ආයතනවල පවතින දත්ත සමුදායන් සමඟ සම්බන්ධ වීමට සහ සමමුහුර්ත කිරීමට ඉඩ සලසන පරිදි ප්‍රොටෝකෝල නිර්මාණය කෙරේ:

- **සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ (WBB) WBIS:** මූල්‍යාධාර ලබන ප්‍රතිලාභීන් නිරීක්ෂණය කරන සුභසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය.
- **සමාජ සේවා දෙපාර්තමේන්තුවේ (DSS) දත්ත පදනම**: වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් වැනි සමාජ සුභසාධන ලබන්නන් පිළිබඳ දත්ත පද්ධතිය.
- **අධ්‍යාපන අමාත්‍යාංශයේ (MoE) ආබාධිත ළමුන් පිළිබඳ වාර්තා**: අධ්‍යාපන පද්ධතියේ සිටින ආබාධ සහිත දරුවන් පිළිබඳ දත්ත.
- **වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) වතු දත්ත:** වතු අංශයේ ප්‍රතිලාභීන්ට විශේෂිත තොරතුරු.

මෙම ප්‍රොටෝකෝල මඟින් මෙම විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන දත්ත හානියකින් හෝ ද්විකරණයකින් තොරව ඒකාබද්ධ කළ හැකි බව සහතික කරනු ඇත, දත්ත නිරවද්‍යතාවය සහ අනුකූලතාව පවත්වා ගනී. මෙය වැඩසටහන් හරහා ප්‍රතිලාභී තොරතුරු තත්‍ය කාලීනව යාවත්කාලීන කිරීම, සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම, පරිපාලන පිරිවැය අඩු කිරීම සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වෙත සේවා සැපයීම වැඩිදියුණු කිරීම යනාදිය සක්‍රීය කරනු ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- **WBB**: UBR පද්ධතියේ සංවර්ධනය සහ තාක්ෂණික කළමනාකරණය මෙහෙයවීම.
- **DSS**: පවතින වැඩසටහන් ඒකාබද්ධ කිරීම(වැඩිහිටියන්, ආබාධිතභාවය) සම්බන්ධීකරණය කිරීම.

• **රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**: NIC දත්ත ඒකාබද්ධ කිරීම සහ වලංගුකරණය සැපයීම.

• **පළාත් සභා**: ග්‍රාම නිලධාරි මට්ටමේ ඉලක්ක සැකසීමේ දී මුදල් කොමිෂන් සභා මාර්ගෝපදේශ සමඟ පෙළගැස්වීම සහතික කිරීම.

• **ICTA**: මෘදුකාංග සහ ඩිජිටල් අතුරු මුහුණත් සංවර්ධනයට සහාය වීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• UBR වෙනුවෙන් වෙන්වූ ක්‍රියාකාරී කණ්ඩායමක් සහිත ජාතික සමාජ ආරක්ෂණ මෙහෙයුම් කමිටුව.

• අන්තර්-ආයතන දත්ත සමමුහුර්ත කිරීමේ මාසික රැස්වීම්.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• ලේඛනයේ සම්පූර්ණත්වය සහ දෝෂ අනුපාත පිළිබඳ වාර්ෂික විගණනය.

• ද්විකරණ අනුපාත, ආවරණ ප්‍රසාරණය සහ දත්ත ඒකාබද්ධ කිරීමේ ප්‍රගතිය පිළිබඳ මාසික වාර්තාකරණය

---

**1.2 බලගැන්වීමේ මාර්ග සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම**

*අවදානමට ලක්විය හැකි කුටුම්භයන් කුසලතා, වත්කම් සහ වෙළඳපල සම්බන්ධතා හරහා,සමාජ ආධාර වලින් නික්මී ජීවනෝපායන් කරා සංක්‍රමණය වීමට උපකාර කිරීම සඳහා ව්‍යුහගත බලගැන්වීමේ ආකෘති අත්‍යවශ්‍ය වේ.*

***මෙහෙයුම් යාන්ත්‍රණය:***

1.2.1. මුදල්, වත්කම් ලබාදීම (පශු සම්පත්, මෙවලම්), කුසලතා පුහුණුව, මග පෙන්වීම සහ වෙළඳපල සම්බන්ධතා සහාය ඒකාබද්ධ කරන කාලානුරූපී පැකේජ සහිත "දරිද්‍රතාවය තුරන්කිරීමට බලගැන්වීමේ වැඩසටහන" දියත් කිරීම:
"දරිද්‍රතාවය තුරන්කිරීමට බලගැන්වෙන වැඩසටහන" යනු අතිශය දුප්පත් කුටුම්භයන් දරිද්‍රතාවයෙන් මිදීමට සහ තිරසාර ජීවනෝපායන් අත්කර ගැනීමට උපකාර කිරීම අරමුණු කරගත් ව්‍යුහගත, බහු-සංරචක මැදිහත්වීමකි. නිශ්චිත කාල සීමාවක් තුළ අවධානය යොමු කළ සහාය සහ මැනිය හැකි ප්‍රගතිය සහතික කිරීම සඳහා මෙම වැඩසටහන පැහැදිලි කාලරාමු (කාලසීමා) සමඟ නිර්මාණය කර ඇත.

• **මූලයාධාර:** *ක්ෂණික පරිභෝජන අවශ්‍යතා සපුරාලීමට සහ ගෘහයේ මූල්‍ය තත්වය ස්ථාවර කිරීමට ප්‍රතිලාභීන්ට නිතිපතා, කොන්දේසි සහිත හෝ කොන්දේසි විරහිත මුදල් ගෙවීම් ලබා දීම.*

• **වත්කම් ආධාර**: ප්‍රතිලාභීන්ට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට හෝ පුළුල් කිරීමට හැකි වන පරිදි පශු සම්පත් (උදා: එළුවන්, කුකුළන්) හෝ මෙවලම් (උදා: ගොවි උපකරණ, කුඩා ව්‍යාපාර කට්ටල) වැනි ඵලදායී වත්කම් බෙදා හැරීම.

• **කුසලතා පුහුණුව**: ප්‍රතිලාභීන්ගේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමට සහ තිරසාර ආදායමක් උත්පාදනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීමට ගැලපෙන වෘත්තීය සහ ව්‍යවසායක පුහුණුවක් ලබා දීම.

**• මග පෙන්වීම**: ප්‍රතිලාභීන් වෙත ලබාදෙන  සම්පත් සහ පුහුණු ඵලදායී ලෙස භාවිතා කිරීමට දිරිමත් කිරීම සඳහා වැඩසටහන පුරා අඛණ්ඩ මග පෙන්වීම, අභිප්‍රේරණය සහ ගැටළු විසඳීමේ සහාය ලබා දෙන උපදේශකයින් හෝ සිද්ධි සේවකයින් පත් කිරීම

**• වෙළඳපල සම්බන්ධතා සහාය**: ප්‍රතිලාභීන් සහ දේශීය වෙළඳපොළ, සැපයුම්කරුවන් හෝ ගැනුම්කරුවන් අතර සම්බන්ධතා පහසු කිරීම, එමඟින් ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල ශක්‍යතාව සහ ලාභදායීතාවය වැඩි කෙරෙනු ඇත.

මෙම සංරචක එක්ව ගත් කළ, ප්‍රතිලාභීන් පරිපූර්ණ ලෙස බලගන්වන, ක්ෂණිකව පැන නැගෙන අවශ්‍යතා සපුරාලන සහ දිගුකාලීන ස්වයං විශ්වාසයක් ගොඩනඟන ඒකාබද්ධ පැකේජයක් සාදයි.

---

**1.2.2. ප්‍රතිලාභීන් ඉලක්ක කර ගැනීම සඳහා ගෘහ ඒකක දරිද්‍රතා පැතිකඩ  භාවිතා කෙරෙන (බහුමාන දරිද්‍රතා ලකුණු කාඩ්පත්):**

වැඩසටහන වඩාත් අවදානමට ලක්විය හැකි සහ සුදුසු නිවාස වෙත ළඟා වන බව සහතික කිරීම සඳහා මෙය භාවිතා කෙරේ , ඉලක්ක කිරීම පදනම් වන්නේ ආදායමට පමණක් නොව පුළුල් දරිද්‍රතා පැතිකඩ මත ය. මෙම පැතිකඩ මැන බැලීමට **බහුමාන දරිද්‍රතා ලකුණු කාඩ්පත්** භාවිතා කරන අතර, එමඟින් දරිද්‍රතාවයේ විවිධ මානයන් හරහා දර්ශක පරාසයක් තක්සේරු කරයි, එනම්

• සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය
• අධ්‍යාපන මට්ටම
• ජීවන තත්වයන් (නිවාස, සනීපාරක්ෂාව, පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය)
• සේවා නියුක්තිය  සහ ආදායම් ස්ථාවරත්වය
• කම්පන වලට ගොදුරු වීමේ සහ සමාජයෙන්  බැහැර වීම්  වලට අවදානම

මෙම ලකුණු කාඩ්පත් හරහා ගෘහස්ථ මට්ටමින් රැස් කරන ලද දත්ත (බොහෝ විට ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් මට්ටමේ නිලධාරීන් විසින්)  බහුවිධ,සහ  එකමත සම්පාත වන දුෂ්කරතාවන්ට  වලට මුහුණ දෙන පවුල් හඳුනා ගැනීමට වැඩසටහනට ඉඩ සලසයි. මෙම නිරවද්‍ය ඉලක්ක කිරීම සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන අතර බලගැන්වීම ආධාරයෙන් වඩාත්ම ප්‍රතිලාභ ලබන කුටුම්භවලට ප්‍රමුඛත්වය දීමෙන්  වැඩසටහනෙහි බලපෑම උපරිම කරයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

**• WBB:** මූල්‍යාධාර ලබා දීම සහ බැහැරවීමේ සුදුසුකම් නිරීක්ෂණය කිරීම.

**• DSS** සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු: ප්‍රගතිය නිරීක්ෂණය කරමින්  සිද්ධි කළමනාකරුවන් ලෙස සේවය කරනු ඇත.

• වෘත්තීය පුහුණු අධිකාරිය සහ NAITA: කුසලතා පුහුණුව ලබා දීම සිදු කරනු ඇත.

**• දේශීය බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන** පශ්චාත් බලගැන්වීමේ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ව්‍යාපාර ණය සක්‍රීය කරනු ඇත.

**සම්බන්ධීකරණ මෙවලම්**:

• අමාත්‍යංශ අතර කුටුම්භ දත්ත හුවමාරුවීම.

• ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය සමඟ සම්බන්ධිත ඩිජිටල්ගත බලගැන්වීමේ ට්‍රැකර්.(Digital Graduation Tracker )

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

- ද්විවාර්ෂික ගෘහස්ථ තක්සේරු කිරීම්.
- දිස්ත්‍රික්කය සහ වැඩසටහන අනුව බලගැන්වීමේ අනුපාත නිරීක්ෂණය කිරීම.

### 1.3 ජීවන චක්‍රය පදනම් කරගත් ඉලක්ක ක්‍රියාත්මක කිරීම

*ජීවිතයේ ප්‍රධාන අවධීන් වන ළමා කාලය, වැඩ කරන වයස, මහලු විය සහ ආබාධිත භාවයන් මත සමාජ ආරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම මගින් ජනගහනය තුල කාලෝචිත සහ අවශ්‍යතා මත පදනම් වූ සහයෝගය සහතික කරනු ඇත*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**1.3.1. ජීවිත අවධීන් හරහා ප්‍රතිලාභීන් ස්වයංක්‍රීයව හඳුනාගෙන ඇතුළත් කර ගැනීමට ජාතික හැඳුනුම්පත් සහ ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය භාවිතා කෙරේ : ළමුන් සඳහා (ප්‍රදාන, පෝෂණය), රැකියා කරන වයස වෙනුවෙන් (රැකබලා ගන්නන්, ආබාධිත), වැඩිහිටියන් සඳහා (විශ්‍රාම වැටුප්), ආබාධිතපුද්ගලයන්ට (ආබාධිත ප්‍රදාන):**

**ජාතික හැඳුනුම්පත් (NIC)** පද්ධතිය **ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය (UBR)** සමඟ ඒකාබද්ධ කිරීම මඟින් සියලුම තීරණාත්මක ජීවිත අවධීන් ආවරණය වන ස්වයංක්‍රීය, කාර්යක්ෂම සහ පුළුල්, ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ සහ ඇතුළත් කිරීමේ ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට හැකියාව ලැබේ:

- **දරුවන්:** උපත් වාර්තා, ගෘහ ඒකක දත්ත සහ අවදානම් දර්ශක මත පදනම්ව ළමා ප්‍රදාන සහ පෝෂණ සහාය වැනි සමාජ ආධාර වැඩසටහන් සඳහා සුදුසුකම් ලත් දරුවන් ස්වයංක්‍රීයව හඳුනා ගනී. මෙය ළමා සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සංවර්ධනයට සහාය වන ප්‍රතිලාභ කාලෝචිත ලෙස සැපයීම සහතික කරයි.

- **රැකියා කරන වයසේ වැඩිහිටියන්:** යැපෙන අය රැකබලා ගන්නන්, ආබාධ සහිත පුද්ගලයින් (PwDs) සහ තාවකාලික හෝ ස්ථිර අවදානම් සහිතව සිටින පුද්ගලයින් ඇතුළුව සහාය ලබාදීම සඳහා සුදුසුකම් ලැබිය හැකි රැකියා කරන වයසේ පුද්ගලයින් හඳුනා ගැනේ. මෙය රැකවරණ ආධාර, වෘත්තීය පුහුණුව හෝ ආබාධිත ආධාර යෝජනා ක්‍රමවලට ඇතුළත් භාවය ලබනු පිණිස සහාය වේ.

- **වැඩිහිටියන්:** ජාතික හැඳුනුම්පත හරහා වයස් සත්‍යාපනය සහ ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය වාර්තා සමඟ හරස් පරීක්ෂා කිරීමෙන් විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සමාජ ආරක්ෂණ ජාල සඳහා සුදුසුකම් ලත් වැඩිහිටි පුරවැසියන් හඳුනා ගැනේ. මෙය මහලු වියේ දී මූල්‍ය ආරක්ෂාව සහතික කිරීම සඳහා ස්වයංක්‍රීය ලියාපදිංචිය සහ කාලෝචිත විශ්‍රාම වැටුප් බෙදාහැරීම් සඳහා පහසුකම් සපයයි.

- **ආබාධ සහිත පුද්ගලයින්:** ඉලක්කගත ආබාධිත ප්‍රදාන සහ විශේෂිත සේවාවන් සඳහා ආබාධිත පුද්ගලයින් ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා විවිධ අමාත්‍යාංශවලින් (උදා: MoE, NSPD) ඒකාබද්ධ කරන ලද

ආබාධිතයන් පිලිබඳ දත්ත භාවිතා කරනු ඇත ,එමගින් සත්‍යාපිතවූ අවශ්‍යතා මත පදනම්ව සහාය වීම සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කරනු ඇත .

මෙම පද්ධතිය දෝෂ අවම කිරීම, ද්විකරණය අඩු කිරීම සහ අන්තර්කරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඩිජිටල් දත්ත සම්බන්ධතාවය භාවිතා කරයි, සමාජ ආරක්ෂණය වඩාත් අන්තර්කරණය කරමින් එක් එක් ජීවන තත්වයන්ට ප්‍රතිචාර දක්වයි.

---

### 1.3.2 වැඩිහිටි කාන්තාවන්ට සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට ප්‍රමුඛත්වය ලබාදීම :

**වැඩිහිටි කාන්තාවන්** සහ **විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ** වැඩිවන අවදානම සැලකිල්ලට ගෙන, ඔවුනට ඇති විශේෂිත අභියෝගවලට මුහුණ දීම සඳහා සමාජ ආරක්ෂණ රාමුව තුළ ප්‍රමුඛතාවය දෙනු ලැබේ:

- **වැඩිහිටි කාන්තාවන්**: බොහෝ විට ඉහළ දරිද්‍රතා අවදානම, සෞඛ්‍ය සේවා සඳහා සීමිත ප්‍රවේශය සහ සමාජ හුදකලාව ඇතුළුව ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස හේතුවෙන් සංකීර්ණගැටළු වලට මුහුණ දෙනු ලබයි . වැඩිහිටි කාන්තාවන්ට ප්‍රමුඛතාවය දීම යනු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, සෞඛ්‍ය පරීක්ෂණ සහ සමාජ රැකවරණය සේවා ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන බව සහතික කිරීම, ඉලක්කගත මූල්‍ය ආධාර, සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සලසීම සහ ප්‍රජා සහභාගීත්ව අවස්ථා සැපයීමයි.

- **විශේෂ අවශ්‍යතා ඇති දරුවන්**: ආබාධිත හෝ නිදන්ගත සෞඛ්‍ය තත්වයන් ඇති දරුවන්ට සඳහා සම්මත ළමා සුභසාධන වැඩසටහන් වලට වඩා විශේෂිත සහාය අවශ්‍ය වේ. ඔවුන්ට ප්‍රමුඛතාවය දීම යනු මුල් අවධියේ හඳුනා ගැනීම, අන්තර්කරණ අධ්‍යාපනය, පෝෂණ වැඩසටහන්, වෛද්‍ය සත්කාර සහ ආබාධිත දීමනා සඳහා ප්‍රවේශය සහතික කිරීමයි. මෙම ප්‍රමුඛතාවය ලබා දීම මගින් පවතින දිගුකාලීන අසමානතාවයන් අඩු කිරීමට උපකාරී වන අතර ඔවුන්ගේ යහපැවැත්ම සහ සමාජයට ඒකාබද්ධ වීමද ප්‍රවර්ධනය කරනු ඇත .

මෙම ඉලක්කගත අවධානය සමාජ ආරක්ෂණ පද්ධතිය තුළ සමානාත්මතාවය වැඩි දියුණු කරයි, වඩාත් අවදානමට ලක්විය හැකි ජනගහනයට අවශ්‍ය අවධානය සහ සම්පත් ලැබෙන බව සහතික කරයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ භූමිකාවන්:**

- **MWCA**: වැඩිහිටි කාන්තාවන් සහ කාන්තා මූලික පවුල් සඳහා සහාය සම්බන්ධීකරණය කිරීම.
- **NSPD** සහ MoE: විශේෂ අවශ්‍යතා ඇති ආබාධිත පුද්ගලයින් සහ දරුවන් හඳුනා ගැනීම.
- **WBB:** ජීවන චක්‍ර මත සංවේදී දර්ශක සමඟ නිර්ණායක සමපාත කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- අමාත්‍යාංශ අතර හුවමරු කරගත් ගෘහ ඒකක දත්ත භාවිතය.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඒකාබද්ධ උපකරණ පුවරු සහ යොමු කිරීමේ මෙවලම්.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

- UBR ජීවන චක්‍ර ඉලක්කගත කළ වාර්තා.

• ජීවන අවධිය අනුව ඇතුළත් කිරීමේ අන්තර්කරණ ආවරණය.
• NIC පද්ධතිය හරහා තත්‍ය කාලීන සුදුසුකම් සලකුණු කිරීම.

---

### 1.4 කම්පන-ප්‍රතිචාරාත්මක සමාජ ආරක්ෂණ පද්ධති ගොඩනැගීම

*ස්වාභාවික විපත්, වසංගත හෝ ආර්ථික කම්පන වැනි අර්බුද පවතින විට ඉතා ඉක්මනින් පරිමාණය කළ හැකි අනුවර්තන පද්ධති පැවතීම ඉතා වැදගත් වේ. එමගින් අවදානමට ලක්විය හැකි ජනගහනය ආරක්ෂා කිරීමට සහ සංවර්ධන ජයග්‍රහණ ආරක්ෂා කිරීමට හැකියාව ඇත.*

ක්‍රියාත්මක යාන්ත්‍රණය

#### 1.4.1 බලපෑමට ලක් වූ නිවාස සඳහා ප්‍රතිස්ථාපනය වෙනුවෙන් ස්වයංක්‍රීයව පූරණය කිරීම ලබා දීම සඳහා UBR සමඟ පූර්ව අනතුරු ඇඟවීමේ දත්ත (DMC) ඒකාබද්ධ කිරීම

.
මෙම උපායමාර්ගය ආපදා අවදානම් කළමනාකරණය සමඟ සමාජ සහනාධාර සැපයීම සම්බන්ධ කිරීම තුලින් **කම්පන-ප්‍රතිචාරාත්මක සමාජ ආරක්ෂණ පද්ධතියක්** නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

• **දත්ත පද්ධති ඒකාබද්ධ කිරීම:** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) ගංවතුර, නායයෑම්, නියඟ හෝ සුළි සුළං වැනි ස්වාභාවික උපද්‍රව පිළිබඳ තත්‍ය කාලීන පූර්ව අනතුරු ඇඟවීමේ දත්ත සපයයි.මෙම දත්ත, ගෘහස්ථ සංයුතිය, භූගෝලීය පිහිටීම සහ අවදානම් තත්ත්වය ඇතුළුව සමාජ ආධාර ලබන්නන් පිළිබඳ සවිස්තර තොරතුරු තබා ඇති සමෝධානිත සමාජ ප්‍රතිලාභී රෙජිස්තරය **(UBR)** සමඟ සෘජුවම සම්බන්ධ වේ.

• **ස්වයංක්‍රීය ප්‍රේරක සහිත යාන්ත්‍රණය**: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අනතුරු ඇඟවීමක් නිකුත් කළ විට හෝ නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක ආපදා සිදුවීමක් හඳුනාගත් විට, ඒකාබද්ධ පද්ධතිය UBR දත්ත සමුදායේ බලපෑමට ලක් වූ කලාප තුළ ඇති නිවාස ස්වයංක්‍රීයව සලකුණු කෙරේ .

• **ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සක්‍රිය කිරීම**: මෙම සලකුණු කරන ලද ගෘහ ඒකක වලට ස්වයංක්‍රීයව හානි පූරණයක්" ලැබේ - අමතර මුදල් ලබාගැනීම හෝ හානිය වෙනුවට ලැබෙන වෙනත් ආධාර - මේ සඳහා නැවත අයදුම් කිරීමට හෝ දිගු සත්‍යාපන ක්‍රියාවලීන් වලට භාජනය වීමට අවශ්‍ය නොවේ . මෙය පරිපාලනමය ප්‍රමාදයන් අඩු කරන අතර හදිසි අවස්ථා වලදී වේගවත් සහාය ලබා දීම සහතික කරයි.

• **ප්‍රතිලාභ:** මෙම ඒකාබද්ධ කිරීම සමාජ ආරක්ෂණ පද්ධතියේ **ප්‍රතිචාරාත්මක බව සහ කාර්යක්ෂමතාව** වැඩි දියුණු කරයි, ආපදාවලින් ජීවනෝපායන් සහ යහපැවැත්ම කඩාකප්පල් වූ නිවාසවලට කාලෝචිත මූල්‍ය සහනයක් ලබා දෙයි, ඔවුන්ට කම්පන සමඟ සාර්ථකව කටයුතු කිරීමට සහ ඉක්මනින් යථා තත්වයට පත් වීමට උපකාරී වේ.

---

#### 1.4.2. සිතියම්ගත කළ අවදානම් තොරතුරු (ගංවතුරට ගොදුරු විය හැකි, නායයෑම් සිදුවන ආදී) භාවිතා කරමින් මුදල්/ ද්‍රව්‍යමය හෝ වෙනත් ආධාර පූර්ව ස්ථානගත කිරීම

*මෙම ප්‍රවේශයට සවිස්තරාත්මකව සිදු කළ  අවදානම් සිතියම්ගත කිරීම මත පදනම් වූ උපායමාර්ගික සම්පත් සැලසුම් කිරීමක්  හරහා පූර්ව ස්ථානගත කිරීමේ ආපදා සූදානම ඇතුළත් වේ:*

- **අවදානම් සිතියම්ගත කිරීම**: භූගෝලීය තොරතුරු පද්ධති (GIS) මෙවලම් සහ ඓතිහාසික දත්ත භාවිතා කරමින්, ගංවතුර, නායයෑම්, නියඟ හෝ කුණාටු වැනි උපද්‍රව වලට ගොදුරු විය හැකි ප්‍රදේශ හඳුනාගෙන හැකි කුඩාම මට්ටමින් සිතියම්ගත කරනු ලැබේ (උදා: ග්‍රාම නිලධාරී හෝ ගම් මට්ටම). මෙම සිතියම්ගත කිරීම දරිද්‍රතාවය, ආබාධිතභාවය සහ වැඩිහිටි සංකේන්ද්‍රණය  වැනි සමාජ ආර්ථික අවදානම් ද සලකා බලයි.

- **සම්පත් පූර්ව  ස්ථාන ගත කිරීම**: මෙම දත්ත මත පදනම්ව, රජයේ ආයතන සහ හවුල්කරුවන් ආපදා ඇතිවීමට පෙර ඉහළ අවදානම් කලාපවල හෝ ඒ ආසන්නයේ මුදල් සංචිත, ආහාර සැපයුම්, වෛද්‍ය කට්ටල, නවාතැන් ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ ගබඩා කෙරේ .

  **සම්පත් උපායමාර්ගිකව  යෙදවීම:** යම් සිදුවීමක් සිදු වූ විට, බලපෑමට ලක් වූ ජනගහනයට සහාය වීම සඳහා මෙම සම්පත් ඉක්මනින් බලමුලු ගන්වනු ලැබේ. පූර්ව ස්ථානගත කිරීම සැපයුම් සඳහා වන අභියෝග සහ ප්‍රතිචාර දැක්වීමට ගතවන කාලයන් අවම කරයි,  ආධාර වඩාත් අවශ්‍ය වූ විට සහ වඩාත් අවශ්‍ය ස්ථානයට ලබා දීමට හැකියාව ලබා දෙනු ඇත .

- **සම්බන්ධීකරණය:** මෙම ක්‍රියාවලියට ආපදා කළමනාකරණ බලධාරීන්, සමාජ ආරක්ෂණ ආයතන, පළාත් පාලන ආයතන සහ සිවිල් සමාජය අතර සමීප සහයෝගීතාවයක් අවශ්‍ය වන අතර එමඟින් සම්පත් තොග, තත්‍ය කාලීන අවදානම් දත්ත සහ ප්‍රතිලාභී අවශ්‍යතා සමඟ පෙළගස්වනු ලැබේ.

- **ප්‍රතිඵලය:** සම්පත් පූර්ව ස්ථානගත කිරීම මඟින් අවදානමට ලක්විය හැකි කුටුම්භවලට ක්ෂණික, ජීවිතාරක්ෂක සහාය ලැබෙන බව, පීඩා විඳීම අඩු කිරීම, අවතැන් වීම වැළැක්වීම සහ ආපදා වලදී සිදුවන ආර්ථික පාඩු සීමා කිරීම සහතික කෙරේ.

---

මෙම උපාය මාර්ග දෙක එක්ව, සමාජ ආරක්ෂණ පද්ධතිවල කම්පන-ප්‍රතිචාරාත්මක ධාරිතාව ශක්තිමත් කරයි, අවදානම් අපේක්ෂා කිරීමට මෙන්ම  , බලපෑමට ලක් වූ ජනගහනයට වේගයෙන් සහාය වීමටද  සහ නැවත නැවත ඇතිවන උපද්‍රව වලට එරෙහිව ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමටද  රජයන්ට  ඉඩ සලසයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ භූමිකාවන්:**

- **DMC සහ අනෙකුත් අදාල ආයතන** : ආපදා අනතුරු ඇඟවීම් සැපයීම, අවදානම් සිතියම්ගත කිරීම කළමනාකරණය කිරීම.

- **DSS සහ WBB**: බලපෑමට ලක් වූ ප්‍රතිලාභීන්ට අරමුදල් ලබා දීම.

- **MWCA**: ව්‍යසනයකින්  පසු අවදානමට ලක්විය හැකි කාන්තා නායකත්වයෙන් යුත් නිවාස හඳුනා ගැනීම.

- **සිවිල් සමාජ හවුල්කරුවන්:** නවාතැන්, මනෝ සමාජීය සහාය ලබා දීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය සමඟ සම්බන්ධිත තත්‍ය කාලීන ග්‍රාම නිලධාරි මට්ටමේ අවදානම් උපකරණ පුවරු.
• හදිසි සමාජ සහනාධාර සංචිත අරමුදල් (රජයේ සහ පළාත් ).

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

• මාසික කම්පන-ප්‍රතිචාර ආවරණ විගණන.
• ආපදා ක්‍රියාමාර්ගයෙන් පසු සමාලෝචන සහ ප්‍රතිලාභී ප්‍රතිපෝෂණ සමීක්ෂණ.

---

**1.5. ශක්තිමත් අධීක්ෂණ සහ බැහැරවීමේ උපාය මාර්ග ස්ථාපිත කිරීම**

*ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට, යැපීම වැළැක්වීමට සහ ප්‍රතිලාභීන් අතර දිගුකාලීනව තමා මත විශ්වාසය තබා කටයුතු කිරීමට සහාය වීම පිණිස , .අඛණ්ඩ අධීක්‍ෂණය සහ පැහැදිලිව නිර්වචනය කරන ලද ගෞරවනීය බැහැරවීමේ මාර්ග අත්‍යවශ්‍ය වේ.*

**මෙහෙයුම් යාන්ත්‍රණය**:

**1.5.1. ප්‍රතිලාභීන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කරන සිද්ධි කළමනාකරුවන් ලෙස සේවය කිරීමට සමෘද්ධි සහ සමාජ සේවා නිලධාරීන් පුහුණු කරනු ඇත**

මෙම උපායමාර්ගය මගින් අරමුණු කරන්නේ මනා සිද්ධි කළමනාකරණයක් හරහා කාර්යක්ෂමතාව සහ සමාජ සහනාධාර වැඩසටහන්වල පුද්ගල ආරෝපණය වැඩි දියුණු කිරීමයි:

• **ධාරිතා වර්ධනය**: සමෘද්ධි නිලධාරීන්ට සහ සමාජ සේවා නිලධාරීන්ට ප්‍රතිලාභී තක්සේරුව, උපදේශනය, ප්‍රගති අධීක්ෂණය සහ දත්ත කළමනාකරණය ඇතුළුව සිද්ධි කළමනාකරණ කුසලතා කෙරෙහිද අවධානය යොමු කළ විශේෂිත පුහුණුවක් ලැබෙනු ඇත. පුහුණුව සදාචාරාත්මකලෙස සලකා බැලීම්, රහස්‍යභාවය සුරැකීම සහ ඵලදායී සන්නිවේදනය සිදුකරන ආකාරයද ආවරණය කරයි.

• **සිද්ධි කළමනාකරුවන් ලෙස ඇති භූමිකාව**: මෙම නිලධාරීන් ප්‍රතිලාභී ගෘහයන් සමඟ නිතිපතා සම්බන්ධතා පවත්වා ගන්නා අතර ඉදිරි පෙළ සම්බන්ධීකාරකවරුන් ලෙස ක්‍රියා කරයි. ඔවුන් අවශ්‍යතා තක්සේරු කිරීම , ගෘහස්ථ තත්වයන්හි වෙනස්කම් නිරීක්ෂණය කිරීම , සහ පවතින සේවා සහ බලගැන්වීමේ මාර්ග හරහා ප්‍රතිලාභීන්ට මග පෙන්වීම ද සිදුකරනු ඇත.

• **අඛණ්ඩ අධීක්‍ෂණය**: සිද්ධි කළමනාකරුවන් එක් එක් ප්‍රතිලාභියාගේ ප්‍රගතිය පිළිබඳ දත්ත රැස් කර යාවත්කාලීන කරන අතර ආදායම, රැකියාව, කුසලතා අත්පත් කර ගැනීම හෝ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම යනාදී කරුණු සලකා බලමින් බලගැන්වීම ප්‍රමාද වීමට හේතු විය හැකි හෝ අමතර සහාය අවශ්‍ය වන බාධක හඳුනා ගනී

• **ප්‍රතිලාභ:** මෙම පුද්ගලාරෝපිත ප්‍රවේශය මඟින් සමාජ ආධාර ගෘහස්ථ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බව සහතික කරයි, ඉලක්ක කිරීමේ නිරවද්‍යතාවය වැඩි දියුණු කරයි, සහ දරිද්‍රතාවයෙන් ඔබ්බට ගොස් තිරසාර ලෙස බලගැන්වීමේ සම්භාවිතාව වැඩි කරයි.

---

### 1.5.2. බලගැන්වීමේ නිර්ණායකයන්ට සම්බන්ධව ඩිජිටල්ගත සිද්ධි සැලසුම් සහ බැහැරවීමේ සන්ධිස්ථාන හඳුන්වා දීම

සිද්ධි කළමනාකරණය වඩාත් කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුක්ත කිරීම සඳහා, ඩිජිටල් මෙවලම් සහ පැහැදිලි බලගැන්වීමේ සන්ධිස්ථාන හඳුන්වා දෙනු ලැබේ:

• **ඩිජිටල්ගත සිද්ධි සැලසුම්**: සෑම ප්‍රතිලාභී නිවසකටම එකඟ වූ ඉලක්ක, සේවා සහ කාලරේඛා ගෙනහැර දක්වන ඔවුන් වෙනුවෙන්ම වූ කළ ඩිජිටල්ගත කළ සිද්ධි සැලැස්මක් ඇත. යාවත්කාලීන කිරීම් අඛණ්ඩ සිදුකිරීමට සහ අධීක්ෂණ කටයුතු සඳහා සිද්ධි කළමනාකරුවන්ට සහ අධීක්ෂකවරුන්ට මෙම සැලැස්ම වෙත ප්‍රවේශ විය හැකිය.

• **බැහැරවීමේ සන්ධිස්ථාන:** සමාජ සහනාධාර වැඩසටහන් බැහැරවීමට අවශ්‍ය කෙරෙන බලගැන්වීම ලබා ගැනීම පැහැදිලි සහ මැනිය හැකි නිර්ණායක මත පදනම් වේ (උදා: ආදායම් සීමාවන්, වත්කම් සමුච්චය කිරීම, ස්ථාවර රැකියාව). වැඩසටහන් බැහැරවීම සඳහා වන සූදානම නිරීක්ෂණය කිරීම සඳහා මෙම සන්ධිස්ථාන ඩිජිටල්ගත පද්ධතියට ඇතුළත් කර ඇත
.
• **දත්ත මත පදනම් වූ තීරණ**: ඩිජිටල් පද්ධතිව ප්‍රතිලාභීන් ප්‍රධාන සන්ධිස්ථාන කරා ළඟා වන විට හෝ මැදිහත්වීමක් අවශ්‍ය වන විට ස්වයංක්‍රීය ඇඟයීම් සක්‍රීය කරන අතර, කාලෝචිත තීරණ ගැනීම සහ සිද්ධි පසු විපරම් කිරීම සඳහා පහසුකම් සපයයි.

• **ප්‍රතිලාභ**: ඩිජිටල්කරණය මඟින්, දත්තවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම, කඩදාසි මත වන ලේඛන කටයුතු අඩු කිරීම , සහ ආයතන හරහා සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම, බලගැන්වීමේ ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කිරීම සහ දෝෂ ඇතිවීමේ හෝ පක්ෂග්‍රාහීත්වයට ඇති ඉඩකඩ අඩු කිරීම සිදු කරයි.

---

### 1.5.3. විනිවිද භාවයෙන් යුතු සහ සදාචාරාත්මක අභියාචනා යාන්ත්‍රණයක් ඇති කිරීම

ප්‍රතිලාභීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් කෙරෙහි විශ්වාසය සහතික කිරීම උදෙසා සාධාරණ සහ ප්‍රවේශ විය හැකි අභියාචනා පද්ධතියක් අත්‍යවශ්‍ය වේ:

• **අභියාචනා පද්ධතිව**: ප්‍රතිලාභීන් බැහැර කිරීම්, ඇතුළත් කිරීමේදී ඇති දෝෂ හෝ ඔවුන්ගේ සමාජ ආධාර ප්‍රතිලාභවලට අදාළ තීරණවලට අභියෝග කිරීම සඳහා පැහැදිලි, භාවිතා කරන්නාට පහසු වන යාන්ත්‍රණයක් - ඩිජිටල්ගත සහ මාර්ග අපගත (offline) ලෙස ස්ථාපිත කිරීම .

• **සදාචාරාත්මක ප්‍රමිතීන්**: අභියාචනා ක්‍රියා පටිපාටින්, විනිවිදභාවය, රහස්‍යභාවය, කාලෝචිතභාවය සහ කිසිවෙකුට වෙනස්ලෙස නොසැලකීමේ මූලධර්ම මගින් පාලනය වේ. පුහුණුව ලත් පිරිස් අයදුම්කරුවන්ගේ ගරුත්වය සුරකිමින් අපක්ෂපාතීව සහ ගරුකටයුතු ලෙස අභියාචනා හසුරවනු ඇත.

• **අධීක්ෂණය සහ වගවීම**: ස්වාධීන විගණකවරුන්, සිවිල් සමාජ සංවිධාන හෝ අධීක්ෂණ කමිටු තුළින් පද්ධතිමය ගැටළු හඳුනා ගැනීමට සහ වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීමට අභියාචනා ප්‍රතිඵල නිතිපතා සමාලෝචනය කරයි.

• **ප්‍රතිලාභ**: මෙම යාන්ත්‍රණය වැඩසටහන්වල සාධාරණත්වය වැඩි දියුණු කර, දුක්ගැනවිලි අඩු කර, බැහැර කිරීමේ දෝෂ වළක්වමින්, ප්‍රතිලාභීන්ගේ විශ්වාසය සහ වැඩසටහන්වල නීත්‍යානුකූලභාවය ශක්තිමත් කරනු ඇත.

මෙම සියල්ල එක්ව, ප්‍රතිලාභීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන අතර සමාජ සහනාධාර වලින් ප්‍රතිලාභීන් ඵලදායී ලෙස බලගැන්වීමට සහාය වන **ශක්තිමත් සිද්ධි කළමනාකරණ සහ අධීක්ෂණ රාමුවක්** නිර්මාණය කරයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **WBB:** අභියාචනා නිරීක්ෂණය කිරීම, බැහැර කිරීමේ ක්‍රියාවලිය /අන්තර්කරණය කිරීමේ නිවැරදි කිරීමේ පද්ධති ක්‍රියාත්මක කිරීම.

• **DSS:** සමාජ කොන්ත්‍රාත්තු සහ සිද්ධිකළමනාකරණය අධීක්ෂණය කිරීම.
• ස්වාධීන විගණකවරුන්/CSO: අභියාචනා ක්‍රියාවලියේ විනිවිදභාවය නිරීක්ෂණය කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ඩිජිටල් සමාජ කොන්ත්‍රාත් සැකිලි
• මාසික සිද්ධි කළමනාකරණ කාර්ය සාධන වාර්තා.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

• ප්‍රතිලාභීන් බලගැන්වීම හා සම්බන්ධිත KPIs.
• සදාචාරාත්මක පිටවීම් සංඛ්‍යාව ,විසඳන ලද අභියාචනා සහ නැවත ඒකාබද්ධ කිරීමේ සිද්ධි

---

**1.6. ඒකාබද්ධ බලගැන්වීම සහ ප්‍රජා සවිබල බලගැන්වීම ප්‍රවර්ධනය කිරීම**

**ගෘහස්ථ මට්ටමේ සහයෝගය ප්‍රජා මූලික මුලපිරීම් සමඟ ඒකාබද්ධ කිරීම මගින් දරිද්‍රතාවයෙන් තිරසාර බැහැරවීම සහතික කරන අතරම දේශීය ඔරොත්තු දීමේ හැකියාව, අන්තර්කරණය කිරීම සහ සමාජ සහජීවනය ශක්තිමත් කරයි.**

**මෙහෙයුම් යාන්ත්‍රණය:.**

**1.6.1. ප්‍රජා මට්ටමේ සංවර්ධන සැලසුම්කරණය බලගැන්වීමේ වැඩසටහන් සමඟ සම්බන්ධ කෙරේ**

• **ප්‍රජා මූලික ප්‍රවේශය:** බලගැන්වීමේ වැඩසටහන් ප්‍රාදේශීය සංවර්ධන මුලපිරීම් සමඟ ඒකාබද්ධ කර ඇති අතර එමඟින් ග්‍රාම නිලධාරි (GN) හෝ ගම් මට්ටමේ ප්‍රජාවන්ට සමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බලය ලබා දේ.

• **ගෘහස්ථ මට්ටමේ ඉලක්ක කිරීම**: ප්‍රජාවගේ බුද්ධිය හා දැනුම භාවිතා කරමින්, පළාත් පාලන ආයතන සහ ප්‍රජා කවුන්සිල බලගැන්වීමේ සහාය සඳහා සුදුසුකම් ලත් අවදානමට ලක්විය හැකි කුටුම්බ හඳුනා ගනී. මෙය මැදිහත්වීම් සන්දර්භය-විශේෂිත වන අතර ප්‍රජා ප්‍රමුඛතා සමඟ පෙළගැසී ඇති බව සහතික කරයි.

• **සම්බන්ධීකරණ සේවා සැපයීම**: ප්‍රජා සැලසුම්වලට කුසලතා පුහුණුව, වත්කම් සහාය සහ සමාජ සේවා වැනි බලගැන්වීමේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ක්‍රියාමාර්ග ඇතුළත් වන අතර එමඟින් දරිද්‍රතාවයෙන් මිදීමට සමස්ත මාර්ගයක් සඳහා පහසුකම් සපයයි.

• **තිරසාරභාවය සහ හිමිකාරිත්වය**: මෙම උත්සාහයන් සම්බන්ධ කිරීම ප්‍රජාවගේ හිමිකාරිත්වය සහ වගවීම පෝෂණය කරයි, ප්‍රජා සාමාජිකයින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ වැඩසටහන් සම්පූර්ණ කිරීමෙන් ඔබ්බට ජයග්‍රහණ තිරසාරව පවත්වා ගැනීමට ක්‍රියාකාරීව සහභාගී වීමට දිරිමත් කරයි.

---

**1.6.2. අවදානම් සහිත නිවාස නිරීක්ෂණය කිරීමට සහ සහාය වීමට වැඩිහිටි කමිටු සහ ප්‍රජා වැඩිහිටි පහසුකම් සපයන්නන් සම්බන්ධ කර ගැනීම**

• ***වැඩිහිටි කමිටු:*** *පිළිගත් ප්‍රජා වැඩිහිටියන්ගෙන් සමන්විත ස්ථාපිත කණ්ඩායම්, සමාජ හුදකලාව හෝ ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි අවදානමට ලක්විය හැකි පුද්ගලයින්, විශේෂයෙන් වැඩිහිටි පුද්ගලයින් සඳහා අවධානයෙන් සිටින්නන් සහ උපදේශකයින් ලෙස ක්‍රියා කරයි.*

• **ප්‍රජා වැඩිහිටි පහසුකම් සපයන්නන් (CEFs):** මෙම පුහුණුව ලත් ස්වේච්ඡා සේවකයින් වැඩිහිටි කමිටු සමඟ එක්ව නිතිපතා නිවාස සංචාර පැවැත්වීම, යහපැවැත්ම නිරීක්ෂණය කිරීම සහ නොසලකා හැරීම, අපයෝජනය කිරීම හෝ නරක අතට හැරෙන දරිද්‍රතාවය වැනි අවදානම් හඳුනා ගනී.

• **සහාය සහ යොමු කිරීම:** CEFs මගින් මනෝ සමාජීය සහාය ලබා දේ., අවදානම් සහිත වැඩිහිටියන් සහ ඔවුන්ගේ පවුල් සමාජ ආරක්ෂණ වැඩසටහන් සමඟ සම්බන්ධ කිරීමට උපකාරී වන අතර සහ සෞඛ්‍ය, නීතිමය හෝ සමාජ සේවා සඳහා යොමු කිරීම් සඳහා පහසුකම් සපයනු ඇත.

• **ප්‍රජා ආරක්ෂණ ජාලය:** මෙම බිම් මට්ටමේ ජාලය සමාජ සහජීවනය ශක්තිමත් කරන අතර අවදානමට ලක්විය හැකි නිවාස දරිද්‍රතාවයේ ගැඹුරට වැටීම වැළැක්වීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස ක්‍රියා කරනු ඇත.

---

**1.6.3. වතු අංශයේ හඳුනාගැනීම් PHDT සහ අනෙකුත් අදාළ වතු සංවර්ධන සහ සුභසාධන ආයතන හරහා ඒකාබද්ධ කිරීම.**

• **PHDT කාර්යභාරය**: නාගරික හෝ ග්‍රාමීය සැකසුම් හා සසඳන විට අද්විතීය සමාජ-ආර්ථික අභියෝග ඇති වතු ප්‍රජාවන් තුළ සමාජ ආරක්ෂාව අධීක්ෂණය කිරීමේදී වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත.

• **සකස් කරන ලද පසු විපරම් පද්ධති**: වතු අංශය තුළ ප්‍රතිලාභීන්ගේ තත්ත්වය, බලගැන්වීම ප්‍රගතිය සහ සේවා භාවිතය නිරීක්ෂණය කරන විශේෂිත දත්ත පද්ධතියක් PHDT කළමනාකරණය කරයි, සකස් කරන ලද මැදිහත්වීම් සහතික කෙරෙනු ඇත.

• **ජාතික වැඩසටහන් සමඟ සම්බන්ධීකරණය**: මෙම වතු-විශේෂිත පසු විපරම පුළුල් ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනය (UBR) සමඟ ඒකාබද්ධ කර ඇති අතර එමඟින් අංශ-විශේෂිත අවශ්‍යතා සපුරාලන අතර අනුකූලතාව පවත්වා ගනී.

• **ඉලක්කගත සහාය**: PHDT හි දත්ත වතු ප්‍රදේශ තුළ විශේෂිත සහාය අවශ්‍ය වන කුටුම්භයන් කෙරෙහි අවධානය යොමු කිරීම, වඩාත් හොඳින් සම්පත් වෙන් කිරීම සහ අධීක්ෂණය සඳහා ඉඩ සලසයි.

---

මෙම උපාය මාර්ග එක්ව ප්‍රජා බලගැන්වීම, ඉලක්කගත අධීක්ෂණය සහ අංශ-සංවේදී සහාය ප්‍රවර්ධනය කරන අතර එමඟින් බිම් මට්ටමේ බලගැන්වීමේ වැඩසටහනේ කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය ශක්තිමත් කෙරේ.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්**:

• **පළාත් පාලන ආයතන සහ ග්‍රාම නිලධාරීන්**: ගෘහ ඉලක්ක කිරීම සම්බන්ධීකරණය කරයි.

• **PHDT සහ RPCs**: බලගැන්වීමට සුදුසුකම් ලත් වතු නිවාස හඳුනා ගැනීම.

• **වැඩිහිටි කමිටු:** හුදකලා වැඩිහිටියන් නිරීක්ෂණය කර සහාය නිර්දේශ කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ග්‍රාම නිලධාරි මට්ටමේ ඒකාබද්ධ ගෘහ සංවර්ධන දත්ත සමුදාය.

• CEF සහ ERPO භාවිතා කරමින් ප්‍රජා පාදක අධීක්ෂණ පද්ධති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

• ප්‍රදේශය අනුව බලගැන්වීමේ අධ්‍යයන.

• ප්‍රජා සම්බන්ධතා සහ බලගැන්වීමේ දර්ශක (උදා: මනෝ සමාජීය සහාය ලබන වැඩිහිටියන්ගෙන් ප්‍රතිශතය කරන ලද ප්‍රජා යොමු කිරීම් ගණන).

---

## 2 වන කුලුණ : සමාජ රැකවරණය

### 2.1. විස්තීර්ණ ජාතික සත්කාර සේවා පද්ධතියක් ස්ථාපිත කිරීම

*ළමුන්, වයස්ගත පුද්ගලයින් සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ (PwDs) අවශ්‍යතා සපුරාලීම සඳහා සම්බන්ධීකරණය වූ සත්කාර සේවාපද්ධතියක් අත්‍යවශ්‍ය වන අතර, ජීවිතයේ සෑම අදියරකදීම ප්‍රවේශ විය හැකි, ගුණාත්මක සහ ඇතුළත් සත්කාර සේවා සහතික කරනු ඇත.*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

2.1.1 ජපානයේ පවතින LTCI ආකෘතියට අනුව වයස්ගතවූවන් , ළමුන් සහ ආබාධිත පුද්ගලයින් සඳහා ජාතික, ඒකාබද්ධ සත්කාර රාමුවක් සංවර්ධනය කිරීම

• **විස්තීර්ණ සත්කාර පද්ධතිය**: වයස්ගතවූ පුද්ගලයින්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සහ ආබාධ සහිත පුද්ගලයින් (PwDs) සඳහා සමාජ රැකවරණය සේවා සම්බන්ධීකරණය කරන ඒකාබද්ධ, ජාතික රාමුවක් ස්ථාපිත කිරීම.
මෙම පද්ධතිය ජපානයේ දිගුකාලීන සත්කාර රක්ෂණ (LTCI) ආකෘතියෙන් අදහස් ලබා ගන්නා අතර, එය රක්ෂණ අරමුදල් , ප්‍රජා පාදක සත්කාර සැපයීම සමඟ ඒකාබද්ධ කෙරේ

**රක්ෂණ-සම්බන්ධිත අරමුදල්:** සත්කාර සේවා සඳහා දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සමාජ රක්ෂණ දායකත්වයන් සහ රජයේ සහනාධාර වැනි තිරසාර මූල්‍යකරණ යාන්ත්‍රණයන් මෙම රාමුව මගින් ප්‍රවර්ධනය කරයි.

• **විවිධ මට්ටම් වලදී සේවා සම්බන්ධීකරණය:** මෙම රාමුව මගින් සෞඛ්‍ය, සමාජ සුභසාධන සහ ප්‍රජා අංශ හරහා සේවාවන් ඒකාබද්ධ කරන අතර, නිවස, ප්‍රජාව සහ ආයතනික සැකසුම් අතර බාධාවකින් තොරව සත්කාර •සක්‍රීය කරයි.

• **පුද්ගල කේන්ද්‍රීය සත්කාර**: එය ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන ලෙස පුද්ගලාරෝපිත සත්කාර සැලසුම්වලට ප්‍රමුඛත්වය දෙයි, ගෞරවය, ස්වාධීනත්වය සහ සමාජ ඇතුළත් කිරීම අවධාරණය කරයි.

---

### 2.1.2 ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර ලබාදෙන ක්‍රමයක් සමග සියලුම සත්කාර නිවාස සහ පහසුකම් සඳහා සත්කාර ප්‍රමිතීන් ස්ථාපිත කිරීම

• **තත්ත්ව සහතිකය**: වැඩිහිටියන්, ආබාධ සහිත දරුවන් සහ ආබාධිත පුද්ගලයින්ට සේවය කරන සියලුම නේවාසික සහ දිවා සුරැකුම් පහසුකම් සඳහා අදාළ වන යටිතල පහසුකම්, කාර්ය මණ්ඩලය, ආරක්ෂාව, සනීපාරක්ෂාව සහ සේවා ගුණාත්මකභාවය සඳහා පැහැදිලි, බලාත්මක කළ හැකි ප්‍රමිතීන් නිර්වචනය කෙරේ.

• **අනිවාර්ය ලියාපදිංචිය**: සෑම සත්කාර සපයන්නෙකු සහ පහසුකමක්ම ලැයිස්තුගත කරන ජාතික ක්‍රමවේදයක් නිර්මාණය කිරීම, සේවා ලබා ගැනීමේ හැකියාව සහ අනුකූලතා තත්ත්වය පිළිබඳ පූර්ණ විනිවිදභාවය සහතික කිරීම.

• **බලපත්‍ර ලබා දීම සහ පරීක්ෂා කිරීම:** ගුණාත්මකභාවය සහ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා, රැකවරණ නිවාස ක්‍රියාත්මක වීමට පෙර සහ වරින් වර පරීක්ෂා කිරීම ප්‍රමිතීන් සපුරාලීමට අවශ්‍ය බලපත්‍ර පද්ධතියක් ක්‍රියාත්මක කිරීම .

• **වගවීම සහ පැමිණිලි**: ප්‍රතිලාභීන් සහ පවුල් සඳහා දුක්ගැනවිලි වාර්තා කිරීමට යාන්ත්‍රණ ස්ථාපිත කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ සත්කාර සැපයීමේ අඛණ්ඩ වැඩිදියුණුව කිරීම සහතික කිරීම.

---

**2.1.3 සංවර්ධන සැලසුම්කරණයේදී සත්කාර යටිතල පහසුකම් ඇතුළත් කිරීම සඳහා පළාත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

• **සත්කාර යටිතල පහසුකම් ප්‍රධාන කොට සැලකීම** : පළාත් සහ පළාත් පාලන ආයතන ඔවුන්ගේ වාර්ෂික සහ දිගුකාලීන සංවර්ධන සැලසුම්වලට සත්කාර පහසුකම් සංවර්ධනය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම ඇතුළත් කිරීමට අවශ්‍ය වේ.

• **සම්පත් වෙන් කිරීම:** වැඩිහිටි දින මධ්‍යස්ථාන, ප්‍රවේශ විය හැකි ප්‍රවාහනය සහ ආබාධිත-හිතකාමී පොදු ස්ථාන වැනි භෞතික යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීම .

• **නිවාස සහ නාගරික සැලසුම්කරණය සමඟ ඒකාබද්ධ වීම:** ආසන්න ප්‍රදේශවල, විශේෂයෙන් අඩු පහසුකම් සහිත ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල සත්කාර යටිතල පහසුකම් ප්‍රවේශ විය හැකි බව සහතික කරමින් ඇතුළත් ප්‍රජා සැලසුම ප්‍රවර්ධනය කිරීම .

• **ආපදා ඔරොත්තු දීමේ හැකියාව:** හදිසි අවස්ථා වලදී සේවා බාධා වීම අවම වන පරිදි, ස්වාභාවික උපද්‍රවයන්ට ඔරොත්තු දීම සඳහා සත්කාර යටිතල පහසුකම් නිර්මාණය කර ගොඩනගා ඇති බව සහතික කරන්න.

---

**2.1.4. සෞඛ්‍ය පද්ධති හරහා කෙරෙන පරීක්ෂා (උදා: දුර්වලබව) සමාජ රැකවරණය මාර්ග සහ ප්‍රතිලාභ යොමු කිරීම් සමඟ සම්බන්ධ කරන්න**

• **පූර්ව හඳුනා ගැනීම**: වැඩිහිටියන්ගේ දුර්වලතාවයන් , දරුවන්ගේ සංවර්ධන ප්‍රමාදයන් සහ ආබාධිත තක්සේරු කිරීම් වැනි සත්කාර අවශ්‍යතාවලට අදාළ සෞඛ්‍ය තත්වයන් සඳහා නිතිපතා පරීක්ෂාව ප්‍රාථමික සෞඛ්‍ය සේවාවලට ඒකාබද්ධ කිරීම .

• **යොමු කිරීමේ යාන්ත්‍රණ**: පරීක්ෂාවට ලක් කරන ලද පුද්ගලයින් සුදුසු සමාජ රැකවරණය සේවා, ප්‍රතිලාභ සහ පුනරුත්ථාපන වැඩසටහන් වෙත බාධාවකින් තොරව යොමු කළ හැකි වන පරිදි සෞඛ්‍ය සේවකයින්ට පැහැදිලි ප්‍රොටෝකෝල සංවර්ධනය කෙරේ.

• **දත්ත බෙදාගැනීම** සහ සම්බන්ධීකරණය: සත්කාර සපයන්නන්, සිද්ධි කළමනාකරුවන් සහ සමාජ සේවකයින් අතර ආරක්ෂිතව පරීක්ෂණ ප්‍රතිඵල බෙදා ගැනීමට අන්තර් ක්‍රියාකාරී ඩිජිටල්ගත සෞඛ්‍ය සහ සමාජ රැකවරණය තොරතුරු පද්ධති භාවිතා කෙරේ.

• **සත්කාරයේ අඛණ්ඩතාව:** ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට සහ ද්විකරණය අවම කිරීමට වෛද්‍ය ප්‍රතිකාර, සමාජ සහනාධාර සහ ප්‍රජා සේවා සම්බන්ධීකරණය කරන බහුවිධ කණ්ඩායම් ස්ථාපිත කරන්න.

• **යොමු කිරීමේ යාන්ත්‍රණ**: පරීක්ෂාවට ලක් කරන ලද පුද්ගලයින් සුදුසු සමාජ රැකවරණය සේවා, ප්‍රතිලාභ සහ පුනරුත්ථාපන වැඩසටහන් වෙත බාධාවකින් තොරව යොමු කළ හැකි වන පරිදි සෞඛ්‍ය සේවකයින්ට පැහැදිලි ප්‍රොටෝකෝල සංවර්ධනය කෙරේ.

• **දත්ත බෙදාගැනීම සහ සම්බන්ධීකරණය**: සත්කාර සපයන්නන්, සිද්ධි කළමනාකරුවන් සහ සමාජ සේවකයින් අතර ආරක්ෂිතව පරීක්ෂණ ප්‍රතිඵල බෙදා ගැනීමට අන්තර් ක්‍රියාකාරී ඩිජිටල්ගත සෞඛ්‍ය සහ සමාජ රැකවරණය තොරතුරු පද්ධති භාවිතා කෙරේ.

• **සත්කාරයේ අඛණ්ඩතාව**: ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට සහ ද්විකරණය අවම කිරීමට වෛද්‍ය ප්‍රතිකාර කරන, සමාජ සහනාධාර ලබදෙන සහ ප්‍රජා සේවා සම්බන්ධීකරණය කරන බහුවිධ කණ්ඩායම් ස්ථාපිත කෙරේ.

---

මෙම සංරචක එක්ව අවදානමට ලක්විය හැකි ජනගහනයේ විවිධ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි උසස් තත්ත්වයේ, ප්‍රවේශ විය හැකි සහ තිරසාර සහයෝගයක් සහතික කරන ශක්තිමත්, ඒකාබද්ධ සමාජ රැකවරණය පද්ධතියක් ගොඩනඟනු ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **MWCA සහ DSS:** වැඩිහිටි/ආබාධිත සත්කාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නායකත්වය සහ සම්බන්ධීකරණය.

• **NSE** (වැඩිහිටියන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය) සහ NSPD: ආබාධිත-ඇතුළත් ප්‍රතිපත්තිය, ප්‍රවේශ්‍යතා ප්‍රමිතීන් සහ සේවා අධීක්ෂණය සඳහා නායකත්වය ලබා දේ.

• **සෞඛ්‍ය අමාත්‍යාංශය** (MoH): සෞඛ්‍ය සේවා සමඟ පරීක්ෂා කිරීම, යොමු කිරීම සහ ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කිරීම

• **පළාත් සභා:** ප්‍රාදේශීය මට්ටමින් අයවැය වෙන් කර සත්කාර යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම

• **පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන:** ප්‍රජා සහ ආයතනික සත්කාර මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• අන්තර් අමාත්‍යාංශ සමාජ රැකවරණය ක්‍රියාකාරී කණ්ඩායම.

• සමාජ රැකවරණය ප්‍රමුඛතා ඇතුළත් කිරීම සඳහා පළාත් PDP ආකෘති.

• සෞඛ්‍ය සහ සත්කාර සේවාසපයන්නන්ගේ ලේඛන සමඟ UBR ඒකාබද්ධ කිරීම.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

- වාර්ෂික සත්කාර පහසුකම් විගණන සහ ප්‍රවේශ්‍යතා තක්සේරු කිරීම්.
- දිස්ත්‍රික්ක පුරා සත්කාර සේවා සඳහා කාර්ය සාධන ලකුණු කාඩ්පත්.
- පළාත් සෞඛ්‍ය සහ සමාජ සංවර්ධන සමාලෝචනවල සමාජ රැකවරණය දර්ශක ඇතුළත් කිරීම.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- ඩිජිටල්ගත සත්කාර පහසුකම් ලේඛනය.
- වැඩිහිටි/ආබාධිත සත්කාර යොමු කිරීම් සඳහා පුහුණු MOH, PHM සහ ERPO පුද්ගලයින්.
- ආපදා-ප්‍රතිරෝධී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් (උදා: අවදානම් කලාපවල වැඩිහිටි නිවාස සඳහා).

**2.2. සත්කර සේවා පුහුණු කිරීමේ සහ සහතික කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම**

විධිමත් සහ අවිධිමත් අංශ වල සත්කාර සේවා සපයන්නන් සඳහා ප්‍රමිතිගත පුහුණුව සහ ප්‍රතීතනය සංවර්ධනය කරමින් රට පුරා සත්කාර සේවාවන්හි ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ වෘත්තීය පිළිගැනීම වැඩි දියුණු කරයි..

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**2.2.1. NVQ පද්ධතිය යටතේ ජාතික සත්කාර සේවා සපයන්නන් සඳහා පුහුණු ආයතනයක් (NCGTI) ස්ථාපිත කිරීම**

- **කැප වූ පුහුණු ආයතනය**: වැඩිහිටි සත්කාර සේවා සහ ආබාධිත සහාය කෙරෙහි අවධානය යොමු කරමින් රට පුරා සත්කාර සේවා සපයන්නන් සඳහා ප්‍රමිතිගත, උසස් තත්ත්වයේ පුහුණු වැඩසටහන් ලබා දීම සඳහා වගකිව යුතු විශේෂිත ජාතික ආයතනයක් පිහිටුවීම.

- **ද්විත්ව පුහුණු ආකෘතිය**: විධිමත් පන්ති කාමර පාදක අධ්‍යාපනය ප්‍රායෝගික රැකියා ස්ථානයේ පුහුණුව සමඟ ඒකාබද්ධ කරන ද්විත්ව පද්ධති ප්‍රවේශය අනුගමනය කෙරේ . මෙය රැකවරණ සැකසුම් තුළ සත්කාර සේවා සපයන්නන් ට න්‍යායාත්මක දැනුම සහ සැබෑ කුසලතා ලබා ගැනීම සහතික කරයි
.
- **ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව:** පිළිගත් සහතික ලබා දීම සඳහා සියලුම පුහුණු වැඩසටහන් NVQ නිපුණතා ප්‍රමිතීන් සමඟ පෙළගස්වන අතර , සත්කාර සේවා සපයන්නන් ගේ වෘත්තීයභාවය සහ සේවා නියුක්තිය වැඩි දියුණු කිරීම සිදු කෙරේ

- **හවුල්කාරිත්වයන්:** පුහුණුවන්නන් සඳහා ප්‍රායෝගික ස්ථානගත කිරීම් සහ ආධුනිකත්ව පුහුණු ලබා දීම සඳහා රෝහල්, සත්කාර සේවා නිවාස, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මධ්‍යස්ථාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**2.2.2වැඩිහිටි සහ ආබාධිත සත්කාර සඳහා NVQ-පෙළගැස්වූ විෂය මාලාවක් සැපයීම**

- **ප්‍රමිතිගත විෂය මාලාව:** පුද්ගලික සත්කර සේවා සපයන්නන්, සංචලතා සහාය, පෝෂණය, ඖෂධ සහාය, සන්නිවේදනය සහ මනෝවිද්‍යාත්මක සත්කාර ඇතුළු අත්‍යවශ්‍ය සත්කාර නිපුණතා ආවරණය වන පුළුල් විෂය මාලාවක් සංවර්ධනය කිරීම.

- **විශේෂ අවශ්‍යතා සඳහා අභිරුචිකරණය:** වැඩිහිටි පුද්ගලයින්ගේ සහ ආබාධිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලන විශේෂිත මොඩියුල ඇතුළත් කිරීම, සංස්කෘතික වශයෙන් සුදුසු සහ ගෞරවය ආරක්ෂා කරන සත්කාර සහතික කිරීම

- **නිපුණතා පාදක තක්සේරුව:** සත්කර සේවා සැපයීම ප්‍රවීණතාවය සහ වෘත්තීය භූමිකාවන් සඳහා සූදානම සහතික කිරීම සඳහා NVQ-පෙළගැස්වූ නිපුණතා පරීක්ෂණ සහ ප්‍රායෝගික ඇගයීම් භාවිතා කෙරේ.

- .**අඛණ්ඩ වැඩිදියුණු කිරීම:** ලබා ගත හැකි හොඳම භාවිතයන්, තාක්ෂණික දියුණුව සහ සමාජ රැකවරණයයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා විෂයමාලාව නිතිපතා යාවත්කාලීන කෙරේ

---

### 2.2.3තරුණ/කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා සත්කර සේවා සපයන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

• **ඉලක්කගත ප්‍රචාරණය:** ප්‍රතිලාභදායක සහ ශක්‍ය වෘත්තීය විකල්පයක් ලෙස සත්කර සේවා සැපයීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා පාසල්, වෘත්තීය මධ්‍යස්ථාන, ප්‍රජා සංවිධාන සහ මාධ්‍ය නාලිකා හරහා වැඩසටහන් රටපුරා ක්‍රියාත්මක කෙරේ .

• **ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී ප්‍රවර්ධනය:** සහභාගීත්වය අධෛර්යමත් කළ හැකි සංස්කෘතික බාධක සහ වැරදි වැටහීම් ආමන්ත්‍රණය කරමින් කාන්තාවන් සහ තරුණයින් සඳහා අවස්ථා අවධාරණය කෙරේ .

• **දිරිගැන්වීම් සහ ශිෂ්‍යත්ව:** අභිප්‍රේරිත අභ්‍යාසලාභීන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට ශිෂ්‍යත්ව, දීමනා සහ වෘත්තීය දියුණු මාර්ග ලබා ගැනීම ප්‍රවර්ධනය කෙරේ .

• **සාර්ථක ආදර්ශ :** අනාගත සත්කර සේවා සපයන්නන් දිරිමත් කිරීම සඳහා සත්කර සේවා වෘත්තිය තුලින් ආදර්ශවත් චරිත සහ සාර්ථක කථා ඉස්මතු කෙරේ.

---

### 2.2.4. අපයෝජන වැළැක්වීම, ඇතුළත් සත්කාර සහ සහායක තාක්ෂණය පිළිබඳ මොඩියුල ඇතුළත් කිරීම

• **අපයෝජන වැළැක්වීමේ පුහුණුව**: සත්කර සේවා සපයන්නන්, ආරක්ෂාව සහ සැලකිල්ල සහතික කරමින් - ශාරීරික, චිත්තවේගීය, මූල්‍ය සහ නොසලකා හැරීම වැනි සියලු ආකාරයේ අපයෝජන හඳුනා ගැනීම, වැළැක්වීම සහ වාර්තා කිරීම පිළිබඳව සත්කර සේවා සපයන්නන්, දැනුවත් කිරීම .

• **ඇතුළත් සත්කාර මූලධර්ම**: විවිධත්වය පිළිගැනීමට සහ සමාජ ඇතුළත් භාවය ප්‍රවර්ධනය කරන, වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් බලගන්වන ගෞරවනීය, පුද්ගල කේන්ද්‍රීය සත්කාරයක් සැපයීම සඳහා රැකබලා ගන්නන් පුහුණු කිරීම .

• **සහායක තාක්ෂණ භාවිතය**: සංචලන ආධාරක, සන්නිවේදන මෙවලම් සහ සෞඛ්‍ය අධීක්ෂණ උපකරණ වැනි නවීන සහායක උපාංග සහ තාක්ෂණයන් භාවිතය පිළිබඳ උපදෙස් ඇතුළත් කරනු ඇත  සත්කාර - ලබන්නන්ගේ ගුණාත්මකභාවය සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම සඳහා.

• **ආචාර ධර්ම සහ වෘත්තීයභාවය**: ආචාර ධර්ම හා බැඳුණු සත්කාර පිළිවෙත්, රහස්‍යභාවය සහ වෘත්තීය සීමාවන් පවත්වා ගැනීම  අවධාරණය කෙරේ .

---

මෙම ක්‍රියාමාර්ග එක්ව, ගුණාත්මකභාවය, කරුණාව  සහ ඇතුළත් භාවය  සමඟ වර්ධනය වන සමාජ රැකවරණය අවශ්‍යතා සපුරාලන වෘත්තීයමය, **හොඳින් පුහුණුව ලත්  සත්කර සේවා සපයන්නන්,** ස්ථාපිත කරනු ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **TVEC සහ NISD:** ප්‍රමුඛ විෂයමාලා නිර්මාණය සහ NVQ මට්ටමේ ක්‍රියාත්මක කිරීම.

• **MoH සහ NSPD:** මොඩියුල නිර්මාණය සහ පුහුණු බෙදාහැරීම සඳහා තාක්ෂණික සහාය.

• **MWCA:** ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී සත්කාර ශ්‍රම බලකායේ ප්‍රතිපත්තිය.

• **අධ්‍යාපන අමාත්‍යාංශය (MoE):** ආබාධ සහිත දරුවන් සඳහා ඇතුළත් අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම .

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ජාතික රැකවරණ ශ්‍රම බලකාය සංවර්ධන සැලැස්ම.

• පළාත් සත්කාර පුහුණු හවුල්කාරිත්වයන් (TVEC, NISD, DSS).

• සහතික කිරීම සහ රැකියා ස්ථානගත කිරීම සඳහා පුහුණු වූ අය  ගැන සොයාබැලීමේකටයුතු කෙරෙන පද්ධතිය.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• දිස්ත්‍රික් සහ සත්කාර අංශය අනුව සහතික කළ රැකබලා ගන්නන් සංඛ්‍යාව.

• සේවායෝජක තෘප්තිය සහ සත්කාර තත්ත්ව විගණන.

• සහතික කළ රැකබලා ගන්නන් සඳහා රැකියා ප්‍රතිඵල පිළිබඳ  අධ්‍යයන.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• කලාපීය රැකබලා ගන්නන් පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම.
• දීමනා සහ පුහුණු සහනාධාර සඳහා අරමුදල්.
• රැකබලා ගන්නන් සඳහා ඩිජිටල්ගත සහතික කිරීමේ සහ ලියාපදිංචි කිරීමේ පද්ධතිය.

---

2.3 **සත්කාර ආර්ථිකයන් ශක්තිමත් කිරීම සහ අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය**

*වැටුපක් නොලබන සහ අවිධිමත් රැකවරණ සපයන්නන් සඳහා සහාය ඇතුළුව රැකවරණ ආර්ථිකය හඳුනා ගැනීම සහ ආයෝජනය කිරීම - සාධාරණව කාර්යයන් බෙදා ගැනීම, ආර්ථික බලගැන්වීම සහ තිරසාර සමාජ ආරක්ෂණ ප්‍රතිඵල සහතික කරනු ඇත .*

**මෙහෙයුම් යාන්ත්‍රණය**:

**2.3.1. රැකවරණ සහාය, මනෝ සමාජීය සහයෝගය සහ විවේක සත්කාර හඳුන්වා දීම - විශේෂයෙන් කාන්තා රැකවරණ සපයන්නන් ඉලක්ක කර ගනිමින්**

- **රැකවරණ සහාය:** වැඩිහිටි, ආබාධිත හෝ නිදන්ගත රෝගාතුර වූ පවුලේ සාමාජිකයින් සඳහා වැටුපක් නොලබා රැකවරණ සපයන අවිධිමත් රැකවරණ සපයන්නන් - ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කාන්තාවන් වන අතර පුහුණු උපදේශනය, විවේක සේවා, මිතුරු සමාගම් වැනි ක්‍රියා මඟින් නිතිපතා හඳුනා ගැනීම සහ සහාය ලබා දේ. මෙමගින් ආර්ථික බර අඩු කර ගැනීමට උපකාරී වන අතර ඔවුන්ගේ වැදගත් දායකත්වයන් අගය කරයි.

- **මනෝ සමාජීය සහාය සේවා:** රැකවරණ රාජකාරිවලට සම්බන්ධ ආතතිය, සමාජීය හුදකලාව සහ චිත්තවේගීය අභියෝගවලට මුහුණ දීම සඳහා රැකවරණ සපයන්නන් සඳහා සකස් කරන ලද උපදේශන සහ මානසික සෞඛ්‍ය සහාය වැඩසටහන් ස්ථාපිත කෙරේ . මෙම සේවාවන් ප්‍රජා මධ්‍යස්ථාන, උපකාරක දුරකථන සේවා හෝ ඩිජිටල් පද්ධති හරහා ලබා දිය හැකිය.

- **විවේක සත්කාර සැපයීම:** විධිමත් විවේක සත්කාර විකල්ප සංවර්ධනය කිරීම - තාවකාලිකව රැකවරණ වගකීම් භාර ගන්නා කෙටි කාලීන සහන සේවා - රැකවරණකරුවන්ට විවේක ගැනීමට, පුද්ගලික අවශ්‍යතා සපුරාලීමට හෝ හදිසි අවස්ථා කළමනාකරණය කිරීමට කාලය ලබා දීම. රැකවරණ යහපැවැත්ම පවත්වා ගැනීමට සහ දිගු කාලීන තෙහෙට්ටුව අඩු කිරීමට මෙය ඉතා වැදගත් වේ
.
- **කාන්තා රැකවරණ සපයන්නන් සඳහා ප්‍රමුඛතාවය:** කාන්තාවන් අසමාන ලෙස අවිධිමත් රැකවරණ ලබා දෙන බැවින්, වැඩසටහන් සඳහා ඔවුන් ඇතුළත් කිරීමට ප්‍රමුඛත්වය දෙන අතර ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී ආධාරක යාන්ත්‍රණ සපයනු ඇත, සූරාකෑමට හෝ අධික වැඩ කිරීමට එරෙහිව බලගැන්වීම සහ ආරක්ෂාව සහතික කරයි.

---

**2.3.2. ආබාධිත පුද්ගලයින් සහ එක්තැන්ව සිටින වැඩිහිටියන් රැකබලා ගන්නා ගෘහ ඒකක සඳහා සහාය ලබාදීම**

- **ගෘහයන් සඳහා රැකවරණ සහාය** : ආබාධ සහිත පුද්ගලයින් (PwDs) සහ ඇඳේ සිටින වැඩිහිටි ඥාතීන් රැකබලා ගන්නා පවුල් සඳහා අමතර වියදම් අඩු කිරීම සඳහා ඉලක්කගත සහන ලබා දීම. මෙය වෛද්‍ය සැපයුම්, උපකාරක උපකරණ, නිවාස වෙනස් කිරීම් සහ රැකවරණය ආශ්‍රිත සේවාවන් ආවරණය කළ හැකිය

• **සත්කාර සේවා සපයන්නන් ට සහාය**: රැකවරණ සහාය: නිවාස පාදක සත්කාර සේවා පවත්වා ගැනීමට සහ සත්කාර සේවා ධාරිතාව වැඩි දියුණු කිරීමට උපකාර කිරීම සඳහා ගෘහ ඒකක වලට පුහුණුව, උපදේශනය, විවේක සේවා සහ සමාන මිතුරු ජාල වල සහය සැපයීම.

• **කොන්දේසි සහිත සහාය**: අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා වැඩ හොඳ ප්‍රතිඵල සහතික කිරීම සඳහා සත්කාර සේවා ගුණාත්මක ප්‍රමිතීන්ට හෝ පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ කිරීම .

• **ඉලක්කගත ප්‍රවේශය**: ඉලක්කගත සම්බන්ධතා: විශේෂයෙන් අඩු සේවා පවතින හෝ දුරස්ථ ප්‍රදේශවල සහාය ලබාගැනීමට කුටුම්භ හඳුනා ගැනීමට සහ ප්‍රමුඛතාවය දීමට සමාජ ලේඛන සහ සෞඛ්‍ය දත්ත භාවිතා කිරීම.

---

**2.3.3. විධිමත් ආධාරක මාර්ගවලට සත්කාර සේවා සපයන්නන් ඒකාබද්ධ කිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය සහ සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ එක්ව කටයුතු කිරීම**

• **අන්තර් අමාත්‍යාංශ සහයෝගීතාව**: ජාතික සෞඛ්‍ය සහ සමාජ රැකවරණය පද්ධති තුළ අවිධිමත් රැකවරණ සපයන්නන් විධිමත් ලෙස හඳුනාගෙන සහාය දෙන ව්‍යුහගත මාර්ග නිර්මාණය කිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (MWCA) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය (MoH) අතර ශක්තිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම.

• **යොමු කිරීමේ පද්ධති**: ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ සමාජ සුභසාධන කාර්යාලවලට සම්බන්ධ විධිමත් යොමු කිරීමේ යාන්ත්‍රණයන් හරහා සෞඛ්‍ය පරීක්ෂණ, පුහුණුව, සමාජ ප්‍රතිලාභ සහ මනෝවිද්‍යාත්මක සේවාවන් වෙත ප්‍රවේශ වීමට රැකබලා ගන්නන්ට හැකියාව ලබාදීම.

**පුහුණු සහ සහතික කිරීමේ සම්බන්ධතා:** විධිමත් පුහුණු වැඩසටහන් සහ සහතික කිරීම් (උදා: ජාතික රැකවරණ පුහුණු ආයතනය හරහා) සඳහා සත්කාර සේවා සපයන්නන් ගේ ප්‍රවේශය පහසු කිරීම, එමඟින් කුසලතා වැඩි දියුණු කිරීම සහ වෘත්තීය සංවර්ධන අවස්ථා • සක්‍රීය කිරීම.
• **දත්ත ඒකාබද්ධ කිරීම:** ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී ඔවුන් අතුලත් කර ඇති බව, කාලෝචිත සහාය ලබා ගැනීම සහ හදිසි ප්‍රතිචාර සැලසුම්වලට ඇතුළත් කර ඇති බව සහතික කිරීම සඳහා අවිධිමත් සත්කාර සේවා සපයන්නන් ගේ දත්ත සමුදායන් හෝ ලේඛන සංවර්ධනය කිරීම.
• **ප්‍රතිපත්ති සහ උපදේශනය:** සත්කාර සේවා සහාය ආයතනිකකරණය කිරීම, අයවැය ප්‍රතිපාදන, නීතිමය ආරක්ෂණ සහ වැඩසටහන් තිරසාරභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

---

මෙම පියවර එක්ව, අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් ට සහාය වන සහ බලගන්වන, ඔවුන්ගේ මූල්‍ය හා චිත්තවේගීය බර අඩු කරන සහ විධිමත් පද්ධතිවලට ඵලදායී ලෙස ඒකාබද්ධ කරන, අවසානයේ අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා සත්කාර සේවා ගුණාත්මකභාවය සහ සමාජ ආරක්ෂාව වැඩි දියුණු කරන **පුළුල් සත්කාර ආර්ථිකයක්** ගොඩනඟයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- **MWCA සහ DSS**: රැකවරණ සහාය යෝජනා ක්‍රම පරිපාලනය කිරීම සහ ගෙවීම් කළමනාකරණය කිරීම.
- **NISD: NVQ** ප්‍රමිතීන් යටතේ අවිධිමත් රැකවරණකරුවන් පුහුණු කිරීම.
- **මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය (MoH):** මනෝ සමාජීය සහ මානසික සෞඛ්‍ය සහාය ලබා දීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය සමඟ ඒකාබද්ධ වූ රැකවරණ ලියාපදිංචි කිරීමේ පද්ධතිය.

PHMs සමාජ සේවා නිලධාරීන් සහ කාන්තා කාර්යාංශය හරහා කාර්යක්ෂම සේවාවක් සහතික කිරීම

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

- සහාය ලබන ලියාපදිංචි අවිධිමත් සත්කාර සේවා සපයන්නන් සංඛ්‍යාව.
- සත්කාර සේවා සපයන්නන් ගේ ආතතිය, තෘප්තිය සහ යහපැවැත්ම පිළිබඳ සමීක්ෂණ.
- සත්කාර සේවා සපයන ගෘහ ඒකක අතර මූල්‍ය ඇතුළත් භාවයේ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- සත්කාර සේවා සපයන්නන් ට සහාය සඳහා අරමුදල.
- සමාජ රැකවරණය ඒකකවල පුහුණු මනෝ සමාජීය උපදේශකයින්.
- ග්‍රාම නිලධාරි මට්ටමේ වලංගුකරණයක් සහිත පළාත් සත්කාර සේවා සපයන්නන් ගේ දත්ත ගොනු

---

**2.4. ප්‍රජා පාදක සත්කාර සේවා සපයන ජාල සංවර්ධනය කිරීම**

*ප්‍රජා ආයතන සහ සේවාවන් හරහා දේශීයකරණය වූ රැකවරණ ජාල ගොඩනැගීම ඔවුන්ගේම පරිසරයන් තුළ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ප්‍රවේශ විය හැකි, සංස්කෘතික වශයෙන් සුදුසු සහ ඇතුළත් සහයෝගය සහතික කරයි.*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**2.4.1. ප්‍රජා පාදක සත්කාර සඳහා කේන්ද්‍රස්ථාන ලෙස ප්‍රාදේශීය ලේකම් මට්ටමේ සමාජ රැකවරණය ඒකක භාවිතා කරන්න.**

- **මධ්‍යගත සේවා ස්ථාන:** ප්‍රජා පාදක සත්කාර සේවා ලබා දීම සඳහා ප්‍රාථමික සම්බන්ධීකරණ මධ්‍යස්ථාන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DS) මට්ටමේ සමාජ රැකවරණය ඒකක ස්ථාපිත කෙරේ. මෙම ඒකක ප්‍රවේශ විය හැකි, සත්කාර සැලසුම් කිරීම, සිද්ධි කළමනාකරණය සහ සම්පත් වෙන් කිරීම සිදුකරන . දේශීය මධ්‍යස්ථාන ලෙස සේවය කරනු ඇත,

- **බහු-විනය කණ්ඩායම්**: සත්කාර සැපයීම කළමනාකරණය කිරීමට සහ අධීක්ෂණය කිරීමට, නැගී එන අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට, අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සේවා සපයන්නන් සමඟ සම්බන්ධ

වෙමින් පුහුණු සමාජ සේවකයින්, සෞඛ්‍ය සේවා සම්බන්ධීකාරකවරුන් සහ පරිපාලන නිලධාරීන් මෙම ඒකකවල සේවය සපයනු ඇත.

• **ප්‍රාදේශීයකරණය කළ සේවා සැපයීම:** දේශීය අවශ්‍යතා තේරුම් ගැනීමට සහ සුදුසු ප්‍රතිචාර බල ගැන්වීමට , ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සහ සංස්කෘතික අදාළත්වය වැඩි දියුණු කිරීමට බිම් මට්ටමේ ක්‍රියාකාරීන් සහ ප්‍රජාවන් සමඟ මෙම මධ්‍යස්ථාන ශක්තිමත් සම්බන්ධතා පවත්වා ගෙන යන බව සහතික කෙරේ.

---

**2.4.2. වැඩිහිටි/ආබාධිත පුද්ගලයින් සඳහා සහාය වීම සඳහා ග්‍රාම නිලධාරී මට්ටමේ සත්කාර නියෝජිතයින් සහ ස්වේච්ඡා සේවකයින් පුහුණු කෙරේ.**

• **බිම් මට්ටමේ ධාරිතා වර්ධනය:** වැඩිහිටි පුද්ගලයින් සහ ආබාධ සහිත පුද්ගලයින් (PwDs) හඳුනා ගැනීම, සහාය දීම සහ අධීක්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ග්‍රාම නිලධාරී (GN) මට්ටමේ ඉදිරිපෙළ සේවකයින් සහ ප්‍රජා ස්වේච්ඡා සේවකයින් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් ලබා දීම.
• **ආවරණය වන කුසලතා:** පුහුණුවට මූලික සෞඛ්‍ය පරීක්ෂාව, මනෝ සමාජීය සහාය, ආබාධිතභාවය පිළිබඳ දැනුවත්භාවය, යොමු කිරීමේ ක්‍රියා පටිපාටි සහ ප්‍රජා සත්කාරයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සත්කාර ආචාර ධර්ම ඇතුළත් වේ.

• **බලගැන්වීම සහ දිරිගැන්වීම්:** මෙම සත්කාර නියෝජිතයින් ප්‍රායෝගික මෙවලම්වලින් සහ පුහුණු සහ හඳුනා ගැනීම් වලින් සන්නද්ධ කිරීම සහ හැකි සෑම විටම තිරසාර සහභාගීත්වයක් ඇති කර ගැනීම සඳහා දීමනා හෝ වෙනත් දිරිගැන්වීම් ලබා දීම.

• **ප්‍රජා විශ්වාසය:** විශ්වාසදායක ප්‍රාදේශීය ක්‍රියාකාරීන් උපයෝගී කර ගැනීමෙන් සේවාවන් ලබා ගැනීම වැඩි දියුණු වන අතර සත්කාර අවශ්‍යතා කල්තියා හඳුනා ගැනීම ප්‍රවර්ධනය කෙරේ.

---

**2.4.3. සේවා අවශ්‍යතා වැඩිපුර උවමනා ඇති. පුද්ගලයින් සඳහා ඩිජිටල් සත්කාර නිරීක්ෂක මෙවලම් නිර්මාණය කර ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය සමඟ ඒකාබද්ධ කෙරේ.**

• **පුද්ගල සත්කාර අධීක්ෂණය:** දුර්වල වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් සහ දිගු කාලීන රෝගීන් වැනි වැඩි අවශ්‍යතා ඇති ප්‍රජා සාමාජිකයින්ගේ තත්ත්වය ලියාපදිංචි කිරීම, නිරීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා සත්කාර නියෝජිතයින් සඳහා පරිශීලක-හිතකාමී ඩිජිටල් පද්ධති (උදා: ජංගම යෙදුම් හෝ වෙබ් ද්වාර) සංවර්ධනය කිරීම.
• **දත්ත ඒකාබද්ධ කිරීම:** සමාජ රැකවරණය ලබන්නන්ගේ පුළුල්, යාවත්කාලීන චිත්‍රයක් පවත්වා ගැනීම සඳහා මෙම සත්කාර නිරීක්ශක මෙවලම් ,මධ්‍යගත ඒකාබද්ධ ප්‍රතිලාභී දත්ත පද්ධතිය(UBR) සමඟ අංශ හරහා සම්බන්ධ කිරීම.

• **තත්‍ය කාලීන යාවත්කාලීන කිරීම්:** සේවා සම්බන්ධීකරණය කිරීමට, ද්විකරණය වළක්වා ගැනීමට සහ සත්කාර අවශ්‍යතා හෝ හදිසි අවස්ථා වල වෙනස්කම් වලට වේගයෙන් ප්‍රතිචාර දැක්වීමට සත්කාර සපයන්නන් අතර කාලෝචිත තොරතුරු බෙදා ගැනීම.

• **දත්ත රහස්‍යතාව සහ ආරක්ෂාව:** දත්ත ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව සංවේදී පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා දැඩි ප්‍රොටෝකෝල සහතික කෙරේ.

---

**2.4.4. සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ අංශයන් හරහා යොමු කිරීමේ මාර්ග ස්ථාපිත කිරීම**

• **බහු-ආංශික සම්බන්ධතා**: සෞඛ්‍ය පද්ධතියේ (සායන, රෝහල්), අධ්‍යාපනය (විශේෂ පාසල්, අන්තර්කරණ වැඩසටහන්) සහ සමාජ සුභසාධනය (ආබාධිත ප්‍රතිලාභ, වැඩිහිටි සේවා) අදාළ සේවාවන් සමඟ ප්‍රජා සත්කාර නියෝජිතයින් සහ සමාජ රැකවරණය ඒකක සම්බන්ධ කරන පැහැදිලි, ප්‍රමිතිගත යොමු කිරීමේ ප්‍රොටෝකෝල නිර්මාණය කිරීම.

• **විධිමත් ක්‍රියාවලීන්:** සේවා ස්ථාන අතර සේවාදායකයින්ගේ ඉක්මන් හා සම්බන්ධීකරණ චලනයන් පහසු කිරීම සඳහා යොමු කිරීමේ මෙවලම් සහ සන්නිවේදන නාලිකා (දුරකථන, ඩිජිටල් පද්ධති) සැලසුම් කිරීම
.
• **පසු විපරම් කිරීමේ ධාරිතාව:** සිදු කෙරෙන යොමු කිරීම් සැබෑ සේවා වෙත ප්‍රවේශය සහ අඛණ්ඩ සත්කාර සඳහා හේතු වන බව සහතික කිරීම සඳහා පසු විපරම් අධීක්ෂණය සඳහා වගකීම පැවරීම.

• **හරස්-අංශ පුහුණුව:** එකිනෙකාගේ භූමිකාවන් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා සම්බන්ධ වූ සියලුම අංශවල සේවකයින් සඳහා ඒකාබද්ධ පුහුණු සැසි පැවැත්වීම.

---

මෙම සංරචක සියල්ල එකතුව ප්‍රජා පාදක සත්කාර ජාලයක් සාදයි, එය අත්‍යවශ්‍ය සත්කාර සේවා අවදානමට ලක්විය හැකි ජනගහනයට සමීප කරයි, බහු අංශ සම්බන්ධ කිරීමෙන් පරිපූර්ණ සහාය සහතික කරයි, සහ කාර්යක්ෂමතාව, ප්‍රතිචාර දැක්වීම සහ ආවරණය වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් මෙවලම් සහ ප්‍රාදේශීය නියෝජිතයින් භාවිතා කරයි.

### ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:

• **DSS සහ MWCA:** සමාජ රැකවරණය ඒකක මෙහෙයවීම සහ ක්ෂේත්‍ර නියෝජිතයින් සම්බන්ධීකරණය කිරීම
.
• **MoH:** ප්‍රජා වැඩිහිටි සිද්ධිකළමනාකරණය සහ වෛද්‍ය-සමාජ යොමු කිරීම් පැවැත්වීම.

• **NSPD:** ආබාධිතභාවය ඇතුළත් ප්‍රොටෝකෝල සහතික කිරීම.

• **MoE** සහ කාන්තා කාර්යාංශය: පාසල් සහ ස්ත්‍රී පුරුෂ භාවය-සංවේදී සම්බන්ධතා සම්බන්ධ කිරීම.

• **PHDT සහ RPCs:** වතු-විශේෂිත ප්‍රජා සත්කාර ක්‍රියාත්මක කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- ඒකාබද්ධ සත්කාර යොමු කිරීමේ පද්ධතිය (සෞඛ්‍ය-අධ්‍යාපනය-සමාජ ආරක්ෂාව).
- GN මට්ටමේ සත්කාර සම්බන්ධීකරණ කමිටු.
- සිද්ධි අධීක්ෂණය සඳහා ජංගම යෙදුම් (උදා: වැඩිහිටි සත්කාර යෙදුම්).

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

- මාසික ප්‍රජා සත්කාර සහ සිද්ධි යොමු කිරීමේ වාර්තා.
- සත්කාර ලබන්නන් සහ කුටුම්භයන්ගෙන් ලබෙන ප්‍රතිපෝෂණ.
- සත්කාර නියෝජිතයින් සහ සමාජ රැකවරණය ඒකක සම්බන්ධ හදිසි සූදානම් කිරීමේ අභ්‍යාස.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා**:

- ආපදා ප්‍රතිචාර දක්වන වැඩිහිටි/අබාධ සහිත පුද්ගලයන් සත්කාර පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව.
- තත්‍ය කාලීන සිද්ධි සොයා බැලීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම්.
- වතුකරයේ සහ ග්‍රාමීය ප්‍රදේශවල දුරස්තව සිටින්නන් සඳහා සේවා රැගෙන යාමට ප්‍රවාහනය.

---

**2.5. සමාජ රැකවරණය ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) පුළුල් කෙරේ.**

*රාජ්‍ය, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන අතර හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමෙන් සමාජ රැකවරණය සේවාවන්හි ප්‍රවේශය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සම්පත්, නවෝත්පාදන සහ විශේෂඥතාව බලමුලු ගැන්විය හැකිය.*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**2.5.1. වැඩිහිටි/ආබාධිත දිවා සුරැකුම් හෝ ජංගම සත්කාර ඒකක පිරිනමන රාජ්‍ය නොවන සංවිධාන, ආගමික සංවිධාන සහ පෞද්ගලික සැපයුම්කරුවන්ට ප්‍රදාන, බදු දිරිගැන්වීම් සහ සම-අරමුදල් සැපයීම**

• **ඉලක්කගත මූල්‍ය සහාය:** දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යන හෝ වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් (PwDs) සඳහා විශේෂයෙන් ජංගම සත්කාර ඒකක ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන, විශ්වාස-පදනම් කරගත් සංවිධාන සහ පෞද්ගලික සත්කාර සපයන්නන්ට අරමුදල් වෙන් කරන ප්‍රදාන වැඩසටහන් ස්ථාපිත කරනු ඇත.

• **බදු දිරිගැන්වීම්:** මෙම සත්කාර සේවාවන්හි ආයෝජනය කරන සංවිධාන සඳහා බදු අඩු කිරීම් හෝ ණය ලබා දෙමින් , ඒවායේ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සහ පුළුල් කිරීම හෝ ගුණාත්මක වැඩිදියුණු කිරීම් දිරිමත් කිරීම.

• **සම-අරමුදල් ආකෘති:** .පරිත්‍යාග, මුදල් එක්රැස් කරන ක්‍රම මගින් හෝ සේවා ගාස්තු හරහා, අනුරක අරමුදල් රැස් කරන ලබන්නන්ගේ සංවිධාන මත කොන්දේසි සහිතව රජය අරමුදල් කොටසක් සපයන සම අරමුදල් ක්‍රමයන් නිර්මාණය කිරීම මගින් සම්පත් බලමුලු ගැන්වීම උපරිම කරයි.

• **ධාරිතා වර්ධනය:** පුහුණුව, තත්ත්ව සහතික කිරීම සහ අධීක්ෂණය සහාය දක්වන සේවාවන් සමඟ සත්කාර ප්‍රමිතීන් සපුරාලන බව සහ ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලන බව සහතික කිරීම සඳහා සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීම

• **ප්‍රවේශ්‍යතාව වැඩි කිරීම:** ස්ථාවර පහසුකම් වෙත පහසුවෙන් ප්‍රවේශ විය නොහැකි දුරස්ථ, ප්‍රමාණවත් සේවා නොලැබෙන හෝ සංචලනය සීමා ඇති පුද්ගලයින් වෙත සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා ජංගම සත්කාර ඒකක වෙත සහය වනු ඇත

---

### 2.5.2. ජංගම හදිසි සත්කාර කණ්ඩායම් සහ හදිසි සහන හරහා ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේදී රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ට (PPPs) සහාය වීම

• **සහයෝගීතා ආපදා සූදානම:** ආපදා (ගංවතුර, නායයෑම්, වසංගත) අතරතුර ඉක්මනින් යොමු කල හැකි .හැකි ජංගම හදිසි සත්කාර කණ්ඩායම් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතන, පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් අතර විධිමත් හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම. **බෙදාගත් සම්පත්:** ආවරණය පුළුල් කිරීම සහ ප්‍රතිචාර දැක්වීමේ වේගය වැඩි දියුණු කිරීම පෞද්ගලික අංශයේ විශේෂඥතාව, සැපයුම් හැකියාවන් සහ උපකරණ භාවිතා කරන්න .

• **හදිසි සහන සේවා:** හදිසි සහන සේවා: PPP මගින්අත්‍යවශ්‍ය ජංගම වෛද්‍ය සායන, මනෝ සමාජීය සහාය, සහන ද්‍රව්‍ය බෙදා හැරීම වැනිසේවාවන් සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය අර්බුදකාරී කාලවලදී තාවකාලික නවාතැන් අවදානමට ලක්විය හැකි වැඩිහිටියන්ගේ සහ ආබාධිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති තාවකාලික නවාතැන් වැනි අත්‍යවශ්‍ය සේවාවන් සැපයිය හැකිය.

• **තිරසාර මූල්‍යකරණය:** ජංගම හදිසි සත්කාර කණ්ඩායම්වල සූදානම සහ මෙහෙයුම් ධාරිතාව පවත්වා ගැනීම සඳහා, ද්‍රව්‍යමය හා සේවා සහාය ඇතුළුව, රජයේ හදිසි අරමුදල් පෞද්ගලික සහ පරිත්‍යාගශීලී දායකත්වයන් සමඟ ඒකාබද්ධ කිරීම.

---

### 2.5.3. වැඩිහිටි/ආබාධිත-හිතකාමී යටිතල පහසුකම්වල ආයතනික සමාජ වගකීම් (CSR) ආයෝජන ප්‍රවර්ධනය කරන්න (උදා: ප්‍රවේශ විය හැකි සායන,)

• **ආයතනික සමාජ වගකීම් සඳහා සහභාගීවීම:** වැඩිහිටියන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට සහාය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ ආයතනික සමාජ වගකීම් සඳහා වන අයවැයෙන් කොටසක් වෙන් කිරීමට ආයතන සහ ව්‍යාපාර දිරිමත් කිරීම.

• **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්:** අබාධ සහිත පුද්ගලයන්ට පහසු ප්‍රවේශය සහිත වැසිකිළි පහසුකම් සකස් කිරීම හෝ වැඩිදියුණු කිරීම, උද්‍යාන සහ වෙළඳපොළවල, විවේක ස්ථාන ස්ථාපනය කිරීම හෝ ආරක්ෂිත පදික මාර්ග නිර්මාණය කිරීම වැනි ආයෝජන

• **දිරිගැන්වීම සහ පිළිගැනීම:** සමාජ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කරන ව්‍යාපාරයන් හි මහජන ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම සඳහා වන දිරිගැන්වීම සඳහා සම්මාන පිරිනැමීම හෝ වෙනත් මහජන පිළිගැනීමේ වැඩසටහන් ඇති කිරීම.

• **ප්‍රජා හවුල්කාරිත්වය:** ප්‍රමුඛත්වය දිය යුතු යටිතල පහසුකම් ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ප්‍රතිලාභී අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා ව්‍යාපාර, පළාත් පාලන ආයතන සහ ප්‍රජා සංවිධාන අතර සංවාදයට පහසුකම් සැලසීම.

• **දිගුකාලීන බලපෑම:** මෙම ආයතනික සමාජ වගකීම් පෙරදැරිවූ වැඩිදියුණු කිරීම් තුළින් විධිමත් සත්කාර සැකසුම් වලින් පිටත සිටින, අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා සංචරණය, සුවපහසුව සහ සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරන සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම.

---

මෙම පියවරයන් එක්ව, රජයේ මූල්‍ය හා මෙහෙයුම් බර අඩු කරමින් විවිධ අරමුදල් සහ සහාය හවුල්කරුවන්ගේ සහයෝගී සහ දිරිගැන්වීමේ ප්‍රවේශයන් හරහා වැඩිහිටි සහ ආබාධිත සත්කාර සේවාවන්හි ගුණාත්මකභාවය සහ පුළුල් ප්‍රවේශයයන් ඇති කිරීම හා වැඩිදියුණු කිරීම.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **මුදල් කොමිෂන් සභාව සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව**: ප්‍රදානයන් පරිපාලනය සහ හවුල්කරුවන්ගේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම.

• **පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන**: මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ ප්‍රජා සත්කාර වැඩසටහන් ව්‍යාප්තිය.

• **පුද්ගලික අංශය/ ආයතනික සමාජ වගකීම් සහාය**: යටිතල පහසුකම්, වාහන හෝ ද්‍රව්‍යමය සහාය සඳහා අරමුදල් සැපයීම.

• **ප්‍රදේශීය වැවිලි සමාගම් සහා වැවැලි සමාගම් භාරය**: වැවිලි ක්ෂේත්‍රයට විශේෂිත සත්කාර සේවා දියත් කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- රාජ්‍ය/ පෞද්ගලික හවුල්කාරිත්ව මාර්ගෝපදේශ සහ සේවාවන්හි ගුණාත්මක තත්ත්වය පිළිබඳ වන බලපත්‍ර.
- බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ පොදු ලේඛනය.
- ආපදා ප්‍රතිචාර වැඩසටහන් පිළිබඳ රාජ්‍ය නොවන සංවිධාන සමඟ වන අවබෝධතා ගිවිසුම

**ඇගයීම් රාමුව සහ අධීක්ෂණය:**

- රාජ්‍ය/ පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන් හි වාර්ෂික කාර්ය සාධන සමාලෝචනය.
- වැඩසටහන් පිළිබඳ ප්‍රතිලාභීන්ගේ තෘප්තිය පිළිබඳ සමීක්ෂණ.
- බලපත්‍ර අනුකූලතා විගණන සහ ආපදා-සූදානම තක්සේරු කිරීම්.

**සම්පත්/ ධාරිතා අවශ්‍යතා:**

• සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය තුළ ඇති රාජ්‍ය/ පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන් ඒකකය.
• කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රදාන පරීක්ෂා කිරීම.
• රාජ්‍ය නොවන සංවිධාන හවුල්කරුවන්ට ප්‍රවේශ විය හැකි ආපදා හදිසි අරමුදල්.

## 3 වන කුළුණ : සමාජ රක්ෂණය

### 3.1. අවිධිමත් අංශයේ සේවකයින් සමාජ රක්ෂණයට ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම

*ආර්ථික සුරක්ෂිතතාවය සහ සමාජ සමානාත්මතාවය පෝෂණය කරමින් අවිධිමත් අංශයේ සේවකයින් සඳහා සමාජ රක්ෂණ ආවරණය පුළුල් කිරීම මගින් ශ්‍රම බලකායේ විශාල සහ අවදානමට ලක්විය හැකි කොටසකට ආරක්ෂාව සහතික කිරීම.*

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය:**

**3.1.1. අවිධිමත් අංශයේ සේවකයින්ට සුහුරු දුරකතන හෝ ප්‍රජා ඩිජිටල් KIOSKS හරහා සෘජුවම කුඩා, නම්‍යශීලී විශ්‍රාම වැටුප් සහ රක්ෂණ දායකත්වයන් ලබා දීමට ඉඩ සලසන පරිශීලක-හිතකාමී ජංගම සහ වෙබ් පද්ධති සැලසුම් කර දියත් කරන අතර ප්‍රවේශ්‍යතාව උපරිම කිරීම සඳහා මෙම පද්ධති බහුභාෂා සහාය සහ සරල අතුරුමුහුණත් ලබා දිය යුතුවේ.**

• **ප්‍රවේශ විය හැකි ඩිජිටල් විසඳුම්:** අවිධිමත් සේවකයින්ගේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ජංගම යෙදුම් සහ වෙබ් ද්වාර යන දෙකම සහිත ඩිජිටල් පද්ධති සංවර්ධනය කෙරේ, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට සීමිත ඩිජිටල් සාක්ෂරතාවයක් තිබිය හැකි බැවින් . විශේෂාංගවලට සරල සංචාලනය, පැහැදිලි නිරූපක සහ පියවරෙන් පියවර මඟ පෙන්වීම ඇතුළත් විය යුතු වේ.

• **නම්‍යශීලී ගෙවීම් විකල්ප:** අවිධිමත් අංශයේ ඊ.කියාවන්හි සුලබව දක්නට ලැබෙන අක්‍රමවත් සහ උච්චාවචනය වන ආදායමට ගැලපෙන, විවිධ වට්නාකම් වලින් සහ කුඩා ප්‍රමාණවලින් මෙන්ම සහ වාර ක්‍රමයකට දායක විය හැකි ක්‍රම ඇති කිරීම.

**බහුභාෂා සහාය**: ශ්‍රී ලංකාවේ ජනගහන විවිධත්වය සලකමින් පුළුල් ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් අතුරු මුහුණත් සහාය ලබා දීම.

**ප්‍රජා ප්‍රවේශ ස්ථාන:** පුද්ගලික සුහුරු දුරකතන හෝ අන්තර්ජාල ප්‍රවේශය නොමැති සේවකයින් සඳහා ප්‍රජා මධ්‍යස්ථාන, ග්‍රාම නිලධාරී කාර්යාල සහ අනෙකුත් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ඩිජිටල් KIOSKS හෝ දත්ත පුවරු ස්ථාපිත කිරීම.

• **අන්තර්ජාල පහසුකම් ආවරණය අඩු කලාප** : අන්තර්ජාල පහසුකම් දුර්වල මට්ටමක දී මෙන්ම ග්‍රාමීය සහ දුරස්ථ ප්‍රදේශවල ද කාර්යක්ෂමව ක්‍රියා කිරීමට පහසුකම් සැලසීම සඳහා පසුකාලීන සමමුහුර්තකරණය (Synchronization) සමඟ අන්තර්ජාල පහසුකම් නොමැතිව දත්ත ඇතුළත් කිරීමේ පුවරු සැලසුම් කිරීම.

---

**3.1.2. සමාජ දත්ත පද්ධති හෝ දරිද්‍රතා දත්ත සමුදායන් හරහා සත්‍යාපනය කරන ලද සුදුසුකම් නිර්ණායක සමඟ, බඳවා ගැනීම දිරිගැන්වීම සහ මූල්‍ය බාධක අඩු කිරීම සඳහා දිළිඳුතම අවිධිමත් අංශයේ සේවකයින් ඉලක්ක කරගත් රජයේ සම-දායකත්ව යෝජනා ක්‍රමයක් සංවර්ධනය කිරීම.**

• **මූල්‍ය දිරිගැන්වීම්:** නිර්වචනය කරන ලද දරිද්‍රතා සීමාවන්ට පහළින් සිටින අවිධිමත් අංශයේ සේවකයින්ගේ දායකත්ව මූල්‍ය බර ලිහිල් කිරීම සහ ඇතුළත් වීම, දිරි ගැන්වීම සඳහා ගැලපෙන සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

• **ඉලක්කගත සුදුසුකම්:** සුදුසුකම් ලත් පුද්ගලයින් නිවැරදිව හඳුනා ගැනීම සහ සුදුසුකම් නොපිරු අය වෙත ප්‍රතිලාභ කාන්දු වීම වැළැක්වීම සඳහා පවතින සමාජ දත්ත, දරිද්‍රතා දත්ත සමුදායන් හෝ ජාතික ප්‍රතිලාභී ලැයිස්තු භාවිතා කිරීම.

• **අන්තර්කරණය දිරි ගැන්වීම:** සමාජ රක්ෂණ වැඩසටහන් සමඟ තිරසාර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නිතිපතා ගෙවීම් අනුකූලතාවයට සහ අඛණ්ඩ සහභාගීත්වයට සම-දායකත්වයන් එකතු කිරීම.

• **වගවීම සහ විනිවිදභාවය:** අපේක්ෂිත ප්‍රතිලාභීන්ට අරමුදල් සාධාරණව හා කාර්යක්ෂමව බෙදා හැරෙන බව සහතික කිරීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ සහ කාලානුරූප විගණන ස්ථාපිත කිරීම.

**3.1.3**. **අවම දායකත්වයන්ට අනුකූල වීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය සහතික කරමින්, අවිධිමත් අංශයේ සේවකයින් සක්‍රීයව හඳුනා ගැනීමට, ලියාපදිංචි කිරීමට සහ සමාජ රක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින ක්ෂේත්‍ර ජාලය (කම්කරු නිලධාරීන්, කම්කරු පරීක්ෂකවරුන්) සහය කර ගැනීම**.

• **ක්ෂේත්‍ර සේවා කණ්ඩායම්:** ස්වකීය ප්‍රජාවන්හි අවිධිමත් අංශයේ සේවකයින් පුද්ගලිකව හඳුනා ගැනීම සහ බඳවා ගැනීම සිදු කිරීම සඳහා ප්‍රදේශ ගැන දැනුම ඇති කම්කරු නිලධාරීන් සහ පරීක්ෂකවරුන්ගේ සහාය.

• **ස්ථානීය ලියාපදිංචිය:** සේවකයින් ක්ෂණිකව ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ගේ පළමු දායකත්වයන් ලබා දීමට සහාය වීමට ඩිජිටල් පද්ධතිවට සම්බන්ධ ජංගම උපාංග සමඟ ක්ෂේත්‍ර නිලධාරීන් ශක්තිමත් කිරීම.

• **අනුකූලතා අධීක්ෂණය:** අඛණ්ඩ දායකත්ව ගෙවීම් සත්‍යාපනය කිරීමට, සහාය වීමට හෝ සිහි කැඳවීම් කිරීමට ලියාපදිංචි වූ අවිධිමත් අංශයේ සේවකයින් සමඟ නිතිපතා පසු විපරම් කිරීමට කම්කරු නිලධාරීන් ගේ සහය ලබා ගැනේ.

• **දත්ත රැස් කිරීම සහ වාර්තා කිරීම:** ක්ෂේත්‍ර කණ්ඩායම් විසින්, බඳවා ගැනීමේ ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ අනුකූලතා අනුපාත පිළිබඳ වාර්තා නිතිපතා මධ්‍යම කාර්යාලයන්ට ඉදිරිපත් කිරීම.

---

**3.1.4. සමාජ රක්ෂණයේ ප්‍රතිලාභ සහ ක්‍රියා පටිපාටි පිළිබඳව අවිධිමත් අංශයේ සේවකයින් දැනුවත් කිරීම සඳහා පළාත් පාලන ආයතන, ග්‍රාම නිලධාරී කාර්යාල, වෘත්තීය සමිති සහ සිවිල් සමාජය හරහා ප්‍රචාරණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

• **බහු විධ සන්නිවේදනය:** සමාජ රක්ෂණ ප්‍රතිලාභ, සුදුසුකම්, ඇතුළත් වීමේ පියවර සහ දායකත්ව ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරු බෙදා හැරීම සඳහා පත්‍රිකා, පෝස්ටර්, ප්‍රාදේශීය ගුවන්විදුලිය, සමාජ මාධ්‍ය සහ ප්‍රජා රැස්වීම් භාවිතා කිරීම.
• **විශ්වාසදායක පණිවිඩ හා පණිවිඩකරුවන්:** පණිවිඩ යැවීමේදී විශ්වාසය සහ විශ්වසනීයත්වය ගොඩනැගීමට, සමාජ රක්ෂණය පිළිබඳ වැරදි වැටහීම් ආමන්ත්‍රණය කිරීමට ග්‍රාම නිලධාරීවරුන්, වෘත්තීය සමිති නායකයින්, ප්‍රජා නායකයින් බලපෑම් කරන්නන් සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කර ගැනීම.
• **ඉලක්කගත දනුවත් කිරීමේ වැඩසටහන්:** සංස්කෘතික වශයෙන් අදාළ අන්තර්ගතයන් සහිතව සහ උදාහරණ සමඟ තෝරා ගත් නිශ්චිත අවිධිමත් අංශයේ සේවක කණ්ඩායම් (උදා: වීදි වෙළෙන්දන්, ගෘහ සේවකයින්, කුඩා පරිමාණ ගොවීන්) වෙත ළඟා වීම.
• **ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ**: මෙම වැඩසටහන් පිළිබඳ අවිධිමත් අංශයේ සේවකයින් සඳහා; ප්‍රශ්න ඇසීමට, අදහස් ලබා දීමට සහ ලියාපදිංචි වීම, හෝ දායකත්ව ගෙවීමට ඇති බාධක වාර්තා කිරීමට ඩිජිටල් පුවරු, ක්ෂනික ඇමතුම් අංක, අදහස්/ යෝජනා පෙට්ටි ඇති කිරීම.

---

**3.1.5. ජාතික ඩිජිටල් හැඳුනුම්පත් පද්ධතිය සමඟ ලියාපදිංචි කිරීම, දායකත්ව සත්‍යාපනය සහ වාර්තා තබා ගැනීම විධිමත් කිරීම සඳහා අනෙකුත් විද්‍යුත් රාජ්‍ය සේවාවන් සමඟ ඒකාබද්ධ කිරීම.**

• **ජාතික හැඳුනුම්පත් සම්බන්ධ කිරීම**: නිවැරදි ප්‍රතිලාභියා හඳුනා ගැනීම, ද්විකරණය සහ වංචා වැළැක්වීම සහ රාජ්‍ය ආයතන හරහා බාධාවකින් තොරව දත්ත බෙදා ගැනීම දිරිමත් කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් පද්ධතිය භාවිතා කිරීම.

• **ඊ- රාජ්‍ය සේවා ඒකාබද්ධතාවය**: සමස්ථ සේවා සැපයීම සහ සුදුසුකම් සත්‍යාපනය සක්‍රීය කිරීම සඳහා බදු වාර්තා, සමාජ සුභසාධන දත්ත සමුදායන් සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු වැනි පවතින ඩිජිටල් රාජ්‍ය සේවාවන් සමඟ සමාජ රක්ෂණ පද්ධති සම්බන්ධ කිරීම.

• **ස්වයංක්‍රීය සත්‍යාපනය**: සේවක අනන්‍යතාවය, සුදුසුකම් සහ දායකත්ව තත්ත්වය තහවුරු කිරීම සඳහා තත්කාලීන සත්‍යාපන ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම.

• **දත්ත ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය**: පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම, රහස්‍යතා රෙගුලාසි වලට අනුකූල වීම සහ පද්ධතිය තුළ පරිශීලක විශ්වාසය ගොඩනැගීම සඳහා ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

• **අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රමිතීන්:** අනෙකුත් සමාජ ආරක්ෂණ වැඩසටහන් හෝ මූල්‍ය සේවා සමඟ අනාගත ව්‍යාප්තිය සහ ඒකාබද්ධ වීමට ඉඩ සලසන විවෘත දත්ත සහ අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රමිතීන් අනුගමනය කිරීම.

---

මෙම සවිස්තරාත්මක මෙහෙයුම් පියවර එක්ව, රජයේ අධීක්ෂණය සහ මානව සබඳතා සමඟ ඩිජිටල් නවෝත්පාදනය, අවිධිමත් අංශයේ සේවකයින් අන්තර්ගත, ප්‍රවේශ විය හැකි සහ තිරසාර සමාජ රක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරනු ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- **කම්කරු දෙපාර්තමේන්තුව (DoL):** සේවක ලියාපදිංචිය, අනුකූලතා අධීක්ෂණය සහ ප්‍රවේශය.
- **මුදල් අමාත්‍යාංශය (MoF):** සම-දායකත්ව යෝජනා ක්‍රම සඳහා අයවැය සහ සහනාධාර වෙන් කිරීම.
- **විදුලි සංදේශ සේවා සපයන්නන්:** විශ්වාසදායක ජංගම සම්බන්ධතා සහ ඩිජිටල් ගෙවීම් විසඳුම් සැපයීම සඳහා හවුල්කරුවන් වේ.
- **පළාත් පාලන සහ ග්‍රාම නිලධාරීන් :** ලියාපදිංචි කිරීමේදී දුරස්ථව වෙසෙන අයට පහසුකම් සැලසීම සහ අවිධිමත් අංශයේ සේවකයින්ට සහාය වීම.
- **රාජ්‍ය නොවන සංවිධාන සහ වෘත්තීය සමිති:** දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- DoL, MoF සහ ඩිජිටල් සේවා සපයන්නන් සම්බන්ධ කරන අන්තර් ආයතන කාර්ය සාධක බලකාය.
- තත්‍ය කාලීන ලියාපදිංචිය නිරීක්ෂණය කිරීම සඳහා ජංගම පද්ධති විශ්ලේෂණ සහ වාර්තාකරණ උපකරණ පුවරු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව**

- ලියාපදිංචි වී මාසිකව දායක වන අවිධිමත් අංශයේ සේවකයින් සංඛ්‍යාව
- නිරීක්ෂණයදායකත්ව අනුකූලතා අනුපාත සහ සම-දායකත්ව බෙදාහැරීමේ නිරවද්‍යතාවය මැනීම
- සේවා පිළිබඳ අවිධිමත් සේවකයින්ගේ දැනුවත්භාවය සහ තෘප්තිය සමීක්ෂණය කිරීම

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- දුරකථන සංඥා දුර්වල ප්‍රදේශවලටද ගැලපෙන බහු භාෂා ජංගම යෙදුම් සංවර්ධනය කිරීම.
- ඩිජිටල් ලියාපදිංචි කිරීමේ මෙවලම් පිළිබඳ DoL ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණුව.
- අවිධිමත් ආර්ථික සේවකයින් සඳහා සකස් කරන ලද ප්‍රජා සම්බන්ධතා ද්‍රව්‍ය.

---

## 3.2. **ඉහළ කාර්යක්ෂමතාවයක් සඳහා සමාජ රක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම**

*සම්බන්ධීකරණය කරන ලද පාලනය සහ ඩිජිටල් ලෙස ඒකාබද්ධ කිරීම හරහා විවිධ කොටස් වලට කැඩී ඇති රක්ෂණ වැඩසටහන් ඒකාබද්ධ කිරීම මඟින් අංශ හරහා සුවහ බව, පරිපාලන කාර්යක්ෂමතාව සහ ප්‍රතිලාභ සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීම . මෙමගින් නව ආයතන ඇති නොකරමින් දත්ත සහ සේවාවන් එකට එක්කර ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිවකට (ISIP) සම්බන්ධ කිරීම*

මෙහෙයුම් යාන්ත්‍රණ:

**3.2.1. ආයතන අතර සම්බන්ධීකරණය සහ එකඟතාව ශක්තිමත් කිරීම**

• **සම්බන්ධීකරණය කරන ලද පාලනය**: ප්‍රතිපත්ති සහ මෙහෙයුම් වල පෙළගැස්ම අධීක්ෂණය කිරීම සඳහා පවතින ආයතන (සේවක අර්ථසාධක අරමුදල, සේවක භාර අරමුදල, අග්‍රහාර සහ අවිධිමත් අංශයේ සේවක වැඩසටහන්) අතර විධිමත් සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කිරීම.

• **යෝජනා ක්‍රම පෙළ ගැස්වීම :** ආයතනික ස්වාධීනත්වය ආරක්ෂා කරමින් සියලුම යෝජනා ක්‍රම හරහා දායකත්ව අනුපාත, ප්‍රතිලාභ සූත්‍ර, සුදුසුකම් නිර්ණායක සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි පෙළගැස්වීම .

• **පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය:** මනා සම්බන්ධීකරණය සහ තීරණ ගැනීම සහතික කිරීම සඳහා අමාත්‍යාංශ, සේවා යෝජකයින්, සේවකයින්, වෘත්තීය සමිති සහ සේවා සපයන්නන් අතර අදහස් හුවමාරුවට සහ එක්ව ක්‍රියා කිරීමට පහසුකම් සැලසීම.

---

**3.2.2. සුවහ බව සහ විනිවිදභාවය සඳහා අන්තර් ක්‍රියාකාරී දත්ත පද්ධති සංවර්ධනය කිරීම**

**දත්ත ඒකාබද්ධ කිරීම:**ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිව සමඟ සම්බන්ධ අන්තර් ක්‍රියාකාරී තොරතුරු තාක්ෂණ පද්ධති හරහා සියලුම යෝජනා ක්‍රම එකිනෙක සම්බන්ධ කිරීම , දායකත්ව සහ ප්‍රතිලාභ ඉතිහාසයන් තනි, සවිස්තරාත්මක වාර්තාවකට ඒකාබද්ධ කිරීම**.**

**ප්‍රතිලාභ වල සුවහ බව** :සේවකයින්ට තම සියලු ප්‍රතිලාභ බාධාවකින් තොරව රැකියා, අංශ සහ ප්‍රදේශ අතර ගෙන යාමේ අවස්ථාව සැලසීම

**තත්කාලීන යාවත්කාලීන කිරීම**: සියලු යෝජනා ක්‍රමයන්හි දායකත්ව සහ හිමිකම් සැනෙකින් පිළිබිඹු වන බව සහතික කිරීම-

• **පරිශීලක කේන්ද්‍රීය ප්‍රවේශය** : ප්‍රතිලාභ නිරීක්ෂණය කිරීමට, හිමිකම් කළමනාකරණය කිරීමට සහ ස්වාධීන ගිණුම් හුවමාරුවීම් නිරීක්ෂණය කිරීමට ප්‍රතිලාභීන්ට ඩිජිටල් ද්වාර සහ ජංගම යෙදුම් ලබා දීම

.

---

**3.2.3. දායකත්වයන් , හිමිකම් සහ ප්‍රතිලාභ කළමනාකරණය සඳහා ඒකීය ඩිජිටල් පද්ධතිවක් සැදීම**

• **මධ්‍යගත දායකත්වය සහ හිමිකම් කළමනාකරණය**: සේවා යෝජකයින්ට, සේවකයින්ට සහ ස්වයං රැකියාලාභීන්ට තනි අතුරු මුහුණතක් හරහා සියලුම යෝජනා ක්‍රම සඳහා දායකත්ව සහ හිමිකම් කළමනාකරණය කළ හැකිය.

**ප්‍රමිතිගතකල ක්‍රියා පටිපාටින්** : ලියාපදිංචිය, දායකත්වයන්, හිමිකම්, අභියාචනා සහ ආරවුල් විසඳීම සඳහා ප්‍රමිතිගත නීති සහ ලියකියවිලි ස්ථාපිත කිරීම

**ඒකාබද්ධිතවූ පාරිභෝගික සේවය**: ප්‍රතිලාභීන් සහ සේවා යෝජකයින් සඳහා ඇමතුම් මධ්‍යස්ථාන, මාර්ගගත සංවාද සහ ප්‍රාදේශීයව සේවා සපයන ස්ථාන ඇතුළු ඒකාබද්ධ සහාය සේවා පිරිනැමීම

**විශ්ලේෂණ සහ වාර්තාකරණය**: කාර්ය සාධනය, අනුකූලතාවය සහ සේවා පරතරය හෝ බාධක හඳුනා ගැනීම නිරීක්ෂණය කිරීමට, පෙර සකසන ලද දත්ත විශ්ලේෂණ භාවිතය

---

### 3.2.4 මෙහෙයුම් සහ නියාමන ප්‍රතිසංස්කරණ තුළින් පරිපාලන ක්‍රියාවලීන් සරල කිරීම

• **නීතිමය එකඟතාවය**: යෝජනා ක්‍රම හරහා ඒකාබද්ධ පාලනය, වාර්තා කිරීම සහ මෙහෙයුම් විධාන සඳහා පවතින නීති සහ රෙගුලාසි සමාලෝචනය කර සම්බන්ධ කිරීම

• **අනවශ්‍ය දෑ ඉවත් කිරීම**: කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අතිඡේදනය වන කාර්යයන්, සුදුසුකම් නිර්ණායක සහ එකිනෙක ගැටෙන ප්‍රතිලාභ නීති හඳුනාගෙන ඉවත් කිරීම

• **විධිමත් කරන ලද අනුකූලතා:** සේවා යෝජකයින් සහ සේවකයින් සඳහා ලියාපදිංචි කිරීම් , වාර්තා කිරීම් සහ විගණන ක්‍රියාවලීන් සරල කිරීම.

• **ධාරිතා වර්ධනය**: මනා ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ඩිජිටල් පද්ධති, සම්බන්ධිත ක්‍රියා පටිපාටි සහ ආයතන අතර සම්බන්ධීකරණය පිළිබඳව කාර්ය මණ්ඩල පුහුණු කිරීම

**.බලපෑම:**

මෙම පියවර මගින් ශ්‍රී ලංකාවේ සමාජ රක්ෂණ ක්‍රියාවලිය නව ආයතනික ව්‍යුහයන් නිර්මාණය නොකරමින් , ආවරණය උපරිම කරන, පරිපාලන දුෂ්කරතා අඩු කරන සහ පරිණාමය වන ශ්‍රම වෙළඳපොළට අනුවර්තනය වන ඒකාබද්ධ, කාර්යක්ෂම සහ පරිශීලක-හිතකාමී පද්ධතියක් බවට පරිවර්තනය කිරීම අරමුණු කරයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **කම්කරු අමාත්‍යාංශය:** ආයතන අතර සම්බන්ධීකරණය සහ නියාමනයන් පෙළගැස්වීම මෙහෙයවීම.

• **සේවක අර්ථසාධක අරමුදල, සේවක භාර අරමුදල, සහ අග්‍රහාර මණ්ඩල**: එකඟ වූ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සහ ඒකා සමඟ ඒකාබද්ධ කිරීම.

• **මුදල් අමාත්‍යාංශය**: අරමුදල් සහ මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම.

• **තොරතුරු තාක්ෂණ ආයතන**: අන්තර් ක්‍රියාකාරී ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම

.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ආයතන අතර ක්‍රියාකාරී කණ්ඩායම් සහ එකඟතා කමිටු.
• ප්‍රතිලාභීන් සඳහා එක් පුරණය වීමකින් පිවිසිය හැකි විවිධ ඩිජිටල් පද්ධති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• පරිපාලනමය කාර්යක්ෂමතාවයෙන් ලද ජයග්‍රහණ නිරීක්ෂණය කිරීම
• ප්‍රවේශවීමේ හැකියාව සහ සුවහ බව පිළිබඳ ප්‍රතිලාභී තෘප්තිය මැනීම
• යෝජනා ක්‍රමයන් හී සුවහ බව ,සිද්ධි සහ ආරවුල් විසඳීම නියාමනය

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති සකස් කිරීම සහ නඩත්තු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කණ්ඩායම් .
• ආයතනික ශක්තිමත් කිරීම සඳහා වෙනස් වීම් කළමනාකරණ විශේෂඥයින්
• අඛණ්ඩ උපදේශන සහ ප්‍රතිපෝෂණ සඳහා කොටස්කරුවන්ගේ සම්බන්ධීකරණ සංසද.

---

**3.3. අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා විශ්වීය අවදානම් ආරක්ෂාව සහතික කිරීම**

***මාතෘත්වය, ආබාධිතභාවය සහ ළමා සෞඛ්‍යය වැනි සමාජ අවදානම් වලට මුහුණ දීමට පුළුල් ආවරණයක් ලබා දීම - සමාජයේ සියලුම කොටස් සඳහා ආරක්ෂාවේ ආවරණය තුළ බව ප්‍රවර්ධනය කිරීම සහ අසමානතාවය අඩු කිරීම***

**මෙහෙයුම් යාන්ත්‍රණය**:

**3.3.1 මාතෘත්වය, ආබාධිතභාවය සහ ළමා සෞඛ්‍යය වැනි ප්‍රධාන සමාජ අවදානම් ඉලක්ක කර ගනිමින් සහනාධාර ලෙස හෝ නොමිලේ ලබාදෙන රක්ෂණ සේවා හඳුන්වා දීම.**

• **ඉලක්කගත ආවරණය :** ප්‍රධාන සමාජ අවදානම් මුල් කර ගත්, අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ගැලපෙන රක්ෂණ සේවා, විශේෂයෙන් කාන්තාවන් සඳහා මාතෘ සත්කාර, ආබාධ සහිත පුද්ගලයින් සඳහා ආබාධිත සහාය සහ පුළුල් ළමා සෞඛ්‍ය සේවා සංවර්ධනය කිරීම

• **උපායමාර්ගික සහනාධාර:** රක්ෂණ සඳහා වන පුළුල් ප්‍රවේශය සහ සමානාත්මතාවය සහතික කිරීම සඳහා අඩු ආදායම්ලාභී සහ සමාජයෙන් දුරස්ව වෙසෙන ජනගහනය සඳහා සම්පූර්ණයෙන්ම සහනාධාර ලෙස හෝ දැරිය හැකි වාරික සහිතව රක්ෂණ යෝජනා ක්‍රම පිරිනැමීම.

 **විවිධ ආකෘතීන්ගෙන් ආදර්ශ ලබාගැනීම :** සමාජ සෞඛ්‍ය රක්ෂණය පුළුල් කිරීමේදී මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා විශ්වීය රාමුවක් යටතේ ආවරණය කිරීමට ජාත්‍යන්තර අත්දැකීම් වලින් පාඩම් ලබා ගනිමින් ගුණාත්මක සත්කාර සහ මූල්‍ය ආරක්ෂාව සහතික කිරීම.

• **සේවා පැකේජ:** පූර්ව ප්‍රසව, දරු ප්‍රසූතිය, පශ්චාත් ප්‍රසව සත්කාර, පුනරුත්ථාපනය, සහායක උපාංග සහ ළමා ප්‍රතිශක්තිකරණ සහ පෝෂණ ආවරණය වන ප්‍රතිලාභ සේවා පැකේජ හඳුනා ගැනීම

• **සේවා සැපයුම්කරුවන්ගේ ජාල :** භූගෝලීය ආවරණය සහ ගුණාත්මකභාවය සහතික කරමින් මෙම සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් සමඟ ගිවිසුම්ගත වීම

---

**3.3.2. සෞඛ්‍ය රක්ෂණ ලියාපදිංචි කිරීම් සහ හිමිකම් දත්ත,ජාතික හැඳුනුම්පත් (NIC) පද්ධතිය සහ සෞඛ්‍ය සේවා බෙදාහැරීමේ වාර්තා සමඟ ඒකාබද්ධ කිරීම තුළින් සුදුසුකම් සත්‍යාපනය විධිමත් කිරීම සහ අවභාවිතය අවම කිරීම**

**දත්ත සම්බන්ධතාවය:**ඉක්මන් සහ විශ්වාසදායක අනන්‍යතා සත්‍යාපනය සක්‍රීය කිරීම වෙනුවෙන් පුද්ගල සෞඛ්‍ය රක්ෂණ ලියාපදිංචි කිරීම් සහ හිමිකම් දත්ත සමුදායන් ජාතික හැඳුනුම්පත් පද්ධතිය සමඟ සම්බන්ධ කරන අන්තර් ක්‍රියාකාරී ඩිජිටල් පද්ධති නිර්මාණය කිරීම

• **සුදුසුකම් පරීක්ෂාවන්:** සමාජ-ආර්ථික තත්ත්වය, රැකියාව හෝ විශේෂ අවශ්‍යතා මත පදනම්ව රක්ෂණ ප්‍රතිලාභ සඳහා වන සුදුසුකම් ස්වයංක්‍රීයව සත්‍යාපනය කිරීමට සහ අතින් කෙරෙන ලේඛන කටයුතු අවම වූ ඒකාබද්ධ කරන ලද දත්ත භාවිතා කිරීම

• **අවභාවිතාව / වංචා වැළැක්වීම:** හිමිකම් සහ ප්‍රතිලාභීන් ද්විකරණය සහ වෙනත් වංචනික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ වැළැක්වීම වෙනුවෙන් සෞඛ්‍ය සේවා සැපයුම් වාර්තා (උදා: රෝහල් ගතවීම්, ප්‍රතිකාර සටහන්) හිමිකම් හරස් පරීක්ෂාවන්ට ලක් කිරීම.

• **තත් කාලීන යාවත්කාලීන කිරීම්:** ප්‍රතිලාභී තත්ත්ව නිරවද්‍යතාව සහ ප්‍රතිලාභ භාවිතය සඳහා දත්ත, යාවත්කාලීන වන බව සහතික කිරීම

• **පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව:** ශක්තිමත් දත්ත ආරක්ෂණ ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීමෙන් සංවේදී පුද්ගලික සහ සෞඛ්‍ය තොරතුරු ආරක්ෂා කිරීම

**3.3.3. වැටුප් සහිත දෙමාපිය නිවාඩු (Paid Parental Leave) ක්‍රමයක් හඳුන්වා දීම.**

**රැකියාවල නියුතු දෙමාපියන්ට (විධිමත් සහ අවිධිමත් අංශයේ) වැටුප් සහිත නිවාඩු ප්‍රතිලාභ වෙත ප්‍රවේශ වීමට, ඉඩ සලසමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට සහ මුල් ළමාවිය රැකවරණය සඳහා සහාය වීම**

• **යෝජනා ක්‍රමය නිර්මාණය:** දරු ප්‍රසූතිය හෝ දරුකමට දරුවන් හදාවඩා ගැනීම වෙනුවෙන් අර්ථ දක්වන ලද කාලයක් සඳහා දෙමාපියන්ට ආදායම් සහාය ලබා දෙන, වැටුප් සහිත දෙමාපිය නිවාඩු වැඩසටහනක් ස්ථාපිත කිරීම

• **ඇතුළත් බවේ ආවරණය:** සරල කළ ඇතුළත් කිරීම් සහ නම්‍යශීලී ප්‍රවේශ විධිවිධාන හරහා අවිධිමත් ආර්ථිකයේ සේවකයින්, ස්වයං රැකියාලාභී දෙමාපියන් සහ කුඩා ව්‍යාපාරවල සේවකයින් ඇතුළත් කිරීමට යෝජනා ක්‍රමය පුළුල් කිරීම

• **ප්‍රතිලාභ ව්‍යුහය:** අලුත උපන් බිළිඳුන් හෝ දරුකමට හදාවඩා ගන්නා බිළිඳුන් රැකබලා ගන්නා කාලය අතරතුර දෙමව්පියන්ට ආදායම් සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා නිශ්චිත කාලයක් සඳහා වැටුප් සහිත නිවාඩු ලබා දීමට කටයුතු කිරීම

• **මුල් ළමාවිය රැකවරණය සඳහා සහාය:** මව්කිරි දීම, ප්‍රතිශක්තිකරණ සහ ළමා සෞඛ්‍ය සඳහා තීරණාත්මක කරුණු අවධාරණය කරමින්. මුල් ළමාවිය සංවර්ධනය ප්‍රවර්ධනය කරන වැඩසටහන් සමඟ වැටුප් සහිත නිවාඩු ප්‍රතිලාභ සම්බන්ධ කිරීම

• **සාධාරණත්ව පියවර(Equity Measures):** අඩු ආදායම්ලාභී පවුල්වල දෙමාපියන්ට මූල්‍ය දුෂ්කරතාවයකින් තොරව නිවාඩු ප්‍රතිලාභ ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා අවශ්‍ය විටෙක අමතර සහාය ලබා දීම.

---

**3.3.4. රැකියා අංශ හරහා වැටුප් සහිත දෙමාපිය නිවාඩු (PPL) සමපාත කිරීම**

**සියලුම සේවකයින් සඳහා ස්ථාවර දෙමාපිය නිවාඩු ප්‍රතිලාභ සහතික කිරීමෙන් බෙදාහදා ගත් රැකවරණ වගකීම් ප්‍රවර්ධනය කිරීම.**

**ප්‍රතිපත්ති පෙළගැස්ම:** දෙමාපියන්ගේ නිවාඩු සඳහා නීති, කාලසීමාව සහ සුදුසුකම් නිර්ණායක විධිමත් සහ අවිධිමත් රැකියා අංශ හරහා සමපාත කිරීම

**ප්‍රතිලාභ වල සුවහ බව :** අවිධිමත් රැකියා ඇතුළුව රැකියාවන් සහ රැකියා අංශ හරහා දෙමාපියන්ගේ නිවාඩු ප්‍රතිලාභ හුවමාරු කළ හැකි බව සහතික කිරීම

• **පීතෘ නිවාඩු**: පියවරුන්ට වැටුප් සහිත දෙමාපිය නිවාඩු ප්‍රතිලාභ පුළුල් කිරීම, මුල් ළමාවිය රැකවරණය සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම සහ රැකවරණ භූමිකාවන්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම.

• **ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී තොරතුරු** : දෙමාපියන්ගේ හවුල් වගකීම්වල වැදගත්කම සහ රැකබලා ගැනීමේදී පියවරුන් සම්බන්ධ වීමෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභ ඉස්මතු කරන දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

• **අධීක්ෂණය:** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ ප්‍රතිඵල තක්සේරු කිරීමට සහ අනාගත ප්‍රතිපත්ති සංශෝධනයන් හිදි  දෙමාපියන්ගේ නිවාඩු ප්‍රතිලාභ හිමිකම් නිරීක්ෂණය.

• මෙම ක්‍රියාමාර්ග එක්ව, අවදානමට ලක්විය හැකි ජනගහනයට සහාය වන, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන සහ ප්‍රවේශ විය හැකි, ඒකාබද්ධ සහ සාධාරණ රක්ෂණ සහ නිවාඩු ප්‍රතිලාභ හරහා මුල් ළමාවියේ යහපැවැත්ම වැඩිදියුණු කරන පුළුල් සමාජ අවදානම් ආරක්ෂණ පද්ධතියක් ගොඩ නැගිම.

---

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **සෞඛ්‍ය අමාත්‍යාංශය**: සෞඛ්‍ය රක්ෂණ සම්බන්ධතාවයන් සහ සේවා   ලබාදීම ඒකාබද්ධ කිරීම හා අධීක්ෂණය

• **කම්කරු අමාත්‍යාංශය**: වැටුප් සහිත දෙමාපිය නිවාඩු යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ නියාමනය කිරීම.

• **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**: ජාතික හැඳුනුම්පත්   දත්ත පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම කළමනාකරණය.

• **සේවායෝජකයින් සහ අවිධිමත් අංශයේ සේවක නියෝජිතයින්**: දැනුවත් කිරීම් සහ අනුකූලවීම සඳහා පහසුකම් සැපයීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• සමාජ අවදානම් හා ආරක්ෂාව පිළිබඳ අන්තර් අමාත්‍යාංශ කමිටුව.

• ජාතික හැඳුනුම්පත්   සහ සෞඛ්‍ය රක්ෂණ දත්ත සමුදායන් සම්බන්ධ කරන ඩිජිටල් සත්‍යාපන සිදු කෙරෙන   පද්ධති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

- මාතෘ, ආබාධිත සහ ළමා සෞඛ්‍ය රක්ෂණ පිළිබඳ ආවරණ අනුපාත
- ස්ත්‍රී පුරුෂ භාවය,  සේවා අංශය අනුව දෙමාපිය නිවාඩු ලබා ගැනීම සහ භාවිතය
- ළමා සෞඛ්‍යය සහ කාන්තා ශ්‍රම දායකත්වයේ අඛණ්ඩතාවය පිළිබඳ බලපෑම් තක්සේරු කිරීම්

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- ආරක්ෂිත දත්ත සම්බන්ධතාවය සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්
- නව ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ සේවා සපයන්නන් දැනුම්වත් කිරීම සඳහා පුහුණුව.
- අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ ව්‍යාපාර.

**3.4. ඩිජිටල් ලියාපදිංචිය සහ ප්‍රතිලාභවල සුවහ බව ක්‍රියාත්මක කිරීම**

**ජාතික හැඳුනුම්පත් පද්ධතිය හා සම්බන්ධ ඩිජිටල් පද්ධති භාවිතා කිරීමට බලය ලබාදෙමින් ප්‍රාදේශීය සහ රැකියා අංශ අතර බාධාවකින් තොරව ලියාපදිංචි කිරීම සහ යාවත්කාලීන කිරීම් හරහා , සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වල සුවහ බව තහවුරු කිරීම.**

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.4.1 බාධාවකින් තොරව ලියාපදිංචිය සහ දායක මුදල් සහ හිමිකම් කළමනාකරණය සක්‍රීය කිරීම සඳහා ප්‍රාදේශීය සහ රැකියා අංශ අනුව ප්‍රවේශ විය හැකි, ජාතික හැඳුනුම්පත සම්බන්ධිත ජංගම සහ මාර්ගගත පද්ධති නිර්මාණය**

- **සමෝධානිත ඩිජිටල් ප්‍රවේශ පහසුකම** : පුද්ගලයින්ට ඕනෑම වේලාවක සහ ඕනෑම තැනකදී සමාජ රක්ෂණ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට, දායක මුදල් ලබා දීමට සහ හිමිකම් ගොනු කිරීමට හැකි වන පරිදි ජාතික හැඳුනුම්පත් (NIC) පද්ධතියට සෘජුවම සම්බන්ධ කර ඇති පරිශීලක-හිතකාමී ජංගම යෙදුම් සහ වෙබ් ද්වාර සංවර්ධනය කිරීම

- **විවිධ ඩිජිටල් පද්ධති අනුකූලතාව:** පරිශීලකයන් ගේ විවිධ මනාපයන් සහ විවිධ තාක්ෂණික හැකියාවන්ට ඉඩ සැලසෙන පරිදි ස්මාර්ට්ෆෝන්, ටැබ්ලට් සහ ඩෙස්ක්ටොප් පරිගණකවල අදාළ පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

**සියලු දෙනා ආවරණය වන ලෙස නිර්මාණය:** නම්‍යශීලි අතුරුමුහුණත් සහ දායකත්ව ලබා දීමේ ක්‍රම ආදායම් රටාවන්ට ගැලපෙන පරිදි නිර්මාණය කිරීමෙන් විධිමත්, අවිධිමත්, ස්වයං රැකියාලාභීන්, ගිග් ආර්ථික සේවකයින් ආදී විවිධ රැකියාවන්හි නියුක්තිකයන්ට සේවය ලබාදීම

- **තත්කාලීන සැකසුම්:** අනුමැතිය ලබා ගැනීම් සහ ගෙවීම් කඩිනම් කිරීම සඳහා ලියාපදිංචිය සහ හිමිකම් ලබා ගැනීමේ කටයුතු ස්වයංක්‍රීය කිරීම මගින් පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ නිලධාරි මැදිහත්වීම් අවම කිරීම

- **බහුභාෂා සහාය:** ජනවාර්ගික සහ භාෂා වෙනස්කම් අනුවර්තිත දේශීය භාෂාවලින් සමන්විත අතුරුමුහුණත් ලබා දීම.

---

**3.4.2. විශේෂයෙන් ග්‍රාමීය සහ දුරස්ථ ප්‍රදේශවල පුද්ගලයන්ට ප්‍රවේශ වීමේ පහසුව උපරිම කිරීම සඳහා මාර්ගගත ද්වාර, ග්‍රාම නිලධාරී කාර්යාල, ජංගම ලියාපදිංචි කිරීමේ ඒකක සහ ප්‍රජා කියෝස්ක් (KIOSKS) ඇතුළු ලියාපදිංචි වීමට විවිධ මාර්ග ඇති කිරීම**

• **විමධ්‍යගත කළ ප්‍රවේශය:** විශ්වාසදායක අන්තර්ජාල පහසුකම් අහිමි හෝ ඩිජිටල් සාක්ෂරතාවයක් නොමැති පුද්ගලයින්ට සේවය කිරීම සඳහා භෞතිකව පැමිණ ලියාපදිංචි වීමේ ස්ථාන සමඟ ඩිජිටල් පද්ධති සම්බන්ධ කිරීම

• **ග්‍රාම නිලධාරී කාර්යාල:** ප්‍රතිලාභී ලියාපදිංචිය සහ සහාය සඳහා විශ්වාසදායක ස්ථාන ලෙස ප්‍රාදේශීය පරිපාලන කාර්යාල භාවිතා කිරීම, (පවතින රජයේ පවතින ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම)

• **ජංගම ලියාපදිංචි කිරීමේ ඒකක:** ටැබ්ලට් පරිගණක සහ ජංගම අන්තර්ජාල පහසුකම් සහිතව ප්‍රජා කණ්ඩායම් යොදවා ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවලට ගොස්, එම ස්ථානයේ දී ලියාපදිංචිය සහ දැනුම ලබාදීම සඳහා පහසුකම් සැලසීම.

• **ප්‍රජා ඩිජිටල් කියෝස්ක්:** ප්‍රවේශ විය හැකි ප්‍රජා මධ්‍යස්ථානවල (පුස්තකාල, තැපැල් කාර්යාල, ප්‍රජා මධ්‍යස්ථාන) කාර්ය මණ්ඩල සහිතව හෝ ස්වයං සේවා සහිත කියෝස්ක් ස්ථාපිත කිරීම, මගින් ප්‍රතිලාභීන්ට මඟ පෙන්වීමක් යටතේ ඔවුන්ගේ ගිණුම් ලියාපදිංචි කර කළමනාකරණය කිරීමට හැකිවීම.

• **දැනුම්වත් කිරීමේ වැඩසටහන්**: ලියාපදිංචි වීමේ විකල්පයන් සහ ලියාපදිංචි වීමෙන් ලබෙන ප්‍රතිලාභ පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා ප්‍රදේශ වලට ගැළපෙන ලෙස සකස් කළ ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත්වීම

---

### 3.4.3. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරිමට සහ සත්‍යපනය කිරීමට ආරක්ෂිත පරිගනක පද්ධති සංවර්ධනය කිරිම මගින් ප්‍රතිලාභී දත්ත ආරක්ෂා කිරීම සහ ප්‍රතිලාභ වල සුවහ බව විධිමත් කිරීම

• **ජෛවමිතික දත්ත ඒකාබද්ධ කිරීම:** ජාතික හැඳුනුම්පත් වාර්තාවලට සම්බන්ධ කර ඇති ජෛවමිතික සත්‍යාපන ක්‍රම (ඇඟිලි සලකුණු, මුහුණු හඳුනාගැනීම) භාවිතා කිරීම තුළින් ප්‍රතිලාභීන් ගේ අනන්‍යතාවය තහවුරු කිරීම, අනන්‍යතාවයන්ට සම්බන්ධ වංචා සහ ද්විත්ව ලියාපදිංචි කිරීම් වැළැක්වීම

• **ද්වි-සාධක සත්‍යාපනය:** ගිණුම් ප්‍රවේශය සිදුවන අතරතුර ආරක්ෂිත ස්ථර එකතු කිරීම ට කෙටි පණිවිඩ සේවා හෝ විද්‍යුත් තැපෑල හරහා යැවෙන එක්-වරක් මුරපද (OTP) වැනි ආරක්ෂිත පිවිසුම් ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම

• **දත්ත සංකේතනය:** සම්ප්‍රේෂණය සහ ගබඩා කිරීමේ දී පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා උසස් සංකේතාංකන ප්‍රමිතීන් භාවිතා කරමින් , රහස්‍යභාවය සහ දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූල වීම සහතික කිරීම

• **ප්‍රවේශ පාලනය :** අනවසර දත්ත භාවිතය අවම කිරීම සඳහා රජයේ ආයතන සහ සේවා සපයන්නන් ට ප්‍රවේශ වන්නාගේ භූමිකාව මත පදනම් ව සංවේදී දත්ත වෙත ප්‍රවේශය ලබාදීම

• **සුවහ බව තහවුරුව :** අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් සමඟ ප්‍රතිලාභී ගිණුම් සම්බන්ධ කිරීම මගින් රැකියා, ප්‍රදේශ, වැඩසටහන් වර්ග සහ පුද්ගලයන් අනුව දායකත්වයන්, ප්‍රතිලාභ සහ වාර්තා බාධාවකින් තොරව ලබා ගැනීමේ හැකියාව තහවුරු වීම

---

### 3.4.4. විනිවිදභාවය වැඩි දියුණු කිරීමට සහ සිදුවන ප්‍රමාදයන් අඩු කිරීම සඳහා තත් කාලීනව දායකත්වය සහ ප්‍රතිලාභ තොරතුරු සම්බන්ධ කිරීම.

• **සජීවී ගනුදෙනු අධීක්ෂණය:** දායකත්ව ගෙවීම් වාර්තා කිරීමට මෙන්ම විදහා දැක්වීමට සහ  දායක මුදල් ගෙවීම් සහ හිමිකම් තත්ත්වයන් ඉතා ඉක්මනින් ලබා ගැනීමට හැකිවන පරිදි , ඔවුන්ගේ ගිණුම් නිරීක්ෂණය කිරීමට හැකි පද්ධතියක් ප්‍රතිලාභීන් වෙනුවෙන් නිර්මාණය කිරීම

• **ස්වයංක්‍රීය දැනුම්දීම්**: දායකත්ව ගෙවීම්, හිමිකම් අනුමත කිරීම් හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව පරිශීලකයින් දැනුම්වත් කිරීම සඳහා කෙටි පණිවුඩ, විද්‍යුත් තැපැල හෝ වෙනත් යෙදුම් හරහා දැනුම්දීම

• **උපකරණ පුවරු ප්‍රවේශය:**  වගවීම සහ පරිශීලකයන්  සවිබලගැන්වීම වැඩි කෙරෙන පරිදි ප්‍රතිලාභීන්ට සහ පරිපාලකයින්ට ගිණුම් ක්‍රියාකාරකම් සාරාංශ කරන, පුවරු ප්‍රවේශය ලබාදීම

• **වංචා / අවභාවිත හඳුනාගැනීම**:  දර්ශනය වන සැක සහිත රටා හෝ නොගැලපීම් තත් කාලීනව සලකුණු කිරීමට, විශ්ලේෂණ ඒකාබද්ධ කිරීම මගින් වංචා වැළැක්වීම සහ ඒ පිළිබඳ විමර්ශන කඩිනම් වීම / සක්‍රීය කිරීම.

• **පරිපාලන ප්‍රමාදයන් අවම කිරීම:** අභ්‍යන්තර වැඩ ප්‍රවාහයන් ස්වයංක්‍රීයකරණය මගින්  හිමිකම් සහ දායකත්ව ක්‍රියාවලිය තුල සැකසුම් කාලය සහ දෝෂ අවම කිරීම.

මෙම පියවර එක්ව, සමාජ රක්ෂණ පරිපාලනය සඳහා ප්‍රවේශ විය හැකි, ආරක්ෂිත සහ විනිවිද පෙනෙන ඩිජිටල් පද්ධතියක් නිර්මාණය කරයි. එමගින් දත්ත  නිරවද්‍යතාවය සහතික කරන අතර  පරිශීලක අත්දැකීම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කෙරෙනු  ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**: ජාතික හැඳුනුම්පත් යටිතල පහසුකම් සහ සත්‍යාපන සේවා සැපයීම.
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය:** ප්‍රධාන පරිගණක පද්ධති  වැඩසටහන් සංවර්ධනය.
**පළාත් පාලන සහ ග්‍රාම නිලධාරී කාර්යාල:** ප්‍රාදේශීය ලියාපදිංචි කිරීමේ ස්ථාන සඳහා පහසුකම් සැලසීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ජාතික ඩිජිටල් අනන්‍යතාවය සහ විද්‍යුත් රාජ්‍ය පාලනය (e-governance)ඒකාබද්ධ කිරීමේ රාමු.
• විවිධ සේවා සැපයුම් ආකෘති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• ලියාපදිංචි කිරීමේ අනුපාත සහ ඇතුළත් කිරීම සඳහා ගතවන කාලය.
• වංචා හෝ දත්ත  නීති උල්ලංඝනය කිරීමේ සිදුවීම්.
• ලියාපදිංචි කිරීම සහ හිමිකම් ක්‍රියාවලීන් පිළිබඳ ප්‍රතිලාභී ප්‍රතිචාර.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• ක්ෂේත්‍ර නිලධාරීන් සහ ප්‍රතිලාභීන් සඳහා ඩිජිටල් සාක්ෂරතා පුහුණුව.
• තොරතුරු තාක්ෂණ  යටිතල පහසුකම් සහ සයිබර් ආරක්ෂාව සඳහා ආයෝජනය කිරීම.
• පරිශීලක සහාය සඳහා උපකාරක කාර්යාල සහ ඇමතුම් මධ්‍යස්ථාන.

**3.5. මතුව එන සේවක කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණ ආවරණය පුළුල් කිරීම**

*ඉක්මණින් වෙනස් වන රැකියා වෙළඳපොළක ගිග් සේවකයින් (Gig) නිදහස් සේවකයින් (Freelancers) ,සහ ස්වයං රැකියාලාභීන් ඇතුළත් කිරීම සඳහා සමාජ රක්ෂණ සහ සහනාධාර වැඩසටහන් නිර්මාණය කිරීමෙන් ආරක්ෂාව සහතික කිරීම*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.5.1. දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමවලට ගිග්, නිදහස් සේවකයින් සහ ස්වයං රැකියාලාභීන් සඳහා විධිමත් ඇතුළත් වීමේ මාර්ග නිර්මාණය කිරීම සඳහා ගිග් ආර්ථික පද්ධති (උදා: PickMe, Uber) සමඟ හවුල් වීම.**

- **උපායමාර්ගික සහයෝගීතාවය**: ප්‍රධාන ගිග් පද්ධති සමඟ විධිමත් හවුල්කාරිත්වයන් හෝ අවබෝධතා ගිවිසුම් (MOU) ස්ථාපිත කිරීම මගින් ඔවුන්ගේ ලියාපදිංචි සේවකයින් සමාජ රක්ෂණ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට ගෙන ඒමට පහසුකම් සැලසීම

- **ඒකාබද්ධ පද්ධති:** ගිග් පද්ධතිවලට ඔවුන්ගේම යෙදුම් හෝ වෙබ් අඩවි හරහා සෘජුවම සමාජ රක්ෂණ ලියාපදිංචිය සහ දායකත්ව විකල්ප ලබා දීමට ඉඩ සලසන ඩිජිටල් ප්‍රවේශ කවුළු (API) හෝ දත්ත බෙදාගැනීමේ ප්‍රොටෝකෝල සංවර්ධනය.

- **ඇතුළත් වීම් සඳහා සහාය:** පවතින විශ්වාසය සහ සන්නිවේදන නාලිකා උපයෝගී කරගනිමින්, ඔවුන්ගේ දෛනික යෙදුම් භාවිතය අතරතුර රක්ෂණ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට සේවකයින් දිරිමත් කිරීම සඳහා ඔවුන් ගේ පද්ධතිව-මගින් විමසීම් කිරීම් හෝ සිහිපත් කිරීම් සක්‍රීය කිරීම

- **සරල කළ සත්‍යාපනය:** අනන්‍යතා සත්‍යාපනය සහ ආදායම් විපරම් සඳහා පද්ධති දත්ත භාවිතා කෙරේ, සුදුසුකම් තහවුරු කිරීම සහ දායකත්ව ගණනය කිරීම් වේගවත් කිරීමද කෙරෙනු ඇත.

- **පුළුල් බඳවා ගැනීමේ ආවරණයන් :** බෙදාහැරීමේ සේවා, නිදහස් වෙළඳපොළවල් සහ අනෙකුත් නැගී එන ගිග් අංශ ඇතුළත් කිරීමට ඔන්ලයින් ඇනවුම් සේවා වලින් ඔබ්බට ආවරණය පුළුල් කිරීම

**3.5.2. අලුතින් නැගී එන සේවක කණ්ඩායම්වල බහුලව දක්නට ලැබෙන අක්‍රමවත් සහ විචල්‍ය ආදායම් සඳහා සුදුසු නම්‍යශීලී දායකත්ව කාලසටහන් සහ විකල්ප ගෙවීම් ක්‍රම සැලසුම් කිරීම**

- **නම්‍යශීලී ගෙවීම් සැලසුම්**: ගිග් සේවකයින් අතර සාමාන්‍ය ඉපැයීම්වල උච්චාවචනයන්ට ඉඩ සැලසීම සඳහා දෛනික, සතිපතා හෝ මාසික විකල්ප දායකත්ව ක්‍රම ඉදිරිපත් කිරීම

• **ක්ෂුද්‍ර දායකත්වයන්**: ස්ථාවර විශාල මුදල් ප්‍රමාණයන්ට වඩා ඔවුන්ගේ වර්තමාන ආදායමට සමානුපාතිකව දායක වීමට සේවකයින්ට හැකි වන පරිදි කුඩා, වර්ධක ගෙවීම් වලට ඉඩ ලබාදීම

• **විවිධ ගෙවීම් නාලිකා**: ප්‍රවේශ වීම් උපරිම කිරීම සඳහා ජංගම මුදල්, ඩිජිටල් මුදල් පසුම්බි, බැංකු මාරු කිරීම් සහ කියෝස්ක් වල මුදල් ගෙවීම් වැනි විවිධ ගෙවීම් ක්‍රම ලබාදීම

• **දායකත්ව නිවාඩු**: ආදායම් අඩු හෝ නොමැති කාලවලදී දායක මුදල් තාවකාලිකව අත්හිටුවීම හෝ අඩු කිරීම සඳහා විධිවිධාන හඳුන්වා දීම, මගින් අතහැර යෑමේ අවදානම අඩු කිරීම.

• **ස්වයංක්‍රීය අඩු කිරීම්**: හැකියාව තිබෙන විට සේවකයින් සඳහා පරිපාලන දු දුෂ්කරතා අඩු කිරීමට ගිග් පද්ධති ඉපැයීම්වලින් ස්වයංක්‍රීය වන අඩු කිරීම් සඳහා පහසුකම් සැපයීම.

### 3.5.3. සමාජ රක්ෂණ ප්‍රතිලාභ සහ ඇතුළත් වීමේ ක්‍රියාවලීන් පිළිබඳව මෙම සේවකයින් දැනුවත් කිරීම සඳහා සකස් කළ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සහාය සේවා සංවර්ධනය කිරීම

• **ඉලක්කගත සන්නිවේදනය:** ගිග් සහ නිදහස් සේවකයින්ගේ අවශ්‍යතා සහ වැඩ කරන ආකාරයන් ආමන්ත්‍රණය කරමින්, අදාළ භාෂාවන් සහ උදාහරණ භාවිතා කරමින්, විශේෂයෙන් ප්‍රජා සන්නිවේදන ව්‍යාපාර සැලසුම් කිරීම

• **ඩිජිටල් සාක්ෂරතා සහාය**: ලියාපදිංචි කිරීමේ සහ දායකත්වය ලබාදෙන පද්ධතිවල සැරිසැරීමට සේවකයින්ට උපකාර කිරීම සඳහා ජංගම යෙදුම් සහ සමාජ මාධ්‍ය හරහා ප්‍රවේශ විය හැකි පහසුවෙන් තේරුම් ගත හැකි ඩිජිටල් මාර්ගෝපදේශ, වීඩියෝ ගත නිබන්ධන සහ නිතර අසන ප්‍රශ්න ලබාදීම.

• **හෙල්ප්ලයින් සහ චැට් බොට්ස් (Helplines and Chatbots)** : ලියාපදිංචි කිරීමේ සහ හිමිකම් විමසීම් සඳහා සහාය වීම සඳහා හෙල්ප්ලයින්, චැට් බොට්ස් සහ ඇතුළු කැපවූ පාරිභෝගික සහාය නාලිකා ස්ථාපිත කිරීම.

• **සමාන කණ්ඩායම් මගින් දැනුම:** දැනුම බෙදා ගත හැකි සහ සමාජ රක්ෂණ වැඩසටහන්වලට සහභාගී වීමට අන් අයව දිරිමත් කළ හැකි ප්‍රජා තානාපතිවරුන් ලෙස පළපුරුදු ගිග් සේවකයින් පුහුණු කිරීම.

• **ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ:** දැනුවත් කිරීමේ උත්සාහයන් වැඩිදියුණු කිරීමට සහ නැගී එන ගැටළු කඩිනමින් විසඳීමට නිතිපතා සමීක්ෂණ සහ ප්‍රතිපෝෂණ ලූප(Feedback loops) වැඩ සටහන් ඇතුළත් කිරීම.

### 3.5.4. පරිණාමය වන ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා නිරීක්ෂණය කිරීම තුලින් සමාජ රක්ෂණ සේවා නිෂ්පාදන සහ ප්‍රතිපත්ති නොකඩවා අනුවර්තනය කිරීම

• **ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂණය:** වෙනස්වන අවශ්‍යතා තේරුම් ගැනීම සඳහා ගිග් ආර්ථික වර්ධනය, සේවක ජනවිකාස, ආදායම් රටා සහ අංශ මාරුවීම් පිළිබඳ අඛණ්ඩ පර්යේෂණ සිදු කිරීම

.

• **නිෂ්පාදන නවෝත්පාදනය:** සමාජ රක්ෂණ සේවා- ආවරණ වර්ග, ප්‍රතිලාභ මට්ටම්, දායකත්ව නීති - නව ආකාරයේ වැඩ සහ මතුවන අවදානම් සමඟ වඩා හොඳින් පෙළගැස්වීමට සකස් කිරීම.

• **ප්‍රතිපත්ති සමාලෝචනය:** පද්ධති පාදක කාර්යයන් හි යථාර්ථයන් පිළිබිඹු කිරීම සඳහා නීතිමය රාමු සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම, නවෝත්පාදනයන් අවහිර කිරීමකින් තොරව ආරක්ෂාව සහතික කිරීම.

• **පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය:** අනාගත ප්‍රවණතා අපේක්ෂා කිරීමට සහ සහයෝගීව විසඳුම් සංවර්ධනය කිරීමට ගිග් පද්ධති, සේවක සංගම් සහ ප්‍රතිපත්ති විශේෂඥයින් සමඟ ක්‍රියාකාරී සංවාදයක් පවත්වා ගැනීම.

• **දත්ත මත පදනම් වූ තීරණ**: වැඩසටහන් අවබෝදය ලබා ගැනීමට, මූල්‍ය තිරසාරභාවය සහ සේවක ප්‍රතිඵල මැනීම සඳහා උපායමාර්ගික ගැලපීම් අනුව මෙහෙයවමින් පද්ධති මගින් සපයන ලද සහ රජය විසින් එකතු කරන ලද දත්ත භාවිතා කිරීම.

---

මෙම ක්‍රියාමාර්ග එක්ව ගිග් සහ අවිධිමත් සේවකයින් සමාජ ආරක්ෂණ පද්ධතිවලට ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමට සහතික කරමින්, මෙම වර්ධනය වන සහ විවිධාකාර රැකියා බලකායට ප්‍රවේශ විය හැකි, දැරිය හැකි සහ ඔවුන්ගේ රැකියාවේ අනන්‍ය බවට අදාළ ආවරණයක් ලැබෙන බව සහතික විම

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- කම්කරු අමාත්‍යාංශය: ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ නියාමන අධීක්ෂණය.
- ගිග් ආර්ථික පද්ධති: සේවක බඳවා ගැනීම් සහ වැටුප්වලින් කෙරෙන ගෙවීම් සඳහා පහසුකම් සැලසීම.
- සමාජ රක්ෂණ අධිකාරීන්: ගැලපෙන යෝජනා ක්‍රම සහ සේවා සැපයීම සංවර්ධනය කිරීම.
- සේවක සංගම් සහ රාජ්‍ය නොවන සංවිධාන: සම්බන්ධතා සහ ධාරිතා වර්ධනය සිදු කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ගිග් පද්ධති සමඟ අවබෝධතා ගිවිසුම් (MOU).
• නම්‍යශීලී දායකත්ව කළමනාකරණ පද්ධති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• ගිග් සහ නිදහස් සේවකයින් අතර ලියාපදිංචිය සහ දායකත්ව අනුපාත.
• සේවක තෘප්තිය සහ දැනුවත් කිරීමේ මට්ටම්.
• නම්‍යශීලී යෝජනා ක්‍රමවල මූල්‍ය තිරසාරභාවය විශ්ලේෂණය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• ගිග් පද්ධති රක්ෂණ පද්ධති සමඟ සම්බන්ධ කිරීම සඳහා API සංවර්ධනය කිරීම.
• විවිධ වැඩ සන්දර්භයන්ට අනුවර්තනය වූ සන්නිවේදන උපාංග.
• නව සේවක කාණ්ඩ පිළිබඳ ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

**3.6. සේවක අර්ථසාධක අරමුදල් (සේවක අර්ථසාධක අරමුදල) පද්ධතිය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම**

***සේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය වැඩිදියුණු කිරීම විශ්‍රාමික ආරක්ෂාව වැඩි දියුණු කරන අතර සේවකයින් අතර විධිමත් ඉතුරුම් සංස්කෘතිය ප්‍රවර්ධනය කරනු ඇත.***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.6.1. ආරක්ෂිත මාර්ගගත සාමාජික ද්වාරයක් සහ ජංගම යෙදුමක් හරහා සමස්ත සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ ප්‍රතිලාභ ආපසු ගැනීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම මගින්, සේවකයින්ට ඔවුන්ගේ ගිණුම්, ශේෂයන් සහ ගනුදෙනු ඉතිහාසයන් වෙත තත් කාලීන ප්‍රවේශය ලබා දීම**

- **සාමාජික ද්වාරය සහ ජංගම යෙදුම් සංවර්ධනය:** සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ට ලියාපදිංචි වීමට, ඔවුන්ගේ ගිණුම් ශේෂයන් බැලීමට, දායකත්ව ඉතිහාසයන් නිරීක්ෂණය කිරීමට සහ ඕනෑම වේලාවක, ඕනෑම තැනක ප්‍රතිලාභ ආපසු ගැනීමේ ඉල්ලීම් ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි වෙබ් සහ ස්මාර්ට්ෆෝන් හරහා ප්‍රවේශ විය හැකි ආරක්ෂිත, පරිශීලක-හිතකාමී ඩිජිටල් පද්ධතියක් ගොඩ නැගීම

- **ආරක්ෂිත සත්‍යාපනය**: දත්ත ආරක්ෂාව සහතික කිරීමට සහ සංවේදී සාමාජික තොරතුරු ආරක්ෂා කිරීමට එක් වරක් පමණක් ක්‍රියාත්මක මුරපද (OTP), ජෛවමිතික සත්‍යාපනය හෝ ජාතික හැඳුනුම්පත-සම්බන්ධිත පිවිසුම් වැනි ශක්තිමත් බහුවිධ සත්‍යාපන ක්‍රම ක්‍රියාත්මක කිරීම

- **තත්කාලීන යාවත්කාලීන කිරීම්**: දායකත්ව සහ ගනුදෙනු තත්ත්වයන් පිළිබඳ තත් කාලීන යාවත්කාලීන කිරීම් සක්‍රිය කිරීමෙන්, සාමාජිකයින්ට ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලෙහි ක්‍රියාකාරකම් පිළිබඳ විනිවිද පෙනෙන සහ ක්ෂණික අවබෝධයක් ලබා දීම

- **ස්වයංක්‍රීය පණිවිඩ:** සාමාජිකයින් දැනුවත් කර සම්බන්ධ කර තබා ගැනීමට දායකත්ව ලැබීම්, මුදල් ආපසු ගැනීමේ අනුමැතීන් සහ වැදගත් කාලසීමාවන් සඳහා කෙටි පණිවිඩ හෝ යෙදුම් දැනුම්දීම් හරහා ස්වයංක්‍රීය පණිවිඩ ලබාදීම

- **ඩිජිටල් ලේඛන කළමනාකරණය**: ප්‍රතිලාභ ආපසු ගැනීම් හෝ හිමිකම් සඳහා අවශ්‍ය ලේඛන ඩිජිටල් ලෙස උඩුගත කිරීමට සහ කළමනාකරණය කිරීමට සාමාජිකයින්ට ඉඩ ලබාදීම තුළින් ලේඛන කටයුතු අඩු කිරීම සහ සැකසුම් කාලය වේගවත් කිරීම.

---

**3.6.2. භාවිතයට පහසු ඩිජිටල් ගෙවීම් විසඳුම් සහ විධිමත් අනුකූලතා පරීක්ෂාවන් හඳුන්වා දීමෙන් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSME) සඳහා ලියාපදිංචි කිරීමේ සහ දායකත්ව ක්‍රියාවලීන් සරල කිරීම.**

• **පරිශීලක-හිතකාමී ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ද්වාරය:** සේවායෝජක ලියාපදිංචිය, සේවක බඳවා ගැනීම සහ දායකත්ව ගෙවීම් සඳහා පහසුකම් සැලසීමට ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සකස් කරන ලද කැප වූ, සරල කළ ඩිජිටල් අතුරු මුහුණතක් සැදීම.

• **බහු ගෙවීම් විකල්ප:** ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ වෙනස්කම්, මනාපයන් සහ හැකියාවන්ට ගැලපෙන පරිදි බැංකු තෝරා ගැනීම, ජංගම මුදල්, ණය/හර කාඩ්පත් සහ QR කේත පාදක ගෙවීම් වැනි විවිධ ඩිජිටල් ගෙවීම් ක්‍රම ඒකාබද්ධ කිරීම.

• **ස්වයංක්‍රීය අනුකූලතා අධීක්ෂණය:** දායක මුදල් නිසි වේලාවට ස්වයංක්‍රීයව සත්‍යාපනය කිරීමට, ප්‍රමාදයන් හෝ හිඟ ගෙවීම් සලකුණු කිරීමට සහ අවශ්‍ය පරිදි සිහි කැඳවීම් හෝ දඩ යැවීමට, භෞතික අධීක්ෂණය අඩු කිරීමට සමත් පද්ධති සංවර්ධනය කිරීම.

• **ව්‍යාපාර සහ බදු ගෙවීම් ක්‍රම ඒකාබද්ධ කිරීම:** දත්ත බෙදාගැනීම විධිමත් කිරීමට, අනුකූලතා නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීමට සහ සේවායෝජක වාර්තා කිරීමේ අවශ්‍යතා සරල කිරීමට බදු අධිකාරීන් සහ ව්‍යාපාර සමඟ සේවක අර්ථසාධක අරමුදල් පද්ධති සම්බන්ධ කිරීම

• **ධාරිතා වර්ධනය:** ඩිජිටල් මෙවලම් ඵලදායී ලෙස සැරිසැරීමට සහ සේවක අර්ථසාධක අරමුදල් බැඳීම් තේරුම් ගැනීමට ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හිමිකරුවන්ට සහ වැටුප් කාර්ය මණ්ඩලයට පුහුණුව සහ මාර්ගගත නිබන්ධන ලබා දීම.

---

### 3.6.3.ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිව සමඟ සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් ඒකාබද්ධ කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදල හි සුවහබව සක්‍රීය කර, සේවකයින්ට රැකියා මාරු වීමේදීත් ඔවුන්ගේ ප්‍රතිලාභ ඉදිරියට ගෙන යාමට ඉඩ සැලසීම

• **පද්ධති ඒකාබද්ධ කිරීම**: සේවක අර්ථසාධක අරමුදල ගිණුම් ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධති දත්ත සමුදාය සමඟ සම්බන්ධ කරමින් අන්තර් ක්‍රියාකාරී ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, දායකමුදල් බාධාවකින් තොරව මාරු කිරීම සහ ඒකාබද්ධ කිරීම පහසු කිරීම.

• **විශ්වීය සාමාජික හැඳුනුම්පත්:** බහු සේවා යෝජකයින් සහ අංශ හරහා සේවක ගිණුම් නිරීක්ෂණය කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් (NIC) අංක හෝ සමාන අනන්‍ය හඳුනාගැනීම් භාවිතා කරනු ඇත.

• **ස්වයංක්‍රීය සුවහ බව:** ගිණුම් තත්ත්වයන් ස්වයංක්‍රීයව යාවත්කාලීන කරන විට සහ සාමාජිකයෙකු රැකියා හෝ රැකියා අංශ වෙනස් කරන සෑම විටම දායක මුදල් මාරු කරන ක්‍රම ඇති කිරීම. (ලේඛන කටයුතු අවම කිරීම.)

• **සාමාජික දැනුම්දීම්**: සුවහ තත්ත්වය පිළිබඳව සේවකයින්ට දැනුම් දීම සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා කෙටි පණිවිඩ (SMS) හෝ ඇඟවීම් (alerts) හරහා දායකමුදල් ගෙවීම් හෝ ප්‍රතිලාභ වෙනස්කම් පිළිබඳ තහවුරු කිරීම.

• **ප්‍රතිපත්ති ඒකාග්‍රතාව**: ප්‍රතිලාභ අඛණ්ඩතාව සහතික කරමින්, සුවහබව (portability) වළක්වන බාධක ඉවත් කිරීම සඳහා විවිධ යෝජනා ක්‍රම හරහා රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි පෙළගැස්වීම.

මෙම පියවර එක්ව, සේවායෝජක අනුකූලතාවය සහ ශ්‍රම වෙළඳපොළ තුළ සේවකයින් බාධාවකින් තොරව මාරු වීමට පහසුවීම මගින් සේවක අර්ථසාධක අරමුදල පද්ධතිය වඩාත් ප්‍රවේශ විය හැකි, විනිවිද පෙනෙන සහ සාමාජික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බවට නවීකරණය.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- **සේවක අර්ථසාධක අරමුදල**: ඩිජිටල් නවීකරණය සහ සාමාජික සේවාවන් මෙහෙයවීම.
- **ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL):** ඩිජිටල් ගෙවීම් යටිතල පහසුකම් සඳහා සහාය වීම.
- **ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංගම්:** සේවායෝජක අනුකූලතාව සහ දැනුවත්භාවය සඳහා පහසුකම් සැලසීම.
- **මුදල් අමාත්‍යාංශය**: නියාමන සහාය සහ අරමුදල් සැපයීම සහතික කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- ඩිජිටල් සාමාජික ද්වාර සහ ආරක්ෂිත ගෙවීම් ද්වාර.
- ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රජාව සම්බන්ධ කිරීම සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව** :

- ඩිජිටල් පද්ධතිවල පරිශීලක අනුගත වීමේ අනුපාත.
- සේවක අර්ථසාධක අරමුදල සැකසුම් කාලය සහ දෝෂ අඩු කිරීම.
- ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක අනුකූලතා අනුපාත සහ දායකත්ව වර්ධනය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සයිබර් ආරක්ෂණ පියවර.
- ඩිජිටල් මෙවලම් පිළිබඳ සේවක අර්ථසාධක අරමුදල කාර්ය මණ්ඩලය සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සේවා යෝජකයින් සඳහා පුහුණුව.
- සාමාජික සහාය සඳහා පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම්.

---

**3.7. සේවක භාර අරමුදලේ (ETF) ප්‍රවේශ්‍යතාව සහ සේවා වැඩි දියුණු කිරීම**

***සේවක භාර අරමුදල ශක්තිමත් කිරීම සේවක සුභසාධනය සඳහා මූල්‍ය සහාය වැඩි දියුණු කරන අතර විධිමත් රැකියා දිරිමත් කිරීම***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.7.1. සේවක භාර අරමුදල් දායකත්ව පරීක්ෂාවන් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කිරීම සහ මාර්ගගත ද්වාර සහ ජංගම යෙදුම් හරහා ණය සහ ප්‍රතිලාභ ආපසු ගැනීමේ අයදුම්පත් ස්වයංක්‍රීය කිරීම, ලේඛන කටයුතු සහ සැකසුම් කාලය අඩු කිරීම.**

• **දායකත්වයන් පරීක්ෂා කිරීමේ ඩිජිටල් පද්ධතිය**: සියලුම සේවායෝජක සහ සේවක සේවක භාර අරමුදල දායකත්වයන් තත් කාලීනව වාර්තා කරන ,ආරක්ෂිත, මධ්‍යගත ඩිජිටල් පද්ධතිවක් සංවර්ධනය කිරීම, මෙමගින් දෙපාර්ශවයටම ගෙවීම් තත්ත්වය සහ ගෙවීම් ඉතිහාසය ක්ෂණිකව නිරීක්ෂණය කිරීමට ඉඩ සැලසීම

• **මාර්ගගත ණය සහ ප්‍රතිලාභ ආපසු ගැනීමේ අයදුම්පත්:** සේවක භාර අරමුදල සාමාජිකයින්ට ණය හෝ මුදල් ආපසු ගැනීමේ ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කළ හැකි, අවශ්‍ය ලියකියවිලි උඩුගත කළ හැකියාව සහිතව සහ කාර්යාලවලට භෞතිකව පැමිණීමකින් තොරව ඔවුන්ගේ අයදුම්පත් වල තත්ත්වය නිරීක්ෂණය කළ හැකි පරිශීලක-හිතකාමී මාර්ගගත ද්වාර සහ ජංගම යෙදුම් ගොඩනැගීම

• **ස්වයංක්‍රීය සැකසුම් කාර්ය ප්‍රවාහ:** අයදුම්පත් වල සුදුසුකම් භාවය වලංගු කිරීමට, ලියකියවිලි සත්‍යාපනය කිරීමට සහ භෞතික සමාලෝචනය සඳහා වන සිද්ධි අනුමත කිරීමට හෝ සලකුණු කිරීමට පසු- අන්ත ස්වයංක්‍රීයකරණය ක්‍රියාත්මක කෙරේ. එමඟින් සැකසුම් කාලය සැලකිය යුතු ලෙස අඩු කර මානව දෝෂ අවම කිරීම

• **විද්‍යුත්මය දැනුම්දීම්:** සන්නිවේදනය සහ සේවා විනිවිදභාවය වැඩි දියුණු කිරීම උදෙසා; අයදුම්කරුවන්ට ඔවුන්ගේ අයදුම්පත් ප්‍රගතිය, බෙදාහැරීමේ දිනයන් හෝ ඕනෑම අමතර අවශ්‍යතා පිළිබඳව ස්වයංක්‍රීය කෙටි පණිවුඩ සහ විද්‍යුත් තැපෑලෙන් යාවත්කාලීනව කිරීම මඟින් සන්නිවේදනය සහ සේවා විනිවිදභාවය වැඩි දියුණු කිරීම.

• **ආරක්ෂිතව දත්ත ගබඩා කිරීම සහ පෞද්ගලිකත්වය**: සියලුම ඩිජිටල් පද්ධති දත්ත ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම, සාමාජිකයින්ගේ පුද්ගලික සහ මූල්‍ය තොරතුරු ආරක්ෂා කිරීම.

---

**3.7.2. සේවක භාර අරමුදල ආවරණය වැඩි කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ අවිධිමත් අංශයේ සේවා යෝජකයින් සහ සේවකයින් කෙරෙහි අවධානය යොමු කරමින් රටපුරා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

• **ඉලක්කගත ප්‍රජා වැඩසටහන්:** සේවක භාර අරමුදල සහභාගීවීමෙන් ලැබෙන ප්‍රතිලාභ සහ බැඳීම් ඉස්මතු කර දැක්වෙන පරිදි, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ අවිධිමත් අංශයේ ශ්‍රමිකයන් ආමන්ත්‍රණය කරන බහු මාධ්‍ය නාලිකා (ගුවන්විදුලි, රූපවාහිනී, සමාජ මාධ්‍ය, ප්‍රජා රැස්වීම්) භාවිතා කරමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ දියත් කිරීම.

• **සේවායෝජක සම්බන්ධතා වැඩමුළු**: සේවක භාර අරමුදල, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්, දායකත්ව අවශ්‍යතා සහ අනුකූලතා ප්‍රතිලාභ පිළිබඳව ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක හිමිකරුවන් සහ අවිධිමත් අංශයේ සේවා යෝජකයින් දැනුම්වත් කිරීම සඳහා ප්‍රාදේශීය වැඩමුළු සහ පුහුණු සැසි සංවිධානය කිරීම.

• **අවිධිමත් සේවක අධ්‍යාපනය:** අවිධිමත් අංශයේ සේවකයින්ට සේවක භාර අරමුදලට ඇතුළත් විය හැකි සහ ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරය පැහැදිලි කරන දේශීය භාෂාවලින් ප්‍රවේශ විය හැකි අධ්‍යාපනික ද්‍රව්‍ය (පත්‍රිකා, වීඩියෝ, ජංගම පණිවිඩ) සංවර්ධනය කිරීම.

• **වෙළඳ සංගම් සමඟ හවුල්කාරිත්වයන්**: පුළුල් ව්‍යාප්තිය සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සතු, වෘත්තීය සමිති සහ සිවිල් සමාජ කණ්ඩායම් මණ්ඩල ජාල භාවිතා කිරීම

• **දිරිගැන්වීමේ වැඩසටහන්:** අවිධිමත් අංශයේ සේවා යෝජකයින් සහ සේවකයින් සේවක භාර අරමුදල හා සම්බන්ධ වීමට දිරිගැන්වීම සඳහා අඩු කළ ආරම්භක දායක මුදල් හෝ දඩ නිදහස් කිරීම් වැනි ක්‍රම මගින් තාවකාලික දිරිගැන්වීම් හෝ සහනාධාර සලකා බැලීම.

**3.7.3 සේවක භාර අරමුදල ණය ක්‍රම පුළුල් කිරීම මගින් සඳහා කුසලතා පුහුණුව, දැරිය හැකි නිවාස ණය සහ ව්‍යවසායකත්ව මූල්‍යකරණය මගින් සේවකයින්ගේ සුභසාධනය සහ ආර්ථික දියුණුවට සහය වීම**

• **නව ණය ක්‍රම නිර්මාණය**: වෘත්තීය හෝ කුසලතා පුහුණුව සඳහා අඩු පොලී ණය, දැරිය හැකි නිවාස ණය සහ කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පුළුල් කිරීමට ක්ෂුද්‍ර ණය වැනි සේවකයින්ගේ අවශ්‍යතාවලට ගැලපෙන විවිධ ණය යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.
• **මූල්‍ය ආයතන සමඟ හවුල්කාරිත්වයන්**: මෙම නව ණය ක්‍රම කාර්යක්ෂමව සම-මූල්‍යකරණය කිරීමට හෝ පරිපාලනය කිරීමට බැංකු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ ණය සමුපකාර සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

• **නම්‍යශීලී ආපසු ගෙවීමේ නියමයන්:** විශේෂයෙන් අවිධිමත් ආදායම් සහිත අවිධිමත් අංශයේ සහ ගිග් ආර්ථික සේවකයින් සඳහා, සේවකයින්ගේ ආදායම් රටා සමඟ අනුකූලව ආපසු ගෙවීමේ කාලසටහන් පිරිනැමීම

• **ණය අයදුම්පත් සහාය**: සාමාජිකයින්ට ණය සුදුසුකම් තේරුම් ගැනීමට, අයදුම්පත් සම්පූර්ණ කිරීමට සහ අරමුදල් වෙත ප්‍රවේශ වීමට උපකාර කිරීම සඳහා ඩිජිටල් පද්ධති සහ ආධාරක මධ්‍යස්ථාන හරහා සහාය ලබා දීම

• **ප්‍රතිඵල අධීක්ෂණය**: සේවකයින්ගේ ආර්ථික යහපැවැත්ම සහ සමාජ සංචලනය සඳහා ඵලදායී ලෙස දායක වන බව සහතික කිරීම සඳහා මෙම ණය ක්‍රමවල ප්‍රයෝජනය සහ ප්‍රතිඵල නිරීක්ෂණය.

---

**3.7.4. ප්‍රතිලාභවල වඩා හොඳ සම්බන්ධීකරණය, සුවහ බව සහ විනිවිදභාවය සඳහා පහසුකම් සැලසීම සඳහා සේවක භාර අරමුදල දත්ත පද්ධති ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිවන් හි පද්ධතිව සමඟ සම්බන්ධ කරන්න.**

• **දත්ත පද්ධති ඒකාබද්ධ කිරීම**: සේවක භාර අරමුදල වාර්තා ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධති දත්ත සමුදායන් සමඟ සම්බන්ධ කිරීම සඳහා අන්තර් ක්‍රියාකාරී පරිගනක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, බාධාවකින් තොරව දත්ත හුවමාරුව සහ ඒකාබද්ධ සාමාජික පැතිකඩ සක්‍රීය කිරීම.

• **සුවහ බව :** විවිධ සමාජ රක්ෂණ යෝජනා ක්‍රම, රැකියා සහ භූගෝලීය ස්ථාන හරහා සේවක භාර අරමුදල දායකත්වයන් සහ හිමිකම් මාරු කළ හැකි බව සහතික කිරීම, ප්‍රතිලාභ අහිමි නොවී ශ්‍රම සංචලතාවයට සහාය වීම.

• **ඒකාබද්ධ සාමාජික උපකරණ පුවරුව**: සාමාජිකයින්ට ඔවුන්ගේ සියලුම සමාජ රක්ෂණ ප්‍රතිලාභ, දායක මුදල් සහ හිමිකම් තත්ත්වය බහු යෝජනා ක්‍රම හරහා නැරඹිය හැකි තනි ඩිජිටල් අතුරු මුහුණතක් ලබා දීම.

• **පරිපාලන කාර්යක්ෂමතාව:** බෙදාගත් පද්ධති හරහා සේවා යෝජකයින් සහ පරිපාලකයින් සඳහා ක්‍රියාවලීන් විධිමත් කිරීම, ද්විකරනය අඩු කිරීම සහ දත්ත නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම.

• **වැඩිදියුණු කළ වාර්තාකරණය සහ විශ්ලේෂණ**: ආවරණය, දායකත්වයන් සහ හිමිකම් පිළිබඳ පුළුල් වාර්තා ජනනය කිරීම සඳහා ඒකාබද්ධ දත්ත භාවිතා කිරීම, වඩා හොඳ ප්‍රතිපත්ති තීරණ සහ මූල්‍ය කළමනාකරණයට පහසුකම් සැලසීම.

මෙම පියවර මගින් සේවක භාර අරමුදල කළමනාකරණය නවීකරණය කිරීම, සේවා සැපයීම වැඩිදියුණු කිරීම, විශේෂයෙන් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ අවිධිමත් අංශයෙහි සේවකයින් අතර ආවරණය පුළුල් කිරීම සහ සේවකයින්ගේ මූල්‍ය ආරක්ෂාව සහ ආර්ථික දියුණුවට සහාය වීම සඳහා අරමුදලේ කාර්ය භාරය ශක්තිමත් වීම

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **සේවක භාර අරමුදල මණ්ඩලය:** ඩිජිටල්කරණය සහ නිෂ්පාදන සංවර්ධනයට නායකත්වය දීම.
• **කම්කරු අමාත්‍යාංශය**: සේවක භාර අරමුදල දැනුවත්භාවය සහ අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.
• **ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ අවිධිමත් අංශයේ නියෝජිතයින්**: ප්‍රජා සම්බන්ධතා සඳහා සහාය වීම.
• **මූල්‍ය ආයතන:** විවිධ ණය ක්‍රම හඳුන්වාදීමේ සහ ලබාදීමේ හවුල්කරුවන් ලෙස.

**සම්බන්ධීකරණ මෙවලම්:**
• සේවක භාර අරමුදල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ඩිජිටල් පද්ධති.
• නිෂ්පාදන පුළුල් කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**
• ඉලක්කගත අංශවල සේවක භාර අරමුදල ආවරණ වර්ධන අනුපාත.
• ණය බෙදාහැරීමේ පරිමාවන් සහ ආපසු ගෙවීමේ කාර්ය සාධනය.
• ප්‍රතිලාභීන්ගේ තෘප්තිමත් බව පිලිබඳ  සමීක්ෂණ.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**
• ණය සැකසීම සහ දායකත්ව නිරීක්ෂණය සඳහා තොරතුරු පද්ධති.
• ඩිජිටල් මෙවලම් සහ පාරිභෝගික සේවය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව.
• අලෙවිකරණ සහ සන්නිවේදන සම්පත්.

### 3.8. සමාජ ආරක්ෂණ මණ්ඩල (SSB ) යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම

***ස්වයං රැකියා නියුක්තිකයන්, අවිධිමත් අංශයේ සේවකයින් සහ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පිරිනැමීම් වැඩි දියුණු කිරීම මගින් පුළුල් ආවරණයක් සහතික කිරීම සහ සියලු දෙනා ඇතුළත් සමාජ ආරක්ෂාව ප්‍රවර්ධනය.***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.8.1. ස්වයං රැකියාලාභීන් සහ අවිධිමත් අංශයේ සේවකයින් වැඩිදෙනෙක් ආකර්ෂණය කර ගැනීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලීන් සරල කිරීම සහ සුදුසුකම් නිර්ණායක පුළුල් කිරීම මගින් "සුරැකුම " විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීම.**

- **සරල කරන ලද ඇතුළත් කිරීම්:** ලේඛන කටයුතු අඩු කිරීම, ලේඛන අවශ්‍යතා අවම කිරීම සහ ඩිජිටල් හා පුද්ගල සම්බන්ධිත නාලිකා හරහා ස්වයං-ලියාපදිංචිය සක්‍රීය කිරීම මගින් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම . ක්‍රියාවලිය ඉක්මන් සහ ආරක්ෂිත කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් සහ ජංගම සත්‍යාපනය භාවිතා කිරීම.

- **පුළුල් කළ සුදුසුකම්:** දෛනික වැටුප් ලබන ශ්‍රමිකයන්, ගෘහ සේවකයින්, කුඩා පරිමාණ ගොවීන්, ධීවරයින්, ගිග් සේවකයින් වැනි පුළුල් පරාසයක අවිධිමත් අංශයේ සේවකයින් ඇතුළත් කිරීමට නිර්ණායක පුළුල් කිරීම. මෙම ඇතුළත් ප්‍රවේශය ආන්තික ජනගහනය වඩා හොඳින් ආවරණය කිරීම සහතික කිරීම.

- **නම්‍යශීලී දායකත්ව සැලසුම්:** අඩු ආදායම්ලාභී සහ අක්‍රමවත් ආදායම් ලබන අයට ඔවුන්ගේ මූල්‍ය ධාරිතාව මත පදනම්ව සහභාගී වීමට ඉඩ සැලසෙන පරිදි සහ කාලයත් සමඟ ඉහළ මට්ටම්වලට උසස් කිරීමේ හැකියාව ඇති ස්ථරගත දායකත්ව විකල්ප හඳුන්වා දීම.

- **රජයේ සම-දායකත්වයන්:** බඳවා ගැනීම දිරිමත් කිරීම සහ දිගුකාලීන ප්‍රතිලාභ ප්‍රමාණවත් බව වැඩි දියුණු කිරීම සඳහා ඇතැම් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (උදා: කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින් හෝ ඉහළ අවදානම් සහිත රැකියා වල සේවකයින්) සඳහා ඉලක්කගත රජයේ ගැලපීම හෝ සම-දායකත්වයන් සලකා බැලීම.

- **ප්‍රාදේශීය ඇතුළත් වීමේ ධාවක(Drives):** බඳවා ගැනීමේ ධාවක සඳහා පහසුකම් සැලසීමට සහ අවිධිමත් අංශයේ සේවකයින් අතර විශ්වාසය ගොඩනැගීමට ප්‍රජා සංවිධාන, සමුපකාර සහ පළාත් පාලන ආයතන සමඟ හවුල්කාරිත්වය.

**3.8.2. ප්‍රතිලාභවල සුවහ බව සහ පරිපාලන සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩල යෝජනා ක්‍රම ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිවේ ඒකාබද්ධ වූ පද්ධතිව සමඟ එක් කිරීම.**

- **ඒකාබද්ධ සමාජ ආරක්ෂණ පද්ධතිය:** සියලුම සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හරහා ප්‍රතිලාභීන්, දායක මුදල් සහ හිමිකම් පිළිබඳ ඒකාබද්ධ දත්ත සමුදායක් නිර්මාණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩල වාර්තා ඒකාබද්ධ සමාජ රක්ෂණ පද්ධතිවේ ඩිජිටල් පද්ධතිව සමඟ ඒකාබද්ධ කිරීම.

- **දායකත්ව වල සුවහ බව:** අඛණ්ඩ ආවරණය සහ විශ්‍රාම වැටුප් ආරක්ෂාව සහතික කරමින්, රැකියා වෙනස් කිරීමේදී හෝ විධිමත් සහ අවිධිමත් අංශ අතර මාරු කිරීමේදී, , විවිධ සමාජ රක්ෂණ යෝජනා ක්‍රම (උදා: සේවක භාර අරමුදල, සේවක අර්ථසාධක අරමුදල, සමාජ ආරක්ෂණ මණ්ඩල ) හරහා සේවකයින්ට තම දායක මුදල් මාරු කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට ඉඩ සැලසීම.

- **දත්ත සමමුහුර්තකරණය:** දායකත්ව ඉතිහාසයන් නිරීක්ෂණය කිරීමට, ද්විකරණය වීම වැළැක්වීමට සහ ප්‍රතිලාභ ලබා දීමේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට පද්ධති අතර තත් කාලීන දත්ත බෙදා ගැනීම සක්‍රීය කිරීම.

• **ඒකාබද්ධ සේවා සැපයීම:** ප්‍රතිලාභීන්ට විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය රක්ෂණ, විරැකියා ප්‍රතිලාභ , තනි අතුරු මුහුණතක් යටතේ බහු යෝජනා ක්‍රම වෙත ප්‍රවේශ විය හැකි පොදු සේවා මධ්‍යස්ථාන සහ මාර්ගගත ද්වාර සංවර්ධනය කිරීම සහ පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ පරිපාලන වියදම් අඩු කිරීම.

- **ප්‍රතිපත්ති පෙළගැස්ම:** කොටස් වලට වෙන් වීම වළක්වා ගැනීම සඳහා සහ සුදුසුකම්, ප්‍රතිලාභ සහ ගෙවීම් සඳහා ස්ථාවර නීති සහතික කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩල යෝජනා ක්‍රම සහ ජාතික අධිකාරීන් සමඟ ප්‍රතිපත්ති එක් කිරීම.

---

**3.8.3. ජංගම උපාංග -හිතකාමී අතුරුමුහුණත් ඇතුළුව ලියාපදිංචි කිරීම, දායක මුදල් ගෙවීම් සහ ප්‍රතිලාභ හිමිකම් සඳහා පරිශීලක-හිතකාමී ඩිජිටල් පද්ධති සංවර්ධනය කිරීම.**

- **විස්තීර්ණ ඩිජිටල් ද්වාරය:**පුද්ගලයන්ට ලියාපදිංචි වීමට, දායක වීමට හෝ දායකත්වයන් කාලසටහන් ගත කිරීමට (බැංකු හුවමාරු හෝ ජංගම මුදල් හරහා)පුද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීමට සහ ප්‍රතිලාභ හිමිකම් ඉදිරිපත් කිරීමට හැකි බුද්ධිමය, බහුභාෂා වෙබ් සහ ජංගම පද්ධති ගොඩනැගීම.
- **ජංගම ප්‍රශස්තකරණය:** අඩු ආදායම්ලාභී ප්‍රජාවන් තුළ පවා ඉහල ධාරිතාවක් සහිත සුහුරු දුරකථන ලබා දී ඇති බැවින්, ජංගම-හිතකාමී ප්‍රවේශය සහතික කිරීම. අඩු සම්බන්ධතා ප්‍රදේශ සඳහා නොබැඳි හෝ ඒ හා සබැඳි විශේෂාංග ඇතුළත් කිරීම.
- **ස්වයංක්‍රීය දැනුම්දීම්:** විනිවිදභාවය සහ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරි ගෙවීම් කාලසීමාවන්, දායක මුදල් තහවුරු කිරීම හෝ ප්‍රතිලාභ බෙදාහැරීම් සඳහා කෙටි පණිවිඩ (SMS) /ඊමේල් ඇඟවීම් සක්‍රීය කිරීම.
- **ආරක්ෂිත ප්‍රවේශය:** පරිශීලක දත්ත ආරක්ෂා කිරීමට සහ ඩිජිටල් පද්ධති කෙරෙහි විශ්වාසය ගොඩනැගීමට හැකි සෑම විටම ද්වි-සාධක සත්‍යාපනය සහ ජෛවමිතික විකල්ප භාවිතා කිරීම.
- **උපකාර සහ සහාය නාලිකා:** ඩිජිටල් මෙවලම් ගැන නුහුරු පරිශීලකයින්ට සහාය වීම සඳහා චැට්බෝට් සේවා, ගාස්තු රහිත ක්ෂණික දුරකථන සේවා සහ වීඩියෝ නිබන්ධන ඇතුළත් කිරීම.

---

**3.8.4.විශේෂයෙන් ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් තුළ යෝජනා ක්‍රම ප්‍රතිලාභ අවධාරණය කරමින් ඉලක්කගත මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- **එක් එක් ප්‍රදේශයට ගැළපෙන ලෙස වෙනස් කළ සන්නිවේදන උපාය මාර්ග:** සුරැකුම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සහ ලියාපදිංචි වන ආකාරය හෝ දායක වන ආකාරය පැහැදිලි කිරීමට දේශීය භාෂා සහ සංස්කෘතිකමය වශයෙන් අදාළ පණිවිඩ භාවිතා කිරීම.
- **විවිධ මාධ්‍ය පද්ධති:** ගුවන්විදුලිය, රූපවාහිනිය, සමාජ මාධ්‍ය, ප්‍රජා පුවත්පත් සහ වෙළඳපොළවල් සහ ආගමික ස්ථානවල හා ආයතනවල පෝස්ටර් හරහා තොරතුරු බෙදා හැරීම, ජනවිකාශ සහ සාක්ෂරතා මට්ටම් හරහා බෙදා හැරීම සහතික කිරීම.
- **ප්‍රජා තානාපතිවරුන්:** ප්‍රජා නායකයින්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් සහ සමාජ බලමුලු ගන්වන්නන්, ප්‍රජා සේවා නියෝජිතයන් ලෙස ක්‍රියා කිරීමට පුහුණු කිරීම, තොරතුරු පතුරුවා හැරීමට සහ විශ්වාසය ගොඩනැගීමට උපකාරී වීම.

- **මිථ්‍යාවන් බැහැර කිරීම :** පොදු වැරදි වැටහීම් පෙන්වාදීම් (උදා: විශ්‍රාම වැටුප් රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා පමණක් බව) සහ ප්‍රතිලාභීන්ගේ සැබෑ ජීවිත කතා බෙදා ගැනීම මගින් සහභාගීත්වයේ වටිනාකම පෙන්නුම් කිරීම.
- **විශේෂ අවස්ථාවන්ට සහභාගීත්වය:** සජීවී ලියාපදිංචි කිරීම් සහ තොරතුරු සැසි පැවැත්වීම සඳහා ජාතික උත්සව, ජංගම සේවා කඳවුරු සහ රජයේ ප්‍රජා සේවා අවස්ථා උපයෝගී කර ගැනීම.

---

මෙම පියවරයන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සහ අනෙකුත් සමාජ ආරක්ෂණ මණ්ඩල යෝජනා ක්‍රමවල **ප්‍රවේශය, කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය** සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇති අතර, ශ්‍රී ලංකාවේ **අවිධිමත් සහ ස්වයං රැකියාලාභීන් සඳහා පුළුල් සමාජ ආරක්ෂණ ආවරණයක්** සහතික කිරීම සිදු කරයි.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **සමාජ ආරක්ෂණ මණ්ඩලය (SSB ):**යෝජනා ක්‍රම පරිපාලනය සහ ඩිජිටල් පද්ධති කළමනාකරණය.
• **කම්කරු අමාත්‍යාංශය:** ප්‍රතිපත්ති මාර්ගෝපදේශකත්වය සහ සම්බන්ධීකරණය.
• **පළාත් පාලන සහ ප්‍රජා කණ්ඩායම්:** ප්‍රජා සේවා සහ සහාය.
• **රාජ්‍ය නොවන සංවිධාන(NGO):** දැනුවත් කිරීමේ සහ අත්‍යවශය වැඩසටහන් පැවැත්වීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**
• මධ්‍යගත ඩිජිටල් ලියාපදිංචිය සහ හිමිකම් පද්ධතිය.
• ප්‍රජා සම්බන්ධතා සංසද.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**
• ඇතුළත් වීමේ සහ දායකත්ව සංඛ්‍යාලේඛන.
• හිමිකම් සැකසීමට ගතවන වේලාවන් සහ ප්‍රතිලාභීන්ගේ ප්‍රතිචාර
• ප්‍රජා සේවා එලදායීතා දර්ශක.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**
• පද්ධති සංවර්ධනය සහ නඩත්තු සම්පත්.
• ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ ප්‍රජා දැනුම්වත් කරන්නන් සඳහා පුහුණුව.
•දැනුම්වත් කිරීමේ සහ ඇතුළත් වීමේ ධාවක(Drives) සඳහා අරමුදල්.

---

**3. 9. සමාජ ආරක්ෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) කාර්යභාරය වැඩි දියුණු කිරීම**

***ජාතික සමාජ ආරක්ෂණ සැලැස්මට, සමාජ ආරක්ෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙ හි රක්ෂණ සේවා ඒකාබද්ධ කිරීම හා ශක්තිමත් කිරීම. රාජ්‍ය අංශයේ රක්ෂණ (උදා: අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණය, SRCC&T, කෘෂිකාර්මික බෝග රක්ෂණය) සහ අංශ හරහා ප්‍රතිරක්ෂණ සහාය ලබා දීමට සමාජ ආරක්ෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල හට ව්‍යවස්ථාපිත බලය හිමි ය .***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.9.1. සමාජ ආරක්ෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට මහජන ප්‍රවේශය, අවිධිමත් අංශයේ සේවකයින්ට පුළුල් කිරීම.**

සාම්ප්‍රදායිකව රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා වෙන් කර ඇති අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය වෛද්‍ය වියදම් ආවරණයක් ලබා දෙන අතර සෞඛ්‍ය ආරක්ෂාවේ තීරණාත්මක කුළුණක් වී ඇත. කෙසේ වෙතත්, වතු කම්කරුවන්, කුඩා වතු හිමි ගොවීන්, ධීවරයින් සහ ස්වයං රැකියාලාභීන් ඇතුළු අවිධිමත් අංශයේ සේවකයින් සෞඛ්‍ය කම්පනවලට ගොදුරු වීමේ අවදානමට තිබියදීත් සහ මූල්‍යමය වශයෙන් අස්ථාවර බව තිබියදීත්, බොහෝ දුරට මෙම ආවරණයෙන් බැහැරව සිටිති.

- **සුදුසුකම් නිර්ණායක සංශෝධනය:** අග්‍රහාර ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැයිස්තුවට අවිධිමත් අංශයේ වෘත්තීන් ඇතුළත් කිරීම.
- **වාරික සහනාධාර:** වඩා දිළිඳු කාණ්ඩ සඳහා රජයේ සම-දායකත්වයන් සමඟ ආදායම් කාණ්ඩ මත පදනම්ව ස්ථර වාරික ව්‍යුහයන් ඇති කිරීම.
- **ග්‍රාම නිලධාරී සහ ප්‍රජා පාදක සංවිධාන (CBOs) හරහා ලියාපදිංචි වීම:** අවිධිමත් අංශයේ සේවකයින් සමඟ දැනටමත් අන්‍යොන්‍ය ලෙස ක්‍රියා කරන ප්‍රජා ව්‍යුහයන් භාවිතා කිරීමෙන් ලියාපදිංචිය සරල කිරීම.

මෙම මැදිහත්වීම්වල අපේක්ෂිත බලපෑමට, විශේෂයෙන් අවිධිමත් අංශයේ සිටින, දැනට රක්ෂණය කර නොමැති මිලියන සංඛ්‍යාත පුරවැසියන් සඳහා සැලකිය යුතු ලෙස පුළුල් සෞඛ්‍ය ආවරණයක් ඇතුළත් වේ. රක්ෂණ ප්‍රවේශය පුළුල් කිරීම සහ ක්ෂුද්‍ර රක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම මගින් හා ප්‍රතිසංස්කරණ මගින් අඩු ආදායම්ලාභී පවුල් අතර ව්‍යසනකාරී සෞඛ්‍ය වියදම් අඩු කිරීම සිදු කරන අතර, අසනීප හෝ තුවාල හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවයන්ගෙන් ඔවුන් ආරක්ෂා කිරීම සිදු කරයි. සාමූහිකව, මෙම පියවරයන් විශ්වීය සෞඛ්‍ය ආවරණය (UHC) සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම ශක්තිමත් කරනු ඇති අතර, සැමට ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සහ මූල්‍ය අවදානම් ආරක්ෂාව සහතික කිරීම අරමුණු කරගත් තිරසාර සංවර්ධන ඉලක්කය 3.8 ඉදිරියට ගෙන යයි.

---

### 3.9.2. සමාජ කම්පන-ප්‍රතිචාරාත්මක සහාය සඳහා වැඩවර්ජන, කැරලි , සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා (SRCC&T) සඳහා ප්‍රතිරක්ෂණ ක්‍රම භාවිතා කිරීම.

ශ්‍රී ලංකාව වරින් වර සිවිල් නොසන්සුන්තා, ස්වාභාවික විපත් සහ වැඩ වර්ජන අත්විඳ ඇති අතර, බොහෝ විට දිළිඳු ප්‍රජාවන්ට ජීවනෝපායන් හෝ ක්ෂණික මූල්‍ය ආධාර සඳහා ප්‍රවේශය නොමැති වේ. ජාතික රක්ෂණ භාර අරමුදලෙ හි පවතින වැඩවර්ජන, කැරලි, සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදය ප්‍රතිරක්ෂණ ආවරණය පුද්ගලික රක්ෂණ අංශයේ භාවිතා වේ. මහජන හදිසි සහන ලබා දීම සඳහා නැවත භාවිතා කළ හැකිය.

- හදිසි මූල්‍ය සහාය යෙදවීම සඳහා **පූර්ව එකඟ වූ ගෙවීම් ප්‍රේරක** (උදා: ආපදා ප්‍රකාශ කිරීම හෝ ඇඳිරි නීතිය පැනවීමක දී) **සංවර්ධනය කිරීම.**
- බලපෑමට ලක් වූ නිවාසවලට වේගවත් මුදල් හුවමාරුව, තාවකාලික නවාතැන් සහනාධාර හෝ හදිසි සෞඛ්‍ය ආවරණ සඳහා ඉඩ සලසන **කම්පන-ප්‍රතිචාරාත්මක සමාජ ආරක්ෂණ ප්‍රොටෝකෝල ස්ථාපිත කිරීම.**
- සත්‍යාපනය සහ බෙදා හැරීම සඳහා **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධීකරණය.**

අපේක්ෂිත බලපෑම අතරට නොසන්සුන්තාව හෝ ආපදා වලදී ජීවනෝපාය අහිමි වීම අවම කිරීම, අවදානමට ලක්විය හැකි ජනගහනය අතර ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියේ

ඵලදායී හා ප්‍රතිචාරාත්මක සංරචක ලෙස රක්ෂණ ආයතන කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීම ඇතුළත් වේ.

---

### 3.9.3. ජාතික රක්ෂණ භාර අරමුදලෙ හි ක්ෂුද්‍ර රක්ෂණ යෝජනා ක්‍රම ජාතික සමාජ රක්ෂණ පද්ධතිවට ඒකාබද්ධ කිරීම.

ජාතික රක්ෂණ භාර අරමුදලෙ හි දැනටමත් ක්ෂුද්‍ර රක්ෂණ සේවා කිහිපයක් ඉදිරිපත් කරයි:

- අස්වැන්න පාළු වීම ආවරනය සඳහා බෝග රක්ෂණය.
- රැකියා ස්ථානයන්හි දී සිදුවන තුවාල හෝ මරණ සඳහා කම්කරු වන්දි.

ජාතික දත්ත සමුදායන් සමඟ ඒකාබද්ධ වීමක් නොමැතිකම සහ දැනුම්වත්භාවය, විශ්වාසය සහ ප්රවේශ ගැටළු හේතුවෙන් අවිධිමත් අංශයේ සේවකයින්ගේ භාවිතය අඩු වීම ඉහත ක්‍රම වෙන් වෙන් ලෙස ක්‍රියාත්මක වේ.

- **අනෙකුත් සුභසාධන පද්ධති සමඟ අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කිරීමට හැකි වීමට මෙම යෝජනා ක්‍රම මධ්‍යගත ඩිජිටල් සමාජ රක්ෂණ පද්ධතියකට ඒකාබද්ධ කිරීම.**
- **බහු නිෂ්පාදන සඳහා තනි කවුළු ලියාපදිංචිය (Single-window enrolment)සඳහා පහසුකම් සැලසීම (උදා: සෞඛ්‍ය, බෝග, ජීවිත).**
- **දැනුම්වත් කිරීම, ප්‍රතිපත්ති කළමනාකරණය සහ වාරික මතක් කිරීම් සඳහා ජංගම තාක්ෂණය භාවිතා කිරීම.**

අපේක්ෂිත බලපෑම අතරට අවිධිමත් ආර්ථික අංශයේ සේවකයින් මුහුණ දෙන අවදානම් සඳහා පුළුල් හා බාධාවකින් තොරව රක්ෂණ ආවරණය, ග්‍රාමීය හා වතු ආශ්‍රිත  ජනගහනය අතර රක්ෂණ භාවිතය වැඩි වීම සහ ද්විකරණය අඩු කිරීම හා  ප්‍රතිලාභී පද්ධති හරහා වඩා හොඳ සම්බන්ධීකරණය තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ඇතුළත් වේ.

---

### 3.9.4. ඩිජිටල් සාමාජිකත්ව කළමනාකරණය සහ හිමිකම් පද්ධති යෙදවීම.

අතින් සැකසීම සහ කඩදාසි මත පදනම් වූ පද්ධති වර්තමානයේ හිමිකම් පියවීම් මන්දගාමී කිරීම, වංචා සඳහා ඉඩ සැලසීම, සහ දුරස්ථ ජනගහනය සඳහා ප්‍රවේශය අපහසු කරවයි. පද්ධතිය ඩිජිටල් කිරීම මඟින් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සේවා සැපයීම නවීන විද්‍යුත් පාලනය සහ මූල්‍ය ප්‍රමිතීන් සමඟ පෙළගැස්වෙයි.

- **අනන්‍යතා සත්‍යාපනය විධිමත් කිරීම සඳහා රක්ෂණ ගිණුම් ජාතික හැඳුනුම්පත් (NIC) අංකයට සම්බන්ධ කිරීම.**
- **ජංගම දුරකථන හරහා ප්‍රවේශ විය හැකි පද්ධතියක් ගොඩනැගීම:**
    - ලියාපදිංචිය
    - වාරික ගෙවීම් (ඊ-පසුම්බි හෝ තැපැල් කාර්යාල හරහා)
    - හිමිකම් ඉදිරිපත් කිරීම් සහ තත්වත් නිරීක්ෂණය **සඳහා**
- **අතිච්ඡේදනය වීම වළක්වා ගැනීම සඳහා සමෝධානිත සමාජ සුභසාධන රෙජිස්ටරය (UBR) සහ ජාතික සමාජ ආරක්ෂණ උපකරණ පුවරුව(Social protection dashboard) සමඟ ඒකාබද්ධ වීම.**

විනිවිදභාවය, වංචා අවම වීම සහ ඉක්මන් හිමිකම් සැකසීම මෙන්ම ප්‍රතිලාභීන් සහ රක්ෂණකරුවන් යන දෙපිරිසටම අඩු ගනුදෙනු පිරිවැය වැඩි දියුණු කළ ක්‍රමවේදයන් ගෙන් ලැබෙන ප්‍රතිලාභයන්. මෙම වැඩිදියුණු කිරීම් මඟින් ජාතික රක්ෂණ යෝජනා ක්‍රමවලට අවිධිමත් අංශයේ සේවකයන්ගෙන් වැඩි විශ්වාසයක් සහ සහභාගීත්වයක් ඇති කරනු ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**
• **ජාතික රක්ෂණ භාර අරමුදල (NITF):** නිෂ්පාදන සංවර්ධනය සහ යෝජනා ක්‍රම පරිපාලනය.
• **මුදල් අමාත්‍යාංශය:** අධීක්ෂණය සහ අරමුදල් සහාය.
• **ආපදා කළමනාකරණ අධිකාරීන්:** සමාජ කම්පන ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම.
• **කෘෂිකාර්මික සහ කම්කරු අංශයේ සංවිධාන:** ප්‍රජා සේවා සහ බඳවා ගැනීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**
• සාමාජිකත්වය සහ හිමිකම් සඳහා ඩිජිටල් ඒකාබද්ධ කිරීමේ පද්ධති.
• සමාජ කම්පන ප්‍රතිචාර සඳහා බහු-ආංශික සම්බන්ධීකරණ කමිටු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**
• අවිධිමත් සහ ආන්තික කණ්ඩායම් අතර ඇතුළත් වීමේ අනුපාත.
• කම්පන-ප්‍රතිචාරාත්මක ප්‍රතිලාභ ගෙවීම්වල කාලානුරූපීබව සහ ප්‍රමාණවත් බව.
• හිමිකම් විගණන වාර්තා.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**
• සාමාජිකත්වය සහ හිමිකම් සැකසීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම්.
• ක්ෂුද්‍ර රක්ෂණ සහ කම්පන-ප්‍රතිචාරාත්මක යාන්ත්‍රණයන් පිළිබඳ පුහුණුව ලත් කාර්ය මණ්ඩලය.
• හදිසි වියදම් සඳහා අරමුදල් සැපයීමේ යාන්ත්‍රණයන්.

---

**3.10. සේවා ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව සඳහා ඩිජිටල් විශ්‍රාම වැටුප් පද්ධති ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම.**

***විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනටමත් ඩිජිටල් පරිවර්තනය සඳහා වැදගත් පියවර ගෙන ඇති අතර, විශ්‍රාමිකයන් සඳහා සේවා සැපයීම වැඩිදියුණු කළ ඊ-විශ්‍රාම වැටුප් සේවා සහ අදාළ ඩිජිටල් මෙවලම් හඳුන්වා දී ඇත. මෙම ජයග්‍රහණ මත ගොඩනැගීම, ඩිජිටල් පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම මගින් වඩාත් පුළුල් ජීවන චක්‍ර ආරක්ෂාව, විධිමත් පරිපාලනය සහ සයිබර් තර්ජන වැනි නැගී එන අභියෝගවලට ඔරොත්තු දීමේ හැකියාව සහතික කරයි.***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**3.10.1.විශ්‍රාම වැටුප් ආශ්‍රිත සේවාවන්හි සම්පූර්ණ ප්‍රදේශය ආවරණය කිරීම සඳහා සියලුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ආරක්ෂිත, ඒකාබද්ධිත විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධති යෙදවීම ඒකාබද්ධ කිරීම සහ පුළුල් කිරීම.**

මෙයට, පවතින මොඩියුල පුළුල් කිරීම සහ අන්තර් සම්බන්ධ කිරීම ඇතුළත් වේ:

- ගෙවීම් තත් කාලීනව සැකසීම, විශ්‍රාම වැටුප් තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ උසස්වීම්, හිඟ වැටුප් සහ විශ්‍රාම වයස් සැකසීම සම්බන්ධ යාවත්කාලීන කිරීම් සඳහා විද්‍යුත් විශ්‍රාම වැටුප් සේවා.

- ප්‍රාථමික විශ්‍රාමිකයාගේ මරණයෙන් පසු සුදුසුකම් ලත් යැපෙන්නන්ට ප්‍රතිලාභ කාලෝචිත, ස්වයංක්‍රීයව මාරු කිරීම සහතික කිරීම සඳහා වැන්දඹු සහ අනත්දරු ලේඛන.
- වැරදි සහගත ගෙවීම් වැළැක්වීම සහ වංචා පාලනය ශක්තිමත් කිරීම සඳහා සිවිල් ලියාපදිංචි පද්ධති (උදා: රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව) සමඟ ඒකාබද්ධ කර ඇති මරණ වාර්තාකරණ මොඩියුල.
- විශ්‍රාමිකයන් සඳහා සහනදායී අවසර පත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම සරල කිරීම සඳහා දුම්රිය ගමන් අවසර පත්‍ර ස්වයංක්‍රීයකරණය.

සියලුම මොඩියුල ආරක්ෂිත, ජෛවමිතික හෝ PIN-පාදක සත්‍යාපනය සමඟ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය සහ ජාතික අනන්‍යතා දත්ත සමුදාය වැනි ජාතික දත්ත සමුදායන් සමඟ අන්‍යෝන්‍යව ක්‍රියා කළ යුතුය. වැඩිහිටි විශ්‍රාමිකයන් සඳහා දේශීය භාෂා සහාය සහ පරිශීලක-හිතකාමී නිර්මාණය හරහා අතුරුමුහුණත් ප්‍රවේශ්‍යතාවයට ප්‍රමුඛත්වය දිය යුතුය.

දිස්ත්‍රික් මට්ටමේ විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා පුහුණුව සහ දුරස්ථ ප්‍රජාවන් සඳහා ජංගම සහාය සේවා, තවදුරටත් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි. දෙපාර්තමේන්තුවේ පවතින ඩිජිටල් යටිතල පහසුකම් සහ ජයග්‍රහණ මත ගොඩනැගීමෙන්, මෙම මුලපිරීම විනිවිද පෙනෙන, කාර්යක්ෂම සහ පුරවැසි කේන්ද්‍රීය විශ්‍රාම වැටුප් සේවාවන් ඉදිරියට ගෙන යනු ඇති අතර, ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සහ ඩිජිටල් පාලනයේ පුළුල් ඉලක්කවලට දායක වේ.

---

**3.10.2.ඩිජිටල් සාක්ෂරතාවය සහ යොදා ගැනීමේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලය සහ විශ්‍රාමිකයන් යන දෙපිරිස ඉලක්ක කර ගනිමින් ව්‍යුහගත වෙනස්වීම් කළමනාකරණ වැඩසටහන් සහ ධාරිතා වර්ධන වැඩමුළු ක්‍රියාත්මක කිරීම, පෙර අනිෂ්ට මෘදුකාංග (Ransomware) ප්‍රතිසාධන අත්දැකීම් වලින් ආදර්ශ උකහා ගැනීම.**

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

විශ්වාසය සහ යොදාගැනීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සඳහා පෙර සයිබර් ආරක්ෂණ සිදුවීම් ආදර්ශ උපයෝගී කර ගනිමින්, පරිපාලන කාර්ය මණ්ඩලය සහ විශ්‍රාමිකයන් යන දෙපිරිසටම ඉලක්ක කරගත් ඩිජිටල් සාක්ෂරතාවය සහ වෙනස්වීම් කළමනාකරණ මුලපිරීම් දියත් කිරීම.

ශ්‍රී ලංකාව ඩිජිටල් විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධති පුළුල් කරන විට, සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික යටිතල පහසුකම් පමණක් නොව මානව සූදානම කෙරෙහි ඕනෑකමින් අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. පරිපාලන කාර්ය මණ්ඩලය සහ විශ්‍රාමිකයන් යන දෙපාර්ශවයටම - විශේෂයෙන් වැඩිහිටි සහ අඩු තාක්ෂණික සාක්ෂරතාවයෙන් යුත් පරිශීලකයින්ට - විශ්වාසයෙන් යුතුව ඩිජිටල් පද්ධතිවලට සංක්‍රමණය විය හැකි බව සහතික කිරීම සඳහා හොඳින් ව්‍යුහගත වෙනස්වීම් කළමනාකරණ වැඩසටහනක් අත්‍යවශයවේ.

මෙම මුලපිරීමට පහත සඳහන් සංරචක ඇතුළත්ය:

- **පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ව්‍යුහගත වෙනස්වීම් කළමනාකරණය**:
  - පද්ධති මෙහෙයුම්, දත්ත ආරක්ෂණ ප්‍රොටෝකෝල්, දෝෂ නිරාකරණය සහ සේවාලාභියා හා සපයන්නා අතර සෘජු අන්තර් ක්‍රියා සහාය කෙරෙහි අවධානය යොමු කළ පුහුණු විෂයමාලා සංවර්ධනය කිරීම.
  - පුහුණුකරුවන් පුහුණු කිරීම (ToT) මොඩියුල සමඟ කැස්කේඩ ආකෘතියක්( cascading model) (ජාතික → දිස්ත්‍රික් → ප්‍රාදේශීය මට්ටම) හරහා ධාරිතා ගොඩනැගීමේ සැසි ලබා දීම.

    - පෙර අනිෂ්ඨ මෘදුකාංග හෝ සයිබර් ප්‍රහාර සිදුවීම් (උදා: පද්ධති ප්‍රතිසාධන ප්‍රොටෝකෝල, සන්නිවේදන උපාය මාර්ග, ආරක්ෂිත උපස්ථ පිළිවෙත්) වලින් සිද්ධි අධ්‍යයන ඇතුළත් වන අවස්ථා-පාදක ඉගෙනීම ඇතුළත් කිරීම.
    - සංක්‍රාන්ති අවධියේදී තාක්ෂණික විමසීම් සඳහා සම වයසේ උපදේශකයින් සහ පළමු ප්‍රතිචාර දක්වන්නන් ලෙස ක්‍රියා කිරීම සඳහා සෑම ලේකම් කාර්යාලයක් තුළම "ඩිජිටල් ශූරයන්" නම් කිරීම.
- **විශ්‍රාමිකයන් සඳහා ඩිජිටල් සාක්ෂරතා වැඩමුළු:**
    - දේශීය භාෂා සහ ප්‍රායෝගික නිරූපණ භාවිතා කරමින් නිතිපතා, ප්‍රජා පාදක ඩිජිටල් දැනුම ඇති කිරීමේ සැසි සංවිධානය කිරීම.
    - විද්‍යුත් විශ්‍රාම වැටුප් ද්වාර භාවිතා කරන ආකාරය, කෙටි පණිවිඩ (SMS) /ඊමේල් ඇඟවීම් තේරුම් ගන්නා ආකාරය සහ ප්‍රතිලාභ මාරු කිරීම් සත්‍යාපනය කරන ආකාරය හෝ පුද්ගලික දත්ත යාවත්කාලීන කරන ආකාරය පිළිබඳ අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කිරීම.
    - සහාය ලබා ගතහැකි ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා හැකි සෑම තැනකම පවුලේ සාමාජිකයන් හෝ සත්කාර සේවා සපයන්නන් සම්බන්ධ කර ගැනීම.
    - අමතර සහාය සඳහා නිදර්ශන පියවර  ගැනීම  සහ ක්ෂණික දුරකථන අංක සහිත මුද්‍රිත මාර්ගෝපදේශ භාවිතා කිරීම.
- **සයිබර් ආරක්ෂණ විනිවිදභාවය තුළින් විශ්වාසය ගොඩනැගීම:**
    - පද්ධති ආරක්ෂා කර ඇති ආකාරය, අතීත සයිබර් සිදුවීම් වලින් ඉගෙන ගත් දේ (උදා: අනිෂ්ට මෘදුකාංග ප්‍රහාර) සහ දැන් ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සරල කළ කෙටි විස්තර පරිශීලකයින් සමඟ බෙදා ගැනීම.
    - බාධා සිදුවන විට වලදී විනිවිද භාවයෙන් යුතු සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම සහ සූදානම් වීමේ අභ්‍යාස සඳහා විශ්‍රාමික සංගම් සම්බන්ධ කර ගැනීම.
- **අධීක්ෂණය සහ ප්‍රතිපෝෂණ(Feedback) ලූප:**
    - පරිශීලක අත්දැකීම් රැස් කිරීමට සහ පුහුණු අන්තර්ගතයන් නැවත නැවත වැඩිදියුණු කිරීමට කෙටි සමීක්ෂණ හෝ ප්‍රජා සංසද වැනි ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.
    - අමතර සහාය   අවශ්‍ය  ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා අවබෝධාත්මක මිනුම් සහ ඩිජිටල් සම්බන්ධතාවයන් නිරීක්ෂණය.

මෙම සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග හරහා, රජයට සුමට ඩිජිටල් භාවිතය සහතික කිරීමට, ඩිජිටල් පද්ධති කෙරෙහි විශ්වාසය ගොඩනඟා ගැනීමට සහ ශ්‍රී  ලංකාවේ විශ්‍රාම වැටුප් නවීකරණ උත්සාහයන්හි සමස්ත සාර්ථකත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට හැකිය.

---

### 3.10.3. විශ්‍රාම වැටුප් ගෙවීම් ස්වයංක්‍රීය කිරීමට, ප්‍රමාදයන් අඩු කිරීමට, භෞතිකව මුදල් භාවිතය අවම කිරීමට සහ පහසුව වැඩි දියුණු කිරීමට LankaQR සහ GovPay වැනි ජංගම සහ ඩිජිටල් ගෙවීම් පද්ධති භාවිතා කිරීම

**මෙහෙයුම් යාන්ත්‍රණය:**
විශ්‍රාමිකයන්ට කාලෝචිත, ආරක්ෂිත සහ පහසු අරමුදල් මාරු කිරීම සහතික කිරීම සඳහා LankaQR සහ GovPay වැනි ජංගම සහ ඩිජිටල් ගෙවීම් පද්ධති සමඟ විශ්‍රාම වැටුප් බෙදාහැරීමේ පද්ධති ඒකාබද්ධ කිරීම

විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකිරීම මිනිස් ශ්‍රමය මත පදනම්ව මුදල් ගෙවීමේ ක්‍රමවලින් ස්වයංක්‍රීය ඩිජිටල් පද්ධතිවලට මාරුවීම මගින් විවිධ මෙහෙයුම් ක්‍රම සහ ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ලබාදීම

- **ස්වයංක්‍රීයකරණය සහ කාලෝචිතභාවය:**
  - ස්වයංක්‍රීය ඩිජිටල් ගෙවීම් තුලින් අතින් සැකසීම, භෞතික චෙක්පත් නිෂ්කාශනය හෝ පුද්ගලයන් මගින් එකතු කිරීමේ ක්‍රම නිසා ඇතිවන ප්‍රමාදයන් ඉවත් කිරීම.
  - ගෙවීම් කාලසටහන්, පද්ධතියට වැඩසටහන්ගත කළහැකි අතර, මානව මැදිහත්වීම් හෝ දෝෂ නොමැතිව කාලෝචිත මාසික ගෙවීම් සහතික කිරීම.
  - විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත සමුදායන් සමඟ ඒකාබද්ධ වීම මගින් ප්‍රතිලාභීන් සඳහා තත් කාලීන යාවත්කාලීන කිරීම් සහ දැනුම්දීම් සක්‍රීය කිරීම.
- **විශ්‍රාමිකයන් සඳහා වැඩි දියුණු කළ පහසුව:**
  - විශ්‍රාමිකයන්ට ජංගම දුරකථන හෝ මූලික විශේෂාංග දුරකථන හරහා ප්‍රවේශ විය හැකි ජංගම මුදල් පසුම්බි හෝ බැංකු ගිණුම් වෙතින් සෘජුවම අරමුදල් ලබා ගත හැකි අතර, මූල්‍ය ඇතුළත් කිරීම වැඩිදියුණු කිරීම.
  - ග්‍රාමීය හෝ ස්ථිර විශ්‍රාමිකයන් සඳහා, ඩිජිටල් ගෙවීම් සඳහා දිගු දුරක් ගමන් කිරීමේ අවශ්‍යතාවය අඩු කරයි, ආරක්ෂාව සහ සුවපහසුව වැඩි දියුණු කිරීම
  - LankaQR වැනි පුළුල් ලෙස භාවිතා කරන පද්ධති භාවිතා කිරීම මගින් විවිධ සිල්ලර වෙළඳසැල්වල හෝ බැංකු නියෝජිතයින්ගේ QR කේත ස්කෑන් කිරීම හරහා ගෙවීම් සක්‍රීය කරයි, ප්‍රවේශ වීමේ අවස්ථා පුළුල් කිරීම
- **මුදල් මත යැපීම සහ අවදානම් අඩු කිරීම:**
  - මුදල් මත යැපීම අඩු කිරීම මඟින් මුදල් බෙදා හැරීම සහ එකතු කිරීමේදී සොරකම් කිරීම, පාඩු හෝ ව්‍යාජ මුදල් හැසිරවීම වැනි අවදානම් අවම කිරීම.
  - ප්‍රවාහනය සහ ආරක්ෂක නිලධාරීන් සම්බන්ධ පරිපාලන වියදම් ඩිජිටල් ගෙවීම් මුදල් හැසිරවීම මගින් අඩු කිරීම.
  - ඩිජිටල් මංපෙත්, විනිවිදභාවය සහ විගණන හැකියාව වැඩි දියුණු කරමින් විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණයේ වගවීම ශක්තිමත් කිරීම
  - 
- **යටිතල පහසුකම් සහ ප්‍රජා සත්කාරයට සහාය වීම:**
  - බාධාවකින් තොරව අරමුදල් මාරු කිරීම් සඳහා විශ්‍රාම වැටුප් දත්ත සමුදායන් සහ ගෙවීම් පද්ධති අතර අන්තර් ක්‍රියාකාරිත්වය සහතික කිරීම.
  - ජංගම මුදල් පසුම්බි, QR කේත ගෙවීම් සහ GovPay යෙදුම් භාවිතා කිරීම පිළිබඳව විශ්‍රාමිකයන්ට පුහුණුව සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර ලබා දීම.

- තාක්ෂණික අභියෝගවලට මුහුණ දෙන විශ්‍රාමිකයන්ට සහාය වීම සඳහා උපකාරක පද්ධති සහ පරිශීලක සහාය මාර්ග ස්ථාපිත කිරීම.

- **අධීක්ෂණය සහ ප්‍රතිපෝෂණය:**
    - ඩිජිටල් ගෙවීම් ක්‍රියාවලිය අඛණ්ඩව ප්‍රශස්ත කිරීම සඳහා බෙදාහැරීමේ සාර්ථකත්ව අනුපාත, ගෙවීමට කාලය සහ පරිශීලක තෘප්තිය නිරීක්ෂණය.
    - අමතර සහාය හෝ විකල්ප ගෙවීම් ක්‍රම අවශ්‍ය විය හැකි විශ්‍රාමිකයන් හඳුනා ගැනීමට විශ්‍රාම වැටුප් දත්ත භාවිතා කිරීම.

මෙම ජංගම සහ ඩිජිටල් ගෙවීම් විසඳුම් අනුගමනය කිරීමෙන්, විශ්‍රාම වැටුප් පද්ධතිය වඩාත් කාර්යක්ෂම, ප්‍රවේශ විය හැකි සහ ආරක්ෂිත වන අතර, ශ්‍රී ලංකාව පුරා මිලියන සංඛ්‍යාත විශ්‍රාමිකයන් සඳහා සේවා අත්දැකීම සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරයි.

---

### 3.10.4. සංවේදී විශ්‍රාමික දත්ත ආරක්ෂා කිරීමට සහ අඛණ්ඩ සේවා සහතික කිරීමට නිතිපතා උපස්ථකිරීම(Backups), අධීක්ෂණය සහ හදිසි සැලසුම් සමඟ සයිබර් ආරක්ෂණ ප්‍රොටෝකෝල ශක්තිමත් කිරීම.

**මෙහෙයුම් යාන්ත්‍රණය:**
විශ්‍රාමිකයින්ගේ තොරතුරු ආරක්ෂා කිරීමට සහ අඛණ්ඩ විශ්‍රාම වැටුප් සේවා පවත්වා ගැනීමට නිතිපතා දත්ත උපස්ථ කිරීම, අඛණ්ඩ පද්ධති අධීක්ෂණය සහ හොඳින් අර්ථ දක්වා ඇති හදිසි සැලසුම් ඇතුළත් පුළුල් සයිබර් ආරක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කිරීම.

වර්ධනය වන සයිබර් තර්ජන සමඟ විශ්‍රාමික දත්තවල තීරණාත්මක වැදගත්කම සහ සංවේදීතාව සැලකිල්ලට ගෙන, මෙම තොරතුරු ආරක්ෂා කිරීමට සහ ඩිජිටල් විශ්‍රාම වැටුප් පද්ධති කෙරෙහි විශ්වාසය තහවුරු කිරීමට, රජය ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවරයන්ට ප්‍රමුඛත්වය දිය යුතුය:

- **නිත්‍ය සහ ආරක්ෂිත දත්ත උපස්ථ කිරීම් :**
    - ප්‍රතිලාභී වාර්තා, ගෙවීම් ඉතිහාසය සහ අනන්‍යතා තොරතුරු ඇතුළුව සියලුම විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත සමුදායන්හි නිතිපතා ස්වයංක්‍රීය උපස්ථ කිරීම් .
    - දේශීයකරණය වූ භෞතික හෝ සයිබර් සිදුවීම් වලින් ඇතිවන අවදානම් අවම කිරීම සඳහා භූගෝලීය වශයෙන් වෙන් කරන ලද, සංකේතනය කරන ලද දත්ත(Encrypted data) මධ්‍යස්ථාන හෝ Cloud පරිසරවල ආරක්ෂිතව උපස්ථ ගබඩා කිරීම.
    - දත්ත අඛණ්ඩතාව සහ ප්‍රතිස්ථාපන වේගය සත්‍යාපනය කිරීම සඳහා වරින් වර උපස්ථ ප්‍රතිස්ථාපන ක්‍රියාවලීන් පරීක්ෂා කිරීම.
- **තත් කාලීන පද්ධති අධීක්ෂණය සහ තර්ජන අනාවරණය:**
    - සැක සහිත හැසිරීම් රටා හඳුනාගැනීම සඳහා, පද්ධති හැසිරීම්, පරිශීලක ක්‍රියාකාරකම් සහ ජාල ගමනාගමනය නිරීක්ෂණය කරන උසස් ආක්‍රමණ හඳුනාගැනීමේ සහ වැළැක්වීමේ පද්ධති (IDPS) යෙදවීම.

- ආරක්ෂක ලොග් එකතු කර විශ්ලේෂණය කිරීමට ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණය (SIEM) මෙවලම් භාවිතා කිරීම, සිදුවීමට වැඩි ඉඩකඩක් ඇති තර්ජන වලට වේගවත් හඳුනා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලබා දීම.
- පද්ධතියේ අඛණ්ඩ නිවැරදි බව සහ තර්ජන අවම කිරීම අධීක්ෂණය කිරීම සඳහා පුහුණු විශ්ලේෂකයින්ගෙන් සමන්විත කැපවූ සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) පවත්වා ගැනීම.

- **දත්ත සංකේතනය සහ ප්‍රවේශ පාලනය:**
  - අනවසර බාධා කිරීම් හෝ විකෘති කිරීම් වැළැක්වීම සඳහා පවතින විට සහ හුවමාරු වන විට දත්ත සඳහා අන්ත අතර සංකේතනය(end-to-end encryption)ක්‍රියාත්මක කිරීම.
  - බහු-සාධක සත්‍යාපනය (MFA) සමඟින්, සංවේදී විශ්‍රාමික දත්ත වෙත බලයලත් පුද්ගලයින්ට පමණක් ප්‍රවේශ විය හැකි බව සහතික කරමින්, දැඩි, භූමිකාව මත පදනම් වූ ප්‍රවේශ පාලන (RBAC) යෙදවීම.
  - අවම වරප්‍රසාද මූලධර්ම බලාත්මක කිරීම, එක් එක් පරිශීලකයාගේ භූමිකාව සඳහා අවශ්‍ය කරුණට පමණක් දත්ත නිරාවරණය සීමා කිරීම.

- **විස්තීර්ණ ආපදා ප්‍රතිසාධන සහ ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීමේ සැලසුම්:**
  - සයිබර් සිදුවීම්, දත්ත බිඳී යාම්, දෘඩාංග අසාර්ථකත්වයන් හෝ අනිශ්ට මෘදුකාංග ප්‍රහාරවලට ප්‍රතිචාර දැක්වීම සඳහා පියවරෙන් පියවර ක්‍රියා පටිපාටි ගෙනහැර දක්වන සවිස්තරාත්මක හදිසි සැලසුම් සංවර්ධනය කිරීම.
  - පද්ධති ඇනහිටීම් වලදී අත්‍යවශ්‍ය විශ්‍රාම වැටුප් බෙදා හැරීමේ කාර්යයන් පවත්වා ගැනීම සඳහා උපස්ථ සන්නිවේදන මාර්ග සහ භෞතික සැකසුම් ප්‍රොටෝකෝල ස්ථාපිත කිරීම.
  - සූදානම් සහ වේගවත් ප්‍රතිචාර හැකියාවන් සහතික කිරීම සඳහා විශ්‍රාම වැටුප් කාර්යාල කාර්ය මණ්ඩලය සමඟ නිතිපතා සයිබර් ආරක්ෂණ පෙරහුරු සහ පුහුණු පැවැත්වීම.

- **අනුකූලතා සහ විගණන යාන්ත්‍රණ**
  - ජාතික සහ ජාත්‍යන්තර දත්ත ආරක්ෂණ ප්‍රමිතීන් සමඟ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති පෙළගැස්වීම. (උදා: ශ්‍රී ලංකාවේ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත, ISO 27001).
  - දුර්වලතා කල්තියා හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා වරින් වර ආරක්ෂක විගණන, අවදානම් තක්සේරු කිරීම් සහ විනිවිද යාමේ පරීක්ෂණ ස්ථාපිතය.
  - සයිබර් ආරක්ෂණ ස්ථාවරය වලංගු කිරීමට සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීමට ස්වාධීන තෙවන පාර්ශවීය විගණකවරුන් සම්බන්ධ කර ගැනීම.
  -

- **ධාරිතා ගොඩනැගීම සහ දැනුවත්භාවය:**
  - සියලුම විශ්‍රාම වැටුප් කාර්යාල සේවකයින්ට සයිබර් ආරක්ෂණ හොඳම පිළිවෙත්, තතුබෑම (phishing)පිළිබඳ දැනුවත්භාවය සහ සිදුවීම් වාර්තා කිරීමේ ප්‍රොටෝකෝල පිළිබඳව පුහුණු කිරීම.

- පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සහ විශ්‍රාම වැටුප් ගෙවීම්වලට අදාළ වංචා උත්සාහයන් හඳුනා ගැනීම පිළිබඳව විශ්රාමිකයන් දැනුවත් කිරීම.

මෙම සයිබර් ආරක්ෂණ පියවරයන් ඇතුළත් කිරීමෙන්, රජයට විශ්‍රාම වැටුප් දත්තවල රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබා ගත හැකි බව සහතික කළ හැකිය, සේවාවන් සඳහා බාධා වැළැක්වීමට සහ ශ්‍රී ලංකාවේ ඩිජිටල් විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිවල විශ්‍රාමිකයන් සහ අනෙකුත් කොටස්කරුවන්ගේ විශ්වාසය පවත්වා ගත හැකිය.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**: පද්ධති ක්‍රියාත්මක කිරීම සහ සේවා සැපයීම මෙහෙයවීම.
• **මුදල් අමාත්‍යාංශය**: අරමුදල් සැපයීම සහ ප්‍රතිපත්ති අධීක්ෂණය සැපයීම.
• **දිස්ත්‍රික් ලේකම් කාර්යාල**: අදාල ප්‍රදේශයට ගැලපෙන ලෙස ඩිජිටල් සේවා ක්‍රියාත්මක කිරීම.
• **තාක්ෂණ සේවා සපයන්නන්**: පද්ධති සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා සහාය වීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**
• වෙනස්වීම් කළමනාකරණ රාමු සහ ඩිජිටල් සාක්ෂරතා ව්‍යාපාර.
• සයිබර් ආරක්ෂණ සිදුවීම් ප්‍රතිචාර කණ්ඩායම් සහ ප්‍රොටෝකෝල.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**
• විශ්‍රාම වැටුප් ගෙවීමේ කාලෝචිතභාවය සහ දෝෂ අනුපාත.
• කාර්ය මණ්ඩලය සහ විශ්‍රාමිකයන් අතර ඩිජිටල් සාක්ෂරතා මට්ටම්.
• පද්ධති ක්‍රියාකාරී කාලය සහ ආරක්ෂක සිදුවීම් වාර්තා.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**
• ඩිජිටල් යටිතල පහසුකම් සහ සයිබර් ආරක්ෂාව සඳහා ආයෝජන.
• විශ්‍රාම වැටුප් කාර්ය මණ්ඩලය සහ ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන්.
• කැපවූ සහාය ලබා දෙන ස්ථාන(Helpdesk) සහ තාක්ෂණික සහාය ඒකක.

## 04 වන කුළුණ : ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුල් වීම

---

**4.1. ඒකාබද්ධ සක්‍රීය කිරීමේ සේවා ක්‍රියාත්මක කිරීම.**

***සමාජ අධාර ලබන්නන් සේවා නියුක්තියට, පුහුණුවට සහ සමාජ සේවා වෙත යොමුවීමේදී , තිරසාර ලෙස ආර්ථිකයට ඇතුළත් කිරීමට පහසුකම් සපයමින් ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය කරන ලද සක්‍රීය කිරීමේ කණ්ඩායම් මගින් සමාජ ආධාර ලබන්නන් වෙත සහාය ලබාදීම.***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**4.1.1. දරිද්‍රතාවය පිටුදැකීමේ සහ අනෙකුත් මුල්‍ය සහන ලබන අයට සහාය වීම සඳහා සමාජ ආධාර නිලධාරීන්, රැකියා උපදේශකයින්, වෘත්තීය පුහුණුකරුවන් සහ සමාජ සේවකයින්ගෙන් සමන්විත සම්බන්ධීකරණ සක්‍රීය කිරීමේ කණ්ඩායම් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ස්ථාපිත කිරීම.**

සමාජ ආධාර ලබන පුද්ගලයින්ට ඵලදායී ලෙස සහාය වීම සඳහා, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම් දෙකෙහිම විවිධ ආකාරයේ "සක්‍රීය කිරීමේ කණ්ඩායම්" පිහිටුවන අතර . මෙම කණ්ඩායම්වලට ඇතුළත් වනුයේ

- ප්‍රතිලාභ නොකඩවා ලැබීම සහ වැඩසටහන්, නියමයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා සමාජ සහාය නිලධාරීන්.
- කුසලතා, රුචිකත්වයන් සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා මත පදනම්ව විකල්ප රැකියා සොයා යන පුද්ගලයින්ට මඟ පෙන්වීම සඳහා රැකියා උපදේශකයින්.
- කුසලතා ගොඩනැගීම පිළිබඳ උපදෙස් ලබා දීමට සහ අදාළ පුහුණු වැඩසටහන්වලට පුද්ගලයින් සම්බන්ධ කිරීමට වෘත්තීය පුහුණුකරුවන්.
- ප්‍රතිලාභීන් ආර්ථික ක්‍රියාකාරකම්වලට සහභාගී වීම වැළැක්විය හැකි මනෝ සමාජීය හෝ ව්‍යුහාත්මක බාධක (රැකවරණ බාධාවන්, ගෘහස්ථ හිංසනය හෝ මානසික සෞඛ්‍ය ගැටළු වැනි) හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට සමාජ සේවකයින්.

මෙම කණ්ඩායම් නිතිපතා හමුවී, සිද්ධි කළමනාකරණය, සම්බන්ධීකරණය, ප්‍රතිලාභීන් බලගැන්වීම සහ සුභසාධනයෙන් ඔබ්බට ගොස් රැකියා සඳහා මාරුවීම සහතික කිරීම සඳහා පළාත් පාලන ඒකක, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන් සමඟ එක්ව කටයුතු කිරීම

---

**4.1.2.ආධර ලබන්නන් ගේ අවශ්‍යතා තක්සේරු කිරීම, එක් එක් පුද්ගලයාට ගැලපෙන සේවා නියුක්තිය සහ පුහුණු සැලසුම් සංවර්ධනය කිරීම, සහ පවතින ශ්‍රම වෙළඳපොළ වැඩසටහන් සහ සමාජ සේවා සඳහා ප්‍රවේශය පහසු කිරීම.**

සෑම ප්‍රතිලාභියෙකුම අද්විතීය ලෙස සලකනු ලබන අතර සක්‍රීය කිරීමේ කණ්ඩායම්:

- කුසලතා, අධ්‍යාපන පසුබිම, ගෘහ ඒකක වගකීම්, සෞඛ්‍ය තත්ත්වයන් සහ රැකියාවට ඇති බාධක (ප්‍රවාහනය, ළමාරක්ෂක සේවා, වෙනස්කම් කිරීම ආදිය) පිළිබඳ **පුළුල් තක්සේරුවක් සිදු කිරීම.**
- දේශීය ශ්‍රම වෙළඳපොළ ඉල්ලීම්වලට අනුකූලව සකස් කරන ලද **රැකියා සක්‍රීය කිරීමේ සැලසුම්,** සුදුසු වෘත්තීය මාර්ග හඳුනා ගනිමින්, පුහුණු අවශ්‍යතා සහ පුද්ගලික සංවර්ධන ඉලක්ක සංවර්ධනය කිරීම.
    - ජාතිකව සහ ප්‍රාදේශීයව රැකියා ස්ථානගත කිරීමේ වැඩසටහන්
    - රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන
    - ක්ෂුද්‍ර ව්‍යවසාය සඳහා ආධාරක යෝජනා ක්‍රම
    - ළමාරක්ෂක සේවා, ප්‍රවාහන සහනාධාර, මනෝ සමාජීය සහාය සහ සෞඛ්‍ය සේවා වැනි සහායක සේවා ආදීන් සමග සම්බන්ධතා සඳහා පහසුකම් සැපයීම.

මෙම පුද්ගලාරෝපිත ප්‍රවේශය, ගරුත්වය දිරිගැන්වීම, පුද්ගල විශ්වාසය වැඩි දියුණු කිරීම මගින් සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් ආදායම් සහාය පමණක් නොව ආර්ථික අන්තර්කරණය සඳහා ඔසවා තැබීමක් ලෙසද සැලකේ.

**4.1.3. යොමු කිරීම් විධිමත් කිරීමට සහ ප්‍රතිලාභීන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට රැකියා සඳහා ලියාපදිංචි ලේඛන, වෘත්තීය පුහුණු සපයන්නන් සහ සේවා යෝජකයන් සතු දත්ත ජාල සමඟ සමාජ ආධාර දත්ත සමුදායන් සම්බන්ධ කරන ඒකාබද්ධ ඩිජිටල් වේදිකාවක් සංවර්ධනය කිරීම .**

කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය උපරිම කිරීම සඳහා ජාතික සක්‍රිය කිරීමේ තොරතුරු පද්ධතියක් සැදීම:

•**දරිද්‍රතාවයට මුදල් සහන ලබා දෙන සහ අනෙකුත් සුභසාධන ලබන්නන්ගේ දත්ත සමුදායන්** රාජ්‍ය සහ පෞද්ගලික රැකියා පුරප්පාඩු දක්වන ද්වාර, TVET සැපයුම්කරුවන්ගේ ලේඛන සහ සේවායෝජක ජාල ඩිජිටල් ලෙස සම්බන්ධ කිරීම.

- **සක්‍රීය කිරීමේ කණ්ඩායම්වලට**:
  - රැකියා අවස්ථා හෝ පුහුණු අවස්ථා සඳහා පුද්ගලයින් තත්‍ය කාලීනව යොමු කිරීම
  - පැමිණීම, පුහුණුව සම්පූර්ණ කිරීම සහ රැකියා ස්ථානගත කිරීමේ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම
  - දිගු කාලීන ප්‍රතිලාභීන්ගේ ප්‍රගතිය සහ ශ්‍රම බලකායට නැවත ඇතුළත් වීම නිරීක්ෂණය කිරීම,ඉඩ ලබා දීම.
- දත්ත විශ්ලේෂණ මත පදනම්ව සක්‍රීය කිරීමේ උත්සාහයන්හි ඵලදායීතාවය ඇගයීමට සහ වැඩසටහන් නිර්මාණය වැඩිදියුණු කිරීමට වාර්තා ජනනය කිරීමට.

මෙම වේදිකාව ජංගම උපාංග වලට ප්‍රතිචාරාත්මක, විවිධ භාෂා පහසුකම් සහිත සහ ආරක්ෂිත වේදිකාවක් වන අතර, රජය, සිවිල් සමාජය සහ සේවායෝජක හවුල්කරුවන් සඳහා භූමිකාව මත පදනම් සුදුසු ප්‍රවේශයක් තිබීම.

---

**4.1.4. කාන්තාවන්, තරුණයින් සහ ආබාධිත පුද්ගලයින් වැනි ආන්තික කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින් සක්‍රීය කිරීමේ සේවා පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් පැවැත්වීම**

රැකියා සහ පුහුණු සේවා ලබා ගත හැකි වුවද, බොහෝ ප්‍රතිලාභීන් - විශේෂයෙන් ආන්තික කණ්ඩායම් වලින් පැමිණෙන අය සංස්කෘතික, භූගෝලීය හෝ තොරතුරු බාධක හේතුවෙන් ඒවා පිළිබඳව නොදැන හෝ ඒවාට ප්‍රවේශ වීමට පසුබට වීම සලකමින් :

සක්‍රීය කිරීමේ සේවා සහ අවස්ථා පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා **ප්‍රජා පාදක ජංගම ප්‍රජා සේවා වැඩසටහන්** (ග්‍රාම නිලධාරී, ප්‍රජා කණ්ඩායම් සහ ආගමික ආයතන හරහා) දියත් කිරීම.

- **විශේෂ අවධානයක් යොමු කළ යුත්තේ**:
- අමතර සත්කාර සේවා දුෂ්කරතාවලට මුහුණ දෙන කාන්තාවන්, විශේෂයෙන් වැන්දඹුවන් හෝ තනි මව්වරුන්.
- සීමිත වැඩ පළපුරුද්දක් හෝ මෘදු කුසලතා ඇති තරුණ ප්‍රජාව
- විශේෂ සේවා, සහායක තාක්ෂණය සහ ප්‍රවේශ විය හැකි වැඩ පරිසරයන් අවශ්‍ය ආබාධ සහිත පුද්ගලයින්.

•ජංගම ප්‍රජා සෞඛ්‍ය සේවා මෙවලම් අතර ගම් මට්ටමේ වැඩමුළු, ජංගම තොරතුරු වෑන් රථ, කෙටි පණිවුඩ අනතුරු ඇඟවීම්, ගුවන් විදුලි සහ සමාජ මාධ්‍ය ව්‍යාපාර සහ සම උපදේශක තානාපතිවරුන් ඇතුළත් විය හැකිය.

සක්‍රිය කිරීමේ සේවාවන් දෘශ්‍යමාන, අදාළ සහ සියළු දේ ඇතුළත් කිරීම මගින්, ආර්ථික ස්වයංපෝෂිතභාවය සඳහා වන මාර්ගවල වැඩි පිරිසක් ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීම

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **කම්කරු අමාත්‍යාංශය**: සක්‍රිය කිරීමේ කණ්ඩායම්වල ප්‍රතිපත්ති මඟ පෙන්වීම සහ අධීක්ෂණය.
• **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව** : සමාජ ආධාර ප්‍රතිලාභී දත්ත කළමනාකරණය කිරීම සහ සක්‍රිය කිරීමේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම.
• **දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල**: සක්‍රිය කිරීමේ කණ්ඩායම් සත්කාරකත්වය සහ ක්‍රියාත්මක කිරීම.
• **වෘත්තීය පුහුණු අධිකාරීන් සහ සේවා යෝජකයින්**: පුහුණු අවස්ථා සහ රැකියා ස්ථානගත කිරීම් සැපයීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- ඩිජිටල් සිද්ධි කළමනාකරණ පද්ධති.
- දිස්ත්‍රික් මට්ටමින් අන්තර් ආයතන සම්බන්ධීකරණ කමිටු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• සක්‍රිය කිරීමේ සේවාවන් සඳහා ලියාපදිංචි වූ සමාජ ආධාර ලබන්නන් සංඛ්‍යාව.

• රැකියා ස්ථානගත කිරීම සහ පුහුණුව සම්පූර්ණ කිරීමේ අනුපාත.

• ප්‍රතිලාභීන්ගේ තෘප්තිය සහ ආර්ථික ප්‍රතිඵල සමීක්ෂණ.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• උපදේශන සහ ඩිජිටල් මෙවලම් පිළිබඳ සක්‍රිය කිරීමේ කණ්ඩායම් කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව.

• ඒකාබද්ධ ඩිජිටල් වේදිකා සංවර්ධනය හා නඩත්තුව.

• ප්‍රතිලාභීන් සඳහා ජංගම ප්‍රජා සේවා සහ ප්‍රවාහන සහාය සඳහා අයවැය.

---

**4.2. පොදු වැඩ සහ හරිත රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම**

*ප්‍රජා පාදක පොදු වැඩ වැඩසටහන් පාරිසරික හා සමාජීය අරමුණු සඳහා සහාය වෙමින් දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර යටිතල පහසුකම් සපයන සේවා නියුක්තියක් අරමුණු කිරීම*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**4.2.1. දේශගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම්, පාරිසරික ප්‍රතිසංස්කරණය, රැකවරණ ආර්ථිකය (උදා: වැඩිහිටි සත්කාර සහායකයින්) සහ ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ප්‍රජා පාදක පොදු වැඩ වැඩසටහන් දියත් කිරීම**

සාම්ප්‍රදායික මාර්ග ඉදිකිරීමේ හෝ ඉඩම් එළිපෙහෙළි කිරීමේ කාර්යයන් ඉක්මවා යාම සඳහා පොදු වැඩ වැඩසටහන් නැවත සැලසුම් කර නවීකරණය කිරීම , . අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක්විය හැකි නිවාස සඳහා **එලදායී, ඇතුළත් සහ ඉදිරි දැක්මක් සහිත රැකියා අවස්ථා නිර්මාණය කිරීම** මෙහි අරමුණයි. මෙම ප්‍රජා පාදක පොදු වැඩ වැඩසටහන් සැලසුම් කිරිම :

• වැසි ජලය රැස් කිරීමේ පද්ධති, ගංවතුරට ඔරොත්තු දෙන ග්‍රාමීය මාර්ග, නියඟයට ඔරොත්තු දෙන වාරිමාර්ග මාර්ග සහ ප්‍රජා නවාතැන් වැනි **දේශගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම.**

• දිගුකාලීන සමාජීය සහ ආර්ථික ප්‍රතිලාභ ඇති, නැවත වන වගාව, කඩොලාන ප්‍රතිසංස්කරණය, ජල පෝෂක කළමනාකරණය සහ පාංශු ඛාදනය පාලනය ඇතුළු **පාරිසරික පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම**.

• වැඩිහිටි රැකවරණ සහායකයින්, ළමා රැකවරණකරුවන් සහ ප්‍රජා සෞඛ්‍ය සේවකයින් ලෙස පුද්ගලයින් - විශේෂයෙන් කාන්තාවන් - පුහුණු කිරීම සහ සේවයේ යෙදවීම මගින්, රැකියා සහ ජනවිකාස රැකවරණ අවශ්‍යතා යන දෙකම සපුරාලීමෙන්, සත්කර සේවා **ආර්ථිකය සංවර්ධනය කිරීම**.

• ගම්මාන ප්‍රවේශ මාර්ග, වාරිමාර්ග පද්ධති, වෙළඳපොළ මඩු, සනීපාරක්ෂක පහසුකම් සහ ඩිජිටල් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම වැනි **ග්‍රාමීය සංවර්ධන ඉලක්ක ඉදිරියට ගෙන යාම**.

මෙම වැඩසටහන් ප්‍රජාව සතුව, දේශීයව සැලසුම් කළ , තිරසාරභාවය සහ දේශීය බලගැන්වීම සහතික වන තාක්ෂණික සහාය ඇතිව ක්‍රියාත්මකවන වැඩසටහන් ය.

---

**4.2.2. කාලීන විරැකියාව තුළ ආදායම් ආරක්ෂාව ලබා දෙමින් දිළිඳු නිවාස සඳහා පුරෝකථනය කළ හැකි පොදු වැඩ අවස්ථා සහතික කිරීම.**

සමාජ ආරක්ෂණයේ මූලික මූලධර්මවලින් එකක් වන්නේ සහාය පුරෝකථනය කිරීමේ හැකියාවයි. එබැවින්:

• විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතු  සාර්ථක නොවන  කාල වලදී හෝ පශ්චාත් පසු ආපදා ප්‍රතිසාධන කාලවලදී දුප්පත් සහ අවදානමට ලක්විය හැකි නිවාස සඳහා වැටුප් සහිත රැකියා අවස්ථා ලබා දෙන ව්‍යුහගත පොදු වැඩ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

• කාන්තා මූලික පවුල්, ආබාධ සහිත පුද්ගලයින් සිටින නිවාස හෝ වැඩිහිටි හෝ දිගුකාලීනව රෝගාතුර වූ සාමාජිකයන් රැකබලා ගන්නා නිවාස සඳහා ප්‍රමුඛතා සහාය ඇතිව ගෙවීම් සිදුකිරීම සහ  කාලෝචිත, සාධාරණ සහ ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී බව සහතික කිරීම.

• මෙම ප්‍රවේශය කෙටි කාලීන ආදායම් සහනයක් ලබා දෙන අතරම කුටුම්භවලට ඔවුන්ගේ මූල්‍ය කටයුතු වඩා හොඳින් සැලසුම් කිරීමට සහ ආහාර සුරක්ෂිතතාව, දරුවන්ගේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය පවත්වා ගැනීමට ඉඩ සලසනු ඇත.

• කාන්දුවීම් අඩු කිරීමට සහ විනිවිදභාවය වැඩි කිරීමට ජංගම මුදල් හෝ බැංකු ගිණුම්වලට සම්බන්ධව ඩිජිටල් ගෙවීම් පද්ධති භාවිතා කිරීම.

• මෙම යෝජනා ක්‍රමය ජාත්‍යන්තර යහපත් භාවිතයන්ගෙන් ආභාෂයක් ලබා ගත හැකි නමුත් ශ්‍රී ලාංකික සන්දර්භයට නම්‍යශීලීව අනුගත ව පවතී.

---

**4.2.3. පාරිසරික තිරසාරභාවය සහ ප්‍රජා අවශ්‍යතා සමඟ පෙළගැසුණු ප්‍රමුඛතා ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා පළාත් පාලන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.**

පොදු කටයුතු ඵලදායී හා අදාළ වීමට:

• ග්‍රාමීය සංවර්ධන කමිටු, ප්‍රාදේශීය සභා හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා **පහළ සිට ඉහළට ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා** යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.

ව්‍යාපෘති පහත පරිදිය:

- දිළිඳුතම සහ දේශගුණික-අවදානමට ලක්විය හැකි ප්‍රදේශ කරා ළඟා වීමට **භූගෝලීය වශයෙන් ඉලක්ක කිරීම.**
- **සමාජීය වශයෙන් ඇතුළත් වන**, කාන්තාවන්, තරුණයින් සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ සහභාගීත්වය සහතික කිරීම.
- පරිසරයට වන බලපෑම පිළිබඳ විශේෂඥ සමාලෝචනය සමගින් **පාරිසරික වශයෙන් තිරසාර බව** .

• පළාත් පාලන බලධාරීන්ට **සහභාගීත්ව සැලසුම් කිරීම, අයවැය කළමනාකරණය සහ කාර්ය සාධන අධීක්ෂණය** පිළිබඳ පුහුණුව ලබාදීම.

• **සමාජ විගණනය** සඳහා රාමුවක් නිර්මාණය කිරීම, ප්‍රජා සාමාජිකයින්ට ව්‍යාපෘති කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය සහ විනිවිදභාවය සමාලෝචනය කිරීමට ඉඩ සැලසීම.

මෙම විමධ්‍යගත, සහභාගීත්ව ආකෘතිය හිමිකාරිත්වය හා පාලනය වැඩිදියුණු කිරීම, සහ පොදු වැඩ ආයෝජන ප්‍රජාවට දිගුකාලීන ප්‍රතිලාභ ලබා දෙන බවට සහතික කිරීම.

---

**4.2.4. වැඩසටහනෙන් ඔබ්බට සහභාගිවන්නන්ගේ රැකියා නියුක්තිය වැඩි දියුණු කිරීම සඳහා පොදු වැඩ ව්‍යාපෘතිවල ධාරිතා ගොඩනැගීම සහ කුසලතා සංවර්ධන සංරචක ඇතුළත් කිරීම**.

පොදු වැඩ, මුදලට ලබා දෙන ශ්‍රමයට සීමා නොවිය යුතු වන අතර සහභාගිවන්නන්ට වඩාත් ස්ථාවර රැකියාවක් බවට පරිවර්තනය විය හැකි බව සහතික කිරීම සඳහා ඒවා **කුසලතා වැඩි දියුණු කිරීම සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය** සමඟ ඒකාබද්ධ කිරීම:

- ඉදිකිරීම්, පාරිසරික කළමනාකරණය, සත්කාර සේවා, කෘෂිකර්මාන්තය සහ ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ **රැකියා ස්ථාන පුහුණුව** හඳුන්වා දීම.
- වෘත්තීය පුහුණු ආයතන හෝ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම (TVEC) සමඟ එක්ව **සහතික ලබා දීම**.
- මූල්‍ය සාක්ෂරතාවය, සෞඛ්‍ය දැනුවත්භාවය, මූලික තොරතුරු තාක්ෂණ කුසලතා සහ සන්නිවේදන කුසලතා වැනි **ජීවන කුසලතා පුහුණුව** ලබා දීම.
- පොදු වැඩ ප්‍රතිලාභීන් සඳහා ක්ෂුද්‍ර ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්, ආධුනිකත්ව හෝ විධිමත් අංශයේ රැකියා වෙත මාරුවීම සඳහා **යොමු කිරීමේ මාර්ග** ස්ථාපිත කිරීම.

මෙම ප්‍රවේශය මගින් පොදු වැඩ, තාවකාලික ආදායම් විසඳුමක සිට, දිගුකාලීන රැකියා හැකියාව, ආර්ථික ඇතුළත් කිරීම සහ ඉහළ සංචලනය සඳහා වේදිකාවක් බවට පරිවර්තනය කිරීම

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

- **කම්කරු අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය**: වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඒකාබද්ධ කිරීම.
- **පළාත් පාලන අධිකාරීන්**: පොදු වැඩ ව්‍යාපෘති හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම.
- **ප්‍රජා පාදක සංවිධාන**: සහභාගිවන්නන් බලමුලු ගැන්වීම සහ අධීක්ෂණය.
- **පාරිසරික හා සමාජ ආරක්ෂාව පිළිබඳ විශේෂඥ රාජ්‍ය නොවන සංවිධාන**: තාක්ෂණික සහාය.

**සම්බන්ධීකරණ මෙවලම්:**

- ව්‍යාපෘති කළමනාකරණය සහ වැටුප් ලේඛන ඩිජිටල් පද්ධති.
- පාරිසරික සහ සමාජ ආරක්ෂණ රාමු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• සේවයේ නියුතු කුටුම්භ සංඛ්‍යාව සහ වැඩ කළ දින.
• ප්‍රජා යටිතල පහසුකම් සහ පාරිසරික දර්ශක මත බලපෑම් තක්සේරු කිරීම්.
• සහභාගිවන්නන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමේ නිරීක්ෂණය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• වැටුප් සහ ව්‍යාපෘති ද්‍රව්‍ය සඳහා අරමුදල්.
• පාරිසරික සහ සමාජ ආරක්ෂණ පිළිබඳ අධීක්ෂකවරුන් සඳහා පුහුණුව.
• අධීක්ෂණ සහ වාර්තා කිරීමේ මෙවලම්.

**4.3. ව්‍යවසාය සංවර්ධන සහයෝගය ශක්තිමත් කිරීම**

*ප්‍රධාන ප්‍රාග්ධනය, උපදේශකත්වය සහ වෙළඳපල සම්බන්ධතා සැපයීම, තරුණයින්, කාන්තාවන් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින්ට තිරසාර ව්‍යාපාර ආරම්භ කිරීමට සහ වර්ධනය කිරීමට බලගන්වන අතර, සියල්ල ඇතුළත් ආර්ථික වර්ධනයක් ඇති කරයි.*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**4.3.1. කුඩා ව්‍යාපාර ස්ථාපිත කර වර්ධනය කිරීමට, තරුණයින්, කාන්තා ව්‍යවසායකයින් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින් ඉලක්ක කරගත් ව්‍යාපාර ආරම්භක ප්‍රාග්ධන ප්‍රදාන, ආරම්භක මෙවලම් කට්ටල සහ උපදේශක වැඩසටහන් සැපයීම.**

ඇතුළත් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සහ සුභසාධනය මත යැපීම අඩු කිරීමට:

- • විශේෂයෙන් අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සහ ඌන සේවා ප්‍රදේශවල ශක්‍ය ක්ෂුද්‍ර හෝ කුඩා ව්‍යාපාර අදහස් ඇති පුද්ගලයින්ට ව්‍යාපාර ආරම්භක ප්‍රාග්ධන ප්‍රදාන (ණය නොවන) ලබාදීම . මෙම ව්‍යාපාර ප්‍රධාන සැලැස්ම සහ සන්දර්භය අනුව රු. 50,000 සිට රු. 200,000 දක්වා පරාසයක පැවතිම.

.• විවිධ අංශවලට ගැලපෙන **ආරම්භක මෙවලම් කට්ටල** සැපයීම. උදාහරණයක් ලෙස:
ආරම්භක ව්‍යාපාර

- මැසීම සඳහා මහන යන්ත්‍ර සහ රෙදි.
- වඩු කාර්මිකයන් සහ පෙදරේරුවන් සඳහා මෙවලම් කට්ටල.
- නිවාස පාදක ආහාර සැකසීම හෝ ආහාර සැපයීම සඳහා උපකරණ.
- ඩිජිටල් අංශයේ නියුතු නිදහස් සේවකයින් සඳහා ස්මාර්ට්ෆෝන් සහ මූලික තාක්ෂණික උපකරණ.

• රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හෝ රාජ්‍ය නොවන සංවිධාන හරහා **උපදේශකයෙකු** සමඟ සෑම ප්‍රදාන ලබන්නෙකුම සම්බන්ධ කිරීම. උපදේශනය තාක්ෂණික කුසලතා සහ ව්‍යාපාරික ඥානය යන දෙකම ආවරණය වන , නිතිපතා නිරීක්ෂණ චාරිකා සහ දෝශ නිරාකරණ සහාය ඇතුළත් විම .

• **ඉලක්කගත ප්‍රතිලාභී කණ්ඩායම්වලට** ඇතුළත් වන්නේ:

- **තරුණයින්**, විශේෂයෙන් පාසල් හැර ගිය අය සහ අධ්‍යාපනය, රැකියාව හෝ පුහුණුව නොලබන අය (NEET).
- කාන්තා මූලික පවුල්වල අය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට හසුව බේරුණු **කාන්තාවන්**.
- **නැවත පැමිණෙන සංක්‍රමණිකයන්**, අවතැන් වීමෙන් හෝ විදේශ රැකියාවෙන් පසු ආර්ථික වශයෙන් නැවත ඒකාබද්ධ වීමට උපකාර කිරීම, ඔවුන්ගේ අත්පත් කරගත් කුසලතා වර්ධනයට උපකාර කිරීම.

මෙම වැඩසටහන් සඳහා තිරසාරභාවය සහ වගවීම සහතික කිරීම සඳහා පැහැදිලි සුදුසුකම් නිර්ණායක, විනිවිද පෙනෙන තේරීම් ක්‍රියාවලීන් සහ ආධාර සඳහා පසු අධීක්ෂණ පද්ධති ක්‍රියාත්මකය .

---

### 4.3.2. යෙදවුම් සහ ණය ලබා ගැනීම සහ ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා, කුඩා ව්‍යවසායකයින් සහ සමුපකාර, වෙළඳ ජාල සහ ඩිජිටල් වෙළඳපොළවල් අතර සම්බන්ධතා වලට පහසුකම් සැලසීම.

ව්‍යවසායකයින් බොහෝ විට අරගල කරන්නේ දුර්වල ව්‍යාපාර අදහස් නිසා නොව, දුර්වල වෙළඳපල ප්‍රවේශය සහ ඛණ්ඩනය වූ සැපයුම් දාමයන් නිසා වේ:

• යෙදවුම් මිලදී ගැනීම සහ නිෂ්පාදන බෙදා හැරීම මගින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ට පරිමාණානුකූල පිරිමැසුම් වලින්(Economies of scale) ප්‍රතිලාභ ලැබීම**ට නිෂ්පාදක සමුපකාර සහ ඉතුරුම් කණ්ඩායම්** ශක්තිමත් කිරීම හෝ නැවත ස්ථාපිත කිරීම.

• කුඩා නිෂ්පාදකයින්ට ඔවුන්ගේ දේශීය ප්‍රජාවන්ගෙන් ඔබ්බට පුළුල් වෙළඳපල වෙත ප්‍රවේශය ලබා දීම සඳහා **තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන් සහ ඊ-වාණිජ්‍ය පද්ධති** සමඟ හවුල්කාරිත්වයන් ඇති කිරීම.

• ව්‍යවසායකයින්ට කාරක ප්‍රාග්ධන ණය, රක්ෂණ සහ ජංගම බැංකු සේවා වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසමින් **ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ බැංකු** සමඟ සම්බන්ධතා පහසු කිරීම.

• ඉලක්කගත සහාය සහ වෙළඳ නාමකරණ අවස්ථා ලබා දෙමින් පොදු වටිනාකම් දාමයන් (උදා: කාබනික ගොවිතැන, අත්කම්, ආහාර සැකසුම්, නිවාස පාදක ඩිජිටල් සේවා) වටා ව්‍යවසායකයින් සංවිධානය කිරීම සඳහා **පොකුරු පාදක සම්බන්ධතා** නිර්මාණය කිරීම.

• දේශීය, සදාචාරාත්මක හෝ පරිසර හිතකාමී නිෂ්පාදන අවධාරණය කරන වෙළඳ නාමකරණය සමඟ, කාන්තා කණ්ඩායම් සහ ප්‍රජා පාදක ව්‍යවසායන් සඳහා **සාමූහික අලෙවිකරණ ආකෘති** භාවිතය දිරිමත් කිරීම.

මෙවැනි ඒකාබද්ධ වෙළඳපල සම්බන්ධතා උපාය මාර්ග කුඩා ව්‍යාපාර ආරම්භයේ සිට ලාභ ලබන තත්ත්වය දක්වා ගමන් කිරීමට උපකාරී වන අතර, සියලු දෙනා සාධාරණ ලෙස පරිමාණානුකූල වාසි ලබන ක්‍රමයක් නිර්මාණය.

---

**4.3.3. මූල්‍ය සාක්ෂරතාවය, අලෙවිකරණය සහ නීති උපදෙස් වැනි ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ව්‍යාපාර සඳහා ආරම්භක සහාය ලබා දෙන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.**

ක්ෂුද්‍ර ව්‍යවසායන්හි තිරසාරභාවය සහ පරිමාණය ප්‍රවර්ධනය කිරීම සඳහා:

• ප්‍රධාන නාගරික සහ ග්‍රාමීය දිස්ත්‍රික්කවල දේශීය **ව්‍යාපාර සඳහා ආරම්භක සහාය ලබා දෙන මධ්‍යස්ථාන** පිහිටුවීම. මේවා පළාත් පාලන ආයතන, වාණිජ මණ්ඩල, විශ්ව විද්‍යාල හෝ සංවර්ධන හවුල්කරුවන් විසින් පවත්වාගෙන යාම.

• පිරිනමන සේවාවන්ට ඇතුළත් වන්නේ:

- **ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහාය** සහ දේශීය නීතිවලට අනුකූල වීම.
- අයවැය කළමනාකරණය කිරීම, ලාභ ගණනය කිරීම, වාර්තා තබා ගැනීම සහ බදු දැනුවත් කිරීම වැනි **මූල්‍ය සාක්ෂරතා පුහුණුව**.
- සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය, ඇසුරුම් නිර්මාණය සහ පාරිභෝගික සහභාගීත්වය ඇතුළුව **අලෙවිකරණ සහ වෙළඳ නාම සහාය.**
- නව්‍ය අදහස් ඇති අය සඳහා කොන්ත්‍රාත් වලට එළඹීමේ සාකච්ඡා, බලපත්‍ර සහ බුද්ධිමය දේපළ පිළිබඳ **නීති උපදෙස්**.
- ගිණුම්කරණ මෘදුකාංග, වෙබ් අඩවි සැකිලි සහ මාර්ගගත පුහුණුව වැනි **ඩිජිටල් මෙවලම් වෙත ප්‍රවේශය**.

• මෙම මධ්‍යස්ථාන නිතිපතා **ව්‍යවසායකත්ව නවකයින් සඳහා පුහුණු ආරම්භක කඳවුරු**(Bootcamps), නවෝත්පාදන අභියෝග වැඩ සටහන් සහ ජාලකරණ අවස්තා සැපයීම

.ඉහත කරුනු පාදකව නව ව්‍යාපාරවල පැවැත්මේ අනුපාත ඉහළ නැංවීම පමණක් නොව, ව්‍යවසායකත්වය, නවෝත්පාදනය සහ ආර්ථික ස්වයංපෝෂණය පිළිබඳ සංස්කෘතියක් ද නිර්මාණය.

---

**4.3.4. ඊ-වාණිජ්‍යය කටයුතු සහ ජංගම ගෙවීම් ඇතුළු ව්‍යාපාරික මෙහෙයුම් සඳහා ඩිජිටල් වේදිකා භාවිතය දිරිමත් කිරීම.**

ඩිජිටල් ආර්ථිකය භූගෝලීය සහ මූල්‍ය බාධක ජය ගැනීමට දැවැන්ත අවස්ථාවන් සපයයි:

• ව්‍යවසායකයින්ට ජංගම දුරකථන භාවිතා කිරීම සඳහා **ඩිජිටල් කුසලතා පුහුණුවක්** පැවැත්වීම:

- මාර්ගගත වෙළඳ දැන්වීම් (ෆේස්බුක් වෙළඳපොළ, වට්ස්ඇප් ව්‍යාපාර, ඉන්ස්ටග්‍රෑම් ආදිය හරහා).
- නිෂ්පාදන/සේවා විකිණීම සඳහා ඊ-වාණිජ්‍ය වේදිකා (ඩරාස්, කප්රුක, ආදිය).
- ආරක්ෂිත, මුදල් රහිත ගනුදෙනු සඳහා **ජංගම ගෙවීම් යෙදුම්** (උදා: eZ Cash, mCash, QR ගෙවීම්).
- **ඩිජිටල් පොත් තැබීමේ මෙවලම්** භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායකයින්ට විකුණුම් නිරීක්ෂණය කිරීමට,භාණ්ඩ ලේඛන කළමනාකරණය කිරීමට සහ ආයෝජන සැලසුම් කිරීමට හැකියාව ලබා දීම.
- **අඩු වියදම් ඩිජිටල් විසඳුම්** පුළුල් කිරීම සහ ලබාගැනීම දිරිමත් කිරීමට, තාක්ෂණික සැපයුම්කරුවන් සහ විදුලි සංදේශ සේවා සපයන සමාගම් සමඟ කටයුතු කිරීම සහ නොමිලේ අත්හදා බැලීම් හෝ ඇතැම් වෙබ් අඩවි සඳහා නිදහස් පිවිසුම ලබා දෙන දත්ත පැකේජ ලබා ගැනීම දිරිමත් කිරීම.
- ව්‍යවසායකයින්ට පුළුල් පාරිභෝගික පදනමක් කරා ළඟා වීමට උපකාර කිරීම සඳහා **ඩිජිටල් ව්‍යාපාර නාමාවලි** නිර්මාණය කිරීම.

මෙමගින් ඩිජිටල් අවකාශය තුළ දියුණු වීමට අවශ්‍ය මෙවලම් සහ දැනුම සමඟින් කාන්තාවන් සතු ව්‍යාපාර සමානව බලගැන්වීම සහතික කරමින්,ස්ත්‍රී **පුරුෂ භාවය මත පවතින ඩිජිටල්මය බෙදීම** අඩු කිරීම කෙරෙහි යොමු කළ විශේෂ අවධානය තිබිම.

---

### 4.4. කුසලතා සංවර්ධනය සහ නැවත කුසලතා පුහුණු වැඩසටහන් පුළුල් කිරීම

*ඉල්ලුම මත පදනම් වූ වෘත්තීය පුහුණුව සහ නැවත කුසලතා පුහුණු කිරීමේ මුලපිරීම්, විශේෂයෙන් රැකවරණ, සංචාරක, ඉදිකිරීම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයන්හි සේවකයින් තිරසාර රැකියා සඳහා අවශ්‍ය කුසලතා වලින් සන්නද්ධ කිරීම*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

#### 4.4.1. පන්ති කාමර උපදෙස් සහ සේවා ස්ථාන ඉගෙනීම ඒකාබද්ධ කරන ද්විත්ව ආධුනිකත්ව වැඩසටහන් සමඟ ඉල්ලුම මත පදනම් වූ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) පරිමාණය කිරීම

• **ද්විත්ව ආධුනිකත්ව ආකෘතිය:** ආයතනික ඉගෙනීම සහ සේවා ස්ථානවල ප්‍රායෝගික පුහුණුව අතර සිසුන් තම කාලය බෙදා ගන්නා ව්‍යුහගත TVET පද්ධතියක් ස්ථාපිත කිරීම. වෘත්තීය ආයතනවල න්‍යායාත්මක සහ මෘදු කුසලතා පුහුණුව සම්පූර්ණ කරන අතරම, කර්මාන්ත හවුල්කරුවන් සමඟ සිසුන්ට ප්‍රායෝගික කුසලතා ලබාදීම

• **රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP)**: ආධුනිකත්ව ස්ථාන නිර්මාණය කිරීම සහ පුහුණු කාලසටහන් සම-සංවර්ධනය කිරීම සඳහා පුහුණු ආයතන සහ පෞද්ගලික අංශයේ සමාගම් අතර විධිමත් ගිවිසුම් ඇති කර ගැනීම.

• **පිලිගැනීම  සහ සහතික කිරීම**: මෙම සංරචක දෙකම (ආයතනය සහ සේවා ස්ථානය) ජාතික සුදුසුකම් රාමු සමඟ පෙළගැසී ඇති බවත් ජාතික/ජාත්‍යන්තරව පිළිගත් සහතික කිරීමකට මග පාදන බවත් සහතික කිරීම.

• **දිරි දීමනා**: තිරසාරභාවය සහ පුළුල් පිළිගැනීමක් සහතික කිරීම සඳහා ආධුනිකත්ව යෝජනා ක්‍රමවලට සහභාගී වන සමාගම්වලට දිරි දීමනා (බදු ප්‍රතිලාභ, පිළිගැනීමේ සම්මාන හෝ අර්ධ සහනාධාර වැනි) ලබාදීම

---

#### 4.4.2. සත්කාර සේවා, සංචාරක ව්‍යාපාර , ඉදිකිරීම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළු ඉහළ වර්ධන විභවයක් සහ ශ්‍රම ඉල්ලුමක් ඇති අංශවල පුහුණුවට ප්‍රමුඛත්වය ලබාදීම.

• **ශ්‍රම වෙළඳපොළ තක්සේරු කිරීම්:** නැගී එන රැකියා අවස්ථා සහිත කර්මාන්ත හඳුනා ගැනීම සඳහා තත්කාලීන ශ්‍රම වෙළඳපොළ බුද්ධිය සහ කුසලතා පුරෝකථනය භාවිතා කිරීම. ඒ අනුව පුහුණු ප්‍රමුඛතා යාවත්කාලීන කිරීම.

• **අංශ-විශේෂිත විෂයමාලා**: නිශ්චිත කර්මාන්ත අවශ්‍යතාවලට ගැලපෙන පරිදි මොඩියුල සහ නිපුණතා පාදක විෂයමාලා නිර්මාණය කිරීම. උදාහරණයක් ලෙස:

- **සත්කාර සේවා:** වයෝවෘද්ධ සත්කාර, නිවාස හෙද සේවය, ආබාධිත සහාය සේවා
- **සංචාරක ව්‍යාපාරය**: පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය, ආගන්තුක සත්කාර කළමනාකරණය, සංචාරක මාර්ගෝපදේශනය

- **ඉදිකිරීම්**: හරිත ගොඩනැගිලි පිළිවෙත්, ආරක්ෂාව සහතික කිරීම, අඩවි කළමනාකරණය
- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය:** මෘදුකාංග සංවර්ධනය, සයිබර් ආරක්ෂාව, ඩිජිටල් අලෙවිකරණය සහ දත්ත විශ්ලේෂණය

• **ස්ත්‍රී පුරුෂ හා අන්තර්කරණය** : ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී (Gender Sensitive) බඳවා ගැනීම් සහ ආරක්ෂිත ඉගෙනුම් පරිසරයන් හරහා පුරුෂ ආධිපත්‍යය දරන අංශවල (උදා: ඉදිකිරීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) සහ කාන්තා ආධිපත්‍යය දරන අංශවල (උදා: සත්කාර සේවා) පුහුණුව සියලුම ස්ත්‍රී පුරුෂ භාවයන්ට ප්‍රවේශ විය හැකි සහ අදාළ බව සහතික කිරීම.

---

**4.4.3. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සමඟ අනුකූලව විෂයමාලා සැලසුම් කිරීමට සහ රැකියා ස්ථාන පුහුණු අවස්ථා සඳහා පහසුකම් සැලසීමට පෞද්ගලික අංශයේ සේවා යෝජකයින් සමඟ එක්ව කටයුතු කිරීම.**

• **කර්මාන්ත උපදේශක මණ්ඩල**: පුහුණු අන්තර්ගතයන් සම-සංවර්ධනය කිරීමට සහ නිතිපතා යාවත්කාලීන කිරීමට සේවා යෝජකයින්, කර්මාන්ත ආයතන සහ පුහුණු සපයන්නන්ගෙන් සමන්විත අංශ-විශේෂිත උපදේශක මණ්ඩල ස්ථාපිත කිරීම.

• **සේවා ස්ථාන සඳහා නිරාවරණය**: සියලුම තාක්ෂණික වැඩසටහන් වල සීමාවාසික පුහුණුව සහ රැකියා ස්ථානයේ කෙරෙන ඉගෙනුම් සංරචකයන් ආයතනගත කිරීම, මඟින් සිසුන්ට ඔවුන්ගේ ඉගෙනීමේ කරුණු වල සැබෑ ලෝක යෙදුම් අත්විඳීමට ඉඩ සැලසීම.

• **කුසලතා ගළපන වේදිකා**: පුහුණුවන්නන් හා උපාධිධාරීන් සඳහා සේවායෝජකයින් විසින් පිරිනමන සීමාවාසික පුහුණුව සහ ආධුනිකත්වයන් සමග ගැලපීමට ඩිජිටල් වේදිකා නිර්මාණය කිරීම.

• **තත්ත්ව සහතිකය**: පුහුණුවේ අදාළත්වය සහ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය සහතික කිරීම සඳහා පුහුණුවන්නන්, පුහුණුකරුවන් සහ අධීක්ෂකවරුන්ගෙන් වරින් වර ලැබෙන ප්‍රතිපෝෂණ හරහා සේවායෝජක සහභාගීත්වයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම.

---

**4.4.4. තාක්ෂණික වෙනස්කම් සහ ආර්ථික මාරුවීම් වලට අනුවර්තනය වීම සඳහා සේවකයින් සඳහා අඛණ්ඩ කුසලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

• **යාවජීව ඉගෙනුම් රාමුව**: විශේෂයෙන් ස්වයංක්‍රීයකරණය, ඩිජිටල්කරණය සහ හරිත සංක්‍රාන්ති වලට ප්‍රතිචාර වශයෙන්, ඔවුන්ගේ වෘත්තීය ජීවිතය පුරා කෙටි කාලීන නව කුසලතා ඉගෙනීමේ සහ පවතින කුසලතා වැඩි දියුණු කිරීමේ මොඩියුල වෙත ප්‍රවේශ වීමට සේවකයින් සඳහා පද්ධති ආයතනිකකරණය කිරීම.

• **නම්‍යශීලී ඉගෙනුම් ක්‍රම**: රැකියා කරන වැඩිහිටියන්ට ගැලපෙන පරිදි මාර්ගගත පාඨමාලා, සවස/සති අන්ත පන්ති සහ ජංගම ඉගෙනුම් ඒකක ඇතුළු මිශ්‍ර ඉගෙනුම් විකල්ප ලබා ලබාදීම.

• **පෙර ඉගෙනීම (RPL) හඳුනා ගැනීම**: පළපුරුදු සේවකයින්ට රැකියාවේදී දැනටමත් ලබාගෙන ඇති කුසලතා සඳහා විධිමත් පිළිගැනීමක් සහ සහතිකයක් ලබා ගැනීමට ඉඩ සලසන පරිදි RPL පද්ධතිය පුළුල් කිරීම.

• **පුහුණු වවුචර්/සහනාධාර**: සේවකයින් සහ සේවා යෝජකයින්ගේ අඛණ්ඩ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා රජයේ සහනාධාර පුහුණු වවුචර් හෝ ඩිජිටල් ඉගෙනුම් ඇගයීම් ලකුනු ලබා ලබාදීම.

---

මෙම පුළුල් මැදිහත්වීම් ශ්‍රී ලංකාවේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු පද්ධතිය ජාතික සංවර්ධන ඉලක්ක සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා යන දෙකටම ඇතුළත්, කාර්යක්ෂම සහ පෙළගැසී ඇති බව සහතික වීම.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)**: විෂයමාලා සංවර්ධනය සහ සහතික කිරීම.

• **කම්කරු අමාත්‍යාංශය**: වැඩසටහන් අරමුදල් සහ නියාමනය.
• **සේවායෝජකයින් සහ කර්මාන්ත සංගම්**: පුහුණු ස්ථානගත කිරීම සහ ප්‍රමිතිගත කිරීම.
• **රාජ්‍ය නොවන සංවිධාන සහ පුහුණු සපයන්නන්**: පුහුණුව සහ ජංගම ප්‍රජා සේවා ලබා දීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ජාතික කුසලතා ලේඛනය සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධති.
• ආධුනිකත්ව කළමනාකරණ වේදිකා.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් සඳහා ඇතුළත් වීමේ සහ සම්පූර්ණ කිරීමේ අනුපාත.
- අභ්‍යාසලාභීන්ගේ රැකියා ප්‍රතිඵල.
- කුසලතා මට්ටම් පිළිබඳව සේවායෝජක තෘප්තිය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු යටිතල පහසුකම් සහ සුදුසුකම් ලත් පුහුණුකරුවන් පුළුල් කිරීම.
- ආධුනිකත්ව සඳහා අරමුදල් සැපයීම.
- ආධුනිකත්ව ගුණාත්මකභාවය සඳහා අධීක්ෂණ පද්ධති.

---

**4.5. සංක්‍රමණ සහාය සහ නැවත ඒකාබද්ධ කිරීමේ සේවා ශක්තිමත් කිරීම**

*නැවත ඒකාබද්ධ කිරීමේ පුළුල් වැඩසටහන් මඟින් නැවත පැමිණෙන සංක්‍රමණිකයින්ට ව්‍යාපාර ආරම්භක සහාය, මනෝ සමාජීය සත්කාර සහ කුසලතා පුහුණුව ලබා දෙන අතර එමඟින් ඔවුන්ගේ තිරසාර දේශීය ආර්ථිකයට නැවත පිවිසීමට පහසුකම් සැලසීම.*

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**4.5.1. ව්‍යාපාර ආරම්භක සහාය, මනෝ සමාජීය උපදේශනය, කුසලතා පුහුණුව සහ රැකියා ස්ථානගත කිරීමේ සේවා සපයන ඒකීය නැවත ඒකාබද්ධ කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

• ඒකාබද්ධ සේවා මධ්‍යස්ථාන: දිස්ත්‍රික් හෝ පළාත් මට්ටමින් හොඳින් සම්පත්දායක නැවත ඒකාබද්ධ කිරීමේ මධ්‍යස්ථාන නිර්මාණය කිරීම, ඒවා එකම වහලක් යට බහුවිධ සේවාවන් සපයන අතර, ඛණ්ඩනය සහ ප්‍රවේශ්‍යතා බාධක අඩු කරයි.

• **ව්‍යාපාර ආරම්භක සහාය**:

- ශක්‍යතා විශ්ලේෂණය, ව්‍යාපාර සැලැස්ම සංවර්ධනය සහ ලියාපදිංචි කිරීමේ සහාය වැනි ව්‍යාපාර පූර්ව ලියාපදිංචි කිරීමේ සහාය ලබා දීම.

- සම-වැඩ (Co Workers) අවකාශයන්, වෙළඳපල සම්බන්ධතා උපදෙස් සහ දේශීය සැපයුම්කරු සම්බන්ධතා සඳහා ප්‍රවේශය ලබා දීම.

**• කුසලතා පුහුණුව:**

- නැවත පැමිණෙන අයගේ අමතර පුහුණු අවශ්‍යතා තීරණය කිරීම සඳහා කුසලතා පරතරය තක්සේරු කිරීම.
- රැකවරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂිකාර්මික සැකසුම් සහ හරිත රැකියා වැනි නැගී එන සහ ඉල්ලුමක් ඇති අංශවල කෙටි කාලීන පුහුණුවක් ලබා දීම.

**• රැකියා ස්ථානගත කිරීමේ සේවා:**

- සුදුසුකම්, රුචිකත්වයන් සහ දේශීය අවස්ථා මත පදනම්ව රැකියා අවස්ථා සහ නැවත පැමිණෙන අය ගැලපීම පිළිබඳ මධ්‍යගත දත්ත සමුදායක් පවත්වා ගැනීම.
- සම්මුඛ පරීක්ෂණ සූදානම් කිරීමේ වැඩමුළු සහ ජීව දත්ත සැදීමේ  සහාය ලබා දීම.

**• මනෝ සමාජීය උපදේශනය:**

ආතතිය, කම්පනය හෝ සමාජ හුදකලාව අත්විඳ නැවත පැමිණෙන අයට සහාය වීම සඳහා පුහුණු උපදේශකයින් යෙදවීම.

---

**4.5.2. ආපසු පැමිණෙන අය අතර ව්‍යවසායකත්වයට සහාය වීම සඳහා ක්ෂුද්‍ර ණය සහ ප්‍රදාන ඇතුළු මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පහසු කිරීම**

**• ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රවේශය:**

- නම්‍යශීලී ආපසු ගෙවීමේ නියමයන් සහ සහන කාල සීමාවන් සමඟ, ආපසු පැමිණෙන අය සඳහා සකස් කරන ලද අඩු පොලී ණය පිරිනැමීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ බැංකු සමඟ හවුල් වන්න.

**• ආරම්භක ප්‍රාග්ධන ප්‍රදාන**:

අවදානමට ලක්විය හැකි ආපසු පැමිණෙන අය සඳහා (උදා: කාන්තා මූලික පවුල්, සූරාකෑමට ගොදුරු වූවන්, අඩු කුසලතා ඇතිව ආපසු පැමිණෙන අය)උදෙසා ක්ෂුද්‍ර ව්‍යවසායන් දියත් කිරීම සඳහා ඉලක්කගත ප්‍රදාන යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.

**• මූල්‍ය සාක්ෂරතා පුහුණුව:**

- සියලුම නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් තුළ අයවැයකරණය, ඉතිරිකිරීම් සහ ණය කළමනාකරණය ඇතුළත් කිරීම.
- වැඩිදියුණු කළ ප්‍රවේශය සහ පහසුව සඳහා ජංගම බැංකුකරණය සහ ඩිජිටල් මූල්‍ය සේවා ප්‍රවර්ධනය කිරීම.

**• ණය සහතික කිරීමේ යෝජනා ක්‍රම:**

- අඩු අවදානමක් සහිත නැවත පැමිණෙන ව්‍යාපාර සඳහා සහාය වීමට පෞද්ගලික ණය ලබාදීමන් දිරිමත් කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලත් ණය සහතික කිරීමේ යාන්ත්‍රණ හඳුන්වා දීම.

**4.5.3. නැවත පැමිණෙන අය මුහුණ දෙන මානසික සෞඛ්‍ය සහ සමාජීය අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් තුළ සෞඛ්‍ය සහ මනෝ සමාජීය සත්කාර සේවා ඒකාබද්ධ කිරීම**

• **සෞඛ්‍ය පරීක්ෂාව සහ යොමු කිරීම් :**

නැවත පැමිණීමේදී මූලික ශාරීරික හා මානසික සෞඛ්‍ය පරීක්ෂණ ලබා දීම සහ මහජන සෞඛ්‍ය ආයතන වෙත යොමු කිරීමේ මාර්ග සැපයීම.

**මානසික සෞඛ්‍ය සේවා:**

නැවත පැමිණෙන අය අතර පැවතිය හැකි කාංසාව, මානසික අවපීඩනය හෝ පශ්චාත් කම්පන ආතති වැනි පොදු මානසික සෞඛ්‍ය ගැටළු හඳුනාගෙන කළමනාකරණය කිරීම සඳහා ප්‍රජා සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම.

**සමාජ නැවත ඒකාබද්ධ කිරීම**:

අපකීර්තියක් පවතී නම් එය සමනය කිරීමට සහ නැවත පැමිණෙන අයගේ සමාජ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමට ප්‍රජා සංවාද සැසි සහ සංවේදීකරණ වැඩසටහන් සංවිධානය කිරීම.

සංක්‍රමණ චක්‍රයෙන් බලපෑමට ලක් වූ පවුලේ සාමාජිකයින් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ සහාය ඇතුළත් කිරීම (උදා: කලත්‍රයන්, දරුවන්).

**ප්‍රජනක සහ වෘත්තීය සෞඛ්‍යය:**

ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම, විශේෂයෙන් නැවත පැමිණෙන කාන්තාවන් අරමුණු කර.

නව රැකියා හෝ ස්වයං රැකියා ආකාරවලට සංක්‍රමණය වන්නේ නම් වෘත්තීය ආරක්ෂාව පිළිබඳව නැවත පැමිණෙන අය දැනුවත් කිරීම.

---

**4.5.4. සහාය සහ කුසලතා හඳුනාගැනීමේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ගමනාන්ත රටවල් සමඟ සම්බන්ධීකරණය කිරීම**

• **ද්විපාර්ශ්වික ගිවිසුම්**:

කුසලතා සහතික කිරීම, සමාජ ආරක්ෂණ සුවහබව සහ නැවත ඒකාබද්ධ කිරීමේ සහාය සඳහා විධිවිධාන ඇතුළත් කිරීම සඳහා ශ්‍රම ගමනාන්ත රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් (MoU) ශක්තිමත් කිරීම.

• **නැවත පැමිණීමට පෙර සම්බන්ධීකරණය**:

ආපසු පැමිණෙන අය කල්තියා හඳුනා ගැනීමට සහ සැලසුම් කළ, ආරක්ෂිත සහ සහාය දක්වන ප්‍රතිලාභ සහතික කිරීමට විදේශීය දූත මණ්ඩල සහ සේවා යෝජකයින් සමඟ වැඩ කිරීම.

• **සංක්‍රමණික සහභාගීත්වය**:

- විගමනිකයන් සඳහා මාර්ගෝපදේශකත්වය, ව්‍යාපාරික උපදෙස් සහ දැනුම හුවමාරු අවස්ථා ලබා දීම සඳහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සමග ජාල ගත වීම.
- විගමනික ආයෝජකයින් ,නැවත පැමිණෙන ව්‍යවසායකයින් සහ දේශීය සමුපකාර සමඟ සම්බන්ධ කරන මාර්ගගත වේදිකා නිර්මාණය කිරීම.

• **කුසලතා සහතික කිරීම සහ පිළිගැනීම**:

ඉදිකිරීම්, ආගන්තුක සත්කාර, ගෘහ සේවය සහ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ විදේශයන්හි දී අත්පත් කරගත් කුසලතා හඳුනා ගැනීම සහ සහතික කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.

නැවත පැමිණෙන අයට පූර්ව ඉගෙනීම හඳුනාගැනීමේ (RPL) සහතික නිකුත් කිරීම සඳහා තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET) බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

---

මෙම පුළුල් නැවත ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ගවල අරමුණ වන්නේ නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින්ට ආර්ථික වශයෙන්, සමාජීය වශයෙන් සහ චිත්තවේගීය වශයෙන් සහාය වීම සහතික කිරීම සහ ඔවුන්ගේ කුසලතා සහ අත්දැකීම් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අර්ථවත් ලෙස දායක වීම සඳහා යොදා ගැනීමය.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• කම්කරු අමාත්‍යාංශය: කුසලතා සංවර්ධන සහ රැකියා සම්බන්ධතා.
• සංක්‍රමණික සුභසාධනය පිළිබඳ විශේෂඥ රාජ්‍ය නොවන සංවිධාන: මනෝ සමාජීය සහ ව්‍යාපාරික සහාය ලබා දීම.
• මූල්‍ය ආයතන: ණය සඳහා ප්‍රවේශය පහසු කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• නැවත ඒකාබද්ධ කිරීමේ සේවා ද්වාර.
• නැවත පැමිණෙන අයගේ ප්‍රගතිය නිරීක්ෂණය කරන සිද්ධි කළමනාකරණ පද්ධති.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව :**

• නැවත ඒකාබද්ධ කිරීමේ සේවාවන්ට ප්‍රවේශ වන නැවත පැමිණෙන සංඛ්‍යාව.
• ව්‍යාපාර ආරම්භක සහ රැකියා ස්ථානගත කිරීම්වල සාර්ථකත්ව අනුපාතය.
• ප්‍රතිලාභීන්ගේ තෘප්තිය සහ යහපැවැත්ම තක්සේරු කිරීම.

**ධාරිතා/සම්පත් අවශ්‍යතා:**

• පුහුණු උපදේශකයින් සහ ව්‍යාපාර උපදේශකයින්.
• මධ්‍යස්ථානවල ප්‍රදාන සහ මෙහෙයුම් පිරිවැය සඳහා අරමුදල් සැපයීම.
• සේවා සම්බන්ධීකරණය සඳහා ඩිජිටල් වේදිකා.

**4.6 . ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ගම්මාන සංවර්ධන වැඩසටහන් සවිබලගැන්වීම**

***බිම් මට්ටම සවි බලගැන්වීමට ගෘහ ඒකක සඳහා ආර්ථික සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, සේවා සැපයීම සහ තිරසාර ජීවනෝපායන් සම්බන්ධීකරණ සඳහා ප්‍රජා මූලික සභා බලමුලු ගැන්වීම***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**

**4.6.1. ග්‍රාම නිලධාරි මට්ටමේ ප්‍රජා මූලික සභා පිහිටුවීම**

**ගෘහස්ථ මට්ටමේ ආර්ථික සංවර්ධන සැලසුම්, සැලසුම් කිරීම සඳහා ප්‍රජා නායකයින්, සමෘද්ධි නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ පළාත් පාලන නියෝජිතයින්ගෙන් සමන්විත වීම.**

**අරමුණ:**
තීරණ ගැනීම විමධ්‍යගත කිරීම සහ බිම් මට්ටමේ සිට සියලු දෙනා ඇතුළත් සහ ඉලක්කගත සංවර්ධන මැදිහත්වීම් මෙහෙයවීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම.

**ප්‍රධාන විශේෂාංග:**

- **සංයුතිය:**
    - ග්‍රාම නිලධාරියාගේ සභාපතිත්වය.
    - සාමාජිකයින් අතර සමෘද්ධි සංවර්ධන නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී, කාන්තා සංවර්ධන නිලධාරී, තරුණ සේවා නිලධාරී, පළාත් පාලන නියෝජිත (ප්‍රාදේශීය සභාව), පාසල් විදුහල්පති, ආගමික නායකයින් සහ ගෞරවනීය ප්‍රජා වැඩිහිටියන් ඇතුළත් විම.
- **කාර්යයන්:**
    - සමාජ ලියාපදිංචි දත්ත සහ දේශීය අවබෝධතාවන් භාවිතා කරමින් ආර්ථික දියුණුව අවශ්‍ය අවදානමට ලක්විය හැකි කුටුම්බ හඳුනා ගැනීම.
    - පවතින කුසලතා, වත්කම් සහ අභියෝග තේරුම් ගැනීමට සහභාගීත්ව කුටුම්භ පැතිකඩකරණයට පහසුකම් සැලසීම.
    - පවුල් අවශ්‍යතා (උදා: ගෙවතු වගාව, කිරි ගොවිතැන, කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම, වෘත්තීය පුහුණුව) අනුව සකස් කරන ලද **කුටුම්භ ආර්ථික සංවර්ධන සැලසුම්** (HEDPs) සංවර්ධනය කිරීම.
- **සම්බන්ධතා:**
    - රජයේ ජීවනෝපාය වැඩසටහන්, රාජ්‍ය නොවන සංවිධාන සහාය සහ පෞද්ගලික අංශයේ අවස්ථා ප්‍රජා අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කිරීම.
    - සුභසාධන යෝජනා ක්‍රම සහ සංවර්ධන මුලපිරීම් අතර තිරස් ඒකාබද්ධතාවය සහතික කිරීම.

**4.6.2. ප්‍රජා මට්ටමින් ජීවනෝපාය, වෘත්තීය පුහුණුව සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා අඛණ්ඩ සහාය ලබා දීම සඳහා සක්‍රීය කණ්ඩායම් යෙදවීම.**

**අරමුණ:**
**ප්‍රජා මූලික සභා** විසින් සංවර්ධනය කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ දරිද්‍රතාවයෙන් මිදෙන කුටුම්භ සඳහා තිරසාර සහයෝගය සහ පසු විපරම් සහතික කිරීම.

**ප්‍රධාන ලක්ෂණ:**

- • **සක්‍රීය කිරීමේ කණ්ඩායම්වල සංයුතිය:**
  - පුහුණු සමාජ බලමුලු ගන්වන්නන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන්, ජීවනෝපාය සම්බන්ධීකාරකවරුන් සහ තරුණ උපදේශකයින්..
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින නමුත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ සමඟ සමීපව කටයුතු කිරීම.
- **කාර්යයන්:**
  - ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී **නිවසින් නිවසට සහාය ලබා දීම**.
  - වෘත්තීය පුහුණු වැඩසටහන්වලට ඇතුළත් වීමට පහසුකම් සැලසීම හෝ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම සහ වෙළඳපොළ ප්‍රවේශ ජාලවලට සම්බන්ධ වීම.
  - දරුවන්ගේ පාසල් පැමිණීම, පෝෂණ තත්ත්වය සහ ආදායම් ස්ථාවරත්වය ඇතුළුව ගෘහස්ථ යහපැවැත්ම නිරීක්ෂණය කිරීම.
  - මූල්‍ය සාක්ෂරතාවය, අයිතිවාසිකම් සහ හිමිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.
- **සමාජ ඒකාබද්ධතාවය:**
  - සමාජීය ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම, විශේෂයෙන් ඓතිහාසිකව බැහැර කරන ලද හෝ ආන්තිකකරණය කරන ලද කුටුම්භ (උදා: වතු පවුල්, ආබාධ සහිත පුද්ගලයින්, කාන්තා මූලික පවුල්) සඳහා.
  - ජීවනෝපාය වැඩිදියුණු කිරීමට බාධා කරන පවුල් හෝ ප්‍රජා ගැටුම් වලට මැදිහත් වීම.

---

**4.6.3. ප්‍රධාන නිෂ්පාදන ඇතුළත් කිරීමේ දර්ශක සමඟ සම්බන්ධිත දත්ත මත පදනම් වූ පස් අවුරුදු ගෘහ සංක්‍රාන්ති සැලසුම් භාවිතා කිරීම.**

**අරමුණ:**
සමාජ ආරක්ෂණයේ සිට තිරසාර ආර්ථික ස්වාධීනභාවය දක්වා සංක්‍රමණය වීම සඳහා කුටුම්භ සඳහා ඉලක්කගත, මැනිය හැකි සහ සාක්ෂි මත පදනම් වූ මාර්ග සහතික කිරීම.

**ප්‍රධාන ලක්ෂණ:**

- **සංක්‍රාන්ති සැලසුම්:**

- ප්‍රජා ශක්ති කවුන්සිල සහ  සක්‍රීය කිරීමේ කණ්ඩායම් සමඟ සාකච්ඡා කර එක් එක් නිවසක් සඳහා සංවර්ධනය කරන ලදී.
- ආදායම් උත්පාදනය, වත්කම් සමුච්චය කිරීම, කුසලතා සංවර්ධනය සහ මූලික සේවාවන් සඳහා ප්රවේශය සම්බන්ධ වසර පහක් පුරා සන්ධිස්ථාන ඇතුළත් කිරීම.

- **දර්ශකවලට :**
  - මාසික කුටුම්බ ආදායම් සීමාවන්.
  - විධිමත් හෝ ස්වයං රැකියා සහිත ගෘහ සාමාජිකයින් සංඛ්‍යාව.
  - නිෂ්පාදන වත්කම්වල හිමිකාරිත්වය හෝ භාවිතය (උදා: පශු සම්පත්, කෘෂිකාර්මික ඉඩම්, උපකරණ
  - ප්‍රජා හෝ වෙළඳපල කණ්ඩායම්වල සහභාගීත්වය.
  - වෘත්තීය හෝ ව්‍යාපාර පුහුණුව සඳහා ඇතුළත් වීම.
  - සුභසාධන ගෙවීම් මත යැපීම අඩු කිරීම ආදිය ඇතුළත් වීම.
- **තාක්ෂණික සහාය:**
  - ග්‍රාම නිලධාරී සහ දිස්ත්‍රික් ලේකම් මට්ටමින් ප්රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ඩිජිටල් පසුවිපරම් උපකරණ පුවරු භාවිතා කිරීම.
  - ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනය (UBR) සහ ජාතික සමාජ ආරක්ෂණ දත්ත සමුදාය සමඟ කුටුම්බ දත්ත ඒකාබද්ධ  කිරීම.
- **ප්‍රතිඵල භාවිතය:**
  - බාධක හඳුනාගෙන සහයෝගීතාව නැවත පෙළගැස්වීම.
  - අතිරේක සම්පත් ,ඉහළ කාර්යසාධනයක් සහිත ප්‍රජාවන්ට ත්‍යාග ලෙස පිරිනැමීම.
  - පුළුල් සහභාගීත්වයක් ඇති කිරීම සඳහා සාර්ථකවූවන්ගේ කතා බෙදා ගැනීම.

---

### 4.6.4. නිතිපතා අධීක්ෂණ රැස්වීම් සහ සහභාගීත්ව සැලසුම් ක්‍රියාවලීන් හරහා ප්‍රජා හිමිකාරිත්වය සහ වගවීම පෝෂණය කිරීම.

**අරමුණ:**
ප්‍රජා මට්ටමින් ඇතුළත්, විනිවිද පෙනෙන සහ වගකිවයුතු පාලන ව්‍යුහයන් හරහා වැඩසටහන් වල තිරසාරභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම.

**ප්‍රධාන ලක්ෂණ:**

- **අධීක්ෂණ රැස්වීම්:**
  - කුටුම්භ, සභා සාමාජිකයින්, සක්‍රීය කණ්ඩායම් සහ බාහිර නිරීක්ෂකයින්ගේ සහභාගීත්වයෙන් ග්‍රාම නිලධාරී මට්ටමින් කාර්තුමය වශයෙන් පැවත්වීම.
  - ගෘහස්ථ ප්රගතිය, ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහ ප්‍රාදේශීය සංවර්ධන අභියෝග සාකච්ඡා කිරීම.

    - දේශීය අරමුදල් හෝ ප්‍රදාන භාවිතය සමාලෝචනය කර සම්පත් වෙන් කිරීම පිළිබඳ ප්‍රජා අධීක්ෂණය සහතික කිරීම.
- **සහභාගීත්ව සැලසුම්කරණය:**
    - කාන්තාවන්, තරුණයින්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු සියලුම ප්‍රජා කොටස්වල ක්‍රියාකාරී සහභාගීත්වයෙන් වාර්ෂික ගම්මාන සංවර්ධන සැලසුම් සෑසි.
    - ප්‍රජා ලකුණු කාඩ්පත් සහ ගැටළු සාකච්ඡා කරන ක්‍රම (Problem trees)වැනි දෘශය සහ ප්‍රවේශ විය හැකි මෙවලම් භාවිතා කිරීම
- **සමාජ විගණන:**
    - සිවිල් සමාජය, මාධ්‍ය සහ ස්වාධීන නිරීක්ෂකයින්ට වරින් වර ක්‍රියාකාරකම් සමාලෝචනය කර ප්‍රතිපෝෂණ ලබා දීමට ආරාධනා කිරීම.
- **ධාරිතා වර්ධනය:**
    - ප්‍රජා ශක්ති කවුන්සිලයේ සාමාජිකයින්ට පහසුකම් සැපයීම, ගැටුම් නිරාකරණය, මූල්‍ය අධීක්ෂණය සහ ඇතුළත් පාලනය පිළිබඳ පුහුණුව ලබා දීම.
- **ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ:**
    - ගැටළු හෝ යෝජනා රහසිගතව බෙදා ගැනීම සඳහා නිවාස සඳහා පැමිණිලි හැසිරවීමේ පද්ධති සහ ජංගම වේදිකා ස්ථාපිත කිරීම.

---

මෙම පියවර එක්ව, විශේෂයෙන් ශ්‍රී ලංකාව පුරා දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් තුළ, ගෘහස්ථ මට්ටමේ ආර්ථික බලගැන්වීම සහ සමාජ පරිවර්තනය සඳහා පහළ සිට ඉහළට, ඇතුළත් සහ තිරසාර ප්‍රවේශයක් සහතික වීම

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **සමෘද්ධි සහ දරිද්‍රතාවය පිටුදැකීමේ අමාත්‍යාංශය**: සභා පිහිටුවීම සහ සම්බන්ධීකරණය මෙහෙයවීම.
• **ප්‍රාදේශීය ලේකම් කාර්යාල:** තාක්ෂණික සහාය සහ අධීක්ෂණය සැපයීම.
• **පළාත් පාලන සහ ප්‍රජා පාදක සංවිධාන**: ප්‍රජා සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම.
• **ආර්ථික සංවර්ධන නිලධාරීන්**:තාක්ෂණික සහාය ලබා දීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• කුටුම්බ ආර්ථික දත්ත කළමනාකරණ පද්ධති.
• ප්‍රජා අධීක්ෂණ සහ වාර්තාකරණ රාමු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව:**

• ආවරණය වන ක්‍රියාකාරී ප්‍රජා ශක්ති සභා සහ කුටුම්භ ගණන.

• ගෘහස්ථ ආර්ථික සංවර්ධන ඉලක්කවලට එරෙහිව ප්‍රගතිය.
• සේවා සැපයීම සහ සහාය පිළිබඳ ප්‍රජා ප්‍රතිපෝෂණය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**

• සභා සාමාජිකයින් සහ සක්‍රීය කණ්ඩායම් සඳහා පුහුණුව.
•දත්ත රැස් කිරීම සහ කළමනාකරණ මෙවලම්.
• ප්‍රජා ක්‍රියාකාරකම් සහ දිරිගැන්වීම් සඳහා අරමුදල් සැපයීම.

---

**4.7. සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සහයෝගය ශක්තිමත් කිරීම.**

***සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සේවාවන් වැඩි දියුණු කිරීම පුළුල් සමාජ ආරක්ෂාවක් සහතික කරන අතර සාර්ථක ලෙස නැවත ඒකාබද්ධ වීමට පහසුකම් සපයයි.***

**මෙහෙයුම් යාන්ත්‍රණය:**
**4.7.1. නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින් සඳහා දිගුකාලීන මූල්‍ය ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා "විගමනික ශ්‍රමික" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීම.**

- **අරමුණ**: විධිමත් දායකත්වයන් සහ දිගුකාලීන ආර්ථික සැලසුම්කරණය දිරිමත් කිරීම, මහලු වියේදී සංක්‍රමණික සේවකයින්ට තිරසාර ආදායම් ආරක්ෂාවක් ලබා දීම.
- **ක්‍රියාමාර්ග**:
  - **බඳවා ගැනීම වැඩි කිරීම**:විශ්‍රාම වැටුප් ක්‍රමයේ, පිටතට යන සහ නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින් ලියාපදිංචි කිරීම සඳහා ඉලක්කගත වැඩසටහන් (ගුවන් තොටුපළ පිටත්වීමේ ස්ථාන, තානාපති කාර්යාල සහ ගම්මාන මට්ටමේ රැස්වීම් ඇතුළුව) හඳුන්වා දීම.
  - **දායකත්ව ක්‍රියාවලීන් සරල කිරීම**: ජංගම වේදිකා (උදා: LankaQR, eZ Cash) හරහා ඩිජිටල් ගෙවීම් සක්‍රීය කිරීම සහ බලපත්‍රලාභී විදේශ රැකියා ආයතන හෝ ප්‍රේෂණ මාර්ග හරහා ස්වයංක්‍රීය අණාවරක පද්ධති ස්ථාපිත කිරීම.
  - **ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම**: සුවහ බව (portability)සහතික කිරීම සහ ද්විකරණය වීම වළක්වා ගැනීම සඳහා ජාතික සමාජ ආරක්ෂණ සහ විශ්‍රාම වැටුප් රාමු (උදා: NSSF, EPF) සමඟ යෝජනා ක්‍රමය සම්බන්ධ කිරීම.
  - **නම්‍යශීලී විකල්ප**: විවිධ ආදායම් මට්ටම්වලට ගැලපෙන දායකත්ව ස්ථර හඳුන්වා දීම සහ සේවකයින් මූල්‍යමය බාධාවන්ට හෝ නැවත මෙරටට ගෙන්වා ගැනීමට මුහුණ දෙන විට තාවකාලික අත්හිටුවීම් හෝ ගෙවීම් සොයා ගැනීමට ඉඩ සලසයි.

---

**4.7.2. සංක්‍රමණික සේවකයින්ට පිටත්වීමට පෙර කෙරෙන පෙරහුරු , රක්ෂණ හිමිකම්, ප්‍රේෂණ සේවා සහ නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රවේශය සපයන මධ්‍යගත, ජාතික හැඳුනුම්පත් හාසම්බන්ධිත ඩිජිටල් පද්ධතියක් සංවර්ධනය කිරීම.**

- **අරමුණ**: **ජාතික හැඳුනුම්පත (NIC)** අද්විතීය හඳුනාගැනීමක් ලෙස භාවිතා කරමින් සමස්ත සංක්‍රමණ චක්‍රය කළමනාකරණය කිරීම සඳහා බාධාවකින් තොරව ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

- **වේදිකා ලක්ෂණ**:
    - **පෙර-පිටත්වීමේ සේවා**: අනිවාර්ය පුහුණුව, අයිතිවාසිකම් තොරතුරු, කොන්ත්‍රාත් සත්‍යාපනය සහ තානාපති කාර්යාල සම්බන්ධතා සඳහා ප්‍රවේශය ලබා දීම.
    - **ස්ථිරව මෙරටට නැවත පැමිණීමේදී ලබාදෙන සේවා**: සංක්‍රමණික සේවකයින්ට ඔවුන්ගේ **රක්ෂණ ආවරණය (උදා: සෞඛ්‍ය, ජීවිත, රැකියා අහිමිවීම්)** නිරීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට සහ ප්‍රේෂණ නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දීම.
    - **නැවත ඒකාබද්ධ කිරීමේ සහාය**: මූල්‍ය ප්‍රදාන, රැකියා සේවා සහ උපදේශනය ඇතුළුව නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සඳහා ඩිජිටල් ලියාපදිංචිය ලබා දීම.
    - **පරිශීලක අතුරුමුහුණත**: ජෛවමිතික පිවිසුම් සහ කෙටි පණිවුඩ යාවත්කාලීන කිරීම් සමඟ වේදිකාව බහුභාෂා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි) සහ ජංගම දුරකථන වලට ප්‍රතිචාර දක්වන බවට පත් කිරීම.

---

**4.7.3. සේවක ආරක්ෂාව, අයිතිවාසිකම් බලාත්මක කිරීම සහ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන ගමනාන්ත රටවල් සමඟ ද්විපාර්ශ්වික කම්කරු ගිවිසුම් ශක්තිමත් කිරීම.**

- **අරමුණ**: ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සඳහා ආරක්ෂිත සංක්‍රමණික මාර්ග, වඩා හොඳ සේවා කොන්දේසි සහ නීතිමය පිළියම් සහතික කිරීම.
- **ප්‍රවේශය**:
    - **අවබෝධතා ගිවිසුම් යාවත්කාලීන කිරීම**: ගල්ෆ් සහයෝගිතා කවුන්සිල රටවල්, දකුණු කොරියාව, මැලේසියාව සහ ඇතුළත් කිරීමට ඇති අනෙකුත් ප්‍රධාන ගමනාන්ත සමඟ ද්විපාර්ශ්වික කම්කරු ගිවිසුම් සමාලෝචනය කර නැවත සාකච්ඡා කිරීම.
        - අවම වැටුප් සහතික
        - වැඩ කරන වේලාවන් සහ ආරක්ෂක ප්‍රමිතීන් බලාත්මක කිරීම
        - ස්ථානීය දුක්ගැනවිලි යාන්ත්‍රණ
        - සමාජ ආරක්ෂණ දායකත්වයන් හඳුනා ගැනීම
    - **අධීක්ෂණය**: සේවායෝජක අනුකූලතාවය කල්තියා නිරීක්ෂණය කිරීමට සහ ආරවුල් මැදිහත්වීමට සහාය වීමට තානාපති කාර්යාලවල කම්කරු සුභසාධන නිලධාරීන් පත් කිරීම.
    - **කුසලතා සහතික කිරීමේ පිළිගැනීම**: ශ්‍රී ලාංකික පුහුණුව සහ සුදුසුකම් (උදා: NVQ) විදේශයන්හි පිළිගැනීමට හැකි වන පරිදි සමානතා රාමු ස්ථාපිත කිරීම, රැකියා නියුක්තිය සහ ඉපැයීම් විභවය වැඩි දියුණු කිරීම.

---

**4.7.4. සංක්‍රමණික පවුල් සඳහා උපදේශනය, මූල්‍ය සාක්ෂරතා පුහුණුව සහ ව්‍යවසායකත්ව සංවර්ධන සේවා ලබා දීම සඳහා කැපවූ සහාය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.**

- **අරමුණ**: සංක්‍රමණික පවුල්වල යහපැවැත්මට සහාය වීම සහ සංක්‍රමණ චක්‍රය තුළ සහ ඉන් පසුව ඔවුන්ගේ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

- **සහාය මධ්‍යස්ථාන සේවා**:

    - **මනෝ සමාජීය උපදේශනය**: ආපසු පැමිණි අය මුහුණ දෙන දිගුකාලීන පවුල් වෙන්වීම, සූරාකෑම හෝ කම්පනයන්ට  අදාළ මානසික සෞඛ්‍ය ගැටළු විසඳීම.

    - **මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්**: සංක්‍රමණිකයින් සහ පවුල් යන දෙපිරිසටම ගෘහස්ථ අයවැයකරණය, ආරක්ෂිත ප්‍රේෂණ භාවිතය, ආයෝජන විකල්ප සහ ණය කළමනාකරණය ඉගැන්වීම.

    - **ව්‍යවසායකත්ව සංවර්ධනය**: ප්‍රේෂණ භාවිතයෙන් කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර පුහුණුව ලබා දීම සහ ක්ෂුද්‍ර  මූල්‍ය ආයතන, සමුපකාර සහ ඩිජිටල් වෙළඳපොළවල් සමඟ පවුල් සම්බන්ධ කිරීම.

    - **භූගෝලීය ආවරණය**: ඉහළ සංක්‍රමණික දිස්ත්‍රික්ක (උදා: කුරුණෑගල, අනුරාධපුර, ගම්පහ, මඩකලපුව) ප්‍රමුඛතාවය දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සේවා ඒකාබද්ධ කිරීම.

---

මෙම සවිස්තරාත්මක මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමෙන්, ශ්‍රී ලංකාවට සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සමාජ-ආර්ථික ඇතුළත් කිරීම ශක්තිමත් කළ හැකි අතර, තිරසාර සංවර්ධන මාවතක් ලෙස චක්‍රීය සංක්‍රමණය ශක්තිමත් කළ හැකිය.

**ප්‍රධාන පාර්ශවකරුවන් සහ භූමිකාවන්:**

• **ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය**: විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සහ ආධාරක වේදිකා කළමනාකරණය.
• **විදේශ කටයුතු අමාත්‍යාංශය**: ද්විපාර්ශ්වික ගිවිසුම් සාකච්ඡා කර අධීක්ෂණය කිරීම..
•  **මුදල් අමාත්‍යාංශය**: අරමුදල් කළමනාකරණය සහ සහනාධාර අධීක්ෂණය කිරීම.
• **රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන**: පවුල් සහාය සේවා ලබා දීම.

**සම්බන්ධීකරණ මෙවලම්:**

• ඩිජිටල් සංක්‍රමණික සේවා ද්වාර.
• ද්විපාර්ශ්වික කම්කරු සහයෝගීතා රාමු.

**අධීක්ෂණ සහ ඇගයීම් රාමුව:**

• විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ ලියාපදිංචි වීමේ සහ ප්‍රතිලාභ ලබා ගැනීමේ අනුපාත
• සහාය සේවා සමඟ සංක්‍රමණික සේවක තෘප්තිය..
•අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී ද්විපාර්ශ්වික ගිවිසුම්වල ඵලදායීතාවය.

**ධාරිතාව/සම්පත් අවශ්‍යතා:**
• විශ්‍රාම වැටුප් සහ සේවා කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති.

• පුහුණු උපදේශකයින් සහ මූල්‍ය උපදේශකයින්.
• සංක්‍රමණික පවුල් සහාය මධ්‍යස්ථාන සඳහා අරමුදල් සැපයීම.

## 6.ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

### 6.1 පාලනය: සමාජ ආරක්ෂාව සඳහා ආයතනික රාමුව

ඒකාබද්ධ, වගවීම සහ අයිතිවාසිකම් මත පදනම් වූ සමාජ ආරක්ෂණ පද්ධතියක් ලබා දීම සඳහා හොඳ පාලන ව්‍යුහයක් වටා කේන්ද්‍රීය වන ශ්‍රී ලංකාව පැහැදිලි නියෝග, සම්බන්ධීකරණ වේදිකා(coordination platforms) සහ නීතිමය පිටුබලය සහිත බහු-ස්ථර පාලන ක්‍රම වේදයක් අනුගමනය කෙරේ

**ප්‍රධාන සංරචක:**

- **ජාතික සමාජ ආරක්ෂණ කවුන්සිලය (NSPC):**
    - ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා විසින් සභාපතිත්වය දරනු ලබයි
    - මුදල්, සමාජ සවිබල ගැන්වීම්, සෞඛ්‍ය, කම්කරු, අධ්‍යාපන, කාන්තා හා ළමා යන අමාත්‍යාංශ වල අමාත්‍යවරුන් සහ පළාත් සභා අමාත්‍යවරුන් ඇතුළත් විම.
    - උපායමාර්ගික අධීක්ෂණය සහ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය සපයනු ලැබිම.

---

### 6.2 සම්බන්ධීකරණය: රජය තුළ සහ ඉන් ඔබ්බට

**ඵලදායී ක්‍රියාත්මක කිරීම රජය පුරා ඇති සිලෝ(silos) බිඳ දැමීම සහ හරස් අංශ සහ හරස් මට්ටමේ සහයෝගීතාව සක්‍රීය කිරීම මත රඳා පවතී.**

**අභ්‍යන්තර සම්බන්ධීකරණය:**

- **අන්තර් අමාත්‍යාංශ සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී කණ්ඩායම:**
    - වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දත්ත බෙදාගැනීම සහ අයවැයකරණය පෙළගැස්වීම සඳහා කාර්තුමය වශයෙන් රැස්වේ.
    - දායකත්ව සහ දායක නොවන යෝජනා ක්‍රම අතර ප්‍රතිපත්තිමය එකඟතාවයට පහසුකම් සපයයි.
- **ඒකාබද්ධ SP-MIS සහ ඒකාබද්ධ තොරතුරු පද්ධතිය:**
    - සමාජ ආධාර, සෞඛ්‍ය, අධ්‍යාපනය, රක්ෂණ සහ රැකියා වැඩසටහන් හරහා අන්තර් ක්‍රියාකාරීත්ව සක්‍රීය කරන ඩිජිටල් පද්ධති (Digital Platforms).
    - නිවැරදි ඉලක්ක කිරීම, ද්විකරණය පාලනය සහ හිමිකම් සුවහ බව (portability)

.

**බාහිර සම්බන්ධීකරණය:**

- **සංවර්ධන හවුල්කරුවන් සහ පරිත්‍යාගශීලීන්:**
    - තාක්ෂණික සහාය, ධාරිතා වර්ධනය සහ ඒකාබද්ධ මූල්‍යකරණය සඳහා අවබෝධතා ගිවිසුම් සහ අංශ ක්‍රියාකාරී කණ්ඩායම්
- **පෞද්ගලික අංශය:**
    - රක්ෂණ සහ විශ්‍රාම යෝජනා ක්‍රම දීර්ඝ කිරීම සඳහා ගිග් වේදිකා(Gig platforms), සේවා යෝජකයින්, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වීම.
- **සිවිල් සමාජය සහ රාජ්‍ය නොවන සංවිධාන:**
    - ප්‍රජා පාදක සත්කාර ආකෘති ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම නිරීක්ෂණය කිරීම සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන්ට සහාය වීම.
- **අධ්‍යයන හා පර්යේෂණ ආයතන:**
    - ඇගයීම්, නවෝත්පාදන නියමු සහ සමාජ ආරක්ෂණ වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

---

**6.3 මූල්‍යකරණය: තිරසාර හා ඇතුළත් පද්ධතියක් ගොඩනැගීම**

මූල්‍ය තිරසාරභාවය, සාධාරණත්වය සහ පරිමාණය සහතික කිරීම සඳහා මිශ්‍ර මූල්‍යකරණ ආකෘතියක් අනුගමනය කිරීම.

**මූලික අරමුදල් ක්‍රම:**

**1. මූලික අවශ්‍යතා – රජයේ මූල්‍යාධාර:**

- අවම ආදායම් සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා ජාතික අයවැය හරහා අරමුදල් සපයනු ලැබේ.
- විශ්වීය සහ දරිද්‍රතාවය ඉලක්ක කරගත් වැඩසටහන් ආවරණය කරයි.:
    - දරිද්‍රතාවය පිටුදැකීමේ මූල්‍ය සහන වැඩසටහන්
    - වැඩිහිටි සහ ආබාධිත ප්‍රතිලාභ
    - පොදු වැඩ සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන් ආදිය.

**2. අනිවාර්ය දායක මුදල්:**

- විධිමත් සේවකයින් සහ සේවා යෝජකයින් දායක වන්නේ:
    - EPF/ETF
    - අග්‍රහාර සහ වෘත්තීය රක්ෂණ යෝජනා ක්‍රම.
- අර්ධ විධිමත් සහ වේදිකා (Platform) සේවකයින් ක්‍රමයෙන් ඇතුළත් කිරීම.

**3. ස්වේච්ඡා දායකත්වයන්:**

- අවිධිමත් අංශයේ සේවකයින්, රට තුල සිටින සේවකයින් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයන් දායක වන්නේ:
    - ජංගම මුදල් පසුම්බි හෝ සමුපකාර වේදිකා හරහා ක්ෂුද්‍ර විශ්‍රාම වැටුප් සහ ක්ෂුද්‍ර රක්ෂණ යෝජනා ක්‍රම.
- අඩු ආදායම්ලාභී සේවකයින් සඳහා රජය විසින් ගැලපෙන දායක මුදල් ලබා දිය හැකිය.

**අතිරේක මූල්‍යකරණ උපාය මාර්ග:**

- ඉලක්කගත මුදල් හුවමාරු සඳහා **අකාර්යක්ෂම සහනාධාර නැවත වෙන් කිරීම**.
- තුවාල රක්ෂණය සහ මාතෘ ආවරණය සඳහා අරමුදල් සැපයීම සඳහා **ඉහළ අවදානම් සහිත කර්මාන්ත** (උදා: ඉදිකිරීම්, රිය පැදවීම) **සඳහා බද්දක් අය කිරීම**.
- ව්‍යවසාය සංවර්ධනය සහ සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීම සඳහා **සමාජ ආයෝජන බැඳුම්කර** සහ මිශ්‍ර මූල්‍යකරණය.

---

### 6.4 අධීක්ෂණය සහ ඇගයීම: කාර්ය සාධනය සහ අධ්‍යනය

ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ උපාය මාර්ගයේ ඵලදායීතාවය නිරීක්ෂණය කිරීම, කොටස්කරුවන්ට වගවීම සහතික කිරීම සහ සාක්ෂි මත පදනම් වූ අනුවර්තන අධ්‍යනය තුළින් අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා පුළුල් හා ක්‍රමානුකූල අධීක්ෂණ සහ ඇගයීම් (අධීක්ෂණය සහ ඇගයීම) රාමුවක් ඉතා වැදගත් වේ.

**ජාතික අධීක්ෂණය සහ ඇගයීම් රාමුව**

- **සමාජ ආරක්ෂණ ප්‍රතිඵල රාමුව**
  උපාය මාර්ගයේ කුළුණු හතර හරහා ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රතිඵල කේන්ද්‍ර කරගත් රාමුවක් ස්ථාපිත කෙරේ. මෙයට ඇතුළත් වන්නේ:
    - **ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs):**
        - මුදල් හුවමාරු වැඩසටහන් මගින් ආවරණය වන දුප්පත් කුටුම්බ ප්‍රතිශතය.
        - විධිමත් සත්කාර සේවා ලබන වැඩිහිටි ජනගහනයේ අනුපාතය.
        - ඉලක්කගත අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (තරුණයින්, කාන්තාවන්, සංක්‍රමණිකයන්) අතර රැකියා අනුපාත.
        - සමාජ රක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් වූ අවිධිමත් අංශයේ සේවකයින්ගේ අනුපාතය.
    - **වාර්ෂික වාර්තාකරණය:**
        - විනිවිදභාවය සහ දේශපාලන අධීක්ෂණය පවත්වා ගැනීම සඳහා සවිස්තරාත්මක ප්‍රගති වාර්තා වාර්ෂිකව සකස් කර පාර්ලිමේන්තුවට සහ ජාතික සමාජ ආරක්ෂණ කවුන්සිලයට (NSPC) ඉදිරිපත් කරනු ලැබේ.
- **ස්වාධීන සමාජ ආරක්ෂණ නිරීක්ෂණාගාරය**
  අපක්ෂපාතී තක්සේරු කිරීම් සැපයීම සහ ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා සහාය වීම සඳහා:

- මෙම නිරීක්ෂණාගාරය සිවිල් සමාජ සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් ප්‍රමුඛ පෙළේ ජාතික විශ්ව විද්‍යාලයක් විසින් සත්කාරකත්වය දරනු ඇත.
- වැඩසටහන් ප්‍රතිඵල සහ සමාජ බලපෑම මැනීම සඳහා එය ආවර්තිත බලපෑම් ඇගයීම්, සමාජ විගණන සහ ප්‍රතිලාභී තෘප්තිමත් සමීක්ෂණ පවත්වනු ඇත.
- ප්‍රතිපත්ති සම්පාදකයින් සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා නිරීක්ෂණාගාරය වාර්ෂික සහ තාවකාලික වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

**වැඩසටහන් මට්ටමේ අධීක්ෂණය සහ ඇගයීම**

- කුළුණු හතර යටතේ ඇති සෑම සමාජ ආරක්ෂණ වැඩසටහනකටම පහත සඳහන් දෑ සහිත සකස් කළ අධීක්ෂණය සහ ඇගයීම සැලැස්මක් ඇතුළත් වේ:
    - **සුහුරු දර්ශක:** ස්ථාවර මිනුම් සඳහා පහසුකම් සැලසීම සඳහා ජාතික KPI සමඟ සෘජුවම පෙළගස්වා ඇති නිශ්චිත, මැනිය හැකි, සාක්ෂාත් කරගත හැකි, අනුකූල සහ කාලානුරූපී දර්ශක.
    - **මූලික, මධ්‍ය සහ අවසාන ඇගයීම්:** කාලයත් සමඟ වැඩසටහන් කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීම සඳහා පුළුල් දත්ත රැස් කිරීමේ ස්ථාන. උදාහරණයක් ලෙස:
        - ඉලක්කගත ජනගහනය සඳහා ආරම්භක කොන්දේසි ස්ථාපිත කිරීම සඳහා මූලික සමීක්ෂණ.
        - අභියෝග හඳුනාගෙන නිවැරදි මාර්ගය සොයා ගැනීමට මධ්‍ය සමාලෝචන.
        - සමස්ත බලපෑම සහ තිරසාරභාවය තක්සේරු කරන අවසාන ඇගයීම්.
    - **තත්‍ය කාලීන අධීක්ෂණ උපකරණ පුවරු:**
        - දරිද්‍රතා සහන වැඩසටහන් වලින් සවිබල අනුපාත, ලබා දුන් සත්කාර සේවා චාරිකා ගණන සහ සක්‍රිය කිරීමේ මුලපිරීම් හරහා ලබා ගත් රැකියා ස්ථානගත කිරීම් වැනි ප්‍රධාන නිමැවුම් පිළිබඳ යාවත්කාලීන දත්ත සැපයීම සඳහා සමාජ ආරක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (SP-MIS) සමඟ ඒකාබද්ධ වීම.

**අනුවර්තීය කළමනාකරණය**

- **වාර්ෂික අධ්‍යන සහ සමාලෝචන සංසදය:**
    - අධීක්ෂණය සහ ඇගයීම සොයාගැනීම් සමාලෝචනය කිරීම සඳහා රජයේ ආයතන, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමන්, ප්‍රතිලාභීන්, සිවිල් සමාජය සහ සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධ වන බහු-පාර්ශවකරුවන්ගේ සංසදයක්.
- මෙම සංසදය සාර්ථකත්වයන්, අභියෝග සහ වැඩසටහන් සැලසුම් කිරීම හෝ බෙදා හැරීම සඳහා අවශ්‍ය ගැලපීම් පිළිබඳ සංවාදයට පහසුකම් සපයනු ඇත.**ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ:**
    - ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සහ ප්‍රතිලාභීන් සඳහා අඛණ්ඩ ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා ව්‍යුහගත නාලිකා ස්ථාපිත කිරීම.
    - බිම් මට්ටමේ දෘෂ්ටිකෝණ වැඩසටහන් ශෝධනය හැඩගස්වන බව සහතික කරමින්, ස්වාධීන ප්‍රතිලාභී ප්‍රතිපෝෂණ සැසි පැවැත්වීම සඳහා සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ ගැනීම.

- **දුක්ගැනවිලි විසඳීම සහ විසඳුම් පසුවිපරම:**
    - ප්‍රතිචාර කාලය සහ විසඳුම් අනුපාත වැනි මිනුම් හරහා දුක්ගැනවිලි යාන්ත්‍රණයන්හි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.
    - දුක්ගැනවිලි දත්ත නිතිපතා විශ්ලේෂණය කිරීමෙන් පද්ධතිමය ගැටළු හඳුනාගෙන ප්‍රතිපත්ති සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් දැනුම් දීම.

**වගුව: ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ උපායමාර්ග සඳහා වන අධීක්ෂණ සහ ඇගයීම් රාමුව.**

| **අධීක්ෂණය සහ ඇගයීම සංරචකය** | **විස්තරය** | **ප්‍රධාන ක්‍රියාකාරකම් / ලක්ෂණ** | **අපේක්ෂිත ප්‍රතිඵල / KPI** |
|---|---|---|---|
| ජාතික අධීක්ෂණ සහ ඇගයීම් රාමුව | සියලුම සමාජ ආරක්ෂණ කුළුණු නිරීක්ෂණය කිරීම සඳහා පුළුල් රාමුවක්. | - ඉහළ මට්ටමේ KPI සහිත සමාජ ආරක්ෂණ ප්‍රතිඵල රාමුවක් සංවර්ධනය කිරීම - පාර්ලිමේන්තුවට සහ NSPC වෙත වාර්ෂික ප්‍රගති වාර්තා ලබාදීම. | - මුදල් ලබාදීම මගින් ආවරණය වන දුප්පත් පවුල් % - සත්කාර සේවා ප්‍රවේශය ඇති වැඩිහිටියන් % - අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා රැකියා අනුපාත |
| ස්වාධීන සමාජ ආරක්ෂණ නිරීක්ෂණාගාරය | ඇගයීම සහ පර්යේෂණ සඳහා ස්වාධීන ආයතනයක්. | -සිවිල් සමාජය සමඟ හවුල්කාරිත්වයෙන් ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාලයක් විසින් සත්කාරකත්වය දරනු ලැබේ - බලපෑම් ඇගයීම්, සමාජ විගණන, ප්‍රතිලාභී සමීක්ෂණ පැවැත්වීම - ප්‍රතිපත්තිය දැනුම් දීම සඳහා වාර්තා ප්‍රකාශයට පත් කිරීම. | - ඇගයීම්වල ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය- වාර්තාකරණයේ විනිවිදභාවය- සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම් |
| වැඩසටහන් මට්ටමේ අධීක්ෂණය සහ ඇගයීම | කුළුණු හතර තුළ එක් එක් වැඩසටහන සඳහා සකස් කරන ලද අධීක්ෂණය සහ ඇගයීම | - ජාතික KPI සමඟ පෙළගස්වා ඇති සුහුරු දර්ශක සැකසීම - මූලික, මධ්‍ය සහ අවසාන ඇගයීම්- තත්‍ය කාලීන උපකරණ පුවරු (SP-MIS ඒකාබද්ධ කිරීම) | නිවැරදි වැඩසටහන් ප්‍රගති දත්ත - ගැටළු කාලෝචිත ලෙස හඳුනා ගැනීම - වැඩිදියුණු කළ වැඩසටහන් කාර්ය සාධනය |
| අනුවර්තීය කළමනාකරණය | අධීක්ෂණය සහ ඇගයීම වෙතින් අධ්‍යනයට යාන්ත්‍රණ සහ ක්‍රියාවට නැංවීම වැඩිදියුණු කිරීම. | - වාර්ෂික බහු පාර්ශ්වකරුවන්ගේ ඉගෙනුම් සහ සමාලෝචන සංසදය- ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය, ප්‍රතිලාභියා, සිවිල් සමාජ ප්‍රතිපෝෂණ ලූප- දුක්ගැනවිලි විසඳීම නිරීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය. | - සාක්ෂි මත පදනම් වූ වැඩසටහන් සැකසුම - ප්‍රතිලාභීන්ගේ තෘප්තිය වැඩි වීම - ඵලදායීව දුක්ගැනවිලි විසඳීම. |

| | | | |
|---|---|---|---|
| 1.2 බල ගැන්වීමේ මාර්ග | BRAC – බල ගැන්වීමේ ආකෘතිය (බංගලාදේශය) | මුදල් ආධාර, කුසලතා, වත්කම් මාරු කිරීම්, මග පෙන්වීම, ඉතිරිකිරීම්; > 95% ක් අතිශය දිළිඳු බවින් මුදා ගැනීම. | මුදල් සහන ලබාදීමේ වැඩසටහන්පවුල් සහ නාගරික අවිධිමත් සේවකයින් සඳහා අවුරුදු 2–3 බල ගැන්වීමේ මාර්ග; ක්ෂුද්‍ර මූල්‍ය, TVET, ව්‍යවසාය ප්‍රදාන. |
| 1.3 ජීවන චක්‍රය මත පදනම් වූ ඉලක්කකරණය | දකුණු අප්‍රිකාව – සමාජ ආධාර පද්ධතිය | ළමුන්, වැඩිහිටියන්, ආබාධිතයන් සඳහා වයස්-විශේෂිත ප්‍රතිලාභ; ප්‍රතිලාභීන් මිලියන 18+ ක් | අස්වැසුමෙන් ඔබ්බට ව්‍යුහගත වයස්-නිශ්චිත යෝජනා ක්‍රම: විශ්වීය/ආසන්න විශ්වීය වැඩිහිටි විශ්‍රාම වැටුප්, ළමා පෝෂණ ප්‍රදාන, ආබාධිත දීමනා |
| 1.4 කම්පන-ප්‍රතිචාරාත්මක පද්ධති | පිලිපීනය – 4Ps + Emergency Top-Ups | පරිමාණය කළ හැකි මුදල් මාරු කිරීම්, ඩිජිටල්/ජංගම ගෙවීම්, භූගෝලීය ඉලක්ක කිරීම | මුදල් සහන ලබාදීමේ වැඩසටහන්හි කම්පන ප්‍රතිචාර මොඩියුලය; ජංගම මාරුවීම්; ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ කාලගුණ විද්‍යාව සමඟ සම්බන්ධීකරණය කිරීම |
| 1.5 අධීක්ෂණ සහ පිටවීමේ උපාය මාර්ග | චිලී – Chile Solidario | මුදල් මාරු කිරීම් + මනෝ සමාජීය සහාය, නිවාස සංචාර, පවුල් සැලසුම් | ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ගෞරවනීය පිටවීම් සැලසුම් කිරීමට සමාජ සංවර්ධන/සමෘද්ධි නිලධාරීන් "සිද්ධි කළමනාකරුවන්" ලෙස පුහුණු කරන්න |
| 1.6 ඒකාබද්ධ උපාධි සහ ප්‍රජා බලගැන්වීම | BRAC + Chile Solidario ආකෘතිය | ගෘහස්ථ මට්ටම් + ප්‍රජා මුලපිරීම් | බලගැන්වීමේ වැඩසටහන් සමඟ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘති හරහා දේශීය ඔරොත්තු දීමේ හැකියාව, ඇතුළත් කිරීම, සමාජ සහජීවනය වැඩි දියුණු කිරීම |

| කුළුණු අංක 2: සමාජ සත්කාර | | | |
|---|---|---|---|
| 2.1 විස්තීර්ණ ජාතික සත්කාර පද්ධතිය | ජපානය – LTCI | රට පුරා ආයතනික සහ නිවාස පාදක සත්කාර, වැටුප්-බදු අරමුදල් සැපයීම. | සේවා පැකේජ, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්, අයවැය ප්‍රතිපාදන සහිත ඒකාබද්ධ සත්කාර ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම . |
| 2.2 සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීම සහ සහතික කිරීම | ජර්මනිය – ජාතික සත්කාර පුහුණු රාමුව | ව්‍යුහගත වෘත්තීය පුහුණුව, බහු මට්ටමේ සහතික කිරීම්. | NVQ යටතේ ජාතික රැකවරණ ආයතනය; වැඩිහිටි, ආබාධිත, මුල් ළමාවිය රැකවරණය පිළිබඳ වෘත්තීය මාර්ග. |
| 2.3අවිධිමත් සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය. | ෆින්ලන්තය – පවුල් සත්කාර සේවා සපයන්නන්ට ආධාර යෝජනා ක්‍රමය. | නාගරික දීමනා, විවේක සත්කාර, සෞඛ්‍ය/මානසික සහාය | එක්තැන් වූ වැඩිහිටියන්/ආබාධිත පුද්ගලයින්, විශේෂයෙන් ග්‍රාමීය/වතු රැකබලා ගන්නන් සඳහා මාසික දීමනාව සහ උපදේශනය. |
| 2.4 ප්‍රජා පාදක සත්කාර ජාල | තායිලන්තය – ග්‍රාමීය ස්වේච්ඡා සේවකයින් | ප්‍රජා ස්වේච්ඡා සේවකයන් වැඩිහිටියන්ගේ/නිදන්ගත රෝග සඳහා සහාය වීම; • ප්‍රාථමික සෞඛ්‍ය සේවා සමඟ ඒකාබද්ධ වීම. | පුහුණු/ශිෂ්‍යත්ව සමඟින් PHM වරුන්, කාන්තා සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් සත්කාර සේවා සම්බන්ධීකාරකවරුන් ලෙස බලගැන්වීම. |
| 2.5 සමාජ සත්කාර ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් | සිංගප්පූරුව – වැඩිහිටි සත්කාර මධ්‍යස්ථාන ආකෘතිය | රාජ්‍ය නොවන සංවිධාන/පුණ්‍යායතන රජයේ සම-මූල්‍යකරණය සමඟ දිවා සුරැකුම් සහ සෞඛ්‍ය සේවා සැපයීම. | විශේෂයෙන් නාගරික සහ වතු ප්‍රදේශ වල නේවාසික/දිවා සුරැකුම් සඳහා රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන, පෞද්ගලික සැපයුම්කරුවන් සඳහා අරමුදල් සැපයීම. |
| **කුළුණු අංක 3: සමාජ රක්ෂණය** | | | |
| 3.1 අවිධිමත් සේවකයින් ඇතුළත් කිරීම | ඉන්දියාව – eShram + PM-SYM | ඩිජිටල් ලේඛනය, දායක විශ්‍රාම වැටුප්, ජංගම/CSC ලියාපදිංචිය | ගොවීන්, ගෘහ සේවකයින්, ධීවරයින්, ගිග් සේවකයින් සඳහා ජංගම දුරකථන පාදක ක්ෂුද්‍ර -විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රම. |

| | | | |
|---|---|---|---|
| 3.2 සමාජ රක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම | ඉන්දුනීසියාව – BPJS Ketenagakerjaan | සෞඛ්‍ය, විශ්‍රාම වැටුප්, මාතෘත්වය, සේවා ස්ථාන තුවාල; ඒකාබද්ධ වේදිකාව | ජාතික සමාජ රක්ෂණ වේදිකාව යටතේ EPF, ETF, ගොවි විශ්‍රාම වැටුප්, අග්‍රහාර යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම. |
| 3.3 විශ්ව අවදානම් ආරක්ෂාව | තායිලන්තය – UCS | බදු අරමුදල් සහිත සෞඛ්‍ය රක්ෂණය; බාහිර රෝගී/නේවාසික රෝගී/මාතෘ ආවරණය | ජාතික හැඳුනුම්පත/මුදල් සහන ලබාදීමේ වැඩසටහන්හා සම්බන්ධ විශ්වීය මාතෘ සහ සෞඛ්‍ය රක්ෂණය |
| 3.4 ඩිජිටල් ලියාපදිංචිය සහ සුවහ බව | රුවන්ඩාව – ස්මාර්ට් හැඳුනුම්පත + ප්‍රජා සෞඛ්‍ය රක්ෂණය | ජංගම ලියාපදිංචිය සහ වාරික ගෙවීම; සුවහබව, ප්‍රතිලාභ | විශ්‍රාම වැටුප්, මාතෘත්වය, විරැකියාව සඳහා ජාතික හැඳුනුම්පතට සබැඳි සුවහ බවෙන් යුතු හැකි ඩිජිටල් සමාජ රක්ෂණ හැඳුනුම්පත |
| 3.5 නැගී එන සේවක කණ්ඩායම් සඳහා ආවරණය | කෙන්යාව – ගිග් සේවක සමාජ ආරක්ෂණ නියමුවන් | බෙදාහැරීමේ සේවකයින් සඳහා වේදිකා පාදක දායකත්වය | ගිග් සේවකයින් ස්වේච්ඡා සමාජ රක්ෂණය සඳහා ස්වයංක්‍රීයව ඇතුළත් කිරීම සඳහා PickMe, Uber සමඟ හවුල් වීම. |
| 3.6 Sසේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය(EPF) ශක්තිමත් කිරීම. | සිංගප්පූරුව– CPF | බහු-ස්ථර විශ්‍රාමික ඉතිරිකිරීම්; විධිමත් ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම. | EPF කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ඩිජිටල් වේදිකා ඒකාබද්ධ කිරීම. |
| 3.7 ETF/EPF ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම. | මැලේසියාව – ETF/EPF ආකෘති | මධ්‍යගත දායකත්වය; සුභසාධන සහාය; නම්‍යශීලී මුදල් ආපසු ගැනීම්. | ETF/EPF ඩිජිටල් ආකාරයෙන් විධිමත් කිරීම සහ සමාජ රක්ෂණ වේදිකා සමඟ ඒකාබද්ධ වීම. |
| 3.8 SSB යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම. | ඉන්දියාව– SSB & State Models | අවිධිමත්/ස්වයං රැකියාලාභී/සංක්‍රමණික සේවකයින් සඳහා රක්ෂණය. | අවිධිමත් අංශයට සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින්ට SSB ආවරණය පුළුල් කිරීම. |
| 3.9 NITF කාර්යභාරය වැඩි දියුණු කිරීම. | පිලිපීනය – ඒකාබද්ධ රජයේ රක්ෂණ පද්ධති. | දැරිය හැකි රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහාය. | ආවරණය පුළුල් කිරීම සඳහා NITF සේවා (අග්‍රහාර, SRCC&T, බෝග රක්ෂණය) භාවිතා කිරීම. |

| | | | |
|---|---|---|---|
| 3.10 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම. | එස්තෝනියාව – ඊ-විශ්‍රාම වැටුප් | සම්පූර්ණයෙන්ම ඩිජිටල්, හැඳුනුම්පත් සම්බන්ධිත, සයිබර්-ප්‍රතිරෝධී | විශ්‍රාම වැටුප් ඩිජිටල්කරණය; අඛණ්ඩතාව සහ ආරක්ෂාව සහතික කිරීම. |
| 3.11 වැටුප් සහිත දෙමාපිය නිවාඩු සහ වැඩ-ජීවිත සමබර බව | ඕස්ට්‍රේලියාව – වැටුප් සහිත දෙමාපිය නිවාඩු (PPL) යෝජනා ක්‍රමය. | සුදුසුකම් ලත් ප්‍රාථමික සත්කාර සපයන්නන් සඳහා අවම වැටුපක් සහිත රජයේ අරමුදල් සහිත සති 18ක් දක්වා නිවාඩු; දෙමාපියන් අතර බෙදා ගත හැකිය; | අවිධිමත් සේවකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආවරණය වන පරිදි, දායකත්ව ජාතික වැටුප් සහිත දෙමාපිය නිවාඩු ක්‍රමයක් හඳුන්වා දීම; කාන්තාවන් අතර ශ්‍රම බලකායෙන් ඉවත් වීම අවම කිරීම සහ මුල් ළමාවිය සංවර්ධනයට සහාය වීම සඳහා නියමු මාතෘ/පීතෘ දීමනා. |
| **කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ නිෂ්පාදන ඇතුළත් කිරීම** | | | |
| 4.1 ඒකාබද්ධ සක්‍රියකරණ සේවා | චිලී – Chile Solidario | කොන්දේසි සහිත මාරුවීම් + රැකියා පුහුණුව, මග පෙන්වීම, සමාජ සේවා. | මුදල් සහන ලබාදීමේ වැඩසටහන්ප්‍රදානලාභීන් NVQ පුහුණුව සහ දේශීය • සක්‍රීය කණ්ඩායම් සමඟ සම්බන්ධ කිරීම. |
| 4.2 පොදු වැඩ සහ හරිත රැකියා | ඉන්දියාව – MGNREGA | දේශගුණික සහ ග්‍රාමීය අවධානය සහිත පොදු වැඩ රැකියා අවස්ථා. | ග්‍රාමීය/ආපදා අවදානම් සහිත ප්‍රදේශවල පොදු කටයුතු; දේශගුණික වශයෙන්ම රොත්තු දීමේ හැකියාව, සත්කාර සේවය, පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර. |
| 4.3 ව්‍යවසාය සංවර්ධන සහාය | ඉතියෝපියාව – ඵලදායී ආරක්ෂණ ජාලය + ව්‍යවසාය සහාය | තරුණ/කාන්තා ගෘහ මූලිකත්වය දරන පවුල් සඳහා ප්‍රදාන, කුසලතා, උපදේශනය. | තරුණයින්, කාන්තාවන් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා ආරම්භක කට්ටල, පොලී රහිත ණය, වෙළඳපොළ සම්බන්ධතා. |
| 4.4 කුසලතා සංවර්ධනය සහ නැවත කුසලතා ලබා ගැනීම. | ජර්මනිය - ද්විත්ව ආධුනිකත්ව පද්ධතිය | පන්ති කාමර + රැකියා ස්ථාන පුහුණුව; ජාතික වශයෙන් පිළිගත් සහතික කිරීම. | රැකවරණ කටයුතු, තොරතුරු තාක්ෂණ, සංචාරක, ඉදිකිරීම් සඳහා TVET + සේවායෝජක හවුල්කාරිත්වයන් |

| | | | |
|---|---|---|---|
| 4.5 සංක්‍රමණ සහාය සහ නැවත ඒකාබද්ධ කිරීම. | පිලිපීනය - විදේශගත ශ්‍රමිකයින් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන. | ව්‍යාපාර සහාය, ජීවනෝපාය පුහුණුව, මනෝ සමාජීය සේවා | ව්‍යවසාය සහාය, උපදේශනය, පුහුණුව සහිත දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිසංයෝජන ඒකක |
| 4.6 ප්‍රජා ශක්ති ගම්මාන / ප්‍රජා නායකත්වයෙන් යුත් සංවර්ධනය | ඉන්දියාව – AMUL සමුපකාර ආකෘතිය | ගොවීන් සතු සමුපකාර; ලාභ බෙදා ගැනීම; කාන්තා සහභාගීත්වය | සමුපකාර නායකත්වයෙන් යුත් ග්‍රාමීය ව්‍යවසායන්; අස්වැසුම/සමෘද්ධි ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීම; තාක්ෂණික සහ වෙළඳපල සහාය. |
| 4.7 සංක්‍රමණික සේවකයින් සහ පවුල් සඳහා සහාය. | පිලිපීනය සහ තායිලන්තය – විස්තීර්ණ සංක්‍රමණික සහාය වැඩසටහන් | මූල්‍ය, සමාජීය, මනෝ සමාජීය සේවා; පවුල් සහයෝගය | සංක්‍රමණික සේවක පවුල් සඳහා සේවා පුළුල් කිරීම; අස්වැසුම/SSB සමඟ ඒකාබද්ධ වීම; උපදේශනය, පුහුණුව, ව්‍යවසාය සහාය. |

**ඇමුණුම 1:**

## ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂාව සඳහා ආයතනික උපායමාර්ගික දිශාවන්

ශ්‍රී ලංකාව සඳහා විස්තීර්ණ සහ ඇතුළත් සමාජ ආරක්ෂණ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීමේදී, ප්‍රධාන රාජ්‍ය ආයතනවල කාර්යභාරය, හැකියාවන් සහ ප්‍රමුඛ ක්‍රියාවන් සමඟ පෙළගැස්වීම අත්‍යවශ්‍ය වේ. පහත දක්වා ඇති ආයතනික උපායමාර්ගික උපදෙස්,සමාජ සහාය සහ සමාජ සත්කාර කුළුණු හරහා අදාළ පාර්ශවකරුවන් ගෙන් ලද සෘජු උපදේශන මත පදනම් වේ. මෙම උපදෙස් මගින් ආයතනික සහජීවනය උපරිම කිරීම, ඛණ්ඩනය අඩු කිරීම සහ සම්බන්ධීකරණ සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි. එක් එක් ආයතනයේ අද්විතීය ශක්තීන් සහ භූමිකාවන් හඳුනා ගැනීමෙන්, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සන්දර්භීයව අදාළ බව, ක්‍රියාකාරීව ඉටුකළ හැකි බව සහ ආයතනික වශයෙන් හිමිකාරීත්වය දරන බව උපාය මාර්ගය සහතික කරයි - එමගින් ජාතික සමාජ ආරක්ෂණ පද්ධතියේ වගවීම, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය වැඩි දියුණු කරයි.

**පහත දැක්වෙන්නේ ප්‍රධාන ආයතන වන නමුත් උපායමාර්ගය මේවාට පමණක් සීමා නොවිය යුතු අතර සහ අනෙකුත් අදාළ ආයතන ද සම්බන්ධ විය හැකිය.**

---

### 1. සුභසාධන ප්‍රතිලාභ මණ්ඩල (WBB) ඒකාබද්ධතාවය

**උපායමාර්ගික දිශාව WBB-1:** සමාජ ආධාර සහ යොමු කිරීමේ පද්ධති සඳහා ඩිජිටල් නැංගුරම ලෙස සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය (WWB) ඔසවා තබයි.

**මැදිහත්වීම්:**

- **WBB-1.1:** ඒකාබද්ධ ප්‍රතිලාභී තොරතුරු පද්ධතිය (UBR) සහ අනෙකුත් අමාත්‍යාංශ MIS වේදිකා සමඟ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කර ඇති, සියලුම මුදල් මාරු කිරීම් සඳහා කේන්ද්‍රීය ඩිජිටල් කොඳු නාරටිය ලෙස සේවය කිරීම සඳහා සුභසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය (WBIS) පුළුල් කිරීම.
- **WBB 1.2:** ඇතුළත් කිරීමේ/බැහැර කිරීමේ දෝෂ සහ දේශපාලන මැදිහත්වීම් අවම කිරීම සඳහා විනිවිදභාවයෙන් සහ ස්වාධීනත්වයෙන් යුතුව විගණනය කෙරෙන ලද සුදුසුකම් සහ ගෙවීම් සත්‍යාපන යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.
- **WBB-1.3:** මුදල් බෙදාහැරීමේ යාන්ත්‍රණයන්, සත්කාර සහ යොමු කිරීමේ මාර්ග සමඟ පෙළගැස්වීම සඳහා අන්තර් අමාත්‍යාංශ කාර්ය සාධක බලකායක් (DSS, MoH, NSPD, NSE, MWCA, DoL, SLBFE ආදිය) රැස්වීම.

**සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

- ජාතික හැඳුනුම්පත්-සම්බන්ධිත අනන්‍යතා පද්ධති හරහා දත්ත ඒකාබද්ධ කිරීම.
- ජංගම/පොදු ප්‍රවේශයන් සහිත ප්‍රා.ලේ සහ ග්‍රා.නි මට්ටමින් දුක්ගැනවිලි විසඳීම සඳහා මෙවලම්.
- බැංකු සේවා ලබා නොගන්නා ජනගහනය, ප්‍රතිපාදනද ඇතුළුව ගිණුම් මගින් ගෙවීම් කිරීමට යොමු කිරීම.

---

## 2. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)

**උපායමාර්ගික දිශාව DSS 1: ප්‍රජා පාදක සමාජ සත්කාර සහ යොමු කිරීමේ සම්බන්ධීකරණය සඳහා මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථානගත කිරීම.**

**මැදිහත්වීම්:**

- **DSS-1.1:** ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටම්වල සියලුම සත්කාර සේවා සපයන්නන් ඩිජිටල් ලෙස සිතියම්ගත කර ලියාපදිංචි කිරීම.
- **DSS-1.2:**DSS නිලධාරීන් පුහුණු කිරීමෙන් සහ ග්‍රාම නිලධාරී මට්ටමින් ප්‍රජා වැඩිහිටි සහ ආබාධිත සත්කාර පහසුකම් සපයන්නන් බලමුලු ගැන්වීමෙන් සිද්ධි කළමනාකරණය ශක්තිමත් කිරීම.
- **DSS-1.3:** සම්බන්ධීකරණ සේවා සැපයීම සක්‍රීය කිරීම සඳහා WBB, MoH සහ NSPD පද්ධති සමඟ DSS ප්‍රවේශය සහ සිද්ධි දත්ත ඒකාබද්ධ කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

- අයවැයගත කළ පළාත් සහ ප්‍රාදේශීය ලේකම් මට්ටමේ ඒකක හරහා විමධ්‍යගත කිරීම.
- සමාජ සේවකයින් සහ සත්කාර සේවා සපයන්නන් සඳහා NVQ අනුව පෙළගැස්වූ පුහුණුව සහ සහතික කිරීම.
- ග්‍රාම නිලධාරී මට්ටමින් සම්බන්ධීකරණ සේවා සැපයීම සඳහා පාලන රාමු.

---

## 3. වැඩිහිටියන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය (NSE)

**උපායමාර්ගික දිශාව NSE-1:** සමාජ සහාය සහ සත්කාර සේවා රාමුව හරහා වැඩිහිටි සත්කාර ආයතනගත කිරීම.

**මැදිහත්වීම්:**

- **NSE-1.1:** වැඩිහිටි ජනගහනය වැඩි දිස්ත්‍රික්කවල වැඩිහිටි දිවා සුරැකුම්, ජංගම නිවාස සංචාර සහ සුහසාධන සේවා පුළුල් කිරීම.
- **NSE-1.2:** DSS සහ MoH සමඟ සම්බන්ධිත ඒකාබද්ධ වැඩිහිටි අපයෝජන වාර්තාකරණ පද්ධති සහ ප්‍රතිචාර පද්ධති ස්ථාපිත කිරීම.
- **NSE-1.3:** දුර්වල වැඩිහිටියන් සහ දිගුකාලීන රෝගී තත්වයන් ඇති අය සඳහා සෞඛ්‍ය-සමාජ සත්කාර සේවා මාර්ග නියමු කිරීම සඳහා MoH සහ DSS සමඟ එක්ව කටයුතු කිරීම.

- **සක්‍රිය කිරීමේ යාන්ත්‍රණ:**

- ජාතික හැඳුනුම්පත් සහ UBR හරහා සම්බන්ධ කර ඇති ඩිජිටල්ගත වැඩිහිටි පුද්ගලයින්ගේ රෙජිස්ටරය.
- නිවාසගත සත්කාර සේවා සැපයීම සඳහා ස්වේච්ඡා සේවකයින්. (උදා: තරුණයින්, විශ්‍රාමිකයන්).
- ස්ටිග්මා තත්ත්වය සහ හුදකලාව අවම කිරීම සඳහා පරම්පරාවන් අතර දැනුවත් කිරීමේ වැඩසටහන්.

---

## 4. ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSPD)

**උපායමාර්ගික දිශාව NSPD-1:** සමාජ ආරක්ෂණ පද්ධති හරහා ආබාධිතභාවය පිළිගැනීම.

**මැදිහත්වීම්:**

- **NSPD-1.1:** WBIS, UBR, MoE, සහ MoH පද්ධති සමඟ අන්තර් ක්‍රියා කළ හැකි ආබාධිත පුද්ගලයින්ගේ රෙජිස්ටරයක් නිර්මාණය කිරීම.
- **NSPD-1.2:** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී මට්ටම්වලින් ආබාධිත පුද්ගලයින් සහතික කිරීම ප්‍රමිතිකරණය සහ ප්‍රතිලාභ සුදුසුකම් විධිමත් කිරීම.
- **NSPD-1.3:** උපකාරක උපාංග සැපයීම, ප්‍රවාහන දීමනා සහ ඇතුළත් ජීවනෝපාය මාර්ග හරහා ස්වාධීන ජීවන සහාය පුළුල් කිරීම.

- **සක්‍රිය කිරීමේ යාන්ත්‍රණ:**

- රාජ්‍ය ආයතන හරහා ප්‍රවේශ්‍යතා අනුකූලතාව ව්‍යාප්ත කිරීම.
- • DSS, WBB, සහ MoE සමඟ හරස්-අංශ යොමු පද්ධති.
- ආබාධිත පුද්ගලයින් සඳහා නියමු සත්කාර සේවා සපයන්නන්ගේ දීමනා සහ පුනරුත්ථාපන සහාය.

---

## 5. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (MWCA)

**උපාය මාර්ග දිශාව MWCA-1:** සමාජ ආධාර සහ රැකවරණය පුරා ස්ත්‍රී පුරුෂ භාවයට ප්‍රතිචාර දක්වන ආරක්ෂාව හා සහයෝගය ඒකාබද්ධ කිරීම.

**මැදිහත්වීම්:**

- **MWCA-1.1:** සමස්ථ සහාය සඳහා කාන්තා හා ළමා ආරක්ෂණ සිද්ධි ගොනු, මුදල් ප්‍රතිලාභ පද්ධති සමඟ සම්බන්ධ කිරීම.
- **MWCA-1.2:**ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය සඳහා උපකාරක දුරකථන (1938/1929) සහ වාසස්ථාන සඳහා යොමු කිරීමේ මාර්ග වැඩි දියුණු කිරීම.
- **MWCA-1.3:** කාන්තා මූලික පවුල් සඳහා නීති ආධාර, උපදේශනය, වෘත්තීය සහාය සහ මුදල් ප්‍රතිලාභ ලබා දෙන ඒකාබද්ධ පහසුකම් ක්‍රියාත්මක කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

- විවිධ අංශවලින් අවදානමට ලක්විය හැකි කාන්තාවන්/ළමුන් පිළිබඳ බෙදාගත් MIS මගින් නිරීක්ෂණය කිරීම.
- වාසස්ථාන සහ මනෝ සමාජීය (Psychosocial) සේවා සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ යුනිසෙෆ් සමඟ හවුල්කාරිත්වයන්.
- වැටුප් රහිත සත්කාර සේවා සැපයීමේ දුෂ්කරතා සඳහා ප්‍රතිපත්තිමය පියවර සහ ආදායම් ආධාර සැපයීම.

---

## 6. සෞඛ්‍ය අමාත්‍යාංශය – ප්‍රතිපත්ති හා සැලසුම් (MoH PD ඒකකය)

**උපායමාර්ගික දිශාව MoH-1:**සමාජ නිර්ණායක සහ සත්කාර සේවා යොමු කිරීම්, ජංගම ප්‍රජා සෞඛ්‍ය සේවා පද්ධති තුළ ඇතුලත් කිරීම

**මැදිහත්වීම්:**

- **MoH-1.1:** UBR සම්බන්ධිත පද්ධති තුළ ආබාධිතභාවය, දුර්වලතාවය, මන්දපෝෂණය සහ මානසික සෞඛ්‍යය කල්තියා හඳුනා ගැනීම සඳහා PHM වරුන් පුහුණු කිරීම.
- **MoH-1.2:** ප්‍රජා සායන, DSS සිද්ධි කළමනාකරණය සහ WBB සහාය වේදිකා අතර යොමු කිරීමේ ප්රොටෝකෝල සංවර්ධනය කිරීම.
- **MoH-1.3:** සෞඛ්‍ය පහසුකම් දත්ත (වැඩිහිටි, ළමා, දිගුකාලීන රෝග) සමාජ සහාය දත්ත සමුදායන් සමඟ ඒකාබද්ධ කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

- සෞඛ්‍ය සහ සමාජ අවදානම් නිරීක්ෂණය සඳහා සමෝධානිත ලේඛන.
- සත්කාර සේවා සඳහා PHM හඳුනාගැනීම සමඟ සම්බන්ධ කරන සමාජ නිර්දේශිත ආකෘති.
- අවදානමට ලක්විය හැකි ජනගහනය ඉලක්ක කර ගනිමින් ජංගම සෞඛ්‍ය-සමාජ සේවා කණ්ඩායම් පුළුල් කිරීම.

---

## 7.ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC)

**උපායමාර්ගික දිශාව DMC-1:** පූර්වාපේක්ෂණ පද්ධති හරහා කම්පනයට ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂාව ආයතනගත කිරීම.

**මැදිහත්වීම්:**

- **DMC-1.1:** WBIS සහ DSS හරහා පූර්ව ලියාපදිංචි මුදල් /ද්‍රව්‍යමය දේ වෙන් කර තැබීමට පූර්ව අනතුරු ඇඟවීමේ සීමාවන් අර්ථ දැක්වීම.
- **DMC-1.2:** අවදානම් සහිත නිවාස (වැඩිහිටියන්, ආබාධිතයන්) හඳුනා ගැනීම සඳහා UBR තුළට අවදානම් පිලිබඳ දත්ත ඇතුළත් කිරීම.
- **DMC-1.3:** හදිසි අවස්ථා සඳහා ඉලක්ක කිරීමේදි සහ මූල්‍යකරණ ආකෘති අනුවර්තනය කිරීමේදි DSS, MoH සහ WBB සමඟ එක්ව කටයුතු කිරීම.

- **සක්‍රිය කිරීමේ යාන්ත්‍රණ:**

- සමාජ ආරක්ෂණ ක්‍රියාකාරීන් ඒකාබද්ධ කරන විධිමත් ආපදා ප්‍රොටෝකෝල.
- පළාත් මට්ටමින් හදිසි අවස්ථා අරමුදල් ,ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව(DSS) විසින් ඒකාබද්ධව කළමනාකරණය කිරීම.
- සමාජ ආරක්ෂණ බෙදා හැරීම ඇතුළුව සූදානම් වීමේ සැලසුම් සහ සමාකරණ අභ්‍යාස. Wikipedia

---

## 8.වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

**උපායමාර්ගික දිශාව MPI-1:** වතුකරයේ සහ ආන්තිකකරණයට ලක් වූ ප්‍රජාවන් සඳහා සමාජ ආරක්ෂාව පුළුල් කිරීම.

**මැදිහත්වීම්:**

- **MPI-1.1:** වතු ජනාවාස UBR සහ WBIS පද්ධතිවලට සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ වී ඇති බව සහතික කිරීම සඳහා DSS සහ WBB සමඟ සම්බන්ධීකරණය කිරීම.
- **MPI-1.2:** සේවා සැපයීමට සහාය වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය (සත්කාර මධ්‍යස්ථාන, මාර්ග, සෞඛ්‍ය සම්බන්ධතා) සඳහා එක්ව කටයුතු කිරීම.
- **MPI-1.3:** වතුකරයේ ලියාපදිංචි කිරීම, සෞඛ්‍ය පරීක්ෂාව සහ සහාය සඳහා ජංගම මධ්‍යස්ථාන සහ ප්‍රජා සත්කාර ඒකක යෙදවීම.

- **සක්‍රිය කිරීමේ යාන්ත්‍රණ:**

- ප්‍රජා සේවා මධ්‍යස්ථාන සඳහා රාජ්‍යය-පෞද්ගලික(PPP) සහ ප්‍රාදේශීය වැවිලි සමාගම්(RPC) අතර හවුල්කාරිත්වයන්.
- ප්‍රවේශ කලාපවලට ප්‍රමුඛත්වය දෙමින් ඒකාබද්ධ යටිතල පහසුකම්-මූල්‍ය සැලසුම්කරණය.

---

## 9. මුදල් අමාත්‍යාංශය / මුදල් කොමිෂන් සභාව

- **උපායමාර්ගික දිශාව FC 1:** ඉලක්කගත සමාජ ආරක්ෂණ ප්‍රතිඵල සඳහා සහාය වීම පිණිස කාර්ය සාධනය මත පදනම් වූ මූල්‍ය මාරු කිරීම් සිදුකිරීම

**මැදිහත්වීම්:**

- **FC 1.1:** උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සඳහා සුදුසුකම් ලෙස ජීවන චක්‍රය මත පදනම් වූ ඉලක්ක කිරීම් සහ UBR මත පදනම් වූ දත්ත සමඟ පළාත් පෙළගැස්ම අනිවාර්ය කිරීම.
- • **FC 1.2**: ප්‍රතිඵල මත පදනම් වූ මිනුම් (ආවරණය, බලගැන්වීම , වැඩිහිටි සහ ආබාධිත නිවාස ඇතුළත් කිරීම) වෙත මූල්‍ය මාරු කිරීම් සම්බන්ධ කිරීම.
- • **FC 1.3:** DSS සහ DMC සමඟ හවුල්කාරිත්වයෙන් හදිසි සමාජ ආධාර සංචිත සඳහා අයවැයකරණය සම්බන්ධීකරණය කිරීම.
- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

. වැඩිහිටි, ළමා සහ ආබාධිත ජනගහනය ඉලක්ක කරගත් සාධාරණ මාරු කිරීම් සඳහා සූත්‍ර ස්ථාපිත කිරීම.

. පළාත් ප්‍රතිපාදනවල කාර්ය සාධනය සහ සාධාරණත්වය නිරීක්ෂණය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ දත්ත භාවිතා කිරීම.

---

## 10.කම්කරු දෙපාර්තමේන්තුව

**උපායමාර්ගික දිශාව DoL 1**: අවිධිමත් අංශයේ සේවකයින්ගේ සමාජ රක්ෂණ ආවරණය සහ විධිමත්කරණය ශක්තිමත් කිරීම.

**මැදිහත්වීම්:**

• **DoL 1.1**:අවිධිමත් සේවකයින් ලියාපදිංචි කිරීම සහ අවම සමාජ රක්ෂණ දායක මුදල් බලාත්මක කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ ජාල සහ කම්කරු පරීක්ෂණ භාවිතා කිරීම.
• **DoL 1.2**:ක්ෂේත්‍ර කාර්යාල සහ ඩිජිටල් වේදිකා හරහා සරල කළ ලියාපදිංචි කිරීමේ මෙවලම් සහ ප්‍රජා සම්බන්ධතා ව්‍යාපාර සංවර්ධනය කිරීම..

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• බාධාවකින් තොරව ලියාපදිංචි කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් (NIC) පාදක කරගත් ඩිජිටල් හැඳුනුම්පත් පද්ධති සමඟ ඒකාබද්ධ වීම.
• අනුකූලතාව සහ සුවහ බව සහතික කිරීම සඳහා සමාජ රක්ෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය.

## 11.සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF)

**උපායමාර්ගික දිශාව ETF 1**: සේවක සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා ETF වෙත ප්‍රවේශ්‍යතාව පහසු කිරීම, ඩිජිටල් කළමනාකරණය සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

**මැදිහත්වීම්:**

• **ETF 1.1**:සේවකයින්ට සහ සේවා යෝජකයින්ට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා ආධාර සහ ණය කළමනාකරණ

වේදිකා ඩිජිටල්කරණය කිරීම.
• **ETF 1.2**:කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සහ අවිධිමත් අංශවල ETF බඳවා ගැනීම් වැඩි කිරීම සඳහා, දැනුවත්භාවය සහ සරල කළ ක්‍රියා පටිපාටි පුළුල් කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• ETF පද්ධති, ජාතික සමාජ රක්ෂණ ඩිජිටල් යටිතල පහසුකම් සමඟ සම්බන්ධ කිරීම.
• පරිශීලක අන්තර්ක්‍රියා පහසු කිරීම සඳහා ජංගම යෙදුම් සහ මාර්ගගත ද්වාර සංවර්ධනය කිරීම.

---

## 12.ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

**උපායමාර්ගික දිශාව NITF 1**:ජාතික සමාජ ආරක්ෂණ රාමුව තුළ NITF හි රක්ෂණ සේවා ඒකාබද්ධ කිරීම සහ පුළුල් කිරීම.

**මැදිහත්වීම්:**

• **NITF 1.1**: අග්‍රහාර වෛද්‍ය රක්ෂණ සහ ක්ෂුද්‍ර රක්ෂණ සේවා ආන්තික අවිධිමත් සහ ග්‍රාමීය අංශ වෙත ව්‍යාප්ත කිරීම.
• **NITF 1.2**: ආපදා සහ ගැටුම් කලාපවල සමාජ කම්පන-ප්‍රතිචාරාත්මක ගෙවීම් සඳහා SRCC&T ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රම භාවිතා කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• ජාතික හැඳුනුම්පත් සහ සමාජ රක්ෂණ වේදිකා සමඟ සම්බන්ධිත ඩිජිටල් සාමාජිකත්වය සහ හිමිකම් පද්ධති.
• අවදානම් සංචිත ගත කිරීම සඳහා අනෙකුත් රක්ෂණ සහ සමාජ ආරක්ෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය.

## 13.විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**උපායමාර්ගික දිශාව DoP 1:** විශ්‍රාමිකයන් සඳහා, විශ්‍රාම වැටුප් බෙදා හැරීම නවීකරණය කිරීම සහ ජීවන චක්‍ර ආරක්ෂාව වැඩි දියුණු කිරීම.

**මැදිහත්වීම්:**

• **DoP 1.1**: ආරක්ෂිත ඩිජිටල් විශ්‍රාම වැටුප් පරිපාලන පද්ධති සහ ජංගම ගෙවීම් වේදිකා පුළුල් කිරීම.
• **DoP 1.2:**වැඩිදියුණු කළ සේවා ගුණාත්මකභාවය සඳහා කාර්ය මණ්ඩල ධාරිතාව සහ ප්‍රතිලාභීන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය ශක්තිමත් කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• ශක්තිමත් සයිබර් ආරක්ෂණ ක්‍රම සහ දත්ත උපස්ථ ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම.
• විශ්‍රාම වැටුප් දත්ත සමුදායන් ජාතික ඩිජිටල් හැඳුනුම්පත් සහ ගෙවීම් පද්ධති සමඟ ඒකාබද්ධ කිරීම.

---

## 14.සමාජ ආරක්ෂණ මණ්ඩලය (SSB)

**උපායමාර්ගික දිශාව SSB 1**:ස්වයං රැකියාලාභීන්, අවිධිමත් අංශ සහ සංක්‍රමණික සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ ආවරණය පුළුල් කිරීම.

**මැදිහත්වීම්:**

• **SSB 1.1**: වැඩිදියුණු කළ ඩිජිටල් ප්‍රවේශයක් සමඟින් අවිධිමත් අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් කිරීම පුළුල් කිරීම.
• **SSB 1.2**: දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි කිරීම සහ ජාතික සමාජ රක්ෂණ වේදිකා සමඟ ප්‍රතිලාභ ඒකාබද්ධ කිරීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• ජංගම සහ මාර්ගගත ලියාපදිංචි කිරීමේ සහ හිමිකම් පෑමේ සේවාවන් සංවර්ධනය කිරීම.
• සංක්‍රමණික සහාය සේවා සහ විධිමත් රක්ෂණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම.

---

## 15.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE)

**උපායමාර්ගික දිශාව SLBFE 1**: සංක්‍රමණික සේවකයින් සහ පවුල් සඳහා සමාජ ආරක්ෂණ සහ නැවත ඒකාබද්ධ කිරීමේ සේවා ශක්තිමත් කිරීම.

**මැදිහත්වීම්:**

• **SLBFE 1.1**: "විගමනික ශ්‍රමික" විශ්‍රාම වැටුප් ක්‍රමය පුළුල් කිරීම සහ පූර්ව පිටත්වීම සහ නැවත ඒකාබද්ධ කිරීමේ සහාය සඳහා මධ්‍යගත ඩිජිටල් වේදිකාවක් සංවර්ධනය කිරීම.
• **SLBFE 1.2**: ද්විපාර්ශ්වික ගිවිසුම් වැඩිදියුණු කිරීම සහ සංක්‍රමණික පවුල් සඳහා ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම.

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• රක්ෂණ හිමිකම්, පුහුණුව සහ නැවත ඒකාබද්ධ කිරීමේ පරීක්ෂාව සඳහා ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම.
• විදේශ කටයුතු අමාත්‍යාංශය සහ සමාජ ආරක්ෂණ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම.

---

## 16.සේවක අර්ථසාධක අරමුදල (EPF)

**උපායමාර්ගික දිශාව EPF 1:** විශ්රාමික ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ විධිමත් ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම.

**මැදිහත්වීම් :**

• EPF 1.1: CBSL ඩිජිටල් මුලපිරීම් සමඟ පෙළගැසී ඇති ආරක්ෂිත ද්වාර සහ ජංගම යෙදුම් හරහා දායක මුදල්, මුදල් ආපසු ගැනීම් නිරීක්ෂණය සහ සාමාජික සේවා ඩිජිටල්කරණය කිරීම

.• **EPF 1.2**: සරල කළ ලියාපදිංචි කිරීමේ සහ ගෙවීම් කිරීමේ යාන්ත්‍රණයන් සමඟින් MSME ආවරණය පුළුල් කිරීම.
• **EPF 1.3**: ආයෝජන කළමනාකරණයේ සහ සාමාජිකයින්ට වාර්තා කිරීමේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම.
• **EPF 1.4**: ඒකාබද්ධ ජාතික පද්ධතියක් යටතේ අනෙකුත් සමාජ රක්ෂණ යෝජනා ක්‍රම සමඟ සුවහ බව ඒකාබද්ධ කිරීම

- **සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ:**

• මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව සහ සමාජ ආරක්ෂණ ඩිජිටල් වේදිකා සම්බන්ධීකරණය.
• ඩිජිටල් මෙවලම් සහ ප්‍රතිලාභ  පිළිබඳව සේවා යෝජකයින් සහ සාමාජිකයින් සඳහා ධාරිතා වර්ධනය.

**ඇමුණුම 2**

## සමාජ ආරක්ෂණ මාර්ග සිතියම: 2025–2035

සමාජ ආරක්ෂණ මාර්ග සිතියම උපායමාර්ගික ප්‍රමුඛතා, ක්රියාත්මක කළ හැකි,අදියරගත පියවර බවට පරිවර්තනය කරන ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි.එය, ජාතික සංවර්ධන ඉලක්ක සහ මූල්‍ය යථාර්ථයන් සමග පෙළගස්වූ කෙටි, මධ්‍යම සහ දිගු කාලීන මැදිහත්වීම් හඳුනා ගැනීම සඳහා පැහැදිලි ගමන් පථයක් සපයයි. මෙම මාර්ග සිතියම,ප්රතිපත්ති, පද්ධති, ආයතනික ධාරිතාව සහ බෙදාහැරීමේ යාන්ත්රණයන් හරහා ප්රතිසංස්කරණ අනුක්රමණය කිරීමෙන් සහජීවනය සහතික කිරීම, ද්වීකරණය වීම වැළැක්වීම සහ විශ්වීය හා ජීවන චක්රය පදනම් කරගත් සමාජ ආරක්ෂණයේ ප්රගතිශීලී සාක්ෂාත් කර ගැනීම යනාදියට සහාය වේ.මෙම මාර්ග සිතියම සාක්ෂි, පාර්ශවකරුවන්ගේ උපදේශන සහ ගෝලීය හොඳම භාවිතයන් මගින් දැනුවත් කර ඇති අතර, සියලුම ශ්රී ලාංකිකයින් සඳහා ඔරොත්තු දෙන, සියල්ල ඇතුළත් සහ ඒකාබද්ධ සමාජ ආරක්ෂණ පද්ධතියක් ගොඩනැගීම සඳහා ව්යුහගත මාර්ගයක් ලබා දෙයි.

---

### අදියර I: පදනම සහ ඩිජිටල්කරණය (2025–2027)

**අරමුණ:** ආයතනික ධාරිතාව ගොඩනැගීම, පද්ධති ඩිජිටල්කරණය කිරීම සහ නියමු වැඩසටහන් දියත් කිරීම.

**කුළුණු අංක 1: සමාජ සහාය**

- ජාතික හැඳුනුම්පත සමඟ සම්බන්ධිත සමෝධානිත ප්‍රතිලාභී ලේඛනය (නියමු පළාත්) දියත් කිරීම.
- ජීවන චක්‍රය පදනම් කරගත් සහාය නිර්මාණය කිරීම (වැඩිහිටියන්, ආබාධිතයන්, දරුවන්)
- දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රදේශවල අස්වැසුම බල ගැන්වීම් නියමු ව්‍යාපෘති  ආරම්භ කිරීම.
- DMC, DSS සමඟ ආපදා-සූදානම සිතියම්ගත කිරීම ආරම්භ කිරීම.
- අවිධිමත් සේවක ලියාපදිංචි නියමුවන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගැනීම.

**කුළුණු අංක 2: සමාජ සත්කාර**

- ජාතික දිගුකාලීන සත්කාර සේවා ප්‍රතිපත්තිය කෙටුම්පත්කරණය.
- සත්කාර සේවා සපයන්නන් සිතියම්ගත කිරීම සහ බලපත්‍ර ලබා දීම ආරම්භ කිරීම.
- NVQ අනුව පෙළගැස්වූ සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීමේ රාමුවක් සංවර්ධනය කිරීම.

**කුළුණු අංක 3: සමාජ රක්ෂණය**

- EPF සහ ETF දායකත්වය සහ මුදල් ආපසු ගැනීම් නිරීක්ෂණය (traking) ඩිජිටල්කරණය කිරීම.
- සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අවිධිමත් අංශයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීම සඳහා නියමු ව්‍යාපෘති .
- ජාතික රක්ෂණ භාර අරමුදලේ ක්ෂුද්‍ර රක්ෂණ සේවා ජාතික වේදිකාවලට ඒකාබද්ධ කිරීම ආරම්භ කිරීම.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ඩිජිටල් විශ්‍රාම වැටුප් සේවා ස්ථාවරකිරීම ආරම්භ කිරීම.

**කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුලත් භාවය**

- සමාජ ආධාර ලබන්නන් රැකියා/පුහුණුව සඳහා සම්බන්ධ කරන දිස්ත්‍රික් මට්ටමේ සක්‍රීය කණ්ඩායම් පිහිටුවීම (නියමු).
- දේශගුණික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව සහ සත්කාර කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රජා පොදු වැඩ වැඩසටහන් දියත් කිරීම.
- තරුණයින්, කාන්තාවන් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා ආරම්භක ප්‍රාග්ධනය සහ උපදේශන වැඩසටහන් සඳහා නියාමනය.
- රැකවරණය සැපයීම , සංචාරක ව්‍යාපාර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් පරිමාණ TVET පුහුණුව.
- නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ ආධාරක මධ්‍යස්ථාන SLBFE සමඟ ආරම්භ කිරීම.

---

## අදියර II: ව්‍යාප්තකරණය සහ ආයතනිකකරණය (2028–2031)

**අරමුණ:** ජාතික වශයෙන් වැඩසටහන් පරිමාණය කිරීම, ආයතනික ප්‍රතිසංස්කරණ ඒකාබද්ධ කිරීම, ඒකාබද්ධතාවය සහතික කිරීම.

### කුළුණු අංක 1: සමාජ සහාය

- සියලුම සමාජ ආධාර යෝජනා ක්‍රම සඳහා සමෝධානිත සමාජ සුභසාධන රෙජිස්ටරය ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම.
- ආබාධිතභාවයට සංවේදී ඉලක්කගත කිරීම පිළිගැනීම.
- හදිසි පූරණ (Top-up) පද්ධති විධිමත්කරණය.
- ප්‍රජාව ඉලක්ක කිරීමේ කටයුතු සඳහා ප්‍රජා ශක්ති කවුන්සිල ඒකාබද්ධ කිරීම.

### කුළුණු අංක 2: සමාජ සත්කාර

- සත්කාර සේවා සැපයීමේ විශ්වීය සහතික කිරීම සහ පුහුණුව.
- සංක්‍රාන්ති  වයසේ පසුවන ආබාධිත පුද්ගලයින් සඳහා සත්කාර මාර්ග.
- අවදානම් සහිත ප්‍රදේශවල සත්කාර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.
- ආබාධිත දරුවන් සඳහා අධ්‍යාපනය සහ රැකවරණ මාර්ග සම්බන්ධ කිරීම.

### කුළුණු අංක 3: සමාජ රක්ෂණය

- කම්කරු දෙපාර්තමේන්තුව හරහා අවිධිමත් සේවක බඳවා ගැනීම රට පුරා ව්‍යාප්ත කිරීම.
- MSME ඇතුළත් කිරීම සමඟ EPF සහ ETF ඩිජිටල් පද්ධති පරිමාණය කිරීම.
- සමාජ ආරක්ෂණ මණ්ඩල යෝජනා ක්‍රමයට ඇතුළත් වීම පුළුල් කිරීම.
- රාජ්‍ය හා අවිධිමත් අංශයේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්යභාරය ශක්තිමත් කිරීම.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ගෙවීම් වේදිකා වැඩිදියුණු කිරීම.

**කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුලත් භාවය**

- සමාජ සහාය සමඟ සක්‍රීය කිරීමේ සේවා සහ ඩිජිටල් සම්බන්ධතාවය පුළුල් කිරීම.
- පොදු වැඩ වැඩසටහන්වල අවම රැකියා දින සහතික කිරීම.
- ව්‍යවසාය සහාය වැඩසටහන් පරිමාණය කිරීම (ප්‍රාග්ධනය, මග පෙන්වීම).
- ඉල්ලුම මත පදනම් වූ TVET සහ ආධුනිකත්ව යෝජනා ක්‍රම පුළුල් කිරීම.
- සංක්‍රමණික සේවක සහාය සේවා සහ නැවත සමාජගත කිරීම SLBFE හරහා ශක්තිමත් කිරීම.

---

## අදියර III: තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව (2032–2035)

**අරමුණ:** විශ්වීය ආවරණය, ඒකාබද්ධ සේවා සැපයීම සහ අනුවර්තීය ඔරොත්තු දීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම.

**කුළුණු අංක 1: සමාජ සහාය**

- විශ්වීය ජීවන චක්‍රයට ආසන්න සහ ගෘහ ඒකක පදනම් වූ සමාජ ආධාර ආවරණය.
- AI/ML මත දිවෙන ගතික ඉලක්ක කිරීම සහ වැඩසටහන් යාවත්කාලීන කිරීම්.
- ක්ෂුද්‍ර මූල්‍ය, ඩිජිටල් ජීවනෝපායන් ඇතුළත් කිරීම උදෙසා බල ගැන්වීම් පුළුල් කිරීම.
- වතු අංශය ඇතුළත්භාවය සහතික කිරීම.

**කුළුණු අංක 2: සමාජ සත්කාර**

- සත්කාර සේවා කාර්ය මණ්ඩලය පූර්ණ වෘත්තීයකරණයට ලක් කිරීම.
- දිගුකාලීන සත්කාර රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම.
- පොදු පහසුකම්වල ඇති යටිතල පහසුකම් අනිවාර්ය කිරීම.
- රට පුරා වැඩිහිටි/ආබාධිත ඔරොත්තු දීමේ හැකියාව සහ සූදානම පිළිබඳ වැඩසටහන් දියත් කිරීම.

**කුළුණු අංක 3: සමාජ රක්ෂණය**

- ඒකාබද්ධ ඩිජිටල් වේදිකාවක් යටතේ EPF, ETF, SSB, NITF යෝජනා ක්‍රමවල පූර්ණ ඒකාබද්ධතාවය සහ සුවහ බව.
- අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා පුළුල් ආවරණයක් ඇති කිරීම. (මාතෘ, ආබාධිත, ළමා සෞඛ්‍ය)
- පරිණත ඩිජිටල් ලියාපදිංචිය, හිමිකම් සහ ප්‍රතිලාභ කළමනාකරණය.
- SLBFE ඩිජිටල් වේදිකා සහ ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා සංක්‍රමණික සේවකයින් සඳහා සමාජ ආරක්ෂාව ශක්තිමත් කිරීම.

**කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුලත් භාවය**

- සක්‍රීය කිරීමේ සේවා ආයතනගත කිරීම සහ සමාජ ආරක්ෂණය සමඟ ඒකාබද්ධ කිරීම.
- තිරසාර හරිත රැකියා සහ ප්‍රජා යටිතල පහසුකම් වැඩසටහන් සහතික කිරීම.
- ව්‍යවසාය සහාය සහ වෙළඳපොළ සම්බන්ධතා පද්ධති ආයතනිකකරණය කිරීම.
- ප්‍රමුඛතා අංශ ඉලක්ක කර ගනිමින් යාවජීව කුසලතා සංවර්ධන වැඩසටහන් පරිමාණය කිරීම.
- පූර්ණ ක්‍රියාකාරී සංක්‍රමණික සේවක නැවත ඒකාබද්ධ කිරීම සහ පවුල් ආධාරක පද්ධති.

---

**සම්බන්ධිත සේවා සක්‍රීය කරන්නන් (Cross-Cutting Enablers )(2025–2035)**

- කම්කරු දෙපාර්තමේන්තුව, EPF, ETF, SSB, NITF, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, SLBFE ඇතුළු අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
- ඒකාබද්ධ ඩිජිටල් යටිතල පහසුකම්.(NIC සම්බන්ධතා, අන්තර් ක්‍රියාකාරී cloud සේවා වේදිකා, සමාජ රක්ෂණ ද්වාර)
- කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ප්‍රජා බලගැන්වීම සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සහ ඇතුළත් වැඩසටහන්කරණය.
- ඒකාබද්ධ අධීක්ෂණ, ඇගයීම් සහ අනුවර්තන කළමනාකරණය මෙහෙයවන ඉගෙනුම් පද්ධති
- මූල්‍ය මාරුවීම් සහ පරිත්‍යාගශීලී න්ගේ සම-මූල්‍යකරණයට සම්බන්ධ බහු-වාර්ෂික සමාජ ආරක්ෂණ මූල්‍යකරණ රාමුව.
- දත්ත බෙදාගැනීමේ ප්‍රොටෝකෝල සහ රහස්‍යතා ආරක්ෂණ, ආයතන හරහා ආරක්ෂා කිරීම.

**ඇමුණුම 3**

## ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ උපාය මාර්ග සඳහා අරමුදල් විකල්ප

---

### කුළුණු අංක 1: සමාජ සහාය

**1. ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනයක් ස්ථාපිත කිරීම (UBR)**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ජාතික ICT අයවැය හරහා පද්ධති සංවර්ධනය, සත්කාරකත්වය සහ නඩත්තුව සඳහා මූලික අරමුදල් සැපයීම.
- සම්බන්ධිත අමාත්‍යාංශ සහ ආයතන හරහා දත්ත ඒකාබද්ධ කිරීම සහ කාර්ය මණ්ඩලය සඳහා මෙහෙයුම් පිරිවැය.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පරිත්‍යාගශීලීන්ගේ ආධාර සහ තාක්ෂණික සහාය (ලෝක බැංකුව, UNDP).
- Cloud සේවා පහසුකම් සහ සයිබර් ආරක්ෂාව සඳහා ICT සමාගම් සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP).
- පුද්ගලික අංශයේ පරිශීලකයින්ගෙන් පරිශීලක ගාස්තු (අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා නොමිලේ ප්‍රවේශය සහතික කරන අතරතුර).
- සමාජීය ප්‍රතිඵල සඳහා පෞද්ගලික ආයෝජකයින් ආකර්ෂණය කර ගන්නා සමාජ බලපෑම් බැඳුම්කර.

---

**2. බල ගැන්වීමේ මාර්ග සංවර්ධනය කර ශක්තිමත් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- මුදල් මාරු කිරීම්, වත්කම් බෙදා හැරීම, පුහුණුව සහ වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා අයවැය වෙන් කිරීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ක්ෂුද්‍ර මූල්‍ය ආයතන බල ගැන්වීම සඳහා ණය සහ ඉතුරුම් සම-අරමුදල් සැපයීම.
- කුසලතා පුහුණුව සහ උපදේශනය සඳහා ආයතනික සමාජ වගකීම් (CSR) අරමුදල්.
- බල ගැන්වීම සාක්ෂාත් කරගැනීම උදෙසා පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රතිඵල මත පාදක වූ මූල්‍යකරණය.
- ප්‍රජා ඉතුරුම් කණ්ඩායම් සහ සමුපකාර වලින් සහාය.

---

**3. ජීවන චක්‍ර මත පාදක වන ඉලක්කකරණය ක්‍රියාත්මක කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ජීවන චක්‍ර ඉලක්කගත පද්ධති සහ අන්තර් ආයතන සම්බන්ධීකරණය සඳහා දත්ත ඒකාබද්ධ කිරීමට අරමුදල් සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ජාත්‍යන්තර තාක්ෂණික සහයෝගීතාව (UNICEF, WHO, UN Women).
- විධිමත් අංශයේ ප්‍රතිලාභීන් සඳහා කුඩා දායක වාරික හෝ සම-ගෙවීම්.
- විදේශගතව ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගෙන් සහ පෞද්ගලික පරිත්‍යාගශීලී න්ගෙන් ස්වේච්ඡා අනුග්‍රහයන්.

---

**4. කම්පන සඳහා ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂණ පද්ධති ගොඩනැගීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- රජයේ විවිධ මට්ටම්වල හදිසි සමාජ ආධාර සංචිත අරමුදල් පවත්වාගෙන යාම.
- ආපදා කළමනාකරණ ආයතන සමඟ සම්බන්ධීකරණය හා දත්ත ඒකාබද්ධ කිරීම සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- දේශගුණික අනුවර්තන සහ මානුෂීය අරමුදල් (හරිත දේශගුණික අරමුදල, අනුවර්තන අරමුදල).
- ව්‍යසන බැඳුම්කර සහ කලාපීය අවදානම් සහන අතිරේක වැනි රක්ෂණ ක්‍රම
- ප්‍රජා පාදක පොදු ආධාර අරමුදල් සහ පෞද්ගලික අංශයේ දායකත්වයන්.

---

**5. ශක්තිමත් අධීක්ෂණ සහ බැහැර වීමේ උපාය මාර්ග ස්ථාපිත කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- අධීක්ෂණය සහ සිද්ධි කළමනාකරණය සඳහා කාර්ය මණ්ඩල පුහුණුව සහ වේදිකා සංවර්ධනය.
- අරමුදල් සැපයීමේ අභියාචනා යාන්ත්‍රණ සහ විගණන ක්‍රියාවලීන්.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ධාරිතා වර්ධනය සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් සඳහා පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- ප්‍රජා අධීක්ෂණය සඳහා ප්‍රදාන මගින් හෝ සමූහ මූලාශ්‍ර මගින් සහාය දක්වන සිවිල් සමාජ සංවිධාන.
- දැඩි රහස්‍යතාව යටතේ නිර්නාමික දත්ත විශ්ලේෂණ මගින්.

---

**6. ඒකාබද්ධ බල ගැන්වීම සහ ප්‍රජා සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- පළාත් පාලන, ග්‍රාම නිලධාරීන් සහ වතු අංශයේ නිරීක්ෂණ කටයුතු සඳහා අරමුදල් සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- වතු සමාගම් සහ RPC වල සුභසාධන වැඩසටහන් , CSR හෝ බදු හරහා සම-මූල්‍යකරණය කිරීම.
- වැඩිහිටි සත්කාර සහ මනෝ සමාජීය(psychosocial) සහාය සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වල සහාය.
- ස්වේච්ඡා සේවය සහ ප්‍රජාව තුලින් ලැබෙන ද්‍රව්‍යමය හා සේවා සහයෝගය.

---

**කුළුණු අංක 2: සමාජ සත්කාර**

**1. පුළුල් ජාතික සත්කාර සේවා පද්ධතියක් ස්ථාපිත කිරීම**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- සත්කාර සේවා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, නියාමන අධීක්ෂණය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අයවැය.
- පළාත් සහ පළාත් පාලන මට්ටමින් සෞඛ්‍ය සහ සමාජ සත්කාර සේවා ඒකාබද්ධ කිරීමට සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- වැඩිහිටි සහ ආබාධිත සත්කාර සේවා ඉලක්ක කරගත් පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් (උදා: WHO, HelpAge).
- සත්කාර සේවා සැපයීම සඳහා පෞද්ගලික සැපයුම්කරුවන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතිකර ගැනීම.
- සත්කාර සේවා යටිතල පහසුකම් සඳහා සහනාධාර ලබා දීම සඳහා, මුදල් අපහසුතා නැති සේවාදායකයින් සඳහා පරිශීලක ගාස්තු හෝ සම-ගෙවීම්.
- සත්කාර සේවා පහසුකම් වැඩිදියුණු කිරීම් සහ පුහුණුව සඳහා සහාය වන ආයතනික සමාජ වගකීම් දායකත්වයන් (CSR).

---

**2.සත්කාර සේවා පුහුණුව ලබාදීමේ සහ සහතික කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ජාතික සත්කාර සේවා පුහුණු ආයතනය (NCGTI) ස්ථාපිත කිරීම සහ විෂයමාලා සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම.
- සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීම සහ සහතික කිරීම සඳහා සහනාධාර ලබා දීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ගෙවීමට හැකියාව ඇති පුහුණුවන්නන්ගෙන් උපකාරක ගාස්තු.
- පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත පුහුණු ශිෂ්‍යත්ව සහ ධාරිතා වර්ධනය (උදා: GIZ, ILO).
- වැටුපෙන් අඩු කිරීම් හෝ බදු ගෙවීම හරහා සේවායෝජක දායකත්වයන්.

- දැනුවත් කිරීමේ ව්‍යාපාර සඳහා පරිත්‍යාගශීලී  සහයෝගය.

---

**3. සත්කාර සේවා ආර්ජිකයන් ශක්තිමත් කිරීම සහ අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය වීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් සඳහා දීමනා සහ මනෝ සමාජීය(psychosocial)ආධාර අරමුදල් වෙන් කිරීම.
- සත්කාර සේවා සපයන්නන්ගේ රෙජිස්ටර සහ යොමු කිරීමේ පද්ධති පවත්වාගෙන යාම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ප්‍රජා අරමුදල් රැස් කිරීම සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයන්.
- සත්කාර සහාය සේවා කේන්ද්‍රගතවූ පෞද්ගලික අංශයේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන්.
- සත්කාර සේවා සපයන්නන්ගේ ආදායමට සහාය වන ක්ෂුද්‍ර මූල්‍ය සහ සමාජ ව්‍යවසාය ආකෘති.
- සහනය සහ සමානයන්ගේ සහාය ලබා දෙන ස්වේච්ඡා ජාල.

---

**4. ප්‍රජා පාදක සත්කාර ජාල සංවර්ධනය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- දිස්ත්‍රික් මට්ටමේ සමාජ සත්කාර ඒකක සඳහා අරමුදල් සැපයීම සහ ග්‍රාම නිලධාරී මට්ටමේ සත්කාර නියෝජිතයින් සඳහා පුහුණුව ලබා දීම.
- සත්කාර සේවා නිරීක්ෂණය සහ යොමු කළමනාකරණය සඳහා ඩිජිටල් මෙවලම් සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- මෙහෙයුම් වියදම් සඳහා පළාත් පාලන වාර්ෂික අයවැය.
- ඩිජිටල් වේදිකා සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආධාර.
- PHDT සහ RPC හරහා වතු අංශයේ දායකත්වයන්.
- ස්වේච්ඡා සේවය සහ ප්‍රජාව තුලින් ලැබෙන ද්‍රව්‍යමය හා සේවා සහයෝගය.

---

**5. සමාජ සත්කාර ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) පුළුල් කිරීම.**

- **රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**
- පෞද්ගලික සත්කාර සපයන්නන්ගේ ප්‍රදාන, බදු දිරිගැන්වීම් සහ ගුණාත්මක අධීක්ෂණය පරිපාලනය කිරීම.
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) ක්‍රියාත්මක කිරීමේ ඒකක කළමනාකරණය කිරීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- සත්කාර යටිතල පහසුකම් සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන සහ ආයතනික සමාජ වගකීම් (CSR) අරමුදල්.
- රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයන් ප්‍රජා සත්කාර සේවා සැපයීම.
- ආගමික සහ ප්‍රජා සංවිධාන වලින් සම-මූල්‍යකරණය.

---

**කුළුණු අංක 3: සමාජ රක්ෂණය**

**1. සමාජ රක්ෂණයට අවිධිමත් අංශයේ සේවකයින් ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ජංගම/වෙබ් වේදිකා සහ සම-දායකත්ව යෝජනා ක්‍රම සඳහා අරමුදල් සංවර්ධනය කිරීම.
- කම්කරු දෙපාර්තමේන්තුව හරහා ජංගම ප්‍රජා සේවා සහ ලියාපදිංචි කිරීමේ උත්සාහයන්ට සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- විදුලි සංදේශ හවුල්කාරිත්වයන් සහනාධාර සහිත දුරකථන සම්බන්ධතා සහ ගෙවීම් සැපයීම.
- තාක්ෂණික සහාය සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර සඳහා පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- අවිධිමත් සේවකයින්ගෙන් ලැබෙන කුඩා ස්වේච්ඡා දායක මුදල් සහ වාරික.
- වෘත්තීය සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගීත්වය බලමුලු ගැන්වීම.

---

**2. වැඩි කාර්යක්ෂමතාවයක් සඳහා සමාජ රක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- NSIA ස්ථාපිත කිරීම, පද්ධති ඒකාබද්ධ කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ සඳහා සම්පත් වෙන් කිරීම.
- වෙනස්වීම් කළමනාකරණය (Change Management)සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ආයතනික සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- සංක්‍රාන්ති අවස්ථාවේදී පවතින යෝජනා ක්‍රම සමඟ පිරිවැය බෙදා ගැනීම.
- පෞද්ගලික අංශයේ තොරතුරු තාක්ෂණ සේවා සපයන්නන් සහනාධාර හෝ අඩියර වශයෙන් සේවා සැපයීම.

---

**3.අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා විශ්වීය අවදානම් ආරක්ෂාව සහතික කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- සහනාධාර/නොමිලේ රක්ෂණ නිෂ්පාදන සහ වැටුප් සහිතදෙමාපිය නිවාඩු යෝජනා ක්‍රම සඳහා මූල්‍ය පහසුකම්.
- අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයන ලද නියමු වැඩසටහන් සහ පුළුල් කිරීම් (උදා: ILO, WHO).
- හැකි සෑම විටම ප්‍රතිලාභීන්ගෙන් කුඩා සම-ගෙවීම්.
- හවුල් දෙමාපිය නිවාඩු අරමුදල් සඳහා සේවායෝජක දායකත්වයන්.
- ආබාධිතභාවය සහ මාතෘත්වය ආවරණය සඳහා ජාත්‍යන්තර දේශගුණික සහ සෞඛ්‍ය අරමුදල්.

---

**4. ඩිජිටල් ලියාපදිංචිය සහ ප්‍රතිලාභ සුවහ බව ක්‍රියාත්මක කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ජාතික හැඳුනුම්පත් සම්බන්ධිත වේදිකා සහ සයිබර් ආරක්ෂණ පියවර සඳහා අරමුදල් සැපයීම.
- බහු නාලිකා ලියාපදිංචි යටිතල පහසුකම් සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ඩිජිටල් සාක්ෂරතාවය සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්.
- වේදිකා සත්කාරකත්වය සහ නඩත්තුව සඳහා විදුලි සංදේශ සහ තාක්ෂණික සමාගම් සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ට (PPPs)එලඹීම.
- මුදල් අපහසුතා නැති ප්‍රතිලාභීන් සඳහා පරිශීලක සේවා ගාස්තු.

---

**5. නැගී එන කම්කරු කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණ ආවරණය පුළුල් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ගිග් ආර්ථික සේවකයින්ට නියාමන රාමු සංවර්ධනය කිරීම සහ අරමුදල් සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ලියාපදිංචි වීමේ සහ දායක මුදල් එකතු කිරීමේ පිරිවැය බෙදා ගැනීම සඳහා ගිග් වේදිකා සමඟ අවබෝධතා ගිවිසුම්.
- දැනුවත්භාවය සහ ගැලපෙන යෝජනා ක්‍රම සැලසුම් කිරීම සඳහා පෞද්ගලික අංශයේ අරමුදල් ලබා ගැනීම.
- සේවක සංගම් මගින් අධ්‍යාපනය සහ සමාන ජාලයන්ට සහාය ලබා ගැනීම.

---

**6. සේවක අර්ථසාධක අරමුදල් (EPF) පද්ධතිය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- EPF පද්ධති ඩිජිටල් ආකාරයෙන් නවීකරණය කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා මුදල් සැපයීම.
- MSME අනුකූලතා වැඩසටහන් සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඩිජිටල් ගෙවීම් විසඳුම් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්.
- MSME සංගම් සම-අරමුදල් සපයන ජංගම ප්‍රජා සේවා සහ අනුකූලතා දිරිගැන්වීම්.
- වැඩි පහසුකම් සහිත ගිණුම් විශේෂාංග සඳහා සේවා ගාස්තු.

---

**7. රැකියා භාර අරමුදලේ (ETF) ප්‍රවේශ්‍යතාව සහ බලපෑම වැඩි දියුණු කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ETF පද්ධති ඩිජිටල්කරණය සහ නිෂ්පාදන පුළුල් කිරීම සඳහා අරමුදල් ලබාදීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සහ හවුල්කාරිත්වයන්ට සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- මූල්‍ය ආයතන ණය සේවා සම-මූල්‍යකරණය.
- ධාරිතා වර්ධනය සහ වේදිකා සංවර්ධනය සඳහා පරිත්‍යාගශීලීන්ගේ ප්‍රදාන.
- කුසලතා පුහුණුව සහ නිවාස ණය සඳහා පෞද්ගලික අංශයේ ආයතනික සමාජ වගකීම් (CSR) අරමුදල්.

---

**8. සමාජ ආරක්ෂණ මණ්ඩල (SSB) යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- යෝජනා ක්‍රම පරිපාලනය සහ ඩිජිටල් වේදිකා නඩත්තුව සඳහා අයවැය සැපයීම.
- මහජන දැනුවත්භාවය සහ බඳවා ගැනීමේ මෙහෙයුම් සඳහා මුදල් සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයන් සහ ප්‍රජා කණ්ඩායම් දායකත්වයන්.
- ඩිජිටල් ලියාපදිංචි කිරීමේ පද්ධති සඳහා පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- හැකි සෑම විටම ප්‍රතිලාභීන්ගෙන් ස්වේච්ඡා දායකත්වයන් ලබා ගැනීම.

---

**9. සමාජ ආරක්ෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) කාර්යභාරය වැඩි දියුණු කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- නිෂ්පාදන සංවර්ධනය සහ සමාජ රක්ෂණ වේදිකා සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම.
- හදිසි සමාජ කම්පන ප්‍රතිලාභ ගෙවීම් සඳහා සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ක්ෂුද්‍ර-රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්.
- ආපදා අවදානම් මූල්‍යකරණය ඉලක්ක කරගත් පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- ආංශික සංවිධාන මගින් ජංගම ප්‍රජා සේවා සැපයීම සහ බඳවා ගැනීම සඳහා සම-මූල්‍යකරණය.

---

**10. ඩිජිටල් කාර්යක්ෂමතාව සහ සේවා ගුණාත්මකභාවය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ඩිජිටල් විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධති සහ සයිබර් ආරක්ෂාව සඳහා අරමුදල් සැපයීම.
- ධාරිතා වර්ධනයට සහ වෙනස්වීම් කළමනාකරණයට (Change Management)සහාය වීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ඩිජිටල් පරිවර්තනය සඳහා පරිත්‍යාගශීලීන්ගේ සහාය.
- තොරතුරු තාක්ෂණ සේවා සහ උපකාරක මධ්‍යස්ථාන(Helpdesks) සඳහා පෞද්ගලික අංශය සමඟ ගිවිසුම්.
- ඇතැම් විශ්‍රාම වැටුප් සේවාවන් සඳහා මධ්‍යස්ථ පරිපාලන ගාස්තු.

---

**කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුලත් භාවය.**

**1. ඒකාබද්ධ සක්‍රිය කිරීමේ සේවාවන් ක්‍රියාත්මක කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- සක්‍රීය කිරීමේ කණ්ඩායම්, පුහුණු කිරීම සහ ඩිජිටල් සිද්ධි කළමනාකරණ පද්ධති සඳහා අයවැය වෙන් කිරීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- වේදිකා සංවර්ධනය සහ ජංගම ප්‍රජා සේවා වැඩසටහන් සඳහා පරිත්‍යාගශීලීන්ගේ ප්‍රදාන.
- රැකියා උපදේශනය සහ සමාජ ක්‍රියාකාරකම් සපයන රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයන්.
- රැකියා ස්ථානගත කිරීමේ සහාය සඳහා පෞද්ගලික අංශයේ සේවා යෝජකයින්ගේ සහභාගීත්වය.

---

**2. පොදු වැඩ සහ හරිත රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- පොදු වැඩ වැඩසටහන් සඳහා වැටුප්, ද්‍රව්‍ය සහ අධීක්ෂණය සඳහා අරමුදල් සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පාරිසරික ප්‍රදාන සහ දේශගුණික අරමුදල් (GCF, GEF).
- ප්‍රජා සම-මූල්‍යකරණය සහ ද්‍රව්‍යමය දායකත්වයන්.
- පරිසර හිතකාමී යටිතල පහසුකම් සඳහා පෞද්ගලික අංශයේ ආයතනික සමාජ වගකීම් ආයෝජන.

---

**3. ව්‍යවසාය සංවර්ධන සහාය ශක්තිමත් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- ආරම්භක ප්‍රාග්ධනය, පූර්ව ලියාපදිංචි තක්සේරු මධ්‍යස්ථාන අරමුදල් සහ සම්බන්ධීකරණය සැපයීම.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සමාජීය වශයෙන් වගකියන ආයෝජකයින්.
- ආයතනික අනුග්‍රාහකත්වයන් සහ ආයතනික සමාජ වගකීම් අරමුදල්.
- ආදායම බෙදා ගන්නා ඩිජිටල් වෙළඳපොළ වේදිකා.

---

**4. කුසලතා සංවර්ධන සහ කුසලතා නැවත වර්ධන වැඩසටහන් පුළුල් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- TVET යටිතල පහසුකම්, පුහුණුකරුවන් සහ ආධුනිකත්ව දීමනා මූල්‍යකරණය.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- ආධුනිකත්ව සහ විෂයමාලා සඳහා සේවායෝජක සම-ආයෝජනය.
- ප්‍රමුඛතා අංශයේ කුසලතා වැඩසටහන් සඳහා පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- මුදල් අපහසුතා නැති සහභාගිවන්නන් සඳහා පුහුණු ගාස්තු.

---

**5. සංක්‍රමණ සහාය සහ ප්‍රත්‍යනුකලන සේවා ශක්තිමත් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- උපදේශන සේවා.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පරිත්‍යාගශීලි  අරමුදල් සහ ප්‍රේෂණ .
- මනෝ-සමාජීය(Psychosocial) සහ ව්‍යාපාරික සහාය ලබා දෙන රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයන්.
- ක්ෂුද්‍ර මූල්‍ය සේවා නිෂ්පාදන සපයන මූල්‍ය ආයතන.

---

**6. ප්‍රජා මූලික සංවර්ධන ගම්මාන ප්‍රාදේශීය සංවර්ධනය සඳහා බලගැන්වීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- උපදේශන පුහුණුව, දත්ත කළමනාකරණය සහ ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා අයවැය.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- පළාත් පාලන සම-අරමුදල් සහ ප්‍රජා දායකත්වයන්.
- ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- වැටුප් ලබන කාර්ය මණ්ඩල අවශ්‍යතාවය අඩු කරන ස්වේච්ඡා සේවය.

---

**7.  සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සහයෝගය ශක්තිමත් කිරීම.**

**රජයේ අරමුදල් සැපයීමේ වගකීම:**

- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පුළුල් කිරීම මූල්‍යකරණය , වේදිකාවන් සඳහා සහාය සහ ද්විපාර්ශ්වික ගිවිසුම් කළමනාකරණය.

**දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍ර:**

- සංක්‍රමණික සුභසාධන වැඩසටහන් සඳහා ආධාර සපයන පරිත්‍යාගශීලීන්ගේ අරමුදල්.
- ප්‍රේෂණ සහ රක්ෂණ සේවා සඳහා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයන්.
- ප්‍රජා මූලික ප්‍රමුඛ පවුල් සහාය සේවා.

## ඇමුණුම 4: ශ්‍රී ලංකාව සඳහා ගෝලීය වශයෙන් දැනුවත් යහභාවිත සමඟ සමාජ ආරක්ෂණ උපායමාර්ග පිළිබඳ සාරාංශ වගුව

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| **කුළුණු අංක 1: සමාජ සහාය** | | | |
| 1.1 ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනය (UBR) | බ්‍රසීලය – කැඩස්ට්‍රෝ යුනිකෝ | මධ්‍යගත ඩිජිටල් ලේඛනය, ගෘහස්ථ සම්මුඛ පරීක්ෂණ, ජාතික හැඳුනුම්පතට සම්බන්ධ කිරීම, සුදුසුකම් නිරීක්ෂණය කිරීම. | අස්වැසුම, වැඩිහිටි දීමනා, ආබාධිතභාවය, ළමා හා ආපදා සහන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී මට්ටම්වලින් ප්‍රවේශයක් සහිත එක් ඩිජිටල් ලේඛනයකට ඒකාබද්ධ කිරීම. |
| 1.2 බල ගැන්වීමේ මාර්ග | BRAC – බල ගැන්වීමේ ආකෘතිය (බංග්ලාදේශය) | මුදල් ආධාර, කුසලතා, වත්කම් මාරු කිරීම්, මග පෙන්වීම, ඉතිරිකිරීම්; > 95% ක් අතිශය දිළිඳු බවින් මුදා ගැනීම. | අස්වැසුම පවුල් සහ නාගරික අවිධිමත් සේවකයින් සඳහා අවුරුදු 2–3 බල ගැන්වීමේ මාර්ග; ක්ෂුද්‍ර මූල්‍ය, TVET, ව්‍යවසාය ප්‍රදාන. |
| 1.3 ජීවන චක්‍රය පදනම් කරගත් ඉලක්කකරණය | දකුණු අප්‍රිකාව – සමාජ ප්‍රදාන ක්‍රමය | ළමුන්, වැඩිහිටියන්, ආබාධිතයන් සඳහා වයස්-විශේෂිත ප්‍රතිලාභ ; ප්‍රතිලාභීන් මිලියන 18+ ක් | අස්වැසුමෙන් ඔබ්බට ව්‍යුහගත වයස්-නිශ්චිත යෝජනා ක්‍රම: විශ්වීය/ආසන්න-විශ්වීය වැඩිහිටි විශ්‍රාම වැටුප්, ළමා පෝෂණ ප්‍රදාන, ආබාධිත දීමනා |

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| 1.4 කම්පන-ප්‍රතිචාරාත්මක පද්ධති | පිලිපීනය – 4Ps +හදිසි Top-Ups | පරිමාණය කළ හැකි මුදල් මාරු කිරීම්, ඩිජිටල්/ජංගම ගෙවීම්, භූගෝලීය ඉලක්ක කිරීම | අස්වැසුමෙහි කම්පන ප්‍රතිචාර මොඩියුලය; ජංගම මාරුවීම්; ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ කාලගුණ විද්‍යාව සමඟ සම්බන්ධීකරණය කිරීම |
| 1.5 අධීක්ෂණ සහ පිටවීමේ උපාය මාර්ග | චිලී – චිලී සොලිඩාරියෝ වැඩසටහන | මුදල් මාරු කිරීම් + මනෝ සමාජීය සහාය, නිවාස සංචාර, පවුල් සැලසුම් | ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ගෞරවනීය පිටවීම් සැලසුම් කිරීමට සමාජ සංවර්ධන/සමෘද්ධි නිලධාරීන් “සිද්ධි කළමනාකරුවන්” ලෙස පුහුණු කිරීම. |
| 1.6 ඒකාබද්ධ බලගැන්වීම සහ ප්‍රජා සවිබලගැන්වීම | BRAC + චිලී සොලිඩාරියෝ ආකෘති | ගෘහස්ථ මට්ටම් + ප්‍රජා මුලපිරීම් | බලගැන්වීම වැඩසටහන් සමඟ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘති හරහා දේශීය ඔරොත්තු දීමේ හැකියාව, ඇතුළත් කිරීම, සමාජ සහජීවනය වැඩි දියුණු කිරීම. |
| **කුළුණු අංක 2: සමාජ සත්කාර** | | | |
| 2.1 විස්තීර්ණ ජාතික සත්කාර සේවා පද්ධතිය | ජපානය – LTCI | රට පුරා ආයතනික සහ නිවාස පාදක සත්කාර සේවා, වැටුප්-බදු අරමුදල් සැපයීම. | සේවා පැකේජ, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන්, අයවැය ප්‍රතිපාදන සහිත ඒකාබද්ධ සත්කාර සේවාප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම . |
| 2.2 සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීම සහ සහතික කිරීම | ජර්මනිය – ජාතික සත්කාර සේවා පුහුණු රාමුව | ව්‍යුහගත වෘත්තීය පුහුණුව, බහු මට්ටමේ සහතික කිරීම්. | NVQ යටතේ ජාතික සත්කාර සේවා ආයතනය; වැඩිහිටි, ආබාධිත, මුල් |

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| | | | ළමාවිය රැකවරණය පිළිබඳ වෘත්තීය මාර්ග. |
| 2.3අවිධිමත් සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය. | ෆින්ලන්තය – පවුල් සත්කාර සේවා සපයන්නන්ට ආධාර යෝජනා ක්‍රමය. | නාගරික දීමනා, විවේක සත්කාර, සෞඛ්‍ය/මානසික සහාය | ඔත්පල වූ වැඩිහිටියන්/ආබාධිත පුද්ගලයින්, විශේෂයෙන් ග්‍රාමීය/වතු රැකබලා ගන්නන් සඳහා මාසික දීමනා සහ උපදේශනය. |
| 2.4 ප්‍රජා පාදක සත්කාර ජාල | තායිලන්තය – ග්‍රාමීය ස්වේච්ඡා සේවකයින් | ප්‍රජා ස්වේච්ඡා සේවකයන් වැඩිහිටියන්ගේ/දිගුකාලීන රෝග සඳහා සහාය වීම; ප්‍රාථමික සෞඛ්‍ය සේවා සමඟ ඒකාබද්ධ වීම. | පුහුණු/ශිෂ්‍යත්ව සමඟින් PHM වරුන්, කාන්තා සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් සත්කාර සේවා සම්බන්ධීකාරකවරුන් ලෙස බලගැන්වීම. |
| 2.5 සමාජ සත්කාර ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් | සිංගප්පූරුව – වැඩිහිටි සත්කාර මධ්‍යස්ථාන ආකෘතිය | රාජ්‍ය නොවන සංවිධාන/පුණ්‍යායතන රජයේ සම-මූල්‍යකරණය සමඟ දිවා සුරැකුම් සහ සෞඛ්‍ය සේවා සැපයීම. | විශේෂයෙන් නාගරික සහ වතු ප්‍රදේශ වල නේවාසික/දිවා සුරැකුම් සඳහා රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන, පෞද්ගලික සැපයුම්කරුවන් සඳහා අරමුදල් සැපයීම. |
| **කුළුණු අංක 3: සමාජ රක්ෂණය** | | | |
| 3.1 අවිධිමත් අංශයේ සේවකයින් ඇතුළත් කිරීම | ඉන්දියාව – eShram + PM-SYM | ඩිජිටල් ලේඛනය, දායක විශ්‍රාම වැටුප්, ජංගම/CSC ලියාපදිංචිය | ගොවීන්, ගෘහ සේවකයින්, ධීවරයින්, ගිග් සේවකයින් සඳහා ජංගම උපාංග පාදක ක්ෂුද්‍ර-විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රම. |
| 3.2 සමාජ රක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම | ඉන්දුනීසියාව – BPJS Ketenagakerjaan | සෞඛ්‍ය, විශ්‍රාම වැටුප්, මාතෘත්වය, සේවා ස්ථාන තුවාල; ඒකාබද්ධ වූ වේදිකාව | ජාතික සමාජ රක්ෂණ වේදිකාව යටතේ EPF, ETF, ගොවි විශ්‍රාම වැටුප්, අග්‍රහාර යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම. |

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| 3.3 විශ්වීය අවදානම් ආරක්ෂාව | තායිලන්තය – UCS | බදු අරමුදල් සහිත සෞඛ්‍ය රක්ෂණය; බාහිර රෝගී/නේවාසික රෝගී/මාතෘ ආවරණය | ජාතික හැඳුනුම්පත/අස්වැසුම හා සම්බන්ධ විශ්වීය මාතෘ සහ සෞඛ්‍ය රක්ෂණය |
| 3.4 ඩිජිටල් ලියාපදිංචිය සහ සුවහ බව | රුවන්ඩාව - ස්මාර්ට් හැඳුනුම්පත + ප්‍රජා සෞඛ්‍ය රක්ෂණය | ජංගම ලියාපදිංචිය සහ වාරික ගෙවීම; සුවහ බව සහිත ප්‍රතිලාභ | විශ්‍රාම වැටුප්, මාතෘත්වය,විරැකියාව සඳහා ජාතික හැඳුනුම්පතට සම්න්ධිත සුවහ බවින් යුතු ඩිජිටල් සමාජ රක්ෂණ හැඳුනුම්පත |
| 3.5 නැගී එන සේවක කණ්ඩායම් සඳහා ආවරණය | කෙන්යාව – ගිග් සේවක සමාජ ආරක්ෂණ නියමුවන් | වේදිකාව මත පදනම් වූ දායකත්ව සහිත ගිග් සේවකයන් /බෙදාහැරීමේ සේවකයින් | ගිග් සේවකයින් ස්වේච්ඡා සමාජ රක්ෂණය සඳහා ස්වයංක්‍රීයව ඇතුළත් කිරීම සඳහා PickMe, Uber යනාදිය සමඟ හවුල් වීම. |
| 3.6 Sසේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය(EPF) ශක්තිමත් කිරීම. | සිංගප්පූරුව– CPF | බහු-ස්ථර විශ්‍රාමික ඉතිරිකිරීම්; විධිමත් ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම. | EPF කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ඩිජිටල් වේදිකා ඒකාබද්ධ කිරීම. |
| 3.7 ETF/EPF ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම. | මැලේසියාව – ETF/EPF ආකෘති | මධ්‍යගත දායකත්වය; සුභසාධන සහාය; නම්‍යශීලී මුදල් ආපසු ගැනීම්. | ETF/EPF ඩිජිටල් ආකාරයෙන් විධිමත් කිරීම සහ සමාජ රක්ෂණ වේදිකා සමඟ ඒකාබද්ධ වීම. |
| 3.8 SSB යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම. | ඉන්දියාව– SSB & ප්‍රාන්ත ආකෘති | අවිධිමත්/ස්වයං රැකියාලාභී/සංක්‍රමණික සේවකයින් සඳහා රක්ෂණය. | අවිධිමත් අංශයට සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින්ට SSB ආවරණය පුළුල් කිරීම. |
| 3.9 NITF කාර්යභාරය වැඩි දියුණු කිරීම. | පිලිපීනය – ඒකාබද්ධ රජයේ රක්ෂණ පද්ධති. | දැරිය හැකි රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහාය. | ආවරණය පුළුල් කිරීම සඳහා NITF සේවා (අග්‍රහාර, SRCC&T, බෝග රක්ෂණය) භාවිතා කිරීම. |

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| 3.10 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම. | එස්තෝනියාව – ඊ-විශ්‍රාම වැටුප් | සම්පූර්ණයෙන්ම ඩිජිටල්, හැඳුනුම්පත් සම්බන්ධිත, සයිබර්-ප්‍රතිරෝධී | විශ්‍රාම වැටුප් ඩිජිටල්කරණය; අඛණ්ඩතාව සහ ආරක්ෂාව සහතික කිරීම. |
| 3.11 වැටුප් සහිත දෙමාපිය නිවාඩු සහ රැකියා -ජීවිත තුලනය | ඕස්ට්‍රේලියාව – වැටුප් සහිත දෙමාපිය නිවාඩු (PPL) යෝජනා ක්‍රමය. | සුදුසුකම් ලත් ප්‍රාථමික සත්කාර සපයන්නන් සඳහා අවම වැටුපක් සහිත රජයේ අරමුදල් සහිත සති 18ක් දක්වා නිවාඩු; දෙමාපියන් අතර බෙදා ගත හැකිය; රැකියා ඉතිහාසයට සම්බන්ධය. | අවිධිමත් අංශයේ සේවකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආවරණය වන පරිදි, දායකත්ව ජාතික වැටුප් සහිත දෙමාපිය නිවාඩු ක්‍රමයක් හඳුන්වා දීම; කාන්තාවන් අතර ශ්‍රම බලකායෙන් ඉවත් වීම අවම කිරීම සහ මුල් ළමාවිය සංවර්ධනයට සහාය වීම සඳහා නියමු මාතෘ/පීතෘ දීමනා. |
| **කුළුණු අංක 4: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායි ඇතුලත් භාවය** | | | |
| 4.1 ඒකාබද්ධ සක්‍රියකරණ සේවා | චිලී – චිලී සොලිඩාරියෝ | කොන්දේසි සහිත මාරුවීම් + රැකියා පුහුණුව, මග පෙන්වීම, සමාජ සේවා. | දරිද්‍රතාවය පිටුදැකීමේ මුල්‍ය සහන වැඩසටහන් ප්‍රදානලාභීන් NVQ පුහුණුව සහ දේශීය සක්‍රීය කණ්ඩායම් සමඟ සම්බන්ධ කිරීම. |
| 4.2 පොදු වැඩ සහ හරිත රැකියා | ඉන්දියාව – MGNREGA | දේශගුණික සහ ග්‍රාමීය අවධානය සහිත පොදු වැඩ රැකියා අවස්ථා. | ග්‍රාමීය/ආපදා අවදානම් සහිත ප්‍රදේශවල පොදු කටයුතු; දේශගුණික වශයෙන්ම රොත්තු දීමේ හැකියාව, සත්කාර සේවය, පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර. |
| 4.3 ව්‍යවසාය සංවර්ධන සහාය | ඉතියෝපියාව – ඵලදායී ආරක්ෂණ ජාලය + ව්‍යවසාය සහාය | තරුණ/කාන්තා ගෘහ මූලිකත්වය දරන පවුල් සඳහා ප්‍රදාන, කුසලතා, උපදේශනය. | තරුණයින්, කාන්තාවන් සහ නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා ආරම්භක කට්ටල, පොලී |

| කුළුණු සහ උපායමාර්ගික දිශා | ගෝලීය යහභාවිත සඳහා උදාහරණ | ප්‍රධාන ලක්ෂණ / ප්‍රතිඵල | ශ්‍රී ලාංකීය අනුවර්තනය |
|---|---|---|---|
| | | | රහිත ණය, වෙළඳපොළ සම්බන්ධතා. |
| 4.4කුසලතා සංවර්ධනය සහ කුසලතා නැවත වර්ධනය. | ජර්මනිය - ද්විත්ව ආධුනිකත්ව පද්ධතිය | පන්ති කාමර + රැකියා ස්ථාන පුහුණුව; ජාතික වශයෙන් පිළිගත් සහතික කිරීම. | සත්කාර සේවා කටයුතු, තොරතුරු තාක්ෂණ, සංචාරක, ඉදිකිරීම් සඳහා TVET + සේවායෝජක හවුල්කාරිත්වයන් |
| 4.5 සංක්‍රමණ සහාය සහ නැවත ඒකාබද්ධ කිරීම. | පිලිපීනය - විදේශගත ශ්‍රමිකයින් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන. | ව්‍යාපාර සහාය, ජීවනෝපාය පුහුණුව, මනෝ සමාජීය සේවා | ව්‍යවසාය සහාය, උපදේශනය, පුහුණුව සහිත දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිසංයෝජන ඒකක |
| 4.6 ප්‍රජා මූලික සභා / ප්‍රජා නායකත්වයෙන් යුත් සංවර්ධනය | ඉන්දියාව – AMUL සමුපකාර ආකෘතිය | ගොවීන් සතු සමුපකාර; ලාභ බෙදා ගැනීම; කාන්තා සහභාගීත්වය | සමුපකාර නායකත්වයෙන් යුත් ග්‍රාමීය ව්‍යවසායන්; අස්වැසුම/සමෘද්ධි ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීම; තාක්ෂණික සහ වෙළඳපල සහාය. |
| 4.7 සංක්‍රමණික සේවකයින් සහ පවුල් සඳහා සහාය. | පිලිපීනය සහ තායිලන්තය – විස්තීර්ණ සංක්‍රමණික සහාය වැඩසටහන් | මූල්‍ය, සමාජීය, මනෝ සමාජීය සේවා; පවුල් සහයෝගය | සංක්‍රමණික සේවක පවුල් සඳහා සේවා පුළුල් කිරීම; දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන්/SSB සමඟ ඒකාබද්ධ වීම; උපදේශනය, පුහුණුව, ව්‍යවසාය සහාය. |

## ඇමුණුම 5: උපාය මාර්ගය දැනුවත් කිරීම සඳහා ගෝලීය යහ පිළිවෙත් භාවිතය

ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ උපාය මාර්ගයේ සංවර්ධනය ආරම්භ වූයේ සමාජ ආධාර, සමාජ රක්ෂණය සහ සමාජ සත්කාරය යන ක්ෂේත්‍රවල ගෝලීය යහ පිළිවෙත් පිළිබඳ පුළුල් සමාලෝචනයකින් පසුවය. මෙම ජාත්‍යන්තර අත්දැකීම්, සියලුදෙනා ඇතුළත්, කාර්යක්ෂම සහ ඒකාබද්ධ පද්ධති සැලසුම් කිරීමේදී සිදුවිය යුතු ආකාරය පිළිබඳ වටිනා ආදර්ශ ගෙන දෙන ලදී. ආකෘති එලෙසම අනුකරණය කිරීමට වඩා, ශ්‍රී ලංකාවේ ආයතනික භූ දර්ශනය, ජනවිකාස ප්‍රවණතා සහ සංවර්ධන ප්‍රමුඛතා වලට අදාළ අනුවර්තනය

කළ හැකි අංග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු වේ. ඒකාබද්ධ දත්ත පද්ධති, ජීවන චක්‍ර පාදක වැඩසටහන් නිර්මාණය, ඩිජිටල් බෙදාහැරීමේ පද්ධති සහ ඒකාබද්ධ සත්කාර ආකෘති වශයෙන් ගෝලීය වශයෙන් පිළිගත් නවෝත්පාදනයන්හි උපාය මාර්ගය පදනම් කර ගැනීමෙන්,

මෙම රාමුව දිගුකාලීන ජාතික ඉලක්ක සමඟ අදාළත්වය, ශක්‍යතාව සහ පෙළගැස්ම සහතික කරයි.. මෙම මිණුම් සලකුණු කිරීමේ අභ්‍යාසය උපාය මාර්ගය හැඩගස්වා ඇති ආකාරය පිළිබඳව අවබෝධයක් සපයන ලබන අතර, එය දේශීය යථාර්ථයන්ට ප්‍රතිචාර දක්වමින් පරීක්ෂා කරන ලද අදහස් මත ගොඩනැගෙන බව සහතික කෙරේ.

- **1 වන කුළුණ : සමාජ සහාය - උපායමාර්ගික මඟ පෙන්වීම මගින් යහ භාවිතයන්**

## 1. ඒකාබද්ධ ප්‍රතිලාභී ලේඛනය

***"ඉලක්කගත කිරීම, විනිවිදභාවය සහ සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා සියලුම ප්‍රතිලාභීන් සඳහා ඒකාබද්ධ, ඩිජිටල් ලේඛනයක් නිර්මාණය කිරීම."***

යහ භාවිතය : **බ්‍රසීලයේ කැඩැස්ට්‍රෝ යුනිකෝ (ඒකාබද්ධ ලේඛනය)**

**කුමක්ද:** ෆෙඩරල් සමාජ වැඩසටහන් 20 කට අධික සංඛ්‍යාවක් හරහා භාවිතා කරන අඩු ආදායම්ලාභී නිවාසවල මධ්‍යගත, ඩිජිටල් දත්ත සමුදායකි.

**ලක්ෂණ**

- ගෘහස්ථ සම්මුඛ සාකච්ඡා හරහා එකතු කරන ලදී.
- නගර සභා මගින් අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී.
- ජාතික හැඳුනුම්පතට සම්බන්ධ කර සුදුසුකම්, අධීක්ෂණය සහ විගණන සඳහා භාවිතා කරන ලදී.

**ශ්‍රී ලාංකිය භාවිතය**:

- **දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන, වැඩිහිටි දීමනාව, ආයතනික/වීදි දරුවන්, ආබාධිත ආධාර** සහ ආපදා සහන **ග්‍රා.නි /ප්‍රා.ලේ මට්ටමේ ප්‍රවේශයක්** සහිත එක් **ඩිජිටල් සමාජ ලේඛනයකට** ඒකාබද්ධ කිරීමෙන් ශ්‍රී ලංකාවට මෙය අනුකරණය කළ හැකිය.

## 2. බලගැන්වීමේ මාර්ග

**"මූල්‍ය ආධාර, කුසලතා පුහුණුව සහ ව්‍යවසාය සංවර්ධනය ඒකාබද්ධ කරමින් කාලානුරූපී බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම."**

යහ භාවිතය: **BRAC හි බලගැන්වීමේ ආකෘතිය (බංග්ලාදේශය)**

**කුමක්ද:** පරිභෝජන සහාය, කුසලතා පුහුණුව, ඵලදායී වත්කම් හුවමාරුව, මග පෙන්වීම සහ ඉතුරුම් සහාය ඒකාබද්ධව කෙරෙන සහතික කරන ලද වැඩසටහනකි.

• **ප්‍රතිඵල:** රටවල් 10 වඩා වැඩි ගණනක සහභාගිවන්නන්ගෙන් 95% කට වඩා අන්ත දරිද්‍රතාවයෙන් මුදා ගැනීම.

• **ශ්‍රී ලාංකිය භාවිතය**:

- ක්ෂුද්‍ර මූල්‍ය, TVET සහ ව්‍යවසාය ප්‍රදාන සමඟ සම්බන්ධ වූ වසර 2-3 ක **බලගන්වීමේ මාර්ගයක්** හරහා **දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් පවුල්** සහ නාගරික අවිධිමත් සේවකයින් සඳහා - විශේෂයෙන් වතු සහ ග්‍රාමීය ප්‍රදේශවල - අනුවර්තනය කළ හැකිය.

## 3. ජීවන චක්‍ර ඉලක්ක කිරීම

**" නිශ්චිත අවධීන් සහ අවදානම් (ළමුන්, තරුණයින්, වැඩ කරන වයසේ දුප්පතුන්, වැඩිහිටියන්) සඳහා සකස් කරන ලද සැලසුම් ප්‍රතිලාභ."**

යහ භාවිතය: **දකුණු අප්‍රිකාවේ සමාජ ප්‍රදාන පද්ධතිය**

**කුමක්ද**: ප්‍රධාන ජීවන චක්‍ර අවධීන්හිදී විවිධ දායක නොවන ප්‍රතිලාභ සපයයි:

- ළමා ආධාර ප්‍රදානය (අවුරුදු 18 ට අඩු)
- දරුවන් හදා වඩා ගැනීමේ සහ ආබාධිත ප්‍රදානය
- වැඩිහිටි පුද්ගල ප්‍රදානය (60+)

• **ආවරණය:** ප්‍රතිලාභීන් මිලියන 18 කට වඩා ප්‍රමාණයක ;දරිද්‍රතාවය සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම කෙරෙහි ප්‍රබල බලපෑමක් කර ඇත.

• **ශ්‍රී ලාංකිය භාවිතය**:

ශ්‍රී ලංකාවට දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහනෙන් ඔබ්බට ගොස් **ව්‍යුහගත, වයස්-නිශ්චිත ආධාර යෝජනා ක්‍රම** වෙත මාරු විය හැකිය - උදාහරණයක් ලෙස, විශ්වීය හෝ ආසන්න විශ්වීය **වැඩිහිටි විශ්‍රාම වැටුප්**, ළමා පෝෂණ ප්‍රදාන සහ ආබාධිත දීමනා.

## 4. කම්පන-ප්‍රතිචාරාත්මක පද්ධති

**"අර්බුද අවස්ථාවලදී ප්‍රතිලාභ වේගවත්ව පුළුල් කිරීම සඳහා පූර්ව නිශ්චිත යාන්ත්‍රණ හඳුන්වාදීම ."**

යහ භාවිතය: **පිලිපීනයේ 4Ps + පිලිපීනයේ 4Ps + හදිසි අවස්ථාවන්හිදී පූරණය කිරීම.**

**කුමක්ද**: "*පැන්ටාවිඩ් පැමිලියාංග් පිලිපිනෝ* වැඩසටහන" (4Ps) හදිසි අවස්ථා වලදී තාවකාලිකව පරිමාණය වැඩි කළ හැකිය (උදා: කුණාටු තත්ත්ව, COVID-19).

**ලක්ෂණ**

- ඩිජිටල් ගත මුදල් ලබා දීම.
- ජංගම මුදල් බෙදා හැරීම ක්‍රම
- ආපදා දත්ත භාවිතා කරමින් භූගෝලීය ප්‍රදේශ ඉලක්ක කිරීම

**ශ්‍රී ලාංකිය භාවිතය**

වර්තමාන හෝ අනාගත දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් තුළ කම්පන-ප්‍රතිචාර මොඩියුලයක් නිර්මාණය කිරීම:

- **ජංගම මුදල් මාරු කිරීම් ක්‍රම**
- ගංවතුර/නියඟ ඇති කලාපවල ප්‍රේරිතව ප්‍රසාරණය කල හැකිවීම
- **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය** (DMC) සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වීම

## 5. අධීක්ෂණ සහ බැහැරවීමේ උපාය මාර්ගය

**"ලබාදෙන සහයෝගයෙන් සුමටව පිටවීම සහ වගවීම සහතික කිරීම සඳහා සමාජයීය ගිවිසුම් සහ ප්‍රගතිය නිරීක්ෂණය භාවිතා කිරීම."**

**යහ භාවිතය**: **චිලී සොලිඩාරියෝ (සදාචාරාත්මක පවුල් ආදායම් වැඩසටහන)**

**කුමක්ද**: මනෝ සමාජීය (**psychosocial**) සහාය ,නිතිපතා නිවාස වෙත කෙරෙන සංචාර සහ **පවුල් සංවර්ධන සැලැස්මක්** සමඟ මුදල් ලබාදීම ඒකාබද්ධ කරයි,

**ලක්ෂණ**

- සමාජ සේවකයින්, එකඟ වූ සන්ධිස්ථාන (පාසල් අධ්‍යාපනය, රැකියා සෙවීම, සෞඛ්‍ය ප්‍රවේශය) සාක්ෂාත් කර ගැනීම සඳහා පවුල්වලට සහාය වේ.
- නිරීක්ෂිතයන් වැඩි දියුණුවන විට ඒ සමඟ කාලානුරූපී ප්‍රතිලාභ.

• **ශ්‍රී ලාංකිය භාවිතය**:

- ශ්‍රී ලංකාවට දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් වලින් ඉවත්ව පුහුණු, රැකියා හෝ ක්ෂුද්‍ර ව්‍යවසාය වෙත යොමුවීම සැලසුම් කිරීමට සහ පවුල්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට, පුහුණු සමාජ සංවර්ධන නිලධාරීන් හෝ සමෘද්ධි නිලධාරීන් "සිද්ධි කළමනාකරුවන්" ලෙස යෙදවිය හැකිය.

- **2 වන කුළුණ : සමාජ සත්කාර**

**"යැපෙන ජනගහනය, එනම් වැඩිහිටියන් , ආබාධ සහිත පුද්ගලයින් සහ අවදානමට ලක්විය හැකි දරුවන් වැනි අය සඳහා ගෞරවය, සහයෝගය සහ ඇතුළත් භාවය සහතික කිරීම."**

**1. ජාතික සත්කාර පද්ධතිය**

**"නිර්වචනය කරන ලද හිමිකම්, සේවා ප්‍රමිතීන් සහ හුවමාරුගත මූල්‍යකරණ යාන්ත්‍රණයන් සහිත ජාතික වශයෙන් සම්බන්ධීකරණය කරන ලද සත්කාර පද්ධතියක් ගොඩනැගීම."**

**යහ භාවිතය**: ජපානය - දිගු කාලීන සත්කාර රක්ෂණය (LTCI)

**කුමක්ද:** රට පුරා පැතිරුනු ආයතනික සහ නිවාස පාදක සේවාවන් යන දෙවර්ගයම ලබා දෙන දිගු කාලීන සත්කාර පද්ධතිය.

**ලක්ෂණ**

- වැටුප් බදු සහ රජයේ සහනාධාරවල එකතුවකින් අරමුදල් සපයයි.
- වෘත්තිකයන් විසින් තක්සේරු කරන ලද තනි පුද්ගල සත්කාර සැලසුම්.

**ශ්‍රී ලාංකිය භාවිතය**:

- වැඩිහිටි සහ ආබාධිත සත්කාර සඳහා අර්ථ දක්වා ඇති සේවා පැකේජ, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අයවැය ප්‍රතිපාදන සහිත **ඒකාබද්ධ සත්කාර ප්‍රතිපත්ති රාමුවක්** ස්ථාපිත කිරීම.

## 2 . සත්කාර සේවා පුහුණුව සහ සහතිකකරණය

**" සත්කාර සේවා කටයුතුවල යෙදෙන අයගේ පුහුණුව ප්‍රමිතිගත කිරීමෙන් සහ එම වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීමෙන් රැකවරණ කටයුතු වෘත්තීයකරණය කිරීම."**

**යහ භාවිතය: ජර්මනිය - සත්කාර සේවා පිළිබඳව ජාතික පුහුණු රාමුව**

**කුමක්ද**: වෘත්තීයමය සත්කාර සේවා සපයන්නන් සඳහා ව්‍යුහගත වෘත්තීය පුහුණුවක් ලබා දෙයි.

**ලක්ෂණ**

- විවිධ මට්ටමේ සහතික කිරීම් (අවුරුදු 3 ක හෙද සේවා උපාධිය, කෙටි කාලීන පාඨමාලා).
- ඉහළ රැකියා අනුපාතයන් සහ වෘත්තීය පිළිගැනීම.

• **ශ්‍රී ලාංකිය භාවිතය** :

- MoH සහ MoSDW සමඟ හවුල්කාරිත්වයෙන් NVQ පද්ධතිය අනුව ජාතික සත්කාර සේවාආයතනයක් නිර්මාණය කිරීම.
- වැඩිහිටි සත්කාර, ආබාධිත සත්කාර සහ මුල් ළමාවිය රැකවරණය පිළිබඳ රැකියා අවස්ථා ලබා දීම.

## 3. අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය ලබාදීම

**"දිගුකාලීන සත්කාර පද්ධති සඳහා අත්‍යවශ්‍ය දායකයින් ලෙස අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන් හඳුනාගෙන සහාය දීම."**

**යහ භාවිතය:** ෆින්ලන්තය - පවුල් සත්කාර සේවා සපයන්නන් සඳහා සහාය යෝජනා ක්‍රමය

**කුමක්ද**: වැඩිහිටි හෝ ආබාධිත ඥාතීන් රැකබලා ගන්නා අවිධිමත් අංශයේ සත්කාර සේවා සපයන්නන්ට නගර සභා විසින් දීමනා ගෙවනු ලැබේ.

**ලක්ෂණ**

- විවේක සත්කාර සේවා
- සෞඛ්‍ය පරීක්ෂණ සහ මානසික සෞඛ්‍ය සහාය

**ශ්‍රී ලාංකිය භාවිතය:**

විශේෂයෙන් ග්‍රාමීය/වතු අංශයේ ඔත්පල වී සිටින වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් රැකබලා ගන්නන්ට **මාසික දීමනාවක්** සහ උපදේශන ලබා දීම.

## 4. ප්‍රජා පාදක සත්කාර ජාලයන්

**"පුහුණු, ප්‍රජාව තුලම වෙසෙන ප්‍රජා ක්‍රියාකාරීන් හරහා බිම් මට්ටමේ සත්කාර පද්ධති ගොඩනැගීම."**

**යහ භාවිතය: තායිලන්තය - ග්‍රාමීය සෞඛ්‍ය ස්වේච්ඡා සේවකයින් (VHVs)**

**කුමක්ද**: ප්‍රජා සෞඛ්‍ය ස්වේච්ඡා සේවකයින් ග්‍රාමීය ප්‍රදේශවල වැඩිහිටියන්ට සහ දිගුකාලීන රෝග ඇති පුද්ගලයින්ට සහාය වේ.

**ලක්ෂණ**

- ප්‍රාථමික සෞඛ්‍ය සේවා පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධ වී ඇත

**ශ්‍රී ලාංකිය භාවිතය** :

සත්කාර සේවා සම්බන්ධීකාරකවරුන් පුහුණු කර ඔවුන්ට අඛණ්ඩ සහාය ලබා දීම.

## 5. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs)

**"දැරිය හැකි, ගුණාත්මක සත්කාර වෙත ප්‍රවේශය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සහ සිවිල් සමාජ හැකියාවන් ප්‍රයෝජනයට ගැනීම."**

**යහ භාවිතය: සිංගප්පූරුව - වැඩිහිටි සත්කාර මධ්‍යස්ථාන ආකෘතිය**

**කුමක්ද:** රජයේ සම-මූල්‍යකරණය සමඟ රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍යායතන මගින් සපයනු ලබන දිවා සුරැකුම් සහ සෞඛ්‍ය සේවා

.

**ලක්ෂණ**

- ප්‍රජා පාදක වැඩිහිටි ආධාරක මධ්‍යස්ථාන
- රාජ්‍ය අරමුදල් සහිතව නමුත් පෞද්ගලිකව කළමනාකරණය කරනු ලැබේ

**ශ්‍රී ලාංකිය භාවිතය :**

- විශේෂයෙන් නාගරික සහ වතු ප්‍රදේශවල වැඩිහිටියන් සඳහා නේවාසික සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පුළුල් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන සහ පෞද්ගලික සැපයුම්කරුවන්ට අරමුදල් සැපයීම.

- **3 වන කුළුණ: සමාජ රක්ෂණය**

**"රැකියාවට අදාළ අවදානම් සහ ජීවන චක්‍රය හේතුවෙන් ආදායම් අහිමි වන පුද්ගලයන් සහ කුටුම්භ ආරක්ෂා කිරීම."**

## 1. අවිධිමත් අංශ ඇතුළත් කිරීම

**"සේවයේ විධිමත් භාවය හෝ ගිවිසුම්ගත තත්ත්වයන් නොසලකා සියලුම සේවකයින්ට සමාජ රක්ෂණය පුළුල් කිරීම."**

යහ භාවිතය: **ඉන්දියාව - eShram + PM-SYM**

• **කුමක්ද**: අවිධිමත් සේවකයින් සඳහා e-Shram ඩිජිටල්ගත රෙජිස්ටරය සහ "ප්‍රධාන මන්ත්‍රී ශ්‍රම් යෝගී මාන්-ධාන් " විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.

• **ලක්ෂණ:**

- o රජය විසින් ගලපන ලද ස්වෙච්ඡා දායකත්වයන්
- o ජංගම හෝ CSC (පොදු සේවා මධ්‍යස්ථාන) හරහා ලියාපදිංචි කිරීම

• **ශ්‍රී ලාංකිය භාවිතය:**

ගොවීන්, ධීවරයින්, ගෘහ සේවකයින් සහ ගිග් සේවකයින් සඳහා ජංගම උපාංග පාදක වූ ක්ෂුද්‍ර විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.

## 2. යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම

**" අවදානම් බොහෝ ප්‍රමාණයක් ආවරණය වන ඒකාබද්ධ සමාජ රක්ෂණ වේදිකාවක් ගොඩනැගීමෙන් ඛණ්ඩනය වීම අවම කිරීම."**

යහ භාවිතය: **ඉන්දුනීසියාව - BPJS Ketenagakerjaan**

• **කුමක්ද**: සෞඛ්‍යය, විශ්රාම වැටුප්, මාතෘත්වය, සේවා ස්ථාන වල ඇතිවන අනතුරු ආවරණය කරන ඒකාබද්ධ සේවා නියුක්තික රක්ෂණය.

**ලක්ෂණ:**

විධිමත් සේවකයින් සඳහා අනිවාර්යය වේ , අවිධිමත් සේවකයින් සඳහා විකල්ප අවස්ථාවකි.

• **ශ්‍රී ලාංකිය භාවිතය:**

o ආධාර ලබාදීම (cross-subsidization), ආයතනික අඛණ්ඩතාව සහ පද්ධතිමය කාර්යක්ෂමතාව සහතික කිරීමට සම්බන්ධීකරණ ජාතික සමාජ රක්ෂණ වේදිකාවක් යටතේ EPF, ETF, ගොවි විශ්රාම වැටුප් සහ අග්රහාර යෝජනා ක්රම සමගාමී කිරීම සඳහා පුළුල් පාර්ශවකරුවන්ගේ උපදේශනය හරහා අදියර වශයෙන් මාර්ග සිතියමක් ස්ථාපිත කිරීම.

## 3. විශ්ව අවදානම් ආරක්ෂාව

**"විශේෂයෙන් කාන්තාවන් සහ දුප්පතුන් සඳහා ජීවිත කාලය පුරා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සහ ආදායම් ආරක්ෂාවන් සහතික කිරීම."**

යහ භාවිතය: **තායිලන්තය - විශ්ව ආවරණ යෝජනා ක්‍රමය (UCS)**

• **කුමක්ද**: සැමට, විශේෂයෙන් අවිධිමත් සේවකයින් සහ දුප්පතුන් සඳහා බදු අරමුදල් මගින් ලබාදෙන මහජන සෞඛ්‍ය රක්ෂණය.

• **විශේෂ ලක්ෂණ**

o බාහිර රෝගීන්, නේවාසික රෝගීන් සහ මාතෘ සත්කාර ආවරණය කරයි

o ජාතික හැඳුනුම්පත සමඟ සම්බන්ධ කර ඇත

• **ශ්‍රී ලාංකික භාවිතය:**:

ජාතික හැඳුනුම්පත් සහ දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් දත්ත පද්ධති සමග සම්බන්ධ විය හැකි සහිතව කාන්තාවන්, ළමුන් සහ අවිධිමත් සේවකයින් සඳහා විශ්ව මාතෘ සහ සෞඛ්‍ය රක්ෂණයක් හඳුන්වා දීම.

## 4. ඩිජිටල්ගත ලියාපදිංචිය සහ නම්‍යශීලිබව

**" ස්ථාන හෝ සේවා යෝජකයන්ට වඩා තනි පුද්ගලයන්ට ප්‍රතිලාභ සම්බන්ධ කිරීමෙන් ආරක්ෂාව අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම. "**

**යහ භාවිතය: රුවන්ඩාව - ස්මාර්ට් හැඳුනුම්පත + ප්‍රජා සෞඛ්‍ය රක්ෂණය**

• **කුමක්ද:** " ජංගම දුරකථන පාදකව *Mutuelle de Santé"* සඳහා ලියාපදිංචිය සහ වාරික ගෙවීම.

• **ලක්ෂණ**:

ඒකාබද්ධ හැඳුනුම්පත සහ ජංගම ගෙවීම් පද්ධති

• **ශ්‍රී ලාංකිය භාවිතය**:

o ජාතික හැඳුනුම්පතට සම්බන්ධිතව විශ්‍රාම වැටුප්, මාතෘ සහ විරැකියා ප්‍රතිලාභ කෙරෙහි භාවිතා කළහැකි සුවහ බැවින් යුතු (Portable) , ඩිජිටල් සමාජ රක්ෂණ අනන්‍යතාවයක් ගොඩනැගීම .

## 5.වර්ධනය වන සේවක කණ්ඩායම් සඳහා ආවරණය

**"වෙනස් වෙමින් පවතින රැකියා වෙළඳපොළ සහ ඩිජිටල් වේදිකාවලට සමාජ ආරක්ෂණ රාමු අනුවර්තනය කිරීම."**

**යහ භාවිතය: කෙන්යාව - ගිග් සේවකයින් සඳහා වන සමාජ ආරක්ෂණය**

• **කුමක්ද**: බෙදාහැරීමේ වේදිකාවන් හි සේවකයින් ජාතික රක්ෂණයට ලියාපදිංචි කිරීමට මග පෙන්වීම.

**ලක්ෂණ:**

- සමාජ ආරක්ෂණ දායකත්වය තුල විවිධ වේදිකා මත වන පදනම් වීම අඩු කිරීම.

**ශ්‍රී ලාංකිය භාවිතය**:

වේදිකා මත පදනම් වන සමාගම් සමඟ එක්ව (උදා: PickMe, Uber) ගිග් සේවකයින් ස්වේච්ඡා විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය යෝජනා ක්‍රමවලට **ස්වයංක්‍රීයව ඇතුළත් කර ගැනීමට** පහසුකම් සැලසීම

## 6. දෙමාපිය නිවාඩු සහ රැකියා-ජීවිත සමතුලිතතාවය

**"වැටුප් සහිත දෙමාපිය නිවාඩු සහ නම්‍යශීලී වැඩ කිරීමේ විධිවිධාන හරහා - විශේෂයෙන් කාන්තාවන් අතර -ශ්‍රම බලකායේ සහභාගීත්වයට සහාය වීම."**

**යහ භාවිතය: ඕස්ට්‍රේලියාව - වැටුප් සහිත දෙමාපිය නිවාඩු (PPL) යෝජනා ක්‍රමය**

• **කුමක්ද**: අලුත උපන් දරුවන්ගේ හෝ අලුතින් හදා වඩා ගන්නා දරුවන්ගේ සුදුසුකම් ලත් ප්‍රාථමික රැකවරණකරුවන්ට අවම වැටුපට සති 18ක් දක්වා රජයේ අරමුදල් සහිත නිවාඩු ලබා දෙනු ලැබේ.

**ලක්ෂණ:**

- රැකියා ඉතිහාසයට සම්බන්ධ කර ඇත (උපතට/දරුකමට හදා ගැනීමට පෙර මාස 13න් 10ක් තුළ පැය 330 කාලයක් )
- දෙමාපියන් අතර බෙදා ගත හැක
- සේවායෝජකයා පදනම්ව ලැබෙන නිවාඩු අතිරේකයන්

**ශ්‍රී ලාංකිය භාවිතය:**

- සමාජ රක්ෂණ අරමුදල් මගින් සහාය දක්වන ජාතික දායකත්ව, වැටුප් සහිත දෙමාපිය නිවාඩු ක්‍රමයක් (මුලින් අවිධිමත් අංශයේ සේවකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා) හඳුන්වා දීම
- කාන්තාවන් අතර ශ්‍රම බලකායෙන් ඉවත් වීමේ අනුපාතය අඩු කිරීමට සහ මුල් ළමාවිය සංවර්ධනයට සහාය වීමට මාපියන් සඳහා වන දීමනා සහිතව නියාමනය.

- **4 වන කුළුණ: ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුළත් කිරීම**

**"දරිද්‍රතාවයෙන් පෙලෙන අයට සහ අවදානමට ලක්වූවන්ට තිරසාර රැකියා සහ ආදායම් උත්පාදන අවස්ථා කරා යාමට හැකියාව ලබා දීම."**

**1. ඒකාබද්ධ සක්‍රිය කිරීම**

**"ආර්ථික ඇතුළත් භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ආදායම් සහාය පුද්ගලාරෝපිත සක්‍රිය කිරීම සමඟ ඒකාබද්ධ කිරීම."**

**යහ භාවිතය**: **චිලී රාජ්‍යය - චිලී සොලිඩාරියෝ / ඉන්ග්‍රෙසෝ එටිකෝ ෆැමිලියර්**

**කුමක්ද:** කොන්දේසි සහිත මාරුවීම් සහ රැකියා පුහුණු ,පවුල් මාර්ගෝපදේශනය සහ සමාජ සේවා සඳහා ප්‍රවේශය.

**ලක්ෂණ**:

- පුද්ගලාරෝපිත සක්‍රිය කිරීමේ සැලසුම්

**ශ්‍රී ලාංකිය භාවිතය:**

- ප්‍රාදේශීය සක්‍රිය කණ්ඩායම් විසින් සහාය ලබාදෙමින් **දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් ආධාර ලබන්නන් NVQ පුහුණුව සහ රැකියාවන්හි ස්ථානගත කිරීම** සඳහා සම්බන්ධ කිරීම.

**2. පොදු වැඩ සහ හරිත රැකියා**

**"දේශගුණය සහ සත්කාර අවශ්‍යතාවලට අනුව සකස් කරන ලද පොදු වැඩ හරහා පුරෝකථනය කළ හැකි ආදායමක් ලබා දීම සහ ප්‍රජා වත්කම් ගොඩනැගීම."**

**යහ භාවිතය:** ඉන්දියාව - MGNREGA (ජාතික ග්‍රාමීය රැකියා සහතික පනත)

**කුමක්ද**: ග්‍රාමීය කුටුම්භ සඳහා වැටුප් සහිත රැකියා දින 100 ක් සහතික කරයි.

**ලක්ෂණ**:

- ග්‍රාමීය යටිතල පහසුකම් සහ පාරිසරික වත්කම් කෙරෙහි අවධානය යොමු කෙරේ.

**ශ්‍රී ලාංකිය භාවිතය**:

o **දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව , රැකවරණය සැලසීම සහ පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය** කෙරෙහි අවධානය යොමු කරන ග්‍රාමීය සහ ආපදා අවදානම් සහිත ප්‍රදේශවල **රැකියා සහතික කිරීමේ වැඩසටහන්** දියත් කිරීම.

## 3. ව්‍යවසාය සංවර්ධන සහාය

**"ඉලක්කගත ව්‍යවසාය සහාය සහ මූල්‍ය ඇතුළත් කිරීම තුළින් තිරසාරව ස්වයං රැකියා පෝෂණය කිරීම."**

**යහ භාවිතය:** ඉතියෝපියාව - එලදායී ආරක්ෂණ ජාලය + ව්‍යවසාය සහාය

**කුමක්ද:** තරුණයින්ට සහ කාන්තා මූලික පවුල් සඳහා ව්‍යාපාර ප්‍රදාන, කුසලතා සහ මග පෙන්වීම ලබා දෙයි.

**ලක්ෂණ:**

- ව්‍යවසායකත්වය හරහා බලගැන්වීම

**ශ්‍රී ලාංකිය භාවිතය:**

- තරුණයින්ට සහ නැවත රටට පැමිණෙන සංක්‍රමණිකයින්ට ව්‍යාපාර ඇරඹීමට අවශ්‍ය **ආරම්භක කට්ටල, පොලී රහිත ණය සහ වෙළඳපල සම්බන්ධතා** ලබා දීම.

## 4. කුසලතා සංවර්ධනය සහ කුසලතා නැවත වර්ධනය

**"විශේෂයෙන් රැකවරණ ක්ෂේත්‍රයේ සහ ඉදිකිරීම් සහ සේවා ක්ෂේත්‍රයන්හි ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සමඟ කුසලතා පද්ධති පෙළගැස්වීම."**

**යහ භාවිතය**: ජර්මනිය - ද්විත්ව ආධුනිකත්ව පද්ධතිය

**කුමක්ද**: පන්ති කාමර උපදෙස් සහ වැටුප් සහිත රැකියා ස්ථානක ලබාදෙන පුහුණුව, ඒකාබද්ධ කිරීම.

**ලක්ෂණ**

- ජාතික වශයෙන් පිළිගත් සහතික කිරීමක් ලැබීම

**ශ්‍රී ලාංකිය භාවිතය**:

- විශේෂයෙන් රැකවරණ කටයුතු, තොරතුරු තාක්ෂණ, සංචාරක, ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි වැඩ-**ඒකාබද්ධ පුහුණු ආකෘති** (TVET + සේවායෝජක හවුල්කාරිත්වයන්) පරිමාණය කිරීම .

## 5. සංක්‍රමණය සහ ප්‍රත්‍යනුකලනය

**ආපසු පැමිණෙන සංක්‍රමණිකයින්ට,"ජීවනෝපාය, උපදේශනය සහ සමාජ රක්ෂණ වෙත නැවත ඇතුළත් වීම සඳහා සහාය වීම."**

**යහ භාවිතය**: පිලිපීනය - විදේශගත සේවකයින් සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන

**කුමක්ද**: නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා ව්‍යාපාර සහාය, ජීවනෝපාය පුහුණුව සහ මනෝ සමාජීය (psychosocial) සේවා ලබාදීම .

**ලක්ෂණ**:

- එක් ස්ථානයකින් සියලු සේවා ලබාගත හැකි සංක්‍රමණ මධ්‍යස්ථාන

**ශ්‍රී ලාංකිය භාවිතය**: **ව්‍යවසාය සදහා ප්‍රදාන, පුහුණුව සහ නිවාස මූල්‍ය පහසුකම් ලබාදිම** සමඟ නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින්ට සහාය වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් **නැවත ඒකාබද්ධ කිරීමේ ඒකක**(Reintegration Units) නිර්මාණය කිරීම.

## 6. සමුපකාර පාදක නිෂ්පාදන ඇතුළත් කිරීම

**"ග්‍රාමීය සහ අවදානමට ලක්විය හැකි ජනගහනය අතර ආදායම් උත්පාදනයට සහ ඔරොත්තු දීමේ හැකියාව ජනනය කිරීම සඳහා සමුපකාර ආකෘති ප්‍රවර්ධනය කිරීම."**

**යහ භාවිතය**: ඉන්දියාව -AMUL (Anand Milk Union Limited)

**කුමක්ද**: සාධාරණ මිල ගණන්, යෙදවුම් සහාය සහ සහතික කළ වෙළඳපල ප්‍රවේශය ලබා දීමෙන් කුඩා පරිමාණ නිෂ්පාදකයින්, විශේෂයෙන් කාන්තාවන් බලගන්වන, ගොවීන් සතු කිරි නිෂ්පාදන සමුපකාරයකි.

**ලක්ෂණ**

- ස්ථර තුනකින් යුතු සමුපකාර ආකෘතිය (ගම → දිස්ත්‍රික්කය → රාජ්‍යය)
- ලාභ බෙදා ගැනීමේ විනිවිද භාවය, පුහුණුව සහ ධාරිතා සංවර්ධනය
- කාන්තා සහභාගීත්වය සහ ආදායම් වැඩි දියුණු කිරීම

**ශ්‍රී ලාංකිය භාවිතය**

- විශේෂයෙන් **වතු ප්‍රජාවන්, සමෘද්ධි/අස්වැසුම ලබන්නන් සහ කාන්තාවන් ප්‍රධානීන් වන කුටුම්භ** ඉලක්ක කර ගනිමින්. **කිරි නිෂ්පාදන, කුළුබඩු, ධීවර කර්මාන්තය, මල් වගාව සහ අත්කම් ක්ෂේත්‍රයන්හි** සමුපකාර නායකත්වයෙන් යුත් ව්‍යවසාය ආකෘති සංවර්ධනය කිරීම.

- තාක්ෂණික සහ අලෙවිකරණ සහාය ඇතිව **ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන වේදිකා** සහ අනෙකුත් දරිද්‍රතාවයට සහනය ලබා දෙන ප්‍රජා පාදක සංවිධාන ශක්තිමත් කිරීම.
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා වෙළඳපොළ සම්බන්ධතා සහ cold-chain/logistics සඳහා යටිතල පහසුකම් සැපයීම.

### ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ උපායමාර්ගය සඳහා ගෝලීය යහ භාවිතයන් පිලිබඳ සාරාංශය

| කුළුණ | උපායමාර්ගික දිශාව | යහ භාවිතය රට/වැඩසටහන | ප්‍රධාන ලක්ෂණ | ශ්‍රී ලාංකික අනුවර්තනය සඳහා අදහස |
|---|---|---|---|---|
| සමාජ සහාය | සමෝධානික සමාජ සුභසාධන රෙජිස්ටරය | බ්‍රසීලය - කැඩස්ට්‍රෝ යුනිකෝ | වැඩසටහන් හරහා මධ්‍යගත ලේඛනය, හැඳුනුම්පතට සම්බන්ධ කර ඇත | දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් සහ වැඩිහිටි, ආබාධිත ප්‍රතිලාභ ඒකාබද්ධ කරන ජාතික ඩිජිටල් ලේඛනය |

| | | | | |
|---|---|---|---|---|
| | බලගැන්වීමේ මාර්ග | බංග්ලාදේශය - BRAC බලගැන්වීම | මුදල් + වත්කම් + කුසලතා + මග පෙන්වීම | ක්ෂුද්‍ර මූල්‍ය හා කුසලතා සමඟ සම්බන්ධිත කාලානුරූපී දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් බලගැන්වීම |
| | ජීවන චක්‍ර ඉලක්ක කිරීම | දකුණු අප්‍රිකාව - ප්‍රදාන ක්‍රමය | එක් එක් ජීවන අවධිය සඳහා ප්‍රදාන (ළමා, ආබාධිත, වැඩිහිටි) | ජීවන චක්‍රය පදනම්ව ලබාදෙන සහාය පුළුල් කිරීම : වැඩිහිටි විශ්‍රාම වැටුප්, ළමා ප්‍රදාන |
| | කම්පන-ප්‍රතිචාරාත්මක පද්ධති | පිලිපීනය – 4Ps + හදිසි පරිමාණය වැඩි කිරීම | ආපදා අවස්ථාවන්හිදී ජංගම උපාංග හරහා පරිමාණය කළ හැකි මුදල් ආධාර | ගංවතුර හෝ උද්ධමනය වැනි අවස්ථාවලදී හදිසි සේවා පරිමාණය වැඩි කිරීම |
| | අධීක්ෂණ සහ බැහැරවීමේ උපාය මාර්ගය | චිලී රාජ්‍යය - චිලී සොලිඩාරියෝ වැඩසටහන | සමාජ ගිවිසුම්, සිද්ධි කළමනාකරුවන්,පවුල් සඳහා පසුවිපරම් සහිත සැලසුම් | දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන් සඳහා සිද්ධි කළමනාකරණය සමඟ බලගැන්වීමේ සැලසුම් |
| **2. සමාජ සත්කාර** | ජාතික සත්කාර සේවා පද්ධතිය | ජපානය – දිගුකාලීන සත්කාර සේවා රක්ෂණය | විශ්වීය, මිශ්‍ර-ආකෘති සත්කාර සේවා (නිවාස සහ ආයතනික) | සැපයුම්කරුවන් සම්මිශ්‍රණයක් හරහා ජාතික වැඩිහිටි/ආබාධිත සත්කාර සේවා පද්ධතිය |
| | සත්කාර සේවා සැපයීමේ පුහුණුව | ජර්මනිය – සහතික කළ සත්කාර සේවා සැපයීමේ පුහුණුව | ජාතික විෂයමාලා සහ සහතික කිරීමේ මට්ටම් | NVQ-පිළිගත් පාඨමාලා සහිත සත්කාර සේවා සැපයීමේ පුහුණු ආයතනය |

| | | | | |
|---|---|---|---|---|
| | අවිධිමත් සත්කාර සේවා සැපයීමේ සහාය | ෆින්ලන්තය - පවුල් සත්කාර සේවා සපයන්නන්ගේ යෝජනා ක්‍රමය | අවිධිමත් සත්කාර සේවා සපයන්නන් සඳහා දීමනා සහ විවේක සත්කාර | පවුල් සත්කාර සේවා සපයන්නන් සඳහා මාසික දීමනා සහ සහයෝගය |
| | ප්‍රජා පාදක සත්කාර සේවා | තායිලන්තය – ග්‍රාමීය සෞඛ්‍ය ස්වේච්ඡා සේවකයින් | ප්‍රාථමික සත්කාර සඳහා ඒකාබද්ධ කරන ලද ස්වේච්ඡා සේවකයින් | පුහුණුව ලත් නිලධාරීන් බඳවා ගැනීම සහ ප්‍රජා සත්කාර සේවා සැපයීම |
| | රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් | සිංගප්පූරුව – වැඩිහිටි සත්කාර සේවා මධ්‍යස්ථාන | රජයේ අරමුදල් සහිත, රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන | අඩු පහසුකම් සහිත ප්‍රදේශවල සත්කාර මධ්‍යස්ථාන සඳහාරාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන්(PPP) සඳහා සහාය වීම |
| **3. සමාජ රක්ෂණය** | අවිධිමත් අංශ ඇතුළත් කිරීම | ඉන්දියාව – eShram + PM-SYM | රජයේ ගැලපීම සමඟ ස්වේච්ඡා ක්ෂුද්‍ර දායකත්වයන් | අවිධිමත් අංශය සඳහා ජංගම උපාංග පාදක විශ්‍රාම වැටුප්/රක්ෂණ |
| | යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම | ඉන්දුනීසියාව – BPJS | ඒකාබද්ධ සේවා නියුක්තික රක්ෂණ වේදිකාව | EPF, ETF, ගොවි විශ්‍රාම, වැටුප් ජාතික පද්ධතියකට ඒකාබද්ධ කිරීම |
| | විශ්වීය අවදානම් ආරක්ෂාව | තායිලන්තය - UCS සෞඛ්‍ය යෝජනා ක්‍රමය | බදු අරමුදල් මගින් කෙරෙන විශ්වීය ආවරණය | සහනාධාර සහිත මාතෘ සහ සෞඛ්‍ය රක්ෂණය |

| | | | | |
|---|---|---|---|---|
| | ඩිජිටල්ගත ලියාපදිංචිය | රුවන්ඩාව – ස්මාර්ට් හැඳුනුම්පත් + ප්‍රජා සෞඛ්‍යය | ජංගම උපාංග පාදක හැඳුනුම්පත් -සම්බන්ධිත ලියාපදිංචිය | ජාතික හැඳුනුම්පත පදනම් කරගත්, කෙටි පණිවුඩ මගින් ගෙවීම් අවස්ථා සහිත රක්ෂණය |
| | නැගී එන සේවක ආවරණය | කෙන්යාව – ගිග් සේවක ඇතුළත් කිරීමේ නියමු වැඩසටහන | වේදිකාවන් මත පදනම් වූ සමාජ ආරක්ෂණ දායකත්වයන් | සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා PickMe/Uber වැනි වේදිකාවන් සමඟ හවුල්කාරිත්වය |
| | දෙමාපිය නිවාඩු සහ රැකියා-ජීවිත තුලනය | ඕස්ට්‍රේලියාව – වැටුප් සහිත දෙමාපිය නිවාඩු (PPL) යෝජනා ක්‍රමය. | සුදුසුකම් ලත් ප්‍රාථමික සත්කාර සපයන්නන් සඳහා අවම වැටුපක් සහිත රජයේ අරමුදල් සහිත සති 18ක් දක්වා නිවාඩු; දෙමාපියන් අතර බෙදා ගත හැකිය; රැකියා ඉතිහාසයට සම්බන්ධය. | අවිධිමත් සේවකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආවරණය වන පරිදි, දායකත්ව ජාතික වැටුප් සහිත දෙමාපිය නිවාඩු ක්‍රමයක් හඳුන්වා දීම; කාන්තාවන් අතර ශ්‍රම බලකායෙන් ඉවත් වීම අවම කිරීම සහ මුල් ළමාවිය සංවර්ධනයට සහාය වීම සඳහා නියමු මාතෘ/පීතෘ දීමනා. |
| **4. ශ්‍රම වෙළඳපොළ සහ ඵලදායී ඇතුළත් කිරීම** | ඒකාබද්ධවූ සක්‍රියකරණය | චිලී – ඉන්ග්‍රෙසෝ එටිකෝ ෆැමිලියර් | මාරුවීම් + සිද්ධි කලමනකරනය +සක්‍රීය කිරීමේ සැලැස්ම | දරිද්‍රතාවයට සහනය ලබා දෙන මූල්‍යය සහන වැඩසටහන්, සේවා නියුක්තික වැඩසටහන් සමඟ සම්බන්ධ කිරීම |
| | රාජ්‍ය රැකියා/හරිත රැකියා | ඉන්දියාව – MGNREGA | ග්‍රාමීය රැකියා සහතික කිරීම, පරිසර හිතකාමි ව්‍යපෘති | දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව,සත්කාර සේවා සැපයීම පිළිබඳ පොදු කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවසායන් වෙත සහාය | ඉතියෝපියාව – PSNP + ව්‍යවසාය ප්‍රදාන | තරුණයින්, කාන්තාවන් සඳහා ව්‍යාපාර සහාය | ආරම්භක ප්‍රදාන, නැවත පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා වෙළඳපොළ ප්‍රවේශය |
| | කුසලතා සංවර්ධනය සහ කුසලතා නැවත වර්ධනය | ජර්මනිය – ද්විත්ව ආධුනිකත්ව | රැකියා ඒකාබද්ධවූ වෘත්තීය පුහුණුව | ප්‍රධාන අංශ සඳහා කර්මාන්ත හා එක්ව ගැලපෙන TVET |
| | සංක්‍රමණය සහ ප්‍රත්‍යනුකලනය | පිලිපීනය – OFW ප්‍රත්‍යනුකලනය | නැවත පැමිණෙන අය සඳහා ණය, කුසලතා පුහුණුව | සංක්‍රමණික ප්‍රත්‍යනුකලන සහාය සඳහා දිස්ත්‍රික් මධ්‍යස්ථාන |
| | සමුපකාර ව්‍යවසාය ආකෘතිය | ඉන්දියාව – අමුල් කිරි නිෂ්පාදන සමුපකාරය | සාමූහික විකුණුම් හරහා වටිනාකම් දාම සබඳතා සහ ආදායම් සුරක්ෂිතභාවය සහිත සාමාජිකයින් සතු ග්‍රාමීය සමුපකාර. | දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහාය මගින් ශීත ගබඩා, වෙළඳපොළ ප්‍රවේශය ඇති කෘෂි/කිරි නිෂ්පාදන සමුපකාර ප්‍රවර්ධනය කිරීම. |